320 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 320 - இல. 13
Volume 320 - No. 13

2025 අගෝස්තු 21වන බ්‍රහස්පතින්දා
2025 ஓகஸ்ட் 21, வியாழக்கிழமை
Thursday, 21st August, 2025

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 2203]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 2203]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [තීරුව 2206]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2208-2251]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
අපනයන ඉපැයීම් වැඩිදියුණු කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම [තීරුව 2251]

මන්නාරම සහ රාමේෂ්වරම් අතර ඍජු මගී නෞකා සේවාව [තීරුව 2253]

රේගු ආඥා පනත:
යෝජනා සම්මතය [තීරු 2254-2356]

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත:
නියමය [තීරුව 2357]

මුදල් පනත:
නියෝගය [තීරුව 2357]

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත:
නියෝග [තීරුව 2357]

කල්තැබීමේ යෝජනාව:
සැවොම අන්තර්ගත ඩිජිටල් ආර්ථිකයක් සඳහා වූ රජයේ වැඩ පිළිවෙළ [තීරු 2358-2370]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 2203]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 2203]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 2206]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2208-2251]

தனி அறிவித்தல் மூல வினா:
ஏற்றுமதி வருமானங்களை மேம்படுத்தலும் முதலீடுகளை ஈர்த்தலும் [ப: 2251]

மன்னார் மற்றும் இராமேஸ்வரம் இடையேயான நேரடிப் பயணிகள் கப்பல் சேவை [ப: 2253]

சுங்கக் கட்டளைச் சட்டம்:
தீர்மானம் [ப: 2254-2356]

உற்பத்தித் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்:
கட்டளை [ப: 2357]

நிதிச் சட்டம்:
ஒழுங்குவிதி [ப: 2357]

நிர்மாணத்தொழில் அபிவிருத்திச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2357]

ஒத்திவைப்புப் பிரேரணை:
அனைவரையும் உள்வாங்கிய டிஜிட்டல் பொருளாதாரம் தொடர்பான அரசாங்கத்தின் வேலைத்திட்டம் [ப: 2358-2370]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Presidents' Entitlements (Repeal) Bill: Petitions to the Supreme Court [Col. 2203]

AUDITOR-GENERAL'S REPORT [Col. 2203]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2206]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2208-2251]

QUESTION BY PRIVATE NOTICE:
Improving Export Earnings and Attracting Investments [Col. 2251]

Direct Ferry Service between Mannar and Rameswaram [Col. 2253]

CUSTOMS ORDINANCE:
Resolution [Cols. 2254-2356]

EXCISE (SPECIAL PROVISIONS) ACT:
Order [Col. 2357]

FINANCE ACT:
Regulation [Col. 2357]

CONSTRUCTION INDUSTRY DEVELOPMENT ACT:
Regulations [Col. 2357]

ADJOURNMENT MOTION:
Government's Initiative towards an Inclusive Digital Economy [Cols. 2358-2370]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 අගෝස්තු 21වන බ්‍රහස්පතින්දා
2025 ஓகஸ்ட் 21, வியாழக்கிழமை
Thursday, 21st August, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
PRESIDENTS' ENTITLEMENTS (REPEAL) BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 අගෝස්තු 19 දිනැති මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් තුනට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLIV කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLVII කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ II හා III කොටස් සහ නවවැනි කාණ්ඩයේ II කොටස මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Agreement between the Democratic Socialist Republic of Sri Lanka and the United Arab Emirates on the Promotion and Reciprocal Protection of Investments entered into on 12th February, 2025.

I move that this Agreement be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Report and Accounts of the Swamy Vipulananda Institute of Aesthetic Studies of the Eastern University, Sri Lanka for the year 2023.I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Performance Report of the Sri Lanka Air Force for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2022/2023 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ඕෂන් ව්‍යූ ඩිවෙලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ සහ 35(1), (2) සහ (4) වගන්ති සමඟ කියවිය යුතු 58 වගන්තිය යටතේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, මාවනැල්ල, උතුවන්කන්ද, හිංවැරැල්ල පාර, අංක 5 ඒ දරන ස්ථානයෙහි පදිංචි පී.එස්. සිරිමලී ශාන්ති ප්‍රනාන්දු මහත්මිය සහ වෙනත් දහතුන් දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු කථානායකතුමනි, බුත්තල, යුධගනාව ජනපදය, පාසල පිටුපස, රුමේෂ් නිවස යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.ජී.පී. වීරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

ගරු කථානායකතුමනි, කොළඹ 12, අලුත්කඩේ, සාරව් ආරච්චිගේ වත්ත, අංක 01 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. මහින්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගම්පොල, ජයමාලාපුර, හතරවැනි පටුමග, අංක 311/5 දරන ස්ථානයෙහි පදිංචි බී.ජී. සීලවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නාවලපිටිය, වැලිගම්පල, "නිසල" යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. බිසෝමැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, නවනගරය පාර, දෙකේ ඇළ, අංක 78/1/2 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජේ. විජේතුංග මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, විජිතපුර, පලුගස්වැව ගොවිපොළ, අංක 89 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. ලියනගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, හක්මන, පොත්තෙවෙල, අංක 95/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.පී. මල්ලිකා පතිරණ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නුගේගොඩ, තලපත්පිටිය පාර, අංක 383/7/B දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මහරගම, ආනන්ද මෛත්‍රී මාවත, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි එස්. උඩකන්දගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරි තනතුර: පුරප්පාඩු
இலங்கை புகையிரதத் திணைக்களத்தில் தொழில்நுட்ப அலுவலர் பதவி: வெற்றிடங்கள்
POST OF TECHNICAL OFFICER IN SRI LANKA RAILWAYS: VACANCIES

676/2025

1. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රශස්ත සේවාවක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට තාක්ෂණ නිලධාරීන්ගේ දායකත්වය ඉතා වැදගත් බව පිළිගන්නේද;

(ii) මේ වන විට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුවේ මේ වන විට පවතින තාක්ෂණ නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை புகையிரதத் திணைக்களத்தால் மிகச் சிறந்த சேவை வழங்குவதற்கு அத்திணைக்களத்துக்கு தொழில்நுட்ப அலுவலர்களின் பங்களிப்பு மிக முக்கியமானது என்பதை ஏற்றுக்கொள்வாரா;

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

(ii) தற்போது இலங்கை புகையிரத திணைக்களத்தில் பணியாற்றும் தொழில்நுட்ப அலுவலர்களின் எண்ணிக்கை எத்தனை;

(iii) தற்போது மேற்படி திணைக்களத்தில் நிலவும் தொழில்நுட்ப அலுவலர்களுக்கான வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை;

(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether he acknowledges the fact that the contribution of Technical Officers is very important to the Sri Lanka Railways in providing an optimal service;

(ii) the number of Technical Officers currently serving in the Sri Lanka Railways;

(iii) the number of vacancies for Technical Officers currently existing in the said Department; and

(iv) the measures that will be taken to fill the aforesaid vacancies?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් නිලධාරින් සහ දෙපාර්තමේන්තුගත තාක්ෂණ නිලධාරින් සේවයේ යෙදී සිටී.

තාක්ෂණ සේවයට අයත් නිලධාරින් සංඛ්‍යාව - 24

දෙපාර්තමේන්තුගත තාක්ෂණ නිලධාරින් සංඛ්‍යාව - 4,425

(iii) තාක්ෂණ සේවයට අයත් නිලධාරින් සංඛ්‍යාව - 35

දෙපාර්තමේන්තුගත තාක්ෂණ නිලධාරින් සංඛ්‍යාව - 3,644

(iv) <u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග:</u>

පර්යේෂණ සහකාර සහ සැලසුම් ශිල්පී තනතුරුවල විශේෂ පන්තියේ පුරප්පාඩු 7ක් පැවතිය ද, සුදුසුකම් සහිත I පන්තියේ නිලධාරින් නොමැතිකමින් පුරප්පාඩු පිරවීමට හැකියාව නොමැත.

පර්යේෂණ සහකාර III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 05 පිරවීම සඳහා විභාග පවත්වා ඇති අතර, ඉදිරියේදී පත්වීම් ලබාදීමට නියමිතය.

රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරි කමිටුව වෙතින් සැලසුම් ශිල්පී III ශ්‍රේණියේ පුරප්පාඩු 23ක් සඳහා සීමිත හා විවෘත පදනමින් බඳවා ගැනීම සිදු කිරීමට 2025.05.21 දිනැතිව අනුමැතිය ඉල්ලුම් කර ඇත.

<u>දෙපාර්තමේන්තුගත තාක්ෂණ තනතුරුවල පවතින පුරප්පාඩු 3,644ක් පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග:</u>

රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරි කමිටුව අනුමැතිය අනුව 1,191ක් සඳහා විභාග පවත්වා අවසන් කර ඇත.

තනතුර	කමිටු අනුමැතිය අනුව විභාගය පවත්වා අවසන් තනතුරු සංඛ්‍යාව
දුම්රිය නියාමක	136
දුම්රිය එන්ජින් රියදුරු	192
අධීක්ෂණ කළමනාකරු	169
දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික/විදුලි)	310
මූලික තාක්ෂණික ශිල්පී	384
එකතුව	1,191

රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුවේ අනුමැතිය අනුව අයදුම්පත් කැඳවා විභාගය පැවැත්වීමට නියමිත සංඛ්‍යාව 206යි.

තනතුර	කමිටු අනුමැතිය ලැබී ඇති සංඛ්‍යාව
දුම්රිය ස්ථානාධිපති	106
එන්ජින් රියදුරු සහායක	100
එකතුව	206

රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුවේ අනුමැතියට යොමු කර ඇති සංඛ්‍යාව 2,150යි.

තනතුර	කමිටු අනුමැතිය සඳහා යොමු කර ඇති සංඛ්‍යාව
දුම්රිය නියාමක	59
දුම්රිය එන්ජින් රියදුරු	06
අධීක්ෂණ කළමනාකරු	71
දුම්රිය ස්ථානාධිපති	102
දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික/විදුලි)	756
මූලික තාක්ෂණික ශිල්පී	952
එන්ජින් රියදුරු ෂන්ටින්	124
එන්ජින් රියදුරු සහයක	80
එකතුව	2,150

මීට අමතරව දෙපාර්තමේන්තුගත තාක්ෂණික තනතුරුවල විශේෂ පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු තවත් සවිස්තරාත්මකව වගුවකට අරගෙන තිබෙනවා. ඔබතුමාගේ අවසරය ඇතිව මම එයත් මේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් එකතු කරන්න කියා ඉල්ලා සිටිනවා. කාල වේලාව යන නිසා මම මෙහි සියල්ල කියවන්නේ නැහැ. එකක් දෙකක් විතරක් කියවන්නම්.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමා, පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ක්‍රියාමාර්ග ගැන මා සඳහන් කළා, ගරු මන්ත්‍රීතුමා. 2025 කමිටුවෙන් දුම්රිය ස්ථානාධිපති තනතුරු 106ක් අනුමත කර තිබෙනවා.

දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරින්ගේ තනතුරු සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය ඇතුළත් වගුව පහත දැක්වේ.

අනු අංකය	තනතුර	වැටුප් කේතය	2024 හා ඊට පෙර අනුමත සංඛ්‍යාව	2025 පෙබරවාරි අනුමත සංඛ්‍යාව	2025 මාර්තු කමිටු අනුමත සංඛ්‍යාව	අනුමත මුළු සංඛ්‍යාව	වර්තමාන ප්‍රගතිය
01	දුම්රිය ස්ථානාධිපති	Railway-2025	-	-	106	106	විභාගය සඳහා 12,000 ට ආසන්න ප්‍රමාණයක් ඉල්ලුම්පත්‍ර ලැබී ඇති අතර, විභාගය 2025.09.28 වන දින දිවයින පුරා පැවැත්වීමට කටයුතු යොදා ඇත.
02	දුම්රිය නියාමක	Railway-2025	63	-	73	136	2025.06.15 විභාගය පවත්වා අවසන්ව ඇත. 2025.08.22 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිඵල ලබා දීමට නියමිත බැවින් 2025.09.02,03,04 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට සැලසුම් කර ඇත. 2025.09.15 දින වන විට පත්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
03	දුම්රිය එන්ජින් රියදුරු	Railway-2025	100	-	92	192	විවෘත විභාගය 2025.07.05 පවත්වා ඇත. පිළිතුරු පත්‍ර ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර, සැප්තැම්බර් මුල් සතිය වන විට ප්‍රතිඵල ලබා දීමට නියමිතව ඇත.
04	අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර)	Railway-2025	9	-	14	23	2025.06.21 විභාගය පවත්වා අවසන්ව ඇත. 2025.08.22 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිඵල ලබා දීමට නියමිත බැවින් 2025.09.02,03,04 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට සැලසුම් කර ඇත. 2025.09.15 දින වන විට පත්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
05	අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා)	Railway-2025	9	-	7	16	
06	අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි)	Railway-2025	12	-	16	28	
07	අධීක්ෂණ කළමනාකරු (පාලම්)	Railway-2025	5	-	3	8	
08	අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග)	Railway-2025	32	-	32	64	
09	අධීක්ෂණ කළමනාකරු (සං/වි)	Railway-2025	13	-	17	30	

[ගරු බිමල් රත්නායක මහතා]

අනු අංකය	තනතුර	වැටුප් කේතය	2024 හා ඊට පෙර අනුමත සංඛ්‍යාව	2025 පෙබරවාරි අනුමත සංඛ්‍යාව	2025 මාර්තු කමිටු අනුමත සංඛ්‍යාව	අනුමත මුළු සංඛ්‍යාව	වර්තමාන ප්‍රගතිය
10	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික)	MT-02	-	117	127	244	2025.07.12 විභාගය පවත්වා අවසන්ව ඇත. සමත් අයදුම්කරුවන් අගෝස්තු 30,31, සැප්තැම්බර් 01,02,03 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. පත්වීම් ලිපි සැප්තැම්බර් 10 දින ලබා දීම.
11	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි)	MT-02	-	36	30	66	2025.07.12 විභාගය පවත්වා අවසන්ව ඇත. 2025.08.21 ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතයි. සමත් අයදුම්කරුවන් අගෝස්තු 30,31, සැප්තැම්බර් 01,02.03 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. පත්වීම් ලිපි සැප්තැම්බර් 10 දින ලබා දීම.
12	මූලික තාක්ෂණ ශිල්පී (තනතුරු	MT-01	-	-	384	384	2025.08.03 විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත. සමත් අයදුම් කරුවන් (116) අගෝස්තු 27,28 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. පත්වීම් ලිපි සැප්තැම්බර් 10 දින ලබා දීම.
13	උපදේශක	MN-03	-	-	08	08	2025.08.02 විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත. සමත් අයදුම් කරුවන් (16) අගෝස්තු 29, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. පත්වීම් ලිපි සැප්තැම්බර් 10 දින ලබා දීම.
14	රියදුරු සහායක	MT-01	100				අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2025.07.25. විභාගය ඔක්තෝබර් මස විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට නියමිතව ඇත.
එකතුව			343	153	909	1405	

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවා නම් අහන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න ගොඩක් එකට පැටලිලා එන ප්‍රශ්නයක් මේක. ඔබතුමා තරහ ගන්න එපා, එකවරම. උදේ පාන්දර හොඳ නැහැ තරහ ගන්නා එක. මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න. මොකද, මේ දවස්වල දුම්රිය ගැන විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා දුම්රිය සේවකයන්ට කිව්වා, සේවයට වාර්තා කරන්න බැරි නම් වහාම ඉල්ලා අස් වෙලා යන්න කියලා. එක පැත්තකින්, දුම්රිය සේවයේ පුරප්පාඩු ගොඩක් තිබෙනවා. පුරප්පාඩු ගොඩක් තියාගෙන මෙසේ පවත්වාගෙන යන දුම්රිය සේවාව සම්බන්ධව රටේ ජනතාවට තිබෙන්නේ ප්‍රසාදයක් නොවෙයි. බොහෝ වෙලාවට අප්‍රසාදයක් තිබෙන්නේ. එහෙම නම්, එය ක්‍රමවත් කරන්න ඕනෑ. අපි දැක්කා, එහි වැසිකිළි පද්ධතියේ ඉඳලාම ක්‍රමවත් කරන්න ඕනෑ බව. විශේෂයෙන් විදේශ රටවලින් ආපු අය කිව්වා, සමහර තැන්වල වැසිකිළිවලට යන්න බැහැ කියලා. එම නිසා දුම්රිය සේවයේ වැසිකිළි පද්ධතියේ ඉඳලා හැම දෙයක්ම ක්‍රමවත් කරන්න ඕනෑ.

ඉතිහාසයේ සිට අපේ ප්‍රෞඪත්වය ආරක්ෂා කරපු දුම්රිය ස්ථාන තිබෙනවා. ඒ ස්ථානත් ආරක්ෂා කරගෙන අපි අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. දුම්රිය සේවය මේ ආකාරයට පවත්වාගෙන යද්දී අපට පෙනෙනවා සේවය කරන එම කණ්ඩායම් එක්ක විශාල ගැටුමක් තිබෙන බවක්. පවත්නා මේ අඩුපාඩු නිවැරැදි කරගෙන යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. අපි දකිනවා දුම්රිය සේවකයන්ට විශාල ප්‍රශ්නයක් තිබෙන බව. දුම්රිය සේවාවේ අභ්‍යන්තරයේ අඩුපාඩු ගොඩක් තිබෙනවා. වැටුප් සම්බන්ධවත් හැම තිස්සේම විශාල වශයෙන් ප්‍රශ්න එනවා. ඉස්සෙල්ලාම මේ සම්බන්ධව විධිමත් සැලැස්මක් හදන්න ඕනෑ කියලායි අප කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා බඳවා ගැනීම් කරගෙන යනවා මේ මාස කිහිපය ඇතුළත. හැබැයි එසේ බඳවා ගැනීම් කරන අය ආයෙත් යොදවන්නේ අතැනටමයි. එම සේවකයන් බඳවා ගනිද්දී තිබෙන්න ඕනෑ නිශ්චිත ක්‍රමවේදයක්, නිශ්චිත වැඩ පිළිවෙළක්, එම සේවය හසුරුවා ගන්නේ කොහොමද කියන එක ගැන. ජනතාවගේ ප්‍රසාදයට ලක් වන විධියට මේ දුම්රිය සේවාව පවත්වාගෙන යන්න හදලා තිබෙන සැලසුම මොකක්ද කියා මම පළමුවෙන්ම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රට වැට්ටුවා කියන එකේ එක කොටසක් තමයි දුම්රිය සේවාව වැට්ටවීම. අපි පිළිගන්නවා රට ආර්ථික, සංස්කෘතික, දේශපාලන, පරිපාලන වශයෙන් බිඳ වැටුණා කියලා. එම තත්ත්වයට එකතු කිරීමක් තමයි දුම්රිය සේවයෙනුත් කර තිබෙන්නේ. ඒ නිසා මම මඟින් මහට කියා තිබෙනවා දුම්රිය දෙපාර්තමේන්තුව සැලකිය යුතු අකාර්යක්ෂමතාවක තිබෙනවා, සැලකිය යුතු ලෙස ජනතාවට අවශ්‍ය සේවය ලබා දීමට අපොහොසත් වෙලා තිබෙනවා කියලා. ඉතාම උනන්දුවෙන් වැඩ කරන නිලධාරින්, සේවක මහත්වරුන් ප්‍රමාණයක් ඒ ආයතනයේ ඉන්නවා වාගේම සැලකිය යුතු

ප්‍රමාණයක් අලස ලෙසත් ඉන්නවා. ඒ වාගේම ඒ ආයතනය පුරවලා තිබෙනවා, එක එක කාලවල හිටපු ප්‍රවාහන ඇමතිවරුන්ගේ දිස්ත්‍රික්කවල පිරිස්වලින්. ඒ අනුව සැලකිය යුතු ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම තනතුරුවලට බඳවා ගෙන නැති ප්‍රශ්නයත් තිබෙනවා. විශේෂයෙන්ම තාක්ෂණික ශිල්පීන් බඳවා ගෙන නැහැ. ඒ නිසා මම ඇමතිවරයා ලෙස පළමුවැනි කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ, දුම්රිය දෙපාර්තමේන්තුවට සේවක සේවිකාවන් බඳවා ගැනීම වෙනුවෙන්. කැබිනට් මණ්ඩලය විධියට අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා, තාක්ෂණික සේවාවල පුරප්පාඩු පුරවනවා කියලා. ඒ සඳහා අපි දෙසැම්බර් මාසයේදීම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා අනුමත කර ගත්තා. ඒ අනුමත කර ගත්ත තනතුරු සඳහා බඳවා ගන්නත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සමහර ප්‍රධානීන් කටයුතු කළේ ඉතාම අලස විධියට. ඒ නිසා තමයි අවුරුද්දක් විතර ගිහිල්ලා තිබෙන්නේ, ඒ සඳහා බඳවා ගැනීමට. ඉතින් ඒ නිසා අපට වෙනත් පරිපාලන තීන්දුත් ගන්න සිද්ධ වුණා. නමුත් දැන් අපට වෙනම දුම්රිය දෙපාර්තමේන්තුවක් හදලා, අලුතින් බඳවා ගන්නා පිරිස ඒකේ පුහුණු කරලා කටයුතු කර ගන්න බැහැ. තිබෙන ආයතනයටම තමයි ගන්න වෙන්නේ. දැන් නව දුම්රිය සාමාන්‍යාධිකාරිවරයෙක් පත්වෙලා ඉන්නවා. නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි කණ්ඩායමක් විශාල වශයෙන් මේ කටයුතුවලට මහන්සි වෙනවා. ඒ වාගේම අපි ස්වේච්ඡාවෙන් කටයුතු කරන ඉංජිනේරුවරුන් සමඟත් කටයුතු කරනවා. වෘත්තිය සමිති සමඟත් ගොඩක් සුහදව කටයුතු කරනවා. ඔබතුමා කියන සියලු අඩුපාඩුකම් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒවා ඉතිහාසයෙන් අපට දීපු දේවල්. ඒවා වෙනස් කරන්න අපට මැජික් පොල්ලක් නැහැ. ඒ නිසා ක්‍රමානුකූලව වෙනස් කරගෙන යනවා. අපි හිතනවා, තවත් වසරක් විතර යනකොට දැන් මේ තිබෙන තත්ත්වයට වඩා සියයට 50කින් විතර හොඳ තත්ත්වයට ගන්න පුළුවන් වෙයි කියලා. ඒක තමයි කියන්න තිබෙන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමනි, අපට අර විධිමත් සැලැස්ම පසුව හරි ඉදිරිපත් කළොත් ඒක වැදගත් කියලා මම හිතනවා. සැලැස්මකට අනුව ගියොත් ඒ ප්‍රශ්න ඔක්කෝම ඉවර කර ගන්න පුළුවන්. සැලැස්මක් නැතුව එකින් එක, එකින් එක, එක එක විධියට ගියොත් මම හිතනවා, ඒක කරන්න බැහැ කියලා. හැබැයි, ප්‍රශ්නය හරියට හඳුනාගෙන ඒ සැලැස්ම හදන්න ඕනෑ. අපට ඒ සැලැස්මත් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලමින්, දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. මොකද, අපේ දිස්ත්‍රික්කයටත් යම්කිසි දෙයක් කෙරෙන්න ඕනෑ. දැන් මීගමුවට යන කල් දුම්රිය lanes දෙකක් තිබෙනවා. එතැනින් එහාට පුත්තලම දිස්ත්‍රික්කය දුම්රිය සේවාව අත්හැරලා තිබෙන ප්‍රදේශයක්. දුම්රිය සේවාව දියුණු කළොත් ඒ ප්‍රදේශයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට ලොකු වාසියක් හම්බ වෙනවා. ඒ වාගේම, ජනතාවට ලොකු පහසුවක් වෙනවා, ගමනාගමනයේදී. එය, භාණ්ඩ ප්‍රවාහනය වෙන්න පුළුවන්, ජනතාව ප්‍රවාහනය වෙන්න පුළුවන්. ඒ සඳහා ගන්නා පියවර මොකක්ද? ඒකත් එක්කම මම අහන්න කැමැතියි, city service එකක් ඇති කිරීම පිළිබඳව. යම්කිසි රටකින් හෝ ආධාරයක් අරගෙන city service එකක් ආරම්භ කරන්න කටයුතු කරන්න. මීට පෙර එවැනි සැලැසුම් තිබුණා. ඒ සැලසුම් ඉදිරියට ක්‍රියාත්මක කරන්න යම්කිසි රටක් එක්ක හෝ සම්බන්ධ වෙලා මීගමුව ඉඳලා කොළඹට city service එකක් දැම්මොත් මාර්ග තදබදය ගොඩක් අඩු වෙයි කියලා මම හිතනවා. හැබැයි, expressway එකට පොඩි පාඩුවක් වෙයි. ජනතාවගේ පහසුව සඳහා එක පැත්තකින් city service එකක් ආරම්භ කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, පුත්තලම දක්වා මාර්ග දෙකක් හදන්න අවශ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කරන්න ඕනෑ. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඒවාත් ඔය සැලැසුම ඇතුළේ තිබෙනවාද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි සැලසුමක් ඇතුව තමයි වැඩ කරගෙන යන්නේ. අපි ඒවා අය වැයටත් ඉදිරිපත් කරනවා. ඒ වාගේම අය වැය සැලැස්මත් ඔබතුමාට බලාගන්න පුළුවන්. ඔබතුමා දක්ෂ මන්ත්‍රීවරයෙක් නිසා කෝච්චියට පෙට්ටි එකතු කරනවා වාගේ ප්‍රශ්නත් පෙට්ටි, පෙට්ටි, පෙට්ටි වාගේ ගොඩක් එකතු කරලා තිබෙනවා. මට ඒ ඔක්කෝම ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න වෙලාවක් නැහැ.

අපි පිළිගන්නවා, පුත්තලම් දිස්ත්‍රික්කයට අදාළව විශේෂයෙන් හලාවතින් එහාට හොඳ දුම්රිය සේවාවක් පවත්වන්නේ නැහැ කියන එක. අපේ ගරු හිරුණි විජේසිංහ මන්ත්‍රීතුමියත් පුත්තලමට ආවා, මේ ප්‍රවාහන අමාත්‍යාංශයට සම්බන්ධ කාරණා ගැන කථා කරන්න. ඔබතුමාත් එයි කියා අපි බලාපොරොත්තු වුණා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට. ඉතින් ඒ මන්ත්‍රීතුමියත් සෑහෙන කරුණු කිව්වා, ඔය ඔබතුමා කියන කරුණුම ඇතිව. නමුත් අපට ඉතාම ඉක්මන් උත්තරයක් නැහැ, මන්ත්‍රීතුමා. අපි දැනට තීරණයක් අරගෙන තිබෙනවා, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තිබෙන ඒ unprotected තැන් කිහිපයක් protect කරන්නට. ඒ වාගේම අපට එන්ජින් ලැබෙන ප්‍රමාණයත් එක්ක අපි බලාපොරොත්තු වෙනවා, පුත්තලම දුම්රිය මාර්ගය හලාවත සිට දියුණු කරන්න. ඒක ලබන අවුරුද්දේ වෙන දෙයක් නොවෙයි. මොකද, ඒවා එන්ජින් එක්ක සම්බන්ධයි. ඒ නිසා එන්ජින් ලැබෙන ප්‍රමාණය එක්ක තමයි කරන්න වෙන්නේ.

අපට කිසිම ප්‍රශ්නයක් නැහැ expressway එක සම්බන්ධව. මිනිස්සු විවිධ ප්‍රවාහන මාර්ගවලින් තමයි ගමන් කරන්න ඕනෑ. ඉතින් දැනට තිබෙන තත්ත්වය අනුව ගත්තොත්, අපට පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනතාවට කරන සාධාරණය තමයි, unprotected ඒවා protect කරන එක. ඒ වාගේම දුම්රිය මාර්ගය නිසා ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවල යම්කිසි ගං වතුර තර්ජනයක් ඇති වෙමින් තිබෙනවා. අන්න ඒක අවම කරන්න තීන්දුත් ගන්නවා. ඒ වාගේම අපි තෝරා ගෙන තිබෙනවා පුත්තලම් දිස්ත්‍රික්කයේත් stations කිහිපයක් modernize කරන්න. අපි ඒවා පටන් ගන්නවා. නමුත් ඔබතුමා ඉල්ලන ප්‍රධාන ඉල්ලීම ඉටු කරන්න අපි තව ටිකක් දුම්රිය සේවය හදා ගන්න ඕනෑ. ඒ, දුම්රිය කළමනාකාරිත්වය සහ රත්මලාන Workshop එක.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඔබතුමා කථා කරන අවස්ථාවේදී Parliamentary Business Committee එක ගැන ප්‍රකාශ කළේ නැහැ, අද තිබෙනවා කියලා. ඒක අද තිබෙනවා නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකද, ඒක ප්‍රකාශ වුණේ නැහැ ඔබතුමා කථා කරන මොහොතේ. ඒක අමතක වෙලා තිබ්බා. ඒක අද තිබෙනවා නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Parliamentary Business Committee එක අද තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Hon. Speaker.

විදුලි සැපයුම් ස්ථායිතාව ශක්තිමත් කිරීම: ගෙනඇති ක්‍රියාමාර්ග
மின்விநியோக நிலைபேறு தன்மையை வலுப்படுத்துதல்: நடவடிக்கை
STRENGTHENING OF STABILITY OF POWER SUPPLY: STEPS TAKEN

735/2025

2. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2025.02.09 වැනි දින ශ්‍රී ලංකාවේ විදුලිය බිඳවැටීමක් සිදු වූ බව දන්නේද;

(ii) එසේ නම්, එම විදුලිය බිඳවැටීමත් සමඟ විදුලි සැපයුම් ජාල ස්ථායිතාව ශක්තිමත් කිරීම සඳහා මේ දක්වා ගන්නා ලද කෙටි කාලීන හා දිගු කාලීන පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025.02.09ஆம் திகதி இலங்கையில் மின்சாரம் தடைப்பட்ட சம்பவமொன்று இடம்பெற்றது என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனின், மேற்படி மின்சாரம் தடைப்பட்ட சம்பவத்தின் பின்னர் மின்விநியோக வலையமைப்பின் நிலைபேறு தன்மையை வலுப்படுத்துவதற்கு இற்றைவரை மேற்கொள்ளப்பட்டுள்ள குறுகிய கால மற்றும் நீண்டகால நடவடிக்கைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that there was a power outage in Sri Lanka on 09.02.2025; and

(ii) if so, separately, the short-term and long-term steps that have been taken to strengthen the stability of the power supply network following the power outage?

(b) If not why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) විදුලි සැපයුම් ජාලයේ ස්ථායිතාව ශක්තිමත් කිරීම සඳහා මේ වන විටත් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒවා කෙටි කාලීන හා දිගු කාලීන ලෙස වෙන් වෙන්ව පහතින් දක්වා ඇත.

❖ කෙටි කාලීන පියවර

1. විදුලි පද්ධතිය තුළ ක්ෂණිකව ඇති වන අස්ථාවර අවස්ථාවන්හිදී වහල මත සවි කර ඇති සූර්ය විදුලිබල පද්ධති, ජාතික විදුලි පද්ධතිය තුළ පවත්වා ගැනීම තුළින් එහි ස්ථායිතාව පවත්වා ගැනීමට හැකි පරිදි ඒවායේ ඉන්වර්ටර් පරාමිතීන් යාවත්කාලීන කිරීම.

   ඉන්වර්ටර් ආරක්ෂණ පරාමිතීන් යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය: මේ වන විට පොළොව මත ඉදිකරන ලද සූර්ය පද්ධති ද ඇතුළුව මෙගාවොට් 800ක ධාරිතාවකින් යුත් ස්ථාපනයන් 31,100කට ආසන්න සංඛ්‍යාවක් යාවත්කාලීන කර ඇත.

2. තවදුරටත්, ජාලක ස්ථායිතාව පිළිබඳ ගැටලුවලට ප්‍රතිචාර වශයෙන්, වහල මත සවි කර ඇති සූර්ය විදුලිබල පද්ධති මඟින් උත්පාදිත බලශක්තිය පද්ධතියට සැපයීම පමණක් සිදු කිරීම වෙනුවට බලශක්ති උත්පාදනය, එම ස්ථානය/ පරිශ්‍රය තුළදීම පරිභෝජනය සඳහා දිරිමත් කිරීමට තාක්ෂණික සහ නියාමන පියවර හඳුන්වා දීම.

3. හැකි සෑම අවස්ථාවකදීම සමමුහුර්ත කන්ඩෙන්සර් - synchronous condenser - ආකාරයෙන් ජල හා තාප බලාගාර ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. විස්තර ඇමුණුමෙහි සටහන 3හි දක්වා ඇත.

   මේ වන විට නව ලක්ෂපාන බලාගාරයෙහි ඒකක 1 හා 2, සමමුහුර්ත කන්ඩෙන්සර් මාදිලියට පරිවර්තනය කර පරීක්ෂා කර ඇත. වෙනත් යන්ත්‍රයක් පරිවර්තනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.

4. අධික හිරු එළිය සහිත දිවා කාලයේදී ඉරිදා වැනි ඉල්ලුම අඩු නිවාඩු දිනවලදී පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම ඉතා දුෂ්කර බැවින්;

- දැනට පද්ධති පාලන මධ්‍යස්ථානයට පාලනය කළ හැකි සූර්ය හා සුළං විදුලි බලාගාරවල සැපයුම ජාතික විදුලිබල පද්ධතියට අවශ්‍යා පරිදි පාලනය කිරීම - සීමා කිරීම - මඟින් ජාතික විදුලිබල පද්ධතිය ස්ථාවරව පවත්වා ගෙන යනු ලබයි.
- පද්ධති පාලන මධ්‍යස්ථානයේ පාලනයෙන් තොර බලාගාරවල [බෙදාහැරීමේ ජාලයට සම්බන්ධ කර ඇති ජනක යන්ත්‍ර - embedded generators], උත්පාදනය නවතන ලෙස ඉල්ලීමක් කරනු ලබයි. පද්ධති පාලන මධ්‍යස්ථානය, කෘත්‍රිම බුද්ධිය භාවිත කර තෝරාගනු ලබන වාර සටහනකට අනුව බෙදා හැරීමේ පාලන මධ්‍යස්ථාන හරහා ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවන්ගේ මාර්ගයෙන් බෙදා හැරීමේ ජාලයට සම්බන්ධ කර ඇති ජනක යන්ත්‍රවල උත්පාදනය නවතන ලෙස ඉල්ලීමක් කරන අතර හිමිකරුවන් කීප දෙනෙකු හැර බොහෝ හිමිකරුවන් ඊට ධනාත්මක ප්‍රතිචාර දක්වමින් උත්පාදනය නවත්වනු ලබයි.

5. පුනර්ජනනීය බලශක්ති බලාගාර ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර ගන්නා අතරම ජාතික විදුලිබල පද්ධතියේ ස්ථායිතාවට සහාය වීම සඳහා බැටරි බලශක්ති ගබඩා පද්ධති - Battery Energy Storage Systems, BESS - ඒකාබද්ධ කරගැනීම පිණිස කාල පාදක ගාස්තුවක් - time-based tariff එකක් - සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එම යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත.
6. ඉදිරියේදී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට නියමිත සියලුම සුළං හා සූර්ය බලාගාර පද්ධති පාලන මධ්‍යස්ථානය හරහා පාලනය කිරීමට අවශ්‍ය නීතිමය හා තාක්ෂණික ක්‍රියාමාර්ග ඒවායේ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම - Power Purchase Agreement එක - හරහා කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.
7. ජාතික විදුලිබල පද්ධතිය අස්ථායී අවස්ථාවන්හීදී එය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා පෙර සිට පැවති තාක්ෂණික පරාමිතීන් (උදාහරණ: භ්‍රමණ සංචිත - spinning reserves) අවශ්‍යතාව, අඩු සංඛ්‍යාත මත භාර ඉවතලීම - Under Frequency Load Shedding, UFLS - විශ්ලේෂණය කර ඒවා යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී.
8. ලක්විජය බලාගාරය ආරක්ෂිතව නැවැත්වීමේ ක්ෂණික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

   ලක්විජය බලාගාරය ආරක්ෂිතව නැවැත්වීම සඳහා බලාගාර සතුව ප්‍රමාණවත් උපකාරක ධාරිතාවක් නොමැතිකම හේතුවෙන් බලාගාරයේ ඒකක තුනම වසා දැමීමට සිදු වූ බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, ක්ෂණික විසඳුම් ලෙස සොබාදනවි බලාගාරයෙන් කොළඹ නගර විදුලි සැපයුම ප්‍රතිස්ථාපනය කරන අතරතුර ලක්විජය බලාගාරය සඳහා උපකාරක ධාරිතාවක් - auxiliary load එකක් - සපයා ගැනීම සඳහා කටයුතු කරමින් ඇත.

   ඉහත 1,2,3 සහ 7 යටතේ දක්වා ඇති ක්‍රියාමාර්ග සම්බන්ධ විස්තරාත්මක සටහන ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

❖ දිගුකාලීන පියවර.

1. පොම්ප බලාගාර - Pump Storage Power Plants - ඉදිකිරීම සඳහා ප්‍රධාන ස්ථාන දෙකක් හඳුනාගෙන ඇති අතර, ඒවායින් වඩාත් සුදුසු ස්ථානය ලෙස මහඔය තෝරාගෙන එම ස්ථානයේ සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර, සවිස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම, අවශ්‍ය ඉඩම් වෙන් කිරීම කර ගැනීම ආදිය සඳහා කටයුතු යොදා ඇත.
2. 2026 හා 2027 වන විට ජාතික විදුලි පද්ධතියට මෙගාවොට් 100ක් සහ 160ක් වන මහා පරිමාණ බැටරි බලාගාර ඉදිකිරීමට නියමිතය.

   මෙගාවොට් 160 සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර, ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් භාවිත කර මෙගාවොට් 100 බලාගාරය සඳහා ඉදිරියේදී ටෙන්ඩර් කැඳවීමට නියමිතය.
3. පුනර්ජනනීය බලශක්ති ප්‍රභව පුරෝකථනය හා එම බලාගාර පද්ධති පාලන මධ්‍යස්ථාන හරහා පාලනය කිරීමට පුනර්ජනනීය බලශක්ති පාලන ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් භාවිත කර ටෙන්ඩර් කැඳවීමට අදාළ ටෙන්ඩර් ලේඛන සකස් කරමින් පවතී.
4. සම්ප්‍රේෂණ පද්ධතියේ ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම උදෙසා ඒ සඳහා භාවිත වන විද්‍යුත් උපාංග (eg: STATCOM, synchronous condenser) එකතු කිරීමට ඉදිරියේදී සැලසුම් කර ඇත.
5. පුනර්ජනනීය බලශක්තිය විශාල ලෙස විදුලි පද්ධතියට අවශෝෂණය වන විට ජාතික විදුලි පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීම උදෙසා අවස්ථිතිය - inertia - සහිත, වේගයෙන් ක්‍රියා කළ හැකි - flexible - විදුලි බලාගාර ඉදිරි කාලයේ ජාතික පද්ධතියට එක් කිරීමට කටයුතු කරමින් සිටී.
6. දුරස්ථ අධීක්ෂණය සහ හදිසි අවස්ථාවකදී විසන්ධි කිරීම පිණිස ස්මාර්ට් මීටර සඳහා අවශ්‍ය අමතර ක්‍රියාකාරිත්වයන් - additional functions - හඳුන්වා දීම.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කුමාර ජයකොඩි මහතා]

7. නිෂ්පාදකයන්ගේ ඉන්වර්ටර් හරහා හෝ සිම් කාඩ්පත්වලින් සමන්විත මොඩම් ස්ථාපනය කිරීමෙන් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියේ තත්‍ය කාලීන දෘශ්‍යතාව සහ පාලනය කිරීමේ හැකියාව සහතික කිරීම සඳහා බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

මෙම ව්‍යාපෘතිය වසර 2ක කාලයක් තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කාල සීමාව අවසන් වන විට බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන හතරෙහිම අවශ්‍ය සියලුම ක්‍රියාකාරිත්වයන් ක්‍රියාත්මක වනු ඇත. ඊට සමගාමීව නිෂ්පාදකයාගේ ඉන්වර්ටර් වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගැනීම පිණිස කටයුතු කරමින් සිටී.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, විශේෂයෙන්ම මේ වෙනකොට පුනර්ජනනීය බලශක්තියේ තිබෙන වැදගත්කම ගැන. ඔබතුමා ලබා දුන් උත්තරය තුළත් ඒ ගැන සඳහන් වුණා. විශේෂයෙන්ම තාප විදුලියට අපි වැය කරන පිරිවැය වැඩියි. අද ඒකේ බර දරන්නේ මේ රටේ පාරිභෝගිකයා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් පිළිගන්නවා ඇති, මේ මොහොතේත් විදුලි බිල අධික ලෙස ජනතාවගේ කර මතට වැටී තිබෙන බව. එවැනි තත්ත්වයකදී විශේෂයෙන්ම සූර්ය බලශක්තිය ගැන කථා කරනකොට, සූර්ය බලශක්ති නිෂ්පාදනයේදී unit එකකට ගෙවන මුදල කලින් තිබුණු ප්‍රමාණයට හෝ ගෙනෙන්න පුළුවන් නම් හොඳයි. මොකද, මම හිතන විධියට සූර්ය බලශක්ති නිෂ්පාදනය තුළ රුපියල් 17කට ආසන්න මුදලක් තමයි මේ වන විට unit එකකට ගෙවන්නේ. ඒ ගෙවන මුදල අවම වශයෙන් කලින් තිබුණු ගණනට හෝ ගෙනෙන්න පුළුවන් නම් හොඳයි. ඔබතුමා කිව්වා, ධාරිතාව වැඩි කරන්න කටයුතු කරනවා කියලා. එසේ ධාරිතාව වැඩි කිරීම තුළ සූර්ය බලශක්ති පැනල වහලය මත ස්ථාපනය කිරීමේ ප්‍රවණතාවේ වැඩිවීමක් සහ යම් ආකාරයේ නිදහසක් ආර්ථික වශයෙන් ජනතාවට ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් ඒ සම්බන්ධව මා උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම "The Sunday Times" පුවත් පතේ පළ වී තිබුණු article එක පිළිබඳවත් අදහසක් දක්වන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසන ලද අතුරු ප්‍රශ්නය සම්පූර්ණයෙන් ගත්තාම පරස්පර විරෝධීයි. මොකද, ජනතාවට අඩු මිලට විදුලිය ලබා දෙන්න කියන ගමන්, නිෂ්පාදකයාට ගෙවන මිල වැඩි කරන්න කියලාත් එතුමා කියනවා. මට තේරෙන්නේ නැහැ, ඒ තර්කය ගොඩනහන්නේ කොහොමද කියලා. *[බාධා කිරීමක්]* ඔව්, වහලය මත සවි කරන එක තමයි. මොකද, ඒකත් tariff එකට එකතු වෙනවා. ඇත්තටම වහලය මත සවි කරන පැනලවලට අදාළව tariff එක හදා තිබෙන්නේ මේ ආර්ථික මට්ටමට අනුවයි. එම විදුලිය ඒකකයක් රුපියල් 37ට හෝ 27ට තමයි ගන්නේ. නමුත් ඒකක 90ක් වෙනකම් ජනතාවට විදුලිය ලබා දෙන්නේ රුපියල් 18යි ගණනකට. ලංකාවේ විදුලි පාරිභෝගිකයන් මිලියන 7ක් පමණ සිටිනවා. ඒ මිලියන 7න්, මිලියන 5ක්ම -සියයට 70කට කිට්ටු ප්‍රමාණයක්- මාසිකව ඒකක 90ට අඩුවෙන් තමයි පාවිච්චි කරන්නේ. එතකොට ඒගොල්ලන්ගේ tariff එක වන්නේ රුපියල් 18.50. වහල මත සවිකර තිබෙන සමස්ත සූර්ය පැනලවලින් සියයට 60කට ආසන්න ප්‍රමාණයකට ඒකකයකට රුපියල් 37 හෝ 27 වශයෙන් කලින් ගෙවීම් කළා. එයිනුත් සියයට 56කට ආසන්නව තිබෙන්නේ රුපියල් 37 unit. ඒවායෙන් අවුරුදු 20ක් විදුලිය ලබා ගන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

තාප විදුලිය නිෂ්පාදනයේ පිරිවැය වැඩියි නේද, සූර්ය පැනලවලට වඩා?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඒක තමයි. මම ඒක පැහැදිලි කර තිබෙනවා. තාප විදුලිය නිෂ්පාදනයේදී භාවිත කරන්නේ ඩීසල් නේ. ඩීසල් භාවිතයෙන් නිපදවන විදුලිය අපි දවල්ට ගන්නේ නැහැ. සූර්ය බලය භාවිතයෙන් නිපදවන විදුලිය තිබෙන්නේ දවල්ට විතරයි. ඒ දෙක compare කරන්න බැහැ, කජු ඇටයි, කොස් ඇටයි වාගේ. මොකද, අපිට රෑට පාවිච්චියට ගන්න සූර්ය බලය භාවිතයෙන් නිපදවන විදුලිය තිබෙනවා නම් පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැහැ නේ. එම නිසා ඒ දෙක එකට ගළපන්න බැහැ. මොකද, දවල්ට ලැබෙන සූර්ය බලය භාවිතයෙන් නිපදවන විදුලිය රෑ වෙනතුරු තියා ගන්න ගියොත්, ඒකේ ගණන වැඩි වෙනවා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, යහ පාලන ආණ්ඩුව සමයේදී මේ සූර්ය පැනල සවි කරන අයට යම්කිසි ණය සහනයක් දුන්නා. ඒ වාගේ වැඩ පිළිවෙළක් අපිට කරන්න බැරිද? මේ සූර්ය පැනලවල බැටරි මිල අධිකයි. ඒගොල්ලන්ට යම්කිසි සහනයක් දුන්නොත් දවල්ට ලැබෙන ධාරිතාව ඒ බැටරිවල store කරලා, රෑට පාවිච්චි කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් අපිට සකස් කරන්න බැරිද, ගරු ඇමතිතුමනි?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඇත්තටම ඒ ගැන අපි සොයා ගෙන යනවා. මට මතක හැටියට, ඒක ආණ්ඩුවෙන් දුන්නු ණයක් නොවෙයි, ADB එකෙන් දුන්නු ණයක්. 2018 කාලයේදීත් ඒ ණය දුන්නා. හැබැයි, අපිට තවම එහෙම ප්‍රතිපාදනයක් නැහැ. අපි ඒ ගැන යෝජනා කරලා තිබෙනවා. නමුත්, ණය දෙන ආයතන තවම ඒකට එකඟ වෙලා නැහැ. එහෙම දෙන්න පුළුවන් නම් අපි ඒ ණය ලබා දෙනවා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයත් අහනවා. ඒ අතරතුර තව දෙවැනි ප්‍රශ්නයත් අහනවා. කරුණාකර ඉදගන්න.

ප්‍රශ්න අංක 3-808/2025-(1), ගරු මුජිබුර් රහුමාන් මහතා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම්, පැහැරගැනීම් සහ පහරකෑම් පිළිබඳවයි. ඒ පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ආදී ආයතන ගණනාවකින් තොරතුරු ගත යුතුව තිබෙන නිසා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති හතරක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4-832/2025-(1), ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5-859/2025-(1), ගරු සුසන්ත කුමාර නවරත්න මහතා.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන: විස්තර
வாகன புகை உமிழ்வுப் பரிசோதனை வேலைத்திட்டம்: விபரம்
VEHICLE EMISSION TESTING PROGRAMME: DETAILS

868/2025

6. ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වූයේ කවරේද;
(ii) එම වැඩසටහන ආරම්භ කරන ලද දිනය කවරේද;
(iii) එමඟින් වාර්ෂිකව උපයනු ලබන ආදායම එක් එක් වාහන කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) එම ආදායම එකතු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වාහන වායු විමෝචන භාරකාර අරමුදල යනු කවරේද;
(ii) එය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද;
(iii) ඒ තුළින් රජයට ආදායමක් ලැබෙන්නේද;
(iv) එසේ නම්, එම ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் வாகனப் புகை உமிழ்வுப் பரிசோதனை வேலைத்திட்டம் அமுல்படுத்தப்படுவதன் அடிப்படை நோக்கம் யாது என்பதையும்;
(ii) அந்த வேலைத்திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;
(iii) அதனூடாக வருடாந்தம் ஈட்டப்படும் வருமானம் ஒவ்வொரு வாகன வகுதியின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;
(iv) மேற்படி வருமானத்தை திரட்டும் நிறுவனம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வாகன புகை உமிழ்வுப் பரிசோதனை நம்பிக்கைப் பொறுப்பு நிதியம் எனப்படுவது யாது என்பதையும்;
(ii) அது யாரால் ஆரம்பிக்கப்பட்டது ஏன்பதையும்;
(iii) அதன்மூலம் அரசாங்கத்துக்கு வருமானம் கிடைக்கின்றதா என்பதையும்;
(iv) ஆமெனில், மேற்படி வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House the -
  (i) primary objective of implementing the Vehicle Emission Testing Programme in Sri Lanka;
  (ii) date on which the said programme was initiated;
  (iii) annual revenue that are generated by it, separately in respect of each vehicle category; and
  (iv) name of the institution that collects the revenue?

(b) Will he also inform this House -
  (i) the role of the Vehicular Emission Test Trust Fund;
  (ii) the name of the individual who initiated the said Fund;
  (iii) whether the Government receives any revenue from the said Fund; and
  (iv) if so, the amount of the said revenue?

(c) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ වායු දූෂණයට ප්‍රධානම සාධකය වාහනවලින් පිටවන දුම බවට හඳුනා ගැනීමත්, එය කළමනාකරණය නොවීම තුළින් ජීවත් වීමට ඇති මූලික අයිතිය කඩ වන බවට පංච පුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඒකමතිකව තීන්දු කිරීමත් සමඟ අංක 569/98 මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වාහන වායු විමෝචන ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයට නියෝග කරන ලදී. එකී නියෝගය කිරීම පදනම් කර ගනිමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන ආරම්භ කෙරිණි.

(ii) 2008.11.17 දින බස්නාහිර පළාතෙන් ආරම්භ කර 2013.06.01 වනවිට උතුරු පළාත ද ඇතුළුව සමස්ත දිවයිනම ආවරණය කර ඇත.

(iii) 2024 වර්ෂයට අනුව වාර්ෂික ආදායම:

- මෝටර් සයිකල් - රුපියල් 1,946,073,510
- මෝටර් ත්‍රිරෝද රථ - රුපියල් 762,248,450
- මෝටර් කාර් - රුපියල් 900,697,080
- ද්විත්ව කාර්ය වාහන - රුපියල් 701,191,565
- මෝටර් ලොරි - රුපියල් 506,282,440
- මෝටර් කෝච්/බස් රථ - රුපියල් 85,515,105
- ප්‍රයිම් මූවර්ස් - රුපියල් 3,361,120
- ඉඩම් වාහන - රුපියල් 126,470

(iv)
- ලාෆ්ස් එකෝ ශ්‍රී සමාගම
- ක්ලීන්කෝ ලංකා පුද්ගලික සමාගම

(ආ) (i) වාහනවලින් පිට වන දුම මඟින් ඇති වන වායු දූෂණය අවම කිරීම ඇතුළු සමස්ත වායු සම්පත කළමනාකරණය කිරීම තනි තනිව සිදු කළ නොහැකි නමුත්, ආයතන ගණනාවක මනා සම්බන්ධීකරණය මඟින් පමණක් ළඟා කර ගත හැකි ඉලක්කයක් වේ.

ඒ අනුව වායු දූෂණය කළමනාකරණය කිරීම හා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා එම කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය අරමුදල් රාජ්‍ය භාණ්ඩාගාරයට බරක් නොවී රැස් කරගැනීම සඳහා වාහන වායු විමෝචන භාරකාර අරමුදල ස්ථාපිත කර ඇත.

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙනු ලැබූ නියෝගයට අනුව එවකට ශ්‍රී ලංකාවට ගැළපෙන පරිදි වාහන වායු විමෝචන පරීක්ෂණ ක්‍රමවේදය 2000-2002 කාල පරිච්ඡේදය තුළ ලෝක බැංකු ආධාර යටතේ, දේශීය හා විදේශීය නියෝජිතයන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් මඟින් සකස් කර ඇත. එහිදී මෙවැනි පාරිසරික සංරක්ෂණ කටයුතු වෙනුවෙන් රාජ්‍යයන්හි ප්‍රමුඛතාව නොලැබීම සැලකිල්ලට ගෙන මේ සඳහා විකල්පයක් වශයෙන් ජාත්‍යන්තරව පිළිගන්නා සංකල්පයක් ලෙස භාර අරමුදල් ක්‍රමවේදය එම කමිටුව විසින් යෝජනා කර ඇත.

දුම් පරීක්ෂාව ආරම්භ කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සන්දේශය හා 2008.09.03 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයට 2008.09.03 දිනැතිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. පසුව නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද වායු විමෝචන භාරකාර අරමුදලේ ගිවිසුම 2009.12.27 දින භාණ්ඩාගාර ලේකම් හා භාරකරුවන් පස්දෙනෙකු අතර අත්සන් කර නිල වශයෙන් වායු විමෝචන භාරකාර ගිවිසුම ආරම්භ කර ඇත. (භාරකරුවන් : මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්-සභාපති, පරිසර අමාත්‍යාංශයේ ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, මුදල් අමාත්‍යාංශ නියෝජිතයෙක්)

(iii) දුම් පරීක්ෂණ ක්‍රියාවලිය රජයට ආදායම් ඉපැයීමේ ප්‍රභවයක් නොවේ. නමුත් දුම් පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 7.5ක් වායු විමෝචන භාරකාර අරමුදලට හා සියයට 17.5ක් රජයේ බදු (VAT හා SSCL) ආදායමට අයත් වේ.

(iv) ඔව්. 2024 වර්ෂය සඳහා සමස්ත බදු ආදායම රුපියල් 852,226,088කි.

(ඇ) අදාළ නොවේ.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඇත්තටම මේ කාර්යය සද්භාවයකින් පටන් ගත්තා වුවත් අපි දන්නවා, අද වෙනකොට මේ පරීක්ෂණය සමත්වීම සඳහා නොයෙක්, නොයෙක් අකටයුතුකම් විශාල ප්‍රමාණයක් සිදු කරන බව. ඒ පරීක්ෂණයේ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා, ඒ පරීක්ෂණය සමත් වීම සඳහා විවිධ ආකාරයේ අයථා ක්‍රම පාවිච්චි කරනවා. එතකොට පරිසරය සම්බන්ධ අපේ ඒ

අරමුණ ඉටු වෙලා නැහැ කියන එකයි මගේ හැඟීම. මේ කටයුත්ත මේ ආකාරයෙන් දිගින් දිගටම පැවතීම රටට අහිතකරයි නේද? ඒ නිසා එවැනි දේ කරන අය සම්බන්ධයෙන් හෝ ඒ ආයතන සම්බන්ධයෙන් මොනවා හරි නීතිමය පියවරක් ගන්නවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මෙයට කාර්යභාර ගණනාවක් තිබෙනවා. මොකද, අපි කොළඹ, නුවර ඇතුළු නගර රාශියක් හඳුනා ගෙන තිබෙනවා, බරපතළ විධියේ air quality drop එකක් තිබෙන. ඒ කියන්නේ, වායුවේ තත්ත්වය හොඳ නැහැ. ඒකට ප්‍රධාන හේතුවක් තමයි වාහන. පොදු ප්‍රවාහනය දියුණු නොවීමත් මෙයට බලපා තිබෙනවා. ඒ නිසා මෙවැනි අරමුදලක් හරහා වායු විමෝචනය පරීක්ෂා කරන එක අත්‍යවශ්‍යයි. ඒක ක්‍රියාත්මක කිරීමේදී සිද්ධ වෙන වැරදි නිසා ඒ අරමුදල හෝ ඒ අරමුණු වැරදි වෙන්නේ නැහැ. ඕනෑම ආයතනයක ක්‍රියාත්මක කිරීමේදී වැරදි වෙන්න පුළුවන්. මට කියන්න තිබෙන මූලික කාරණය ඒකයි. ඒ වාගේම මේ අරමුදලෙන් මෙවැනි දේවල් කෙරෙනවා.

අහඹු සහ හදිසි දුම් පරීක්ෂාවනුත් මාර්ගයේ සිදු කරනවා. වාහනය අරගෙන ගිහිල්ලා test එක කරන එකට අමතරව මේ දේවලුත් කරනවා. ඊට පස්සේ air quality එක බලනවා. ඒ වාගේම, පවතින විෂ දුම කළමනාකරණය සඳහා රුක් රෝපණ වැඩසටහන් කරනවා. ගරු කථානායකතුමනි, මම උදාහරණයක් කියන්නම්. Transport Safety වැඩසටහන යටතේ මේ traffic lights පද්ධතියේ ඒ තැන්වල කාලය දමලා තිබුණේ නැති නිසා; තත්පර ගණන දාලා තිබුණේ නැති නිසා - countdown system එකක් නැති වුණාම - මොකක්ද වෙන්නේ? එතකොට ඒ තැන්වල නවත්වන වාහනවල අය හරිම නොඉවසිල්ලෙන් ඉන්නේ. මෝටර් සයිකලයක ඉන්න කෙනෙකු නම් ඔහු ඒක accelerate කර කර ඉන්නේ. වාහනවල සිටින රියැදුරන් දන්නේ නැහැ, ඊළඟට ලයිට් එක පත්තු වෙන්නේ කීයටද කියලා. ඒ නිසා අපි අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරලා මේ වායු විමෝචන අරමුදලේ මුදල්වලින් මට මතක විධියට රුපියල් මිලියන 64ක් අරගෙන කොළඹ නගරයේ countdown systems නැති තැන්වල countdown timers සවි කළා. එතකොට ඇත්තටම අපි එතැනදි කාලය දන්නවා, අපට අවසාන තත්පර කිහිපයේදී ලෑහැස්ති වුණාම ඇති. මම හැම කෙනෙකුටම තේරෙන එක උදාහරණයක් මේ කිව්වේ. එවැනි තව ගොඩක් දේවල් කරන්න පුළුවන්. නමුත්, මේ කටයුත්ත ක්‍රියාත්මක වීමේදී හොඳින් ගිවිසුම්ගත වී නොමැති නිසා, මේ පරීක්ෂණ කරන ආයතන හරියාකාරව අධීක්ෂණය නොකිරීම නිසා යම්කිසි වංචනික ක්‍රමවලට මේ certificate එක ගන්න පුළුවන් බව අපි කවුරුත් දන්නවා අත්දැකීම් තිබෙන නිසා. මගේ දැනීමේ හැටියට, 2026 වසරේ දෙසැම්බර් 31 දින වන විට මේ ගිවිසුම අහෝසි වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී වඩාත් හොඳින්, වඩාත් ප්‍රායෝගික වශයෙන් සහ ඉහළ මට්ටමින් මේ කටයුත්ත සිදු කරන්න. ඒක තමයි ගරු මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ. අඩුපාඩුකම් වෙනවා. නමුත්, අඩුපාඩුකම් වෙද්දී වුණත් මේ අරමුදල සහ මේ purpose එක වැදගත්.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මෙතැන විශාල මුදලක් එකතු වෙන බව අපි දන්නවා. මම හිතන විධියට ඒ අරමුදලින් පොඩි කොටසක් තමයි රජයට ලැබෙන්නේ. ඒ නිසා මම දැනගන්න කැමැතියි, අලුතින් මේ සඳහා පියවර ගැනීමේදී ඒ දැවැන්ත මුදල රාජ්‍ය ආදායමක් හැටියට ලැබෙන විධියේ පියවරක් ගැනීම සඳහා ඔබතුමාගේ අදහසක් තිබෙනවා ද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි පිළිගන්න ඕනෑ මේ පරීක්ෂණ කරන ආයතනත් රට පුරාම එවැනි stations හදලා, invest කරලා ඔවුනුත් සැලකිය යුතු ප්‍රාග්ධනයක් මේ වෙනුවෙන් වෙන් කර තිබෙනවා කියලා. ඒක රජය කළා නම් ඒ සඳහා විශාල මුදලක් යනවා. නමුත්, ඒවා ගිවිසුම්ගත වෙද්දී අධීක්ෂණ ක්‍රියාවලියේ දුර්වලතා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, 2026 වසර අවසාන වන විට දැනට අත්සන් කර තිබෙන මේ ගිවිසුම අහෝසි වෙනවා. ඉන්පසුව අපට පුළුවන් වඩාත් පාරදෘශ්‍ය ආකාරයට ගිවිසුම්ගත වෙන්න. ඒ වාගේම, විදුලි වාහන - EVs - ප්‍රචලිත වීමත් සමඟ මේ ක්‍රියාවලියේ අවශ්‍යතාවත් ක්‍රමානුකූලව අඩු වීමට නියමිතයි. ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි අපි කටයුතු කරගෙන යන විධිය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -877/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ඉදිකර ඇති ගුවන් පාලම් සහ උමං මාර්ග: වැය වූ මුදල්
நிர்மாணிக்கப்பட்டுள்ள மேம்பாலங்கள் மற்றும் சுரங்கப்பாதைகள்: செலவிடப்பட்ட நிதி
FLYOVERS AND ROAD TUNNELS CONSTRUCTED: MONEY SPENT

955/2025

8. ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මහාමාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව, දුම්රිය මාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව සහ ඉදිකර ඇති උමං මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ඉදිකිරීම සඳහා වැයවී ඇති මුදල කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ඉදිකර ඇති ස්ථාන කවරේද;

(iii) උතුරු දිග දුම්රිය මාර්ගයේ, මහව මංසන්ධිය හරහා ගුවන් පාලමක් ඉදිකිරීමට යෝජනා කර තිබුණේද;

(iv) වර්ෂ 2004 සිට 2014 දක්වා කාල වකවානුව තුළ එම ගුවන් පාලමේ ඉදිකිරීම් ආරම්භ කිරීම වෙනුවෙන් උත්සවයක් සංවිධානය කර තිබුණේද;

(v) එසේ නම්, එම උත්සවය සඳහා දරන ලද වියදම කොපමණද;

(vi) එම ගුවන් පාලම ඉදිකිරීම සඳහා ඉදිරියේදී පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු සුජීව දිසානායක මහතා]

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நெடுஞ்சாலைகள் ஊடாக நிர்மாணிக்கப்பட்டுள்ள மேம்பாலங்களின் எண்ணிக்கை, புகையிரத வீதிகள் ஊடாக நிர்மாணிக்கப்பட்டுள்ள மேம்பாலங்களின் எண்ணிக்கை மற்றும் நிர்மாணிக்கப்பட்ட சுரங்கப் பாதைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவற்றை நிர்மாணிப்பதற்காகச் செலவிடப்பட்ட நிதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு வெவ்வேறாக அறிவிப்பாரா?

(ஆ) (i) குருணாகல் மாவட்டத்தில் நிர்மாணிக் கப்பட்டுள்ள மேம்பாலங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி பாலங்கள் எவ்விடங்களில் நிர்மாணிப்பட்டுள்ளன என்பதையும்;

(iii) வடக்கு புகையிரதப் பாதையில் மஹவ சந்தி ஊடாக மேம்பாலமொன்றை நிர்மாணிப்பதற்கு முன்மொழியப்பட்டிருந்ததா என்பதையும்;

(iv) 2004ஆம் ஆண்டு தொடக்கம் 2014ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் மேற்படி மேம்பாலத்தை நிர்மாணிக்கும் பணிகளை ஆரம்பிக்கும் பொருட்டு விழாவொன்று ஏற்பாடு செய்யப்பட்டதா என்பதையும்;

(v) ஆமெனில், அவ்விழாவுக்காகச் செலவிடப்பட்ட நிதி எவ்வளவு என்பதையும்;

(vi) எதிர்காலத்தில் மேற்படி மேம்பாலத்தை நிர்மாணிப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House, separately -

(i) the number of flyovers constructed across highways, flyovers constructed across railways and road tunnels constructed in Sri Lanka; and

(ii) the amount that has been spent on the construction of those referred to above?

(b) Will he also inform this House -

(i) the number of flyovers that have been constructed in the Kurunegala District;

(ii) the locations where the above flyovers have been constructed;

(iii) whether it has been proposed to construct a flyover across the Maho Junction on the Northern Railway Line;

(iv) whether a ceremony had been organized to commence the construction of the flyover concerned during the period from 2004 to 2014;

(v) if so, the expenditure that the ceremony incurred; and

(vi) whether steps will be taken in future to construct the said flyover?

(c) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) • මහාමාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව 12 කි.

• දුම්රිය මාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව 16කි.

• මහාමාර්ග හරහා ඉදිකර ඇති උමං මාර්ග සංඛ්‍යාව 20කි.

(ii) • මහාමාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් 12 ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 21,131.80ක් - බිලියන 21ක් පමණ- වියදම් වී තිබෙනවා.

• දුම්රිය මාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් 16ක් ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 23.9ක් පමණ වියදම් වී තිබෙනවා.

• උමං මාර්ග 20ක් ඉදි කිරීම සඳහා රුපියල් බිලියන 8.2ක් පමණ වියදම් වී තිබෙනවා.

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ජාතික මහාමාර්ග හරහා ඉදිකර ඇති මගී ගුවන් පාලම් සංඛ්‍යාව 05යි. රථ වාහන ගුවන් පාලම් ඉදිකරලා නැහැ.

(ii) • කඩහපොළ රඹාවැව මාර්ගයේ (මගී ගුවන් පාලම), සියඹලාගස්කොටුව මදීනා පාසල අසල.

• කළුගමුව - විලාකටුපොත - බමුණාකොටුව මාර්ගයේ (15 වන කිලෝමීටරයේ), බමුණාකොටුව පාසල අසල.

• නිකවැරටිය - මොරගොල්ලාගම- සියඹලන්ගමුව මාර්ගයේ (23 වන කිලෝමීටරයේ) යාපහුව පාසල අසල.

• ඉබ්බාගමුව -කුඹුක්ගැටේ- මඩගල්ල මාර්ගයේ, පොල්පිතිගම පාසල අසල.

• අඹේපුස්ස -කුරුණෑගල- ත්‍රිකුණාමලය මාර්ගයේ, ගොකරැල්ල පාසල අසල.

(iii) ඔව්, එවකට පැවති දේශපාලන අධිකාරිය විසින් 2008 වර්ෂයේ දී මෙවැනි ඉදිකිරීමකට යෝජනා ඉදිරිපත් කර තිබුණි.

(iv) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එවැනි කිසිදු උත්සවයක් සංවිධානය කර නොතිබූ අතර, එවැනි උත්සවයක් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු හෝ සහභාගි වී නොමැත. එවැනි උත්සවයක් මහාමාර්ග අමාත්‍යාංශය විසින් ද සංවිධානය කර ඇති බවට තොරතුරු සොයා ගත නොහැක.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ අහන ප්‍රශ්නයට අදාළව තිබෙන පසුබිම් වාර්තාවේ තිබෙනවා, මෙහෙම උත්සවයක් සංවිධානය කරලා තිබෙනවා කියලා. මා එය කියවන්නම්.

2008 වර්ෂයේදී යෝජනා කර ඇති පරිදි, මහා මාර්ග අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාගේ උපදෙස් පරිදි මහා මාර්ග රාජ්‍ය අමාත්‍ය ටී.බී. ඒකනායක මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2008 මාර්තු 01 වන දින එවකට පැවති දේශපාලන අධිකාරිය විසින් එම ස්ථානයේ උත්සවයක් සංවිධානය කර මෙම ගුවන් පාලමේ ඉදි කිරීම් කටයුතු සඳහා මුල් ගල තබා ඇත. නමුත් එහි ඉදි කිරීම ආරම්භ කිරීම වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් උත්සවයක් සංවිධානය කර නැත කියා එහි සඳහන් වනවා. උත්සවයක් සංවිධානය කරලා තිබෙන්නේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් නොවෙයි.

(v) උක්ත (ආ) - (iv) පිළිතුරට අනුව අදාළ නොවේ.

(vi)

- 2023-2030 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබේ.
- අවශ්‍ය සැලසුම් සහ ඇස්තමේන්තු මධ්‍යම පළාත් සැලසුම් අංශය විසින් සකස් කරමින් පවතී.
- ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව නගරයට දුම්රිය මාර්ගය හරහා යන ගුවන් පාලමක් ඉදි කරන්න අපි සැලසුම් කර තිබෙනවා. එය 2026දී පටන් ගන්නවා. Kurunegala Town එකෙන් එහා, මුත්තෙට්ටුගල, Kurunegala railway crossing එකත් එක්ක, අපි ගුවන් පාලමක් ඉදිකරන්න යනවා, 2026දී. ඒ වාගේම ගැටඹේ ගුවන් පාලමේ දැනට තිබෙන ගැටලු විසඳලා ඒකට මුදල් වෙන් කරලා ගොඩ නඟනවා. සියයට 98ක් වැඩ අවසන් කර ඇති කොහුවල ගුවන් පාලමේ වැඩකටයුතු අපි අවසන් කරනවා.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට අදාළ පිළිතුරකුත් ගරු අමාත්‍යතුමාගේ උත්තරයේ අන්තර්ගත වුණා. ගරු ඇමතිතුමනි, A6 මාර්ගය කියන්නේ අඹේපුස්ස-ත්‍රිකුණාමලය මාර්ගය. එම මාර්ගයේ කුරුණෑගල දිස්ත්‍රික්කය හරහා වන කොටසේ දුම්රිය මාර්ගය හතර තැනකින් හරස්ව ගමන් කරනවා, යාංගල්මෝදර, පොල්ගහවෙල, පොතුහැර සහ ගැට්ටුවාන වශයෙන්. ඔබතුමාත් දන්නවා ඇති, උතුරුදිග ප්‍රදේශයෙන් දැවැන්ත වාහන ප්‍රමාණයක්, විශේෂයෙන් එළවලු, සහල් රැගත් ලොරි රථ ඇතුළු ලොරි රථ විශාල ප්‍රමාණයක් කුරුණෑගල නගරය හරහා ගමන් කරන බව. ඒත් එක්ක නගරය තුළ විශාල වාහන තදබදයක් ඇති වෙනවා. අපි මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා පුළුවන් නම් ඒ ප්‍රධාන වාහනවලට විකල්ප මාර්ගයක් හදලා දෙන්න කියලා. අධිවේගී මාර්ගය භාවිත කරලා දඹොක්ක ප්‍රදේශයට ප්‍රවිෂ්ට වීමේ හැකියාව තිබෙනවා. එහෙම වුණොත් නගර මධ්‍යයේ තිබෙන වාහන තදබදය සෑහෙන ප්‍රමාණයකට විසඳෙනවා. ඒ සඳහා මහාමාර්ග අමාත්‍යාංශයෙන් විකල්පයක් යෝජනා කරන්න පුළුවන්ද කියන තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය, ගරු ඇමතිතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනවා ලබන වසරේ අග වෙනකොට, - 2026 දෙසැම්බර් පමණ වන විට - රඹුක්කන දක්වා අධිවේගී මාර්ගය සම්පූර්ණ කරලා මහ ජනතාවට විවෘත කරන්න. ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා ඔබතුමාගේ ප්‍රශ්නයට ඒකෙන් යම්කිසි ප්‍රමාණයකට උත්තර ලැබෙයි කියලා.

ඒ වාගේම, අපි මුදල් වෙන් කරලා තිබෙනවා ලබන වසරේදී පොල්ගහවෙල-කුරුණෑගල දුම්රිය මාර්ගය double line කරන්න. ඊට අමතරව අපි නගර 25ක bypasses 25ක් - වරකාපොල bypass එක වාගේ - හදන්න මුදල් වෙන් කරන්න යෝජනා කරලා තිබෙනවා. කුරුණෑගල නගරය තරමක් හරි blessed. මොකද, ඒකේ circular roads කිහිපයක් තිබෙනවා. නගරය මග හැර යා හැකි ඊටත් වඩා විකල්ප, වෙනත් bypass එකක් යෝජනා කරන්න ගරු මන්ත්‍රීතුමන්ලාට පුළුවන් නම් අපි කැමැතියි, ඒ ගැන අධ්‍යයනය කරලා, feasibility study එකෙන් පස්සේ ඉස්සරහට යන්න.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. A10 මාර්ගය කියන්නේ නුවර-පුත්තලම මහා මාර්ගය. මට මතක විධියට, A6 මාර්ගය ගැට්ටුවාන ඉඳන් වැහැර දක්වා මංතීරු 4කින් නිර්මාණය කර තිබෙනවා. නමුත් පුත්තලම මාර්ගයේ - කුරුණෑගල නගරය හරහා ගමන් කරන මාර්ගයේ- තිබෙන්නේ මංතීරු දෙකයි. විශේෂයෙන්ම නගරයේ ප්‍රධාන පාසල් 4ක්, කාර්මික විද්‍යාලය, බැංකු, යතුරුපැදි අළෙවි කරන ව්‍යාපාරික ස්ථාන ගණනාවක් ඒ මාර්ගය දෙපස තිබෙනවා. විශේෂයෙන් පුත්තලම පාරේ තිබෙනවා, යන්තම්පලාව කියලා හන්දියක්. සාමාන්‍යයෙන් උදේ 7.00, 8.00, ඊළඟට උදේ 11.00, 12.00 වෙලාව, ඊළඟට සවස 5.00, 6.00 වෙද්දී එහි විශාල වාහන තදබදයක් තිබෙනවා. විශේෂයෙන් සවස 5.00, 6.00 වෙලාව කියන්නේ කිලෝමීටර එකහමාරක් දෙකක් දුරට මේ මාර්ගයේ දැවැන්ත වාහන තදබදයක් තිබෙන වෙලාවක්. මම හිතන විධියට, මීට ඉස්සෙල්ලා එතැන යම් මිනුමක් කරලා තිබෙනවා, ඒ මාර්ගය මංතීරු 6කට වෙන් කරලා මාර්ග සංඥා පද්ධතියක් සකස් කිරීමට. නමුත් යම් මොහොතක ඒක යට ගිහිල්ලා තිබෙනවා. එවැනි යෝජනාවක් තිබුණාද, මහාමාර්ග අමාත්‍යාංශය හැටියට මේ වාහන තදබදයට ඉදිරියේදී ඒ යෝජනාව ක්‍රියාත්මක කරනවාද කියන අතුරු ප්‍රශ්නය මම අහනවා, ගරු ඇමතිතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මංතීරු 6ක මාර්ගයක් කියන්නේ නම් ඉතාම විශාල මාර්ගයක්. මම හිතන විධියට, ඇත්තටම මේ traffic congestion ප්‍රශ්නය මහාමාර්ග ඉදි කිරීමෙන් විසඳන්න බැහැ. ඒක කරන්න පුළුවන් urban planningවලින්. ඒ නිසා UDA එකත් එක්ක කථා කරලා කුරුණෑගල නගරයේ දැනට තිබෙන UDA plan එක නූතන තත්ත්වයට අනුව upgrade කරගෙන අන්න ඒ සැලැස්මේ කොටසක් විධියට මෙන්න මේ දේවල් කරන්න කියලා අපිට යෝජනා කරනවා නම් මන්ත්‍රීතුමා, අපිට ඒ ගැන බලන්න පුළුවන්. එහෙම නැතුව පාරවල් පුළුල් කිරීමෙන් විතරක් traffic congestion විසඳන්න බැහැ, නගරයක් ඇතුළේ. නගරයක traffic congestion කියන්නේ urban planning පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මම හිතනවා, නාගරික සංවර්ධන අධිකාරියත්, RDA එකත් එකතු කරගෙන ඒ ගැන යම්කිසි හොඳ සැලැස්මක් හදනවා නම් හොඳයි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අං 9, ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, දැන් මේ ප්‍රශ්නය ගත්තොත්, මේකේ වචන 171ක් තිබෙනවා. ප්‍රශ්නයක් නැහැ. වචන වැඩිවීම ප්‍රශ්නයක් නොවෙයි. නමුත් යම් අය මේක ප්‍රතික්ෂේප කරනවා. ප්‍රශ්නයක වචන ප්‍රමාණය 150ට අඩු විය යුතුයි. මේක, මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන පළමුවැනි වතාව නොවෙයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් කරුණාකර,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස පිළිගන්නවා. ලේකම් මණ්ඩලය මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, ප්‍රශ්න ලබා දුන්නාට පස්සේ අවශ්‍ය කටයුතු කරන්න කියා මම උපදෙස් දෙනවා.

දේශීය වෛද්‍ය පීඨ සහ පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචිය : විස්තර
சுதேச மருத்துவ பீடம் மற்றும் பாரம்பரிய மருத்துவர்கள்: விபரம்
FACULTIES OF INDIGENOUS MEDICINE AND REGISTRATION OF TRADITIONAL PHYSICIANS: DETAILS

971/2025

9. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ආයුර්වේද වෛද්‍ය විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) 1925 දී පිහිටුවා, 1941 දී නීතිගත කර, 1949 දී ගැසට් කරන ලද යාපනය ශ්‍රී ලංකා ආයුර්වේද සිද්ධ වෛද්‍ය විද්‍යාලයට මේ වන විට සිසුන් ඇතුළත් කර නොගැනීමට හේතු කවරේද;

(iii) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) පාරම්පරික වෙදකම සම්බන්ධයෙන් කිසිදු දැනුමක් නොමැති විශ්වවිද්‍යාල උපාධිධාරීන් ආයුර්වේද දෙපාර්තමේන්තුවට පත් කිරීමට හේතු කවරේද;

(v) ඔවුන් තම ප්‍රශ්න අවබෝධ කර නොගන්නා බව පාරම්පරික වෛද්‍යවරුන් චෝදනා කරන බව දන්නේද;

(vi) ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vii) උතුරු පළාතේ පාරම්පරික වෛද්‍ය අධ්‍යාපනයේ සහ ආයුර්වේද අධ්‍යාපනයේ උන්නතිය උදෙසා දේශීය වෛද්‍ය විද්‍යාලවලට අනුමතිය දෙන්නේද;

(viii) ඒ සඳහා ගන්නා නීතිමය/පරිපාලනමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) පාරම්පරික වෛද්‍යවරුන්ට හැඳුනුම්පත්, වෛද්‍ය සහතික සහ උපාධි ලබා දීමට ආයතනයක් පිහිටුවන්නේද;

(ii) ඔවුන්ට බඳවා ගැනීමේ පටිපාටියක් හා වැටුප් පරිමාණයක් හඳුන්වා දෙන්නේද;

(iii) ඔවුන්ට රජයේ සහාය නොලැබීමට හේතු කවරේද;

(iv) ඔවුන්ගේ ලියාපදිංචිය/හැඳුනුම්පත අලුත් කිරීම/ සායන අවසරය සඳහා රු. 5,000/- දක්වා මුදලක් ගෙවිය යුතු අතර, එය ඔවුන්ට වැය බරක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள ஆயுர்வேத மருத்துவக் கல்லூரிகளின் எண்ணிக்கை எத்தனை;

(ii) 1925இல் தாபிக்கப்பட்டு, 1941இல் கூட்டிணைக் கப்பட்டு, 1949இல் வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்ட, யாழ்ப்பாணம், ஸ்ரீ லங்கா ஆயுர்வேத சித்த மருத்துவக் கல்லூரிக்குத் தற்போது மாணவர்கள் அனுமதிக்கப்படாமைக் கான காரணங்கள் யாவை;

(iii) அதன் தற்போதைய நிலைமை யாது;

(iv) பாரம்பரிய மருத்துவம் பற்றிய எந்தவோர் அறிவும் இல்லாத பல்கலைக்கழகப் பட்டதாரிகள் ஆயுர்வேதத் திணைக்களத்துக்கு நியமனம் செய்யப்படுவதற்கான காரணங்கள் யாவை;

(v) அவர்கள் தமது பிரச்சினைகளைப் புரிந்து கொள்வதில்லை என்று பாரம்பரிய மருத்து வர்கள் குற்றஞ்சாட்டுகின்றார்கள் என்பதை அறிவாரா;

(vi) அதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(vii) வட மாகாணத்தில் பாரம்பரிய மருத்துவக் கல்வி மற்றும் ஆயுர்வேதக் கல்வியின் முன்னேற் றத்துக்காக சுதேச மருத்துவக் கல்லூரிகளுக்கு அங்கீகாரம் வழங்கப்படுமா;

(viii) அதற்காக மேற்கொள்ளும் சட்டரீதியான/ நிருவாக ரீதியான நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பாரம்பரிய மருத்துவர்களுக்கு அடையாள அட்டை, மருத்துவச் சான்றிதழ் மற்றும் பட்டம் வழங்குவதற்கான நிறுவனமொன்று தாபிக்கப்படுமா;

(ii) அவர்களுக்கான ஆட்சேர்ப்பு நடவடிக்கைமுறை மற்றும் சம்பள அளவுத்திட்டம் அறிமுகம் செய்யப்படுமா;

(iii) அவர்களுக்கு அரசின் உதவி கிடைக் காமைக்கான காரணங்கள் யாவை;

(iv) அவர்களின் பதிவு/அடையாள அட்டைகளைப் புதுப்பித்தல்/கிளினிக் அனுமதிக்கு ரூபாய் 5,000 வரையான தொகையை செலுத்த வேண்டும் என்பதுடன், இது அவர்களுக்கு செலவினச் சுமையாகும் என்பதை ஏற்றுக்கொள்வாரா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state -

(i) the number of Ayurveda medical colleges in Sri Lanka;

(ii) the reasons as to why students are not enrolled into the Sri Lanka Ayurveda Siddha Medical College in Jaffna now, which was established in 1925, incorporated in 1941 and gazetted in 1949;

(iii) the current status of it;

(iv) the reasons for appointing university graduates who do not have any knowledge of traditional medicine to the Department of Ayurveda;

(v) whether he is aware that Traditional Physicians accuse that these graduates do not understand their problems;

(vi) the measures that have been taken in this regard;

(vii) whether approval is granted to the medical colleges of indigenous medicine for the advancement of traditional education in medicine and Ayurveda education in the Northern Province; and

(viii) the legal/administrative measures that will be taken in this regard?

(b) Will he also state -

(i) whether an institution will be established to provide identity cards, medical certificates and degrees to Traditional Physicians;

(ii) whether a recruitment scheme and a salary scale will be introduced for them;

(iii) the reason as to why they do not get assistance of the Government; and

(iv) whether he acknowledges that the fee up to Rs. 5,000, which has to be paid for their registration/ renewal of the identity card/ clinical permit, is a burden to them?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ගැනයි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ගැනයි ගරු රවී කරුණානායක මැතිතුමා කියපු දේ අපි අවධානයට ගනිමු. එතුමාටත් ඒ video clip එක තියා ගන්න කියලා කියමු. ඒක ඉදිරියේදී අපට වැදගත් වෙයි.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දීමේදී මේ වචනවල terminology එකේ සමහර තැන් වෙනස් කරගෙනම තමයි පිළිතුර කියවන්න වෙන්නේ. ඒ නිසා මම ඒවා නිවැරදි කරගෙනම පිළිතුර කියවන්නම්.

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ආයුර්වේද වෛද්‍ය විද්‍යාල නොමැති අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාල 4ක දේශීය වෛද්‍ය පීඨ ආයුර්වේද/ සිද්ධ/ යුනානි යන අංශ තුන පිහිටා ඇත.

- කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය පීඨය (ආයුර්වේද/ යුනානි)
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය පීඨය (ආයුර්වේද)
- නැගෙනහිර විශ්වවිද්‍යාලය - ත්‍රිකුණාමලය මණ්ඩපය - සිද්ධ වෛද්‍ය පීඨය
- යාපනය විශ්වවිද්‍යාලය - සිද්ධ වෛද්‍ය පීඨය

(ii) "යාපනය ශ්‍රී ලංකා ආයුර්වේද සිද්ධ වෛද්‍ය විද්‍යාලය" නමින් ආයුර්වේද ශාස්ත්‍රී විද්‍යාලයක් නොමැත.
1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 22වන වගන්තිය අනුව පිහිටුවා ඇති ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද විද්‍යාලය වන්නේ නො.127, ස්ටැන්ලි පාර, යාපනය පිහිටි ලංකා සිද්ධායුර්වේද ආයුර්වේද ශාස්ත්‍රී විද්‍යාලයයි. ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය යටතේ ලියාපදිංචි කර තිබූ ශාස්ත්‍රී විද්‍යාල 20 එම මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව 2017.12.31 දින සිට අත්හිටුවා ඇත. ඒ අනුව උක්ත ශාස්ත්‍රී විද්‍යාලය සඳහා ද නවක සිසුන් බඳවා ගැනීම අත්හිටුවා ඇත.

(iii) 2017 වර්ෂය දක්වා බඳවාගත් සිසුන් සඳහා අවසාන වසර ලිඛිත/ වාචික/ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ලබයි.

(iv) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් බඳවාගන්නා ලද සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් 69ක් ආයතනික කටයුතු සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනවලට අනුබද්ධිතව සේවයේ යොදවා ඇත. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ දේශීය වෛද්‍ය අංශයට සංවර්ධන නිලධාරීන් ලෙස උපාධිධාරීන් බඳවාගෙන දීප ව්‍යාප්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය සඳහා අනුයුක්ත කර ඇත.

(v) උක්ත සංවර්ධන නිලධාරීන් පාරම්පරික වෛද්‍යවරුන් සමඟ සෘජුව රාජකාරි කටයුතු සිදු නොකරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සංරක්ෂණ සභාවේ සම්බන්ධීකරණ කටයුතු ඔවුන් විසින් සිදු කරනු ලැබේ. පාරම්පරික වෛද්‍ය නිලධාරීන්ගේ ගැටලු විසඳීම සංරක්ෂණ සභා හරහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කරනු ලබයි.

(vi) අදාළ නොවේ.

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

(vii), (viii) 2023 අංක 19 දරන පනතින් සංශෝධිත 1961 අංක 31 දරන ආයුර්වේද පනතෙහි 22 වන වගන්තිය අනුව පිහිටුවා ඇති ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය සඳහා දේශීය වෛද්‍ය විද්‍යාල පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දීමට නෛතික ප්‍රතිපාදන නොමැත.

(ආ) (i) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) හා 55(2) වගන්ති යටතේ ලියාපදිංචි කරනු ලබන ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම, වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් සිදු කරනු ලැබේ. පනතට අනුව උපාධි ලබා දීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවට නීතිමය බලතල පැවරී නොමැත.

(ii) දෛනික පදනම මත වැටුප් ගෙවනු ලබන තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීමක් සිදු නොකරන බැවින්, පාරම්පරික වෛද්‍යවරුන් සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් හා වැටුප් පරිමාණයක් හඳුන්වා දීමේ හැකියාවක් නොමැත.

(iii) සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සංරක්ෂණ සභා වෙතින් පාරම්පරික වෛද්‍යවරුන් සඳහා අවශ්‍ය රජයේ සහාය ලබා දීම සිදු කරනු ලබයි.

(iv) නැත.

`ඔවුන්ගෙන් රුපියල් 5,000ක් අය කර ගන්නවාද කියලා නේ අහන්නේ. රුපියල් 5,000ක් නොවෙයි අය කර ගන්නේ.

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 19 සහ 50 වගන්ති සමඟ 18 වන වගන්තියේ (ඊ) වගන්තිය යටතේ අංක 1884/36 හා 2014.10.15 දිනැති ගැසට් නිවේදනය අනුව ලියාපදිංචි සෑම වෛද්‍යවරයෙකුම ලියාපදිංචිය ලබා වසර 5කට වරක් තම ලියාපදිංචිය අලුත් කළ යුතුය. ඒ සඳහා වසර පහක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනුමත රුපියල් 6,000/-ක මුදලක් අය කරනු ලබයි.

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අංක 21(1) (ආ) වගන්තිය ප්‍රකාරව පනතට අනුව අය කරන ගාස්තු අය කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විධිවිධාන සලසා ඇති බැවින්, ඒ අනුව මෙම ගාස්තු අය කිරීම සිදු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නවලට යන්න කලින් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට කිව යුතු කරුණක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, මේ අදාළ ප්‍රශ්නයේ වචන 135ක් තිබෙනවා කියලා ලේකම් මණ්ඩලය මා වෙත දැනුම් දෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් කොහොමද ඒක අර්ථකථනය කරන්න පුළුවන්? අපි ප්‍රශ්නයක් දුන්නාම ඒ ඔක්කෝම දේවල් එක, දෙක වශයෙන් points විධියට කථා කරන්න කියන්නේ මොකද? අපේ ප්‍රශ්නවලට ඒක බලපාන්නේ වෙනත් ආකාරයකට. ඉංග්‍රීසි ප්‍රශ්නයේ තිබෙනවා වචන 187ක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ලැබී තිබෙන විධියට, සිංහල ප්‍රශ්නයේ වචන ගණන count කළාම වචන 135ක් තිබෙනවා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්න අහන්න.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

பல்கலைக்கழகங்களில் ஆயுர்வேத மருத்துவக் கற்கைநெறி தொடங்கப்படுவதற்கு முன்னர், 100 ஆண்டுகள் பழமைவாய்ந்த ஸ்ரீ லங்கா ஆயுர்வேத சித்த மருத்துவக் கல்லூரியில் பலர் பரம்பரை ரீதியாகப் படித்து ஆயுர்வேத மருத்துவத்தை இந்த நாட்டில் காப்பாற்றி இருக்கிறார்கள். பல்கலைக்கழகங்களில் ஆயுர்வேத கற்கைநெறியைக் கற்பதற்குச் செல்கின்றவர்கள் Z-score - வெட்டுப்புள்ளி - அடிப்படையிலே தெரிவாகின்றார்கள். ஆனால், நீண்ட காலமாக பாரம்பரியமாக இந்த வைத்தியத்தைச் செய்து வருகின்ற பாரம்பரிய வைத்தியர்களாக இருக்கின்றவர்கள் மேற்குறித்த கல்லூரியிலே பயின்று இருக்கிறார்கள்.

இவ்வாறானதொரு நிலையில், இலங்கையில் மட்டும் காணப்படுகின்ற மூலிகைத் தாவரங்கள், பாரம்பரிய மருந்துகள் என்பவற்றைப் பயன்படுத்தி கற்பிக்கப்படுகின்ற இதுபோன்ற பழமையான கல்லூரியையும் அங்கு கற்றவர்களையும் பாரம்பரிய வைத்தியர்களையும் முதன்மைப்படுத்தி, அவர்கள்மூலம் உள்நாட்டு மருத்துவத் தேவையை நிவர்த்தி செய்வதன்மூலம் எமது நாட்டுக்கு இறக்குமதி செய்யப்படும் மருந்துகளுக்கான செலவைக் குறைக்க முடியும். இலங்கைக்கே உரித்தான மருத்துவ முறைமூலம் சுற்றுலாத்துறை ஊடாக வெளிநாட்டவர்கள் சிகிச்சை பெறும் வகையில் ஏதாவது ஏற்பாடுகளைச் செய்ய முடியுமா? எனக் கேட்கின்றேன். ஏனென்றால், வெளிநாடுகளில் இருந்து பலர் இவ்வாறான மருத்துவ முறையைத் தேடி இலங்கைக்கு வருகின்றார்கள். அவ்வாறானதொரு மருத்துவ முறையை நாங்கள் தொடர்ச்சியாக வளர்ப்பதன் ஊடாக சுற்றுலாத்துறை மூலம் மேலும் வருமானத்தைப் பெற்றுக்கொள்ள முடிவதோடு, இந்த மருத்துவர்களையும் பயன்படுத்த முடியும் என்பதோடு, பாரம்பரிய மருத்துவத்தையும் பேணிக்கொள்ளலாம். அதற்குரிய ஏற்பாடுகள் ஏதேனும் இருக்கிறதா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු රජීවන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණය, එනම් විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයත් එක්කම ආයුර්වේද, සිද්ධ, යුනානි සහ පාරම්පරික වෛද්‍ය ක්‍රමය දියුණු

කිරීම ගැන කිව්වොත්, ඇත්තටම අපි ඒ සඳහා මැදිහත් වෙමින් ඉන්නේ. මේක මධ්‍යම ආණ්ඩුවට පමණක් නොවෙයි, පළාත් සභාවලටත් අයිති විෂය පථයක්. මෙහිදී විශේෂයෙන් උතුරේ යාපනය වාගේ ප්‍රදේශවල සහ අනෙකුත් ප්‍රදේශවල තිබෙන අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරනවා.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, இரண்டாவது மேலதிக வினாவை கௌரவ மயில்வாகனம் ஜெகதீஸ்வரன் அவர்கள் கேட்பார்கள்.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த மே மாதம் 16ஆம் திகதி முல்லைத்தீவு ஆயுர்வேத வைத்தியசாலைக்கு contract basis அடிப்படையில் நியமிப்பதற்காக ஆயுர்வேத பட்டப்படிப்பை நிறைவு செய்தவர்களுக்கு - degree holdersக்கு - interview நடைபெற்றது. எனினும், இதுவரை அவர்களுக்கான நியமனம் வழங்கப்படாமல் இழுத்தடிப்புச் செய்யப்படுகின்றது. இது எந்தத் தரப்பில் இருக்கும் தவறு என்று தெரியவில்லை. தங்களுக்கான நியமனம் வழங்கப்படவில்லை என அவர்களிடமிருந்து தொடர்ச்சியாக முறைப்பாடுகள் கிடைக்கப்பெற்ற வண்ணம் இருக்கின்றன.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඒ රෝහල උතුරු පළාත් සභාවට අයත් රෝහලක්. එම නිසා උතුරු පළාත් සභාවේ අවධානය යොමු කරවලා එතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආදේශක සේවකයන්: පුරප්පාඩු තනතුරු සඳහා පත් කිරීම
தபால் திணைக்களத்தில் பதிவுசெய்யப்பட்ட பதிலீட்டாளர்கள்: பதவி வெற்றிடங்களுக்கான நியமனம்
REGISTERED SUBSTITUTE WORKERS OF DEPARTMENT OF POSTS: APPOINTMENT TO VACANT POSTS

977/2025

10.ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආදේශකයන් 3,081ක් සේවය කරන බව දන්නේද;

(ii) ඔවුන්ගේ සේවා කාලය කොපමණද;

(iii) තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන් පත් කිරීමට පියවර ගෙන තිබේද;

(iv) තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින ලියාපදිංචි ආදේශකයන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தபால் திணைக்களத்தில் 3081 பதிவுசெய்யப்பட்ட பதிலீட்டாளர்கள் கடமையாற்றுவதை அறிவாரா என்பதையும்;

(ii) அவர்களது சேவைக் காலம் யாது என்பதையும்;

(iii) தபால் திணைக்களத்தில் நிலவும் பதவி வெற்றிடங்களுக்கு அவர்களை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) தபால் திணைக்களத்தில் நிலவும் பதிவுசெய்யப்பட்ட பதிலீட்டாளர்களுக்கான பதவி வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனின், அந்நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that 3,081 registered substitute workers serve in the Department of Posts;

(ii) their respective duration of service;

(iii) whether steps been taken to appoint them to fill the vacancies existing in the Department of Posts;

(iv) whether steps have been taken to fill the vacancies existing for registered substitute workers in the Department of Posts; and

(v) if so, those steps?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ආදේශකයන් 1,848ක් මේ වනවිට ලියාපදිංචි වී සිටී.

(ii) මෙම ලියාපදිංචි ආදේශකයන් 2012, 2014, 2017, 2018 සහ 2021 වසරවල ලියාපදිංචි කර ඇති අය වේ.

(iii) තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින තැපැල් සහායක පුරප්පාඩු 1,982ක් සඳහා ලියාපදිංචි ආදේශකයන් අතරින් පත්වීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ඉල්ලුවා. එම ඉල්ලීමට අනුව පුරප්පාඩු 1,000ක් පිරවීම අනුමත කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර, අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචනය සහ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කළා.

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ලියාපදිංචි ආදේශකයන් 1,000ක් ස්ථිර කිරීම සඳහා මීට සති දෙකකට කලින් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ අයගේ ජ්‍යෝෂ්ඨතාව අනුව බඳවා ගැනීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනවා. තව මාසයක් තුළ ඒ ලියාපදිංචි ආදේශකයන් 1,000 තැපැල් දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයන් හැටියට බඳවා ගැනීමේ හැකියාවක් පවතිනවා.

(iv) ඔව්.

(v) බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණා. ඉන් 1,000ක් බඳවා ගැනීම නිර්දේශ කර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචනය සහ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ කමිටුවේ අනුමැතිය සඳහා යොමු කළා. ඒ අනුව, අලුතින් ලියාපදිංචි ආදේශකයන් 1,000ක් බඳවා ගන්නත් අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒ අනුව අපි අදාළ කටයුතු සිදු කරනවා. ඒකට නම් මාසයකට වැඩි කාලයක් ගතවෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி!

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவை தபால் சேவைகள் தொடர்பாகக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, தபால் ஊழியர்களின் பணிப் பகிஷ்கரிப்பால் தபால் சேவைகள் பாதிப்படைந்து உள்ளதையடுத்து 'கூரியர்' சேவை அதிகரித்துள்ளது. தற்பொழுது, அதற்காக அறவிடப்படும் கட்டணங்கள் உயர்த்தப்பட்டுள்ளதாக பொது மக்கள் கவலை தெரிவிக்கின்றனர். தபால் ஊழியர்களின் தொழிற்சங்கப் போராட்டம் காரணமாக தபால் விநியோகம் பாதிக்கப்பட்டுள்ளதால், அதற்கு மாற்றீடாக பொது மக்கள் 'கூரியர்' சேவையை நாடுகின்றனர். இதன் காரணமாக தற்போது 'கூரியர்' சேவையை மேற்கொள்ளும் நிறுவனங்கள் அதற்கான கட்டணங்களை உயர்த்தியுள்ளன. சிறிய பொதி ஒன்றுக்காக உள்ளூர் ஒரு நாள் சேவைக்கு முன்னர் அறவிடப்பட்ட 450 ரூபாய் கட்டணம் தற்போது 900 ரூபாயாக உயர்த்தப்பட்டுள்ளது. 35 கிராம் எடையுள்ள கடிதம் ஒன்றைக்கூட 900 ரூபாய் செலுத்தி அனுப்பவேண்டிய சூழல் காணப்படுவதாக பொது மக்கள் கவலை தெரிவிக்கின்றனர். மேலும், அரச தபால் நிலையத்தில் 150 ரூபாய் செலுத்தி பதிவுத் தபாலில் அனுப்பும் சிறிய கடிதத்துக்கு 'கூரியர்' சேவையில் 900 ரூபாய் வரை செலுத்தவேண்டி உள்ளது. எனவே, தபால் ஊழியர்களுடைய வேலைநிறுத்தத்துக்கு சமாதானமான முறையில் தீர்வைக் கண்டு பொதுமக்களுக்கு ஏற்படுகின்ற பாதிப்புக்களைக் குறைக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි එතුමාගේ අතුරු ප්‍රශ්නයට.

මම බලාගෙන හිටියා, විපක්ෂයේ මන්ත්‍රීවරු ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නවලින්වත් තැපැල් වර්ජනය ගැන මොනවා හෝ ප්‍රකාශයක් කරයි කියලා. එහෙම ප්‍රකාශයක් කළේත් නැහැ. ඒ වැඩ වර්ජනය කරන වෘත්තිය සමිති අතරේ සමගි තැපැල් සේවක සංගමය ඉන්නවා. එහෙම තිබිලාත් රටේ ගොඩක් ප්‍රශ්නවලට ස්ථාවර නියෝග 27(2) යටතේ කාලය අරගෙන කථා කරන විපක්ෂ නායකතුමාගේ පැත්තෙනුත් ඒ ගැන සද්දයක් ආවේ නැහැ.

කොහොම වුණත්, මේ වැඩ වර්ජනය පටන් ගන්නකොට මම කිව්වා, ජනතාවට තාවකාලිකව පාඩුවක් වෙනවා, මහහැරීම් වෙනවා, ප්‍රමාදවීම් වෙනවා, ඒ වාගේම ඒ අවස්ථාවේදී පෞද්ගලික අංශයේ කුරියර් සේවා මිල වැඩි කරලා ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න ඉඩකඩ තිබෙනවා කියලා. ඒ ඔක්කෝම තිබියදී මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න නම් යම් දවස් කිහිපයක් ඉවසලා මධ්‍යම තැපැල් හුවමාරුවේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම කිව්වා, බඳවා ගැනීම් නතර කරලා තිබුණු ආදේශකයන් 1,000ක් ස්ථිර කරන්න කටයුතු කරගෙන යනවා කියලා. ආදේශකයන් හැටියට තව 1,000ක් බඳවා ගන්නවා. මීට අමතරව බඳවා ගැනීම් රාශියක් සිදු වෙමින් තිබෙනවා, අගමැති කමිටුවේ අනුමැතිය ලබා දීලා තිබෙන නිසා. ඒ වාගේම මිලියන 250ක වාහන ගන්න කටයුතු කරගෙන යනවා. අලුතින් තැපැල් කාර්යාල ඉදිකරනවා. Renovationsවලටත් මිලියන 600ක් යොදලා තිබෙන්නේ. තැපැල් පද්ධතිය digitalize කරනවා; නවීකරණය කරනවා. එහෙම කරමින් තිබියදී තමයි ඒ වෘත්තීය සමිති වැඩ වර්ජනය කරන්නේ. ඒ වර්ජනය තුළ ඉන්නේ කවුද? ශ්‍රී ලංකා නිදහස් වෘත්තිය සමිතිය ඉන්නවා. දන්නවා නේ, ඒ මොන පක්ෂයේද කියලා. එක්සත් ජාතික වෘත්තිය සමිති, සමගි තැපැල් වෘත්තිය සමිති කියන ඒ අය එකතු වෙලා තැපෑලේ වැඩ කටයුතු යම් ප්‍රමාණයකට නතර කරලා තිබුණා. විශේෂයෙන් මධ්‍යම තැපැල් හුවමාරුවේ ප්‍රධාන ඉල්ලීම් දෙකයි තිබෙන්නේ. එකක්, රාජ්‍ය සේවයේ පොදු පිළිගත් අතිකාල පිළිගන්න බැහැ, ඊට වඩා වැඩියෙන් දෙන්න කියන එක. ඒක කරන්න බැහැ. එතැන අතිකාල ගන්න විධිය කථා කළොත් ගරු මන්ත්‍රීතුමනි, ඒ තැපැල් සේවකයෝ ලජ්ජාවට පත් වෙනවා. ඒ නිසා රජය තීන්දු කරපු ගණන තමයි අතිකාලවලට ලබා දෙන්න වෙන්නේ. ඒ වාගේම, අතිකාල වැඩි කරලා තිබියදීත් අතිකාල දෙන්න යනකොට fingerprint එක ඕනෑ. තැපෑලේ ඉන්න සේවකයන් පිරිසක් - පාලන කාර්යාලවල ඉන්න සේවකයන් - fingerprint machine එක පාවිච්චි කරනවා නේ. ඉතින් ඇයි මධ්‍යම තැපැල් හුවමාරුවේ ඉන්න අයට විතරක් ඒක පාවිච්චි කරන්න බැරි? ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ පැත්තෙනුත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කළා වාගේම, රජයේ සේවයට ඇතුළත් වෙලා ඉන්නවා නම්, මේ වැඩි කරලා තිබෙන අතිකාල පිළිගෙන කටයුතු කරන්න ඕනෑ. මම උදාහරණයක් කියන්නම්. දෙවන පෙළ තැපැල් සේවා නිලධාරියෙකුගේ රුපියල් 168ට තිබුණු OT පැය රුපියල් 237ට වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, දෙවන පෙළම ටිකක් ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකුගේ රුපියල් 257ට තිබුණු OT එක රුපියල් 370ට වැඩි කරලා තිබෙනවා. පළමු පෙළ තැපැල් සේවා නිලධාරියෙකුගේ රුපියල් 226ට තිබුණු OT පැයක් රුපියල් 324ක් වෙනවා. ඒ පළමු පෙළම ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකුගේ රුපියල් 303 ප්‍රමාණය රුපියල් 439ක් වෙනවා. එතකොට මෙහෙම වැඩි කරලා භාණ්ඩාගාරයේ මුදල් අපි වියදම් කර තිබියදී, ඒකට වගකීමක් තිබෙන්නට ඕනෑ. 2027 ජනවාරිවල අතට ලැබෙන මූලික වැටුපට

තමයි පසුගිය අප්‍රේල් මාසයේ ඉඳන් OT එක ගණන් හදන්නේ. එහෙම තිබියදීත් ඊටත් වඩා වැඩිපුර OT ඉල්ලනවා නම්, ඒක දෙන්න හැකියාවකුත් නැහැ.

ඒ විතරක් නොවෙයි, මේ වැඩි කරපු OT එක දෙනකොටත් අනිවාර්යයෙන්ම ඒකට වගකීමක් රජයට තිබෙන්න ඕනෑ. ඒ නිසා තමයි මේ fingerprint machine එක අපි මෙතැනට ගේන්න උත්සාහ කරන්නේ. ඒක කොහොම හරි කරනවා. ඒ නිසා මේ පාඩුව පොඩ්ඩක් දරාගෙන අපි මේකට මුහුණ දෙමු. මේ ගැටලුවට මේ වෙලාවේ මුහුණ දුන්නොත් ගරු මන්ත්‍රීතුමා, මේක නිරාකරණය කර ගන්න පුළුවන්. මොකද, ගිය අවුරුද්දේත් - 2024දීත් - අපි රුපියල් බිලියන 4ක්, -මිලියන 4,000ක්- භාණ්ඩාගාරයෙන් වැඩිපුර අරගෙන තිබෙනවා, තැපැල් දෙපාර්තමේන්තුවට. එතකොට මේ වැටුප් වැඩිවීමත් එක්ක හරියට මේ කටයුත්ත කළේ නැත්නම් සහ OT අනවශ්‍ය විධියට පාවිච්චි කර ගත්තොත්, ඒ පරතරය තව වැඩි වෙනවා. එය බිලියන 7කට, 8කට යන්න පුළුවන්කමක් තිබෙනවා. තැපැල් දෙපාර්තමේන්තුව මහන්සි වෙලා උපයන මුදල්වලින් සියයට 70ක් විතර යොදවන්න වෙන්නේ වැටුප් සහ අතිකාලවලට. ඉතින් මේ වැඩේ කර ගන්න බැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඇහුවාට ඔබතුමාට බොහොම ස්තුතියි. ඔය කුරියර් සේවා මේ වෙලාවේදී යම් ප්‍රයෝජනයක් ගන්න ඉඩකඩ තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය නිරාකරණය කර ගත්තොත්, ඇත්තටම තැපැල හොඳ තැනකට ගේන්න පුළුවන්.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, வேலைநிறுத்தத்தில் ஈடுபட்டுள்ள தபால் திணைக்கள ஊழியர்களுக்கு உடனடியாக இன்றையதினம் கடமைக்குத் திரும்புமாறு தபால் திணைக்களத்தின் உயர் அதிகாரிகள் சிவப்பு எச்சரிக்கை விடுத்துள்ளதாகத் தெரிவிக்கப்படுகின்றது. உண்மையிலேயே தொழிலாளர்களின் நலன்களில் அக்கறை செலுத்தி, பெரும் போராட்டங்களையும் வேலைநிறுத்தங்களையும் செய்து, எப்பொழுதும் தொழிலாளர்களின் நலன்சார்ந்த செயற்பாடுகளை முன்னெடுத்து, ஆட்சி மாற்றத்துக்கு அடிநாதமாக இருந்த நீங்கள் இன்று மக்களுக்குச் சேவை செய்துகொண்டு இருக்கின்றீர்கள். கௌரவ அமைச்சர் அவர்களே, சிறப்பாகக் கடமையாற்றும் அமைச்சர்களில் நீங்களும் ஒருவர் என்பது எங்களுக்குத் தெரியும்! எனவே, உங்களுடைய தலைமையில் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண்பதற்கு - இரண்டு தரப்பும் பேசி இந்தப் பிரச்சினைக்கு சுமுகமாகத் தீர்வு காண்பதற்கு - ஏதாவது ஏற்பாடுகள் மேற்கொள்ளப்படுகின்றதா?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම් 19 පිළිබඳව අපි තැපැල්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා සමඟ සාකච්ඡා කළා. සාකච්ඡා කළත්, නොකළත් ඇත්තටම ඒ ඉල්ලීම් 19න් 17ක්ම අපි දැන් කරමින් ඉන්න දේවල්. බඳවා ගැනීම්වලට අදාළ දේවල්, වාහන මිලදී ගැනීම, නවීකරණය, සේවා ව්‍යවස්ථා සකස් කිරීම, work study කරන එක, මේ ආදී දේවල් දැන් කරමින් ඉන්නවා. ඒකත් ඒ අය දන්නවා. මෙතැන තිබුණු මූලික ප්‍රශ්න දෙක තමයි, OT එක සහ fingerprint පිළිබඳ ප්‍රශ්නය. ඒකට යට වෙන්න බැහැ. විශේෂයෙන්ම මධ්‍යම තැපැල් හුවමාරුවේ අය ඇඟිලි සලකුණු තැබීමට එකඟ වෙලා, මේ OT එක දෙන ප්‍රමාණය පිළිගෙන ආවාම ඉතුරු ඉල්ලීම් 17හි තිබෙන මොනවා හෝ අඩුපාඩුකම්, ප්‍රමාදයන් තිබෙනවා නම් සාකච්ඡා කරන්න පුළුවන්. අපි රජයක් හැටියට ඉන්නේ ඒ ස්ථාවරයේ. පක්ෂවලට සම්බන්ධ වෘත්තීය සමිති නේ ඉන්නේ. තමන්ගේ පක්ෂ නායකයන් එක්ක කථා කරලා, අර ඉල්ලීම් 17 සම්බන්ධයෙන් මොනවා හෝ සාකච්ඡාවකට එන්න පුළුවන්. හැබැයි, ඇඟිලි සලකුණු තියන්නයි, OT එක දෙන ප්‍රමාණය පිළිගන්නයි එකඟ වෙලා එන්න ඕනෑ. ඒ නිසා මම සමගි ජන බලවේගය, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඇතුළු සියලුදෙනාගෙන් ඉල්ලීමක් කරනවා, තමන්ගේ වෘත්තීය සමිති එතැනට අරගෙන එන්න කියලා.

ඊයේ postman කෙනෙක් බාගෙට ඇඳගෙන ඇවිල්ලා පොඩි "ෂෝ" එකක් දැම්ම හැටි අපි දැක්කා නේ. ඒ, ලුණුගම්වෙහෙර පැත්තේ ප්‍රාදේශීය සභාවක හිටපු සභාපති කෙනෙක්. තැපැල් සේවකයන්ට කලිසම, කමිසය, සපත්තු දෙක, මේස් දෙක රජයෙන් ලබා දෙනවා. එක්කෝ ඒවා මහගන්න කුලිය ලබා දෙනවා. ගොඩක් අය පළාත් මට්ටමෙන් ඒ වැඩේ කරගෙන තිබෙනවා. ඒ අය ඉල්ලන්නේ රජයෙන් නිල ඇඳුම ලබා දෙනවා වෙනුවට කුලිය අතට ලබා දෙන්න කියලා. ඕනෑ දෙයක් සාකච්ඡා කරන්න පුළුවන්. ඒවා ලබා දී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම ඉන්ධන දීමනා වැඩි කරන්නත් අපි කටයුතු කර තිබෙනවා. මේ සියල්ල තිබියදී තමයි මේක කරන්නේ. ඒ නිසා ඇත්තටම මේක දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් මෙහෙයවන වැඩ වර්ජනයක්. ඉල්ලීම් ටික බැලුවාම ඒක ඔබතුමාට පෙනෙනවා ඇති. ඉල්ලීම් 17 ගැන සාකච්ඡා කරන්න සූදානම්. හැබැයි, අර ඉල්ලීම් දෙක පිළිගෙන එන්නට ඕනෑ. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

බාල වයස්කරුවන් විදේශ රැකියා සඳහා යැවීම: වැළැක්වීම
பராயமடையாதவர்களை வெளிநாட்டு வேலைவாய்ப்புக்காக அனுப்புதல்: தடுத்தல்
MINORS SENT ABROAD FOR EMPLOYMENT: PREVENTION

832/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියා සඳහා යොමු කර ඇති බවට අනාවරණය වී ඇති බාල වයස්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විදේශීය රැකියා සඳහා යොමු කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේද කවරේද;

(iii) බාල වයස්කරුවන් විදේශ රැකියා සඳහා යොමු කිරීම පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை வெளிநாட்டு வேலைவாய்ப்புக்கென அனுப்பி வைக்கப்பட்டுள்ளதாகத் தெரியவந்துள்ள பராயமடையாதவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) வெளிநாட்டு வேலைவாய்ப்புக்கென அவர்களை அனுப்பி வைக்கும்போது பின்பற்றப்பட்டுள்ள நடைமுறை யாது என்பதையும்;

(iii) பராயமடையாதவர்களை வெளிநாட்டு வேலைவாய்ப்புக்காக அனுப்பி வைப்பதைக் கட்டுப்படுத்துவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the -

(i) number of minors found to have been sent to foreign employment since the year 2020 up to now;

(ii) methods that have been adopted in sending them for foreign employment; and

(iii) measures that will be taken to prevent minors from being sent to foreign employment?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය කිරීම කාර්යාංශයේ ප්‍රධාන පරමාර්ථයක් වන අතර විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් වයස අවුරුදු 18ට අඩු බාල වයස්කරුවන් විදේශ රැකියා සඳහා යොමු කිරීම වැළැක්වීම සඳහා නීති ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව බාල වයස්කාර දරුවන්හට විදේශ රැකියා සඳහා යෑමේ හැකියාවක් නොමැත. එසේ වුවද, ගුවන් ගමන් බලපත්‍ර අංක N9775218 යටතේ මොහොමඩ් ෆර්හාන් ෆාතිමා මුවීනා නම් කාන්තාව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදංචියක් නොමැතිව විදේශ රැකියාවක් සඳහා 2022.06.12 දින ඕමාන් රාජ්‍යය වෙත ගොස් ඇති බව ඕමාන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වාර්තා කර ඇත. එහෙත් මෙම කාන්තාව 2007.11.26 දින උපන් තැනැත්තියක් බවත් ඇයගේ සත්‍ය නම ආදම් භාවා උදුමා ලෙබ්බේ ෆාතිමා බවත් තානාපති කාර්යාලය මඟින් අනාවරණය කරගෙන ඇත.

(ii) එම තැනැත්තිය 2022.06.12 දින ඕමාන් රාජ්‍යය වෙත පැමිණ ඇති බව ඕමාන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කාර්යාංශය වෙත වාර්තා කර ඇති අතර ඇය කාර්යාංශයේ ලියාපදිංචිය නොමැතිව විදේශ ගත වි ඇත.

තවද, මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා කාර්යාංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, තැනැත්තන් වෙළඳාම ජාවාරම් විමර්ශන හා සමුද්‍රීය අපරාධ විමර්ශන අංශය වෙත යොමු කර ඇත.

(iii) බාල වයස්කරුවන් විදේශ රැකියා සඳහා යොමු කිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නීති පැනවීම සිදු කර ඇත.

ඒ අනුව විදේශ රැකියා සඳහා යොමු වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ගැනීමේදී සම්පූර්ණ කළ යුතු අවම වයස සීමාවන් පවතී.

ඒ අනුව ගෘහස්ථ රැකියාවක් සඳහා විදේශගත වන කාන්තාවක් නම් කාර්යාංශයේ ලියාපදිංචි වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවම වයස (සියලුම රටවල් සඳහා) අවුරුදු 21ක් වන අතර, ගෘහස්ථ රැකියාවක් සඳහා විදේශගත වන පිරිමි ශ්‍රමිකයෙකු හෝ ගෘහස්ථ නොවන රැකියාවක් සඳහා විදේශගත වන කාන්තා/පිරිමි ශ්‍රමිකයෙකු නම් (සියලුම රටවල් සඳහා) වයස අවුරුදු 18 සම්පූර්ණ කළ යුතුය.

මෙම වයස් සීමාවන් සම්පූර්ණ කර නොමැති කිසිදු පුරවැසියෙකු විදේශ රැකියා සඳහා කාර්යාංශයෙහි ලියාපදිංචි කිරීමක් සිදු නොකරයි. එසේම බාල වයස්කරුවන් රැකියා සඳහා විදේශගත වීම සම්බන්ධයෙන් දැඩි පරීක්ෂාවකින් කටයුතු කරන ලෙස කාර්යාංශයේ ගුවන් තොටුපළ ඒකකයේ නිලධාරින්ට තවදුරටත් උපදෙස් දී ඇත.

(ආ) අදාළ නොවේ.

මන්මුනෛ උතුර ප්‍රා.ලේ. කොට්ඨාසයේ රජයේ ඉඩම් : අනවසර පදිංචිකරුවන්

மண்முனை வடக்குப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகள்: சட்டவிரோத குடியிருப்பாளர்கள்

STATE LANDS IN MANMUNAI NORTH DS DIVISION: UNAUTHORIZED SETTLERS

877/2025

7. **ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන `දීමනා පත්‍ර' - Deed of Grant - හෝ `ඉඩම් බලපත්‍ර' - Land Permit - නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෛ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) නඩු පවරන ලද පුද්ගලයන් අතරින් උක්ත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 'அளிப்புப் பத்திரம்' (Deed of Grant) அல்லது 'காணி உரிமம்' (land Permit) இல்லாது மட்டக்களப்பு மாவட்டத்தின், மண்முனை வடக்குப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரசாங்கக் காணிகளில் ஆட்கள் குடியிருக்கின்றமையை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அரசாங்கக் காணிகளிலிருந்து மேற்குறிப்பிட்ட ஆட்களைச் சட்டரீதியாக வெளியேற்றுவதற்கு 2017.01.01 தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில் ஏற்புடைய பிரதேச செயலாளர் அவர்களுக்கு எதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்துள்ளாரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் சம்பந்தப்பட்ட விபரங்கள் யாவை என்பதையும்;

(v) வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ள ஆட்களில் மேற்குறிப்பிட்ட காலப் பகுதியில் நீதிமன்ற உத்தரவுகளுக்கமைய அரசாங்கக் காணிகளிலிருந்து வெளியேற்றப்பட்ட ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(vi) வழக்குத் தாக்கல் செய்யவேண்டி இருப்பினும், ஏற்புடைய பிரதேச செயலாளரினால் வழக்குத் தாக்கல் செய்யப்படாத ஆட்கள் இருக்கின்றார்களா என்பதையும்;

(vii) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் சம்பந்தப்பட்ட விபரங்கள் யாவை என்பதையும்;

(viii) குறிப்பிட்ட சிலருக்கு எதிராக மாத்திரம் வழக்குத் தாக்கல் செய்யப்பட்டமைக்கும், கூடுதலான ஆட்களுக்கெதிராக வழக்குத் தாக்கல் செய்யப்படாமைக்குமான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that persons are residing on State lands in the Manmunai North Divisional Secretary's Division of the Batticaloa District without a 'Deed of Grant' or a 'Land Permit' awarded by the Government;

(ii) if so, the number of such individuals, their names and relevant details;

(iii) whether the respective Divisional Secretary has filed action at the court of law against them during the period from 01.01.2017 to 31.03.2025 to legally evict those individuals from the State lands referred to above;

(iv) if so, the number of such individuals, their names and their relevant details;

(v) the number of evicted individuals from the State lands during the above period on court orders along with their names and relevant details, out of those, the number of individuals who were prosecuted;

(vi) whether there are persons against whom the Divisional Secretary has not filed action although he should have;

(vii) if so, the number of such persons, and their names and other relevant details; and

(viii) the reasons for filing action against only a few of them while not filing action against most?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීමනාපත්‍ර සහ බලපත්‍ර නොමැතිව රජයේ ඉඩම්වල පදිංචි ජනතාවට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2008/04 දරන චක්‍රලේඛයට අනුව අදාළ ඉඩම් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ලබා දීමට ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු සිදු කරනු ලබයි.

(ii) ඇමුණුම 01හි දක්වා ඇත.

[ගරු සුසිල් රණසිංහ මහතා]

ඇමුණුම 01

S.no	G.N Division	Total
1	Puthunagar	496
2	Bharathipuram	179
3	Saththurukondan	536
4	Iruthayapuram East	189
5	Kallady Mugathuwaram	57
6	Navalady	256
7	Panichchayady	634
8	Manchchanthoduwai South	966
9	Kokkuvil	410
10	Thiruchchentoor	626
11	Koolavady East	217
12	Mamangam	278
13	Sinna Urani	1199
14	Thiraimadu	480
15	Kallady Veloor	580
16	Thirupperunthurai	566
17	Periyaurani	51
18	Karuveppankerny	586
19	Nochchimunai	622
20	Iruthayapuram Central	137
21	Manchanthoduwai North	73
22	Thimilaitheevu	313
23	Settukkudah	112
24	Jeyanthipuram	275
25	Navatkudah East	935
26	Punnaichcholai	455
27	Iruthayapuram West	768
28	Gananasooriyam Square	109
29	Veddukkadu	46
30	Koolavady	110
31	Palameenmadu	144
32	Amirthakaly	25
33	Dutch Bar	160
34	Kallady Uppodai	368
35	Kallady	98
36	Navatkudah South	34
37	Navatkudah	23
38	Veechchukkalmunai	14
39	Puliyanthevu South	44
	Total	13171

(iii) ඔව්.

කිසිදු අවසරයක් නොමැතිව රජයේ ඉඩම් බලහත්කාරයෙන් භුක්ති විඳින අයට විරුද්ධව ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ නඩු පවරා ඇත.

(iv) ඇමුණුම 02හි දක්වා ඇත.

එය දීර්ඝ ඇමුණුමක්. එම නිසා ඇමුණුම 02 සභාගත* කරනවා.

(v) ඇමුණුම 03හි දක්වා ඇත.

අධිකරණයේ පිස්කල් කටයුතු මඟින් ඉවත් නොකරන ලද පුද්ගලයින් 41දෙනෙකු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වා ඇත. අනෙක් පුද්ගලයන් පිළිබඳ වාර්තා ඉදිරිපත් කරන ලෙස එම ප්‍රදේශයන්හි ග්‍රාම නිලධාරින් වෙත දන්වා ඇත.

ඇමුණුම 03

අධිකරණ නියෝගය අනුව රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයින් පිළිබඳ විස්තර

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: මන්මුනේ උතුර

දිනය : 2017.01.01 - 2025.03.31

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	ඉඩමේ වපසරිය	ඉඩම් බලහත්කාරයෙන් භුක්ති විඳින අයගේ විස්තර	පවරා ඇති නඩුවේ විස්තර (නඩු අංකය)
1.	කල්ලඩි උප්පෝඩෙයි	19	ගනේෂ් මල්ලිකා	45596/Misc/2017
2.	තිරායිමඩු	11.5	කන්දයියා කලාමෝහන්	46777/Misc/17
3.	තිරායිමඩු	7	නල්ලතම්බි ජයකාන්තන්	46778/Misc/17
4.	සත්තුරුකොන්ඩාන්	අක්කර 13	ගණපතිපිල්ලෙයි ගෝකුලරමණන්	46779/Misc/17
5.	සත්තුරුකොන්ඩාන්	අක්කර 24	ජයානන්දම් නිරන්ජන්කුමාර්	46780/Misc/17
6.	පනිච්චෙයඩි	හෙක්. 0.0306	තම්බියප්පා ධර්මරත්නම්	48532/Misc/17
7.	තිරුප්පෙරුන්තුරෙයි	අක්කර 1	කරුප්පයියා තවරාසා	48533/Misc/17
8	තිරුප්පෙරුන්තුරෙයි	අක්කර 1	කෝනේෂමූර්ති ඥානසෞන්දරි	48534/Misc/17
9	නොච්චිමුනෙයි	රූඩ් 2 පර්. 10	ආදම්බාවා සාහුල් හමීඩ්	48535/Misc/17
10	නොච්චිමුනෙයි	රූඩ් 1 පර්. 23	පක්කීර් මුහයිදීන් මුහම්මද් ඉස්සදීන්	48536/Misc/17
11	නොච්චිමුනෙයි	රූඩ් 1 පර්. 23	මුහම්මද් මුස්තෆා මුහම්මද් මර්සූක්	48537/Misc/17
12	නොච්චිමුනෙයි	රූඩ් 1 පර්. 25	පක්කීර් මුහයිදීන් මුහම්මද් ඉස්සදීන්	48538/Misc/17
13	නොච්චිමුනෙයි	අක්. 1 රූ. 1 පර්. 28	සාහුල් හමීඩ් අබ්දුල් අසීස්	48539/Misc/17
14	සත්තුරුකොන්ඩාන්	අක්. 5	කනගරාජා අරුවලගන්	67873/S/2023
15	සත්තුරුකොන්ඩාන්	අක්. 5	දෙයිවනායගම් සෙන්දූරන්	67874/S/2023
16	සත්තුරුකොන්ඩාන්	අක්. 5	වේලායුදම් පද්මශ්‍රී	67875/S/2023
17	සත්තුරුකොන්ඩාන්	අක්. 5	සෙල්ලතම්බි කුමාර්	67876/S/2023
18	සත්තුරුකොන්ඩාන්	අක්. 5	තවනාදන් සිවකාන්දන්	67877/S/2023
19	සත්තුරුකොන්ඩාන්	අක්. 1	තංගයියා නෙල්සන්	67879/S/2023
20	සත්තුරුකොන්ඩාන්	අක්. 2	අරසරත්නම් වේල්	67880/S/2023
21	සත්තුරුකොන්ඩාන්	10	වේලුපිල්ලෙයි රත්නසිංගම්	68038/S/2023

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(vi) නැත.

(vii) අදාළ නොවේ.

(viii) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අපනයන ඉපැයීම් වැඩිදියුණු කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
ஏற்றுமதி வருமானங்களை மேம்படுத்தலும், முதலீடுகளை ஈர்த்தலும்
IMPROVING EXPORT EARNINGS AND ATTRACTING INVESTMENTS

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I seek your permission to raise the following Question under Standing Order No. 27(2).

Sri Lanka, which declared bankruptcy not long ago, is now struggling to lift itself out of one of the gravest economic crises in its history. With the foreign borrowing space severely restricted, our path to recovery depends almost entirely on exports of merchandise and services.

The Government has announced a bold target of US Dollars 36 billion in export earnings by 2030, but yet, the present earnings stand at only US Dollars 16 billion. This means our exports must be more than doubled within just four years, a herculean challenge even under stable global conditions. But, the global environment is far from being stable. The recent trade tariffs imposed by US President Donald Trump on multiple countries, including developing economies like ours, threaten to tighten market access, reduce competitiveness and potentially erode the earnings of our key export sectors.

Therefore, with time running out and risks mounting, this House and the people deserve clear and measurable answers on how the Government intends to transform our export performances, diversify markets, conclude meaningful trade agreements, attract new investments and to protect exporters from adverse global trade policies.

Accordingly, I wish to ask the Hon. Minister of Finance, Planning and Economic Development the following:

1. Export roadmap: What is the detailed year-by-year plan to grow exports from US Dollars 16 billion in 2024 to US Dollars 36 billion by 2030 and what are the specific milestones set for each major sector?
2. Sectoral targets: What are the projected export earnings, separately for merchandise such as apparel, tea, rubber, gems, agriculture, shipping et cetera and services such as ICT, BPO, tourism, financial services and logistics, and what policy measures would drive these increases?
3. Impact of US tariffs: What is the expected impact, positive or negative, of the newly-imposed Trump tariffs on Sri Lanka's export earnings and what countermeasures, bilateral or multilateral, does the Government intend to pursue to safeguard market access?

Hon. Deputy Minister, as you know, that 20 per cent is added on to another 10 per cent and 13 per cent. So, altogether, there would be a 38.4 per cent tax on Sri Lanka with regard to trade is what has been mentioned.

4. Market diversification and trade agreements: How many new trade agreements or preferential access arrangements would be finalized by 2030? Why are previously signed agreements not operational yet and what new countries or regions are being targeted? Is Sri Lanka considering joining any regional trade groupings?

Hon. Speaker, the Free Trade Agreements with Singapore and Thailand had been signed, sealed and delivered, but are not put into operation. What particular problem is causing delay?

5. Value addition and competitiveness: What steps are being taken to shift away from raw exports and low-value manufacturing towards high-value products and services capable of withstanding tariff pressures?
6. Infrastructure and ease of doing business: By when would export-critical infrastructure projects such as the Trincomalee Harbour - it was none other than the President who mentioned that the Trincomalee Port will be useful in the drive towards US Dollars 36 billion of export earnings by 2030 - airport cargo upgrades and port automation be fully operational? What measures would be taken to improve Sri Lanka's Ease of Doing Business ranking to support exporters and investors?
7. SME export promotion: Will the Government introduce targeted export financing, tax relief or guarantee schemes to enable SMEs and small exporters to scale up and compete internationally?

Hon. Deputy Minister, as you know, our interest rates are between 13 per cent to 20 per cent, while our peers in th region are having rates between 4 per cent to 10 per cent.

8. Investment mobilization: What levels of local and foreign direct investments are projected between now and 2030? Through which frameworks - BoI Law, Port City Law or Companies Act - are these investments being mobilized?

[ගරු රවි කරුණානායක මහතා]

9. Incentives for investors: What specific tax incentives, tax holidays, qualifying investment expenditure allowances and concessional lending schemes are being offered to attract investments into export-oriented sectors?
10. Debt and reserve management: Given that Sri Lanka must resume large-scale debt repayments from April, 2028, could the Government's export and investment drive help build sufficient foreign reserves in advance?

The Public Debt Management Act ensures exactly that. So, that is the answer I am seeking for.

The Public Debt Management Act ensures exactly that. So, that is the answer I am seeking for.

Further, can the Minister state:

(i) the level of foreign reserves as at 01st January, 2025; and
(ii) the month-by-month accumulation of reserves by the Central Bank from January, 2025 to date?

Thank you, Sir.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

II

මන්නාරම සහ රාමේෂ්වරම් අතර සෘජු මගී නෞකා සේවාව

மன்னார் மற்றும் இராமேஸ்வரம் இடையேயான நேரடிப் பயணிகள் கப்பல் சேவை

DIRECT FERRY SERVICE BETWEEN MANNAR AND RAMESWARAM

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே! நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி.

இலங்கையின் மன்னார் மற்றும் இந்தியாவின் தமிழ் நாட்டிலுள்ள இராமேஸ்வரம் இடையே நேரடிப் பயணிகள் கப்பல் சேவையை ஆரம்பிக்கும் திட்டம், இரண்டு நாடுகளுக்கும் இடையேயான பன்னாட்டு சமூக மற்றும் வர்த்தக உறவுகளை வலுப்படுத்தும் முக்கியமான நடவடிக்கையாகும். இந்தச் சேவை பிராந்திய இணைப்பை மேம்படுத்தி சுற்றுலா, வர்த்தகம் மற்றும் மக்களுக்கு இடையிலான உறவுகளை ஊக்குவிக்கும் வகையில் செயற்படவுள்ளது.

1. மன்னார் மற்றும் இராமேஸ்வரம் இடையேயான நேரடிப் பயணிகள் கப்பல் சேவையை ஆரம்பிக்கும் திட்டம் அரசாங்கத்துக்கு உள்ளதா? மற்றும் இதன்மூலம் பிராந்திய இணைப்பை மேம்படுத்துவதற்கான முயற்சிகள் ஏதாவது உள்ளதா?
2. இந்தக் கப்பல் சேவையின் பொருளாதார, சமூக மற்றும் பாதுகாப்புத் தாக்கங்கள் குறித்து ஏதாவது மதிப்பாய்வுகள் மேற்கொள்ளப்பட்டுள்ளதா?
3. இந்தக் கப்பல் சேவையை நடைமுறைப்படுத்துவதற்கான காலக்கெடு மற்றும் முன்மொழியப்பட்ட கட்டமைப்பு, துறைமுக வளங்கள் மேம்பாடு மற்றும் சுங்கச் செயல்முறைகள் எவ்வாறு திட்டமிடப்பட்டுள்ளன என்பது தொடர்பாக அமைச்சர் விளக்கமளிப்பாரா?
4. பயணிகள் பாதுகாப்பு, குடியுரிமை மற்றும் இந்திய அதிகாரிகளுடன் இரு நாடுகளும் இணைந்து செயற்படுவதில் ஏற்படக்கூடிய சவால்களை அரசு எவ்வாறு கையாளத் திட்டமிட்டுள்ளது?
5. இந்தக் கப்பல் சேவையால் வட மாகாண மக்கள் மற்றும் இலங்கை - இந்தியாவுக்கு இடையிலான பரஸ்பர உறவுகளில் ஏற்படும் நன்மைகள் என்ன?

நன்றி!

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට ඊළඟ සභා වාරයේදී පිළිතුරු ලබා දෙන්න අදහස් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය 1 සිට 4 දක්වා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. Hon. Minister, you have 15 minutes.

රේගු ආඥා පනත: යෝජනා සම්මතය

சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்

CUSTOMS ORDINANCE: RESOLUTION

[පූ.භා. 10.58]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.08.05 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය).

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය, විෂය අංක 3 - මුදල් පනත යටතේ නියෝගය, විෂය අංක 4 - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග ද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයට අනුව අද දින ඉදිරිපත් කරන යෝජනාවල විශේෂයෙන්ම මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ වන විධිවිධාන කිහිපයක් තිබෙනවා.

ඉන් පළමුවැන්න බවට පත් වන්නේ මෙයයි. වාහන ආනයනයේදී අපට අලුත් වර්ගීකරණ සඳහා HS codes නිර්මාණය කරන්න සිද්ධ වුණා. ඒකට හේතුව, ඕනෑම භාණ්ඩයක් ආනයනය කරනකොට ඒවාට අදාළ වන බදු පැනවීමට ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන මේ HS - Harmonized System - codes කියලා අපි හඳුන්වන අංක භාවිත කරනවා. ඒ අනුව විශේෂයෙන්ම වාහන සම්බන්ධයෙන් වෙන් වෙලා තිබෙනවා, ප්‍රධාන වර්ග 4ක්.

එකක් තමයි, භාවිත වන ඉන්ධන සහ වාහනය ක්‍රියාත්මක වන ආකාරය. ඩීසල් සහ පෙට්‍රල් සම්බන්ධ කර ගත්තාම ඒවායෙන් වාහනය ක්‍රියාත්මක වන්නේ එන්ජින් එක ක්‍රියාත්මක වීම හරහායි. ඊට පස්සේ අපි දන්නා මේ දෙමුහුන් වර්ගයේ - hybrid - වාහනවලදී එන්ජිම ක්‍රියාත්මක වෙනවා වාගේම මෝටරයකුත් ක්‍රියාත්මක වෙනවා. ඉහත කාණ්ඩ දෙකටම වර්ග දෙක බැගින් හතරක් තිබෙනවා. ඒ වාගේම විද්‍යුත් - electric - වාහන ගත්තාම, එම වාහනය පණ ගැන්විලා ඉදිරියට යන්නේ මෝටරය හරහායි. ඒ අනුව ගැටලුවක් තිබුණේ නැහැ. නමුත් අපි දන්නවා, අවුරුදු ගණනාවක් වාහන ආනයනය නොකර තිබිලා වාහන ආනයනය කරන තත්ත්වයකදී ලෝකයේත් වාහන නිෂ්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණයේ විශාල වෙනස්කම් සිද්ධ වෙලා මේ විද්‍යුත් වර්ගීකරණ යටතේ තිබෙන වාහනවල මෝටරය පණ ගැන්වීමේ ක්‍රමවේදයට අලුතින් උපාංග එකතු වෙලා තිබෙන බව.

ශ්‍රී ලංකා රේගුව විසින් එහෙම ආපු වාහන පරීක්ෂා කර බැලීමේදී පෙනී ගියා, මේ කියන වර්ගීකරණයන්ට එම වාහන යටත් වෙන්නේ නැති බව. මෝටරය පණ ගැන්වීම සඳහා යම් ආකාරයකට ඉන්ධන භාවිත වන ස්වරූපයක් ඒවායේ තිබුණත්, මේ පිළිබඳව පරීක්ෂා කර අලුත් කේතාංක ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව එහිදී පැන නැඟුණා. හේතුව, එහෙම අලුත් වර්ගීකරණයක් නැති හැම කාණ්ඩයකටම "වෙනත් වර්ගීකරණය" කියන එක යෙදෙනවා. නමුත්, වෙනත් වර්ගීකරණය කියන එක යෙදුණාම ඒකට පැනවෙන බදු ප්‍රමාණය අනික් ඒවාට සාපේක්ෂව වැඩියි. දැන් අපි ඩීසල්, පෙට්‍රල්, දෙමුහුන්, electric කිව්වාම ඒවාට පැනවෙන තීරු බදුවලදී ඉලෙක්ට්‍රික් වාහනවලට පැනවෙන බදු ටිකක් අඩුයි. හැබැයි, මේ විද්‍යුත් - electric - කියන එක යටතේ එන අලුත් වර්ග, නව තාක්ෂණය පැත්තෙන් එන වාහන “other category” එකට වැටුණොත් විශාල බද්දක් පැනවෙනවා. එතකොට ඒක ප්‍රායෝගික නැහැ. ඒ ගැටලු තත්ත්වයන් සලකා කැබිනට් මණ්ඩලයේ අනුමැතියත් දීලා කමිටුවක් පත් කරලා ඒ අනුව සංකේතාංක අලුතින් වර්ගීකරණය කළා. ඒක තමයි පළමු කොටසෙන් අපි ඉදිරිපත් කරන්නේ. ඒ අනුව ඒ සංකේතාංක ස්ථාපිත කරනවා, දැනට තිබෙන electric වාහන category එකත්, දෙමුහුන් - hybrid - එකත් අතර. ඒ අලුත් HS codes නිර්මාණය වුණාම ඒකට ආවේණික බදු නිර්ණය කරන්න ඕනෑ.

ඒ තීරුබදු ප්‍රතිශත පැනවෙනකොට, නිෂ්පාදන බදු පැනවෙනකොට, ඩීසල්, පෙට්‍රල්, දෙමුහුන් ඩීසල්, දෙමුහුන් පෙට්‍රල්, ඒ වාගේම විද්‍යුත් කියන කාණ්ඩවලට ක්‍රමිකව බදු අනුපාත අඩු වෙනවා. අපි අලුතින් හදන කාණ්ඩය තනිකරම විද්‍යුත් වෙන්නේත් නැහැ, ඒ වාගේම තනිකරම දෙමුහුන් වෙන්නේත් නැහැ. එය ඒ දෙක අතරමැදට එන්නේ. ඒ නිසා මා කලින් සඳහන් කළ කමිටුව විසින් තාර්කික පදනමකින් තීරණය කර තිබෙනවා, එම බදු පැනවීම සිදු කිරීමේදී වඩාත් උචිත වන්නේ විද්‍යුත් - electric - කොටසටත්, ඒ කියන්නේ තිබෙන පහළම කාණ්ඩයටත්, දෙමුහුන් කියන ඊළඟ කාණ්ඩයටත් නොවෙයි, ඒ අතරට කියා. ඒ අනුව තමයි එහිදී විද්‍යුත් කාණ්ඩයත්, දෙමුහුන් කාණ්ඩයත් අතර තිබෙන කාණ්ඩයට අදාළව නිෂ්පාදන බදු පනවා තිබෙන්නේ.

එම නිෂ්පාදන බදු පැනවීමේදීත් ඒ වාහනවල ධාරිතාව විශේෂ සැලකිල්ලකට භාජන කළා. එතැනදී දැනට තිබෙන විද්‍යුත් වාහනවල ධාරිතාවට වඩා අලුතින් එන වාහනවල කිලෝවොට් ධාරිතාව - output එක - සහ අනෙක් කාරණා සැලකිල්ලට භාජන කළා. ඒ වාගේම වාහනයේ මිල ගණනත් සැලකිල්ලට භාජන කළා. ඒ අනුව අඩු මිලක් තිබෙන වාහනයක් මිලදී ගන්නා කෙනෙකුට අඩු බදු බරක් පැනවෙන විධියටත්, තත්ත්වයෙන් ඉහළ සුඛෝපභෝගී වාහනයකට වැඩි බදු බරක් පැනවෙන විධියටත් තමයි මේ යෝජනා නිශ්චය කර තිබෙන්නේ. ඒ, දෙවැනි කාණ්ඩය.

ඊළඟට, තුන්වැනි කාණ්ඩය ගනිමු. එතැනදී ප්‍රශ්නයක් පැන නඟිනවා, නිෂ්පාදන බදු සම්බන්ධව. නිෂ්පාදන බදු අය කරන්නේ ශ්‍රී ලංකා රේගුව හරහා. අපි වාහන ආනයනය කරනවා. මොකද, අපි වාහන නිෂ්පාදනය කරන්නේ නැති රටක්. මේ ආර්ථිකය පුළුල් කිරීම සඳහා වාහන එකතු කරන ගමන්ම, ඒ හරහා රජයට බදු ආදායම් එකතු කර ගැනීමේ ක්‍රියාවලියක් තිබෙනවා. ඒ අනුව සමහර වාහනවලට අදාළව දැනටමත් සුඛෝපභෝගී බද්ද - Luxury Tax එක - පැනවෙනවා. ඒ අනුව අලුතින් කාණ්ඩයක් නිර්මාණය වුණාම, ඒ කාණ්ඩයට මේ Luxury Tax එක ඇතුළත් කළ යුතු වෙනවා. මේ කාණ්ඩයට Luxury Tax එක ඇතුළත් නොවී, අනෙක් කාණ්ඩ 4ට Luxury Tax එක ඇතුළත් වුණොත්, වාහන මිලදී ගැනීමේ වෙළෙඳ පොළ තුළ යම් විකෘති තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා එයට උත්තරයක් වශයෙන් Luxury Tax එක වෙනස් කිරීම තමයි මෙතැනදී කරන්නේ. ඒක කොහොමද අපි කරන්නේ?

දැනට ඩීසල් වාහනවලට Luxury Tax එක තීරණය කිරීමේදී රුපියල් මිලියන 5කට වඩා ඒවායේ CIF - Cost, Insurance and Freight - value එක වැඩි නම්, ඒ අතිරික්තයට සියයට 120ක බද්දක් පැනවෙනවා. ඒ වාගේම දැනට පවතින තත්ත්වය යටතේ පෙට්‍රල් වාහනවල CIF value එක රුපියල් මිලියන 5ට වඩා වැඩි නම්, ඒ අතිරික්තයට සියයට 100ක බද්දක් පැනවෙනවා. ඒ වාගේම hybrid diesel vehiclesවල CIF value එක රුපියල් මිලියන 5.5ට වඩා වැඩි නම්, ඒ අතිරික්තයට සියයට 90ක් වශයෙන් සහ hybrid petrol vehicles සඳහා අතිරික්තයට සියයට 80ක් වශයෙන් බද්ද පැනවෙනවා. අර electric කාණ්ඩය යටතේ තිබුණු ඒවාට සුඛෝපභෝගී බද්ද පැනවෙන්නේ CIF value එක රුපියල් මිලියන 6 ඉක්මවනවා නම්. ඒ සඳහා තිබෙන්නේ අතිරික්තයට සියයට 60ක බද්දක්. ඒ නිසා අපි අලුතින් නිර්මාණය කරන කාණ්ඩයටත් අර හා සමපාතව, electric කාණ්ඩයෙන් අය කරන බදු ප්‍රමාණයම තියන්න යෝජනා කර තිබෙනවා, මේ යෝජනා යටතේ.

අපි ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර මේ සංශෝධන ටික තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අනුව 2434/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ යෝජනා සම්මතයකුත්, අංක 2434/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියමයකුත්, ඒ වාගේම Luxury Tax එක සම්බන්ධයෙන් අංක 2434/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මුදල් පනත යටතේ වන

[ගරු අනිල් ජයන්ත මහතා]

නියෝගයකුත් අපි ඉදිරිපත් කර තිබෙනවා. වෙළෙඳ පොළ තුළ සමතුලිතතාව පවත්වා ගැනීම, බදු අය කිරීමේ සාධාරණත්වය පවත්වා ගැනීම, ආදායම් බදු අය කර ගැනීමේ කාර්යක්ෂමතාව සහ අනුකූලතාව වැඩිදියුණු කර ගැනීම, රේගු බදු සහ නිෂ්පාදන බදු අය කර ගැනීමේ කාර්යක්ෂමතාව සහ අනුකූලතාව වැඩිදියුණු කර ගැනීම කියන පරමාර්ථ සහිතව තමයි මේ වැඩ කටයුත්ත සිද්ධ කර තිබෙන්නේ. අපි ඒවා පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

තවත් කාරණයක් මේකටම ගැට ගැසී තිබුණා. අපේ ආණ්ඩුව ආදායම් එකතු කර ගැනීමත් මේ හරහා සිද්ධ කරනවා. ආදායම් එකතු කර ගැනීමේ අපේ ක්‍රියාවලිය සම්බන්ධව පසුගිය පාර්ලිමේන්තු සතියේදී අවිනිශ්චිතතාවක් මතු කළා. මේවා කරන්න පුළුවන්ද, බැරිද කියන තර්ක නැඟුවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රේගුවෙන් බදු අය කිරීම සම්බන්ධව ප්‍රශ්න මතු කළා. ගිය අවුරුද්දේදී දීලා තිබුණු ඉලක්කය වුණේ රුපියල් බිලියන 1,550ක්. මේ අවුරුද්දේ ඉලක්කය රුපියල් බිලියන 2,115යි. මෙච්චර ඉලක්කයකට යන්න පුළුවන්ද, මේ වාහනවලට විශාල වශයෙන් බදු ගහලා නේද කියලා ප්‍රශ්නයක් මතු කළා. ඇත්තටම මෙතැනදී අතිරේක බදු පැනවීමකට වඩා බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව හා අනුකූලතාව වැඩි වෙලා තිබෙනවා. මම කියන්න කැමැතියි, අපි පසුගිය අවුරුද්දේ රුපියල් බිලියන 1,550ක ඉලක්කයට ළඟා වුණා වාගේම මේ අවුරුද්දේ රුපියල් බිලියන 2,115ක ඉලක්කයක් තිබෙන බවත්, මේ වනවිට ඒ ඉලක්ක නිසි ආකාරයට සම්පූර්ණ කරමින් තිබෙන බවත්. මේ වෙනකොට ශ්‍රී ලංකා රේගුවේ සමස්ත බදු එකතු කිරීම රුපියල් බිලියන 1,316 ඉක්මවා තිබෙනවා. ඒ කියන්නේ, කලින් අවුරුද්දේ එකතු කරපු ප්‍රමාණය ආසන්නයට ඇවිල්ලා තිබෙනවා. ඒ සියල්ල ලබාගෙන තිබෙන්නේ වාහනවලින් නොවෙයි. වාහනවලින් අපි අපේක්ෂා කළේ, රුපියල් බිලියන තුන්සිය ගණනක් වාගේ කුඩා ප්‍රමාණයක්. එයිනුත් සැලකිය යුතු ප්‍රමාණයක් මේ වනවිට ලැබිලා තිබෙනවා. මෙහිදී සඳහන් කරන්න ඕනෑ කාරණය තමයි, ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඉදිරියට අරගෙන එමින් තිබෙනවා කියන එක.

ඒ වාගේම, වාහන සම්බන්ධයෙන් තවත් ගැටලු පැන නැඟී තිබෙනවා. අපි දන්නවා, වාහන ආනයනය කිරීමේ වැඩකටයුතු කරගෙන යනකොට ශ්‍රී ලංකා රේගුවට, ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාගේම containers handle කරනකොට යම් යම් ගැටලු පැන නැඟුණු අවස්ථා තිබෙන බව. ඒ සම්බන්ධයෙනුත් ප්‍රශ්න මතු කළා. ඒ ගැටලුවලට ඉතා වේගයෙන් මැදිහත් වෙලා, අපි කාර්යක්ෂමව උත්තර ලබා දෙනවා. ඒත් එක්කම සමාජයේ පැන නැඟුණු, කථා බහට ලක් වුණු ප්‍රශ්න දෙකක් තිබෙනවා. එක ප්‍රශ්නරබන්ධයෙබෙයක් තමයි, BYD කියන වාහනය නිදහස් කර ගන්න බැරිව යම් කාල පමාවකට යටත් වුණු එක. ඒකටත් හේතු වුණේ, ශ්‍රී ලංකා රේගුවේ හා වෙනත් තැන්වල ගැටලුවලට වඩා වෙනත් කාරණයක්. අපි කවුරුත් දන්නවා, වාහන ආනයනය කිරීමේදී වංචා, දූෂණ හා ගැටලු තිබෙනවා කියලා ශ්‍රී ලංකා රේගුවට චෝදනා එල්ල වෙන බව. හැබැයි, අනෙක් පැත්තෙන් බැලුවාම, වාහන ආනයනය කිරීමේදී BYD කියන electric category එකේ වාහනය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නැඟුණා. ඒ ප්‍රශ්නය තමයි, එහි මෝටරයේ ධාරිතාවට වඩා අඩු ධාරිතාවකින් ගෙනැල්ලා තිබෙනවාද කියන එක. ඒ නිසා ශ්‍රී ලංකා රේගුව කලින් තිබුණු තත්ත්වයන්ට වඩා වේගයෙන් මැදිහත් වෙලා, නීතියට අනුව වැඩ කටයුතු කරන්න යෑමේදී, ආනයනකරුවන් සහ ශ්‍රී ලංකා රේගුව අතර ඒ පිළිබඳ ගැටලුවක් පැන නැඟුණා. දැන් ඒක උසාවියට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒකට අදාළ විසඳුම, උසාවියෙන් ලැබෙන පිළිතුර එක්කම සාකච්ඡා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඒකට උසාවි යන්නේ නැතුව decision එකක් ගන්න බැරිද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමනි, උසාවි යන්නේ නැතුව decision එකක් ගන්න පුළුවන් ඒවාත් තිබෙනවා. ඔබතුමාත් දන්නවා, යම් යම් අවස්ථාවල ඔබතුමන්ලාගේ පාලන කාලයේදී වාහන වගයක් ගෙනැල්ලා, ශ්‍රී ලංකා රේගුවේ බලය පාවිච්චි කරලා යම් දඩ මුදලකට අනුව නිදහස් කරපු තත්ත්වයක් තිබුණු බව. 2025 ගැසට් නිවේදනයට අනුව ඉතා පැහැදිලිව Regulation එක තිබෙන්නේ, Regulation violation එකක් තිබෙනවා නම්, මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවට වැඩ කටයුතු කරන්න තිබෙන වපසරියට අමතරව, re-export කළ යුතුයි කියන එකයි. ඒක තමයි නීතියේ තිබෙන්නේ. එතකොට අපට ප්‍රායෝගිකව විසඳාගෙන එන්න බැරි තත්ත්වයකදී අනිවාර්යයෙන්ම ඒ තීරණයට යන්න සිද්ධ වෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙතැන තිබෙන්නේ motor capacity එක පිළිබඳ ප්‍රශ්නයක් නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඔව්, ඒක තමයි. ඒ පිළිබඳව administrative පැත්ත පළමුවෙන්ම අපි සාකච්ඡා කළා, ගරු මන්ත්‍රීතුමනි. එතැනදී කිලෝවොට් 150 කියන එක තමයි මෝටරයේ තිබෙන්නේ. කිලෝවොට් 100 කියන එක තමයි, සමාගම කියන්නේ. ඒකට software එකක් පාවිච්චි කරනවාය කියනවා. මේ මත පිළිබඳ ගැටුම නිසා ශ්‍රී ලංකා රේගුව කැමැති නැහැ, අවදානම අරගෙන වාහන නිදහස් කරන්න. ඒ නිසා දැන් උසාවියේදීත් සාකච්ඡා කරලා, වාහන නිදහස් කිරීමක් කරලා තිබෙනවා. ඒ සියලු වාහන දැන් එළියට එනවා. හැබැයි, ඒ කොන්දේසියකට යටත්ව. ඒ කොන්දේසිය මොකක්ද? මේ පිළිබඳ යම් පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙනවා. යම් විධියකින් ඒ පරීක්ෂණවලින් කිලෝවොට් 150 කියලා තීරණය වුණොත්, ඔප්පු වුණොත්, ඒකට අදාළ bank guarantee එකක් සහිතව ඒ වැඩ කටයුත්ත සිද්ධ කරලා තිබෙනවා. මම ඒ ගැන සාකච්ඡා කළේ නැත්තේ අධිකරණයේ තිබෙන කරුණක් නිසායි.

ඒත් එක්කම cross-border transactions සම්බන්ධයෙනුත් ඒ වාගේ violation එකක් තිබිලා තිබෙනවා. අපේ පැත්තෙන් ගන්න පුළුවන් තීන්දුව තමයි, re-exportation එක. නමුත්, ඒකත් අභියෝගයට ලක් කරමින්, දැන් උසාවියේ නඩුවක් පවතිනවා. ඒවා අපි ඉක්මනින් විසඳාගෙන යනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

රටින් එළියට සල්ලි ගිහිල්ලා තිබෙනවා නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඔව්, ඒක තමයි. රටින් සල්ලි ගිය එක ඇත්ත. ඒ සියලු කාරණා ඇත්ත. නමුත්, regulation violation එකක් තිබෙනවා නම්, අපිට

වැඩ කටයුතු කරන්න සිද්ධ වෙන්නේ ඒකට තිබෙන නීති ප්‍රතිපාදනය යටතේ පමණයි. මේ Gazette Notification එකට අනුව re-exportation කරන්න තිබෙන්නේ. නමුත්, හැම තිස්සේම උසාවිය ඉදිරියේදී, නීතිය ඉදිරියේදී අභියෝගයට ලක් වෙනවා නම් ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න අපි සූදානම් වෙනවා.

ඒත් එක්කම මේ මොහොතේදී මම තවත් කාරණයක් මතු කරන්න කැමැතියි. මේ කාරණය මේ සතියේදීත් මතු වුණා. අපි මේ රට අස්ථාවර තැනක ඉඳලා ස්ථාවර කරමින් ඉදිරියට එනකොට, අපිට ඇති කරන විවිධ වූ බාධක අතරේ, මේ අවිශ්වාසය, අස්ථාවරත්වය නිර්මාණය කරන්න හදපු කතන්දර ඇතුළේ, එක් ප්‍රධාන කථාවක්, මාතෘකාවක් තමයි මුදල් අච්චු ගැසීම කියන මාතෘකාව. ඒ පිළිබඳව මම පසුගිය දවසකත් උත්තර දුන්නා. ඒකත් ප්‍රමාණවත් නොවන මට්ටමක් තිබෙනවා. ඒකට හේතුව, ඒක නැවත නැවතත් විකෘති කිරීම සහ වැරැදි අර්ථ දැක්වීම. මේ සඳහා කරුණු සහ දත්ත ඉදිරිපත් කරන්න මම කැමතියි. අපි පසුගිය සැප්තැම්බර් මාසයේ ආණ්ඩුව භාර ගත්තා. මුදල් සැපයුම, මුදල් අච්චු ගැසීම කියන්නේ මොකක්ද, මොකක්ද සිද්ධ වුණේ කියන කාරණය අපි පැහැදිලි කරන්නට ඕනෑ. රටක මුදල් අච්චු ගැසීම කියන්නේ මහ බැංකුව ඇතුළේ කරන භෞතික කාරණය නොවෙයි. මුදල් අච්චු ගැසීමක් කියන්නේ රට ඇතුළට සංචිත මුදල් - reserve money - කොච්චර එනවාද කියන එකයි. ඒක තමයි පදනම. ඒ කියන්නේ, භෞතිකව පුද්ගලයන් සතුව තිබෙන නෝට්ටු හා කාසි, බැංකු පද්ධතිය සතුව තිබෙන ඒවා, වාණිජ බැංකු විසින් මහ බැංකුවේ සංචිත විධියට තැන්පත් කරලා තිබෙන ඒවා යන සියල්ල සංචිත මුදල් - reserve money - කියලා අපි කියනවා. ඒක පදනම බවට පත් වෙන්නේ ඇයි? අන්න ඒ සංචිත මුදල් ප්‍රසාරණය වෙලා ආර්ථික ක්‍රියාකාරකම්වලින් පුළුල් මුදල් සැපයුම කියන එක සිද්ධ වෙන්න පුළුවන්. අපි ආණ්ඩු බලය ගන්නකොට තිබුණු මෙන්න මේ සංචිත මුදල් ප්‍රමාණයත්, පුළුල් මුදල් ප්‍රමාණයත් 2025 ජූනි මාසය වෙනකොට වර්ධනය වෙලා තිබෙනවා. එහෙම වර්ධනය වෙලා තිබෙන්නේ සංචිත මුදල් ප්‍රමාණයේ විශාල වැඩි වීමක් නිසා නොවෙයි. ඇත්තටම සංචිත මුදල් ප්‍රමාණය, ඒ කියන්නේ reserve money වැඩි වෙලා තිබෙන්නේ රුපියල් බිලියන 137ක්. මොකද, මහ බැංකුවේ කාර්යභාරයක් තමයි මුදල් ස්ථාවරත්වය අත්පත් කර ගැනීම සහ අවශ්‍යතාව පරිදි මුදල් නිකුත් කිරීම. ඔබතුමන්ලා දන්නවා, අපේ ආණ්ඩුව බලයට පත් වෙච්ච වෙලාවේ විදේශ විනිමය අනුපාතය 400ට, 500ට යනවාය කිව්ව බව. එතකොට මහ බැංකුව ඉතාම උපක්‍රමශීලීව මුදල් කළමනාකරණය කරමින් විදේශ වෙළෙඳ පොළෙන් සංචිත මිලදී ගත්තා. ඩොලර් බිලියන 1.74ක් මේ කාල පරිච්ඡේදය තුළ මිලදී අරගෙන තිබෙනවා. රුපියල් බිලියන 522ක ඇතුළට විදීමක් - සෘජු injection එකක් - කරලා තිබෙනවා.

ඒ වාගේම ආණ්ඩුව විසින් මහ බැංකුවෙන් රුපියල් බිලියන 76ක ණය අරගෙන තිබෙනවා. අපේ reserve money ප්‍රමාණයේ වැඩිවීම තිබෙන්නේ රුපියල් බිලියන 137ක්. ඒ කියන්නේ මහ බැංකුව Open Market Operations සහ විවිධ කටයුතු හරහා නැවතත් මුදල් ඇතුළට අරගෙන තිබෙනවා. හැබැයි, මේ කරුණු ඉදිරිපත් කරපු අය වැරැදි දත්ත ඉදිරිපත් කළා. මෙන්න මේ broad money supply එක තමයි පටලවා ගත්තේ. නිරන්තරයෙන් පත්තරවල පළ වෙනවා නේ, රුපියල් බිලියන 1,227ක් -රුපියල් ට්‍රිලියන 1.227ක්- මුදල් අච්චු ගහලා කියලා. ඒ මුදල් අච්චු ගහපු ප්‍රමාණය නොවෙයි. මේ තිබෙන්නේ පුළුල් මුදල් සැපයුමේ වැඩිවීම. අන්න ඒ අගය තමයි රුපියල් බිලියන 1,227. ඇයි එහෙම වැඩි වෙලා තිබෙන්නේ? එහෙම වැඩි වෙලා තිබෙන්නේ සංචිත මුදල්වල - reserve moneyවල - වැඩි වෙච්ච රුපියල් බිලියන 137 සහ බැංකු පද්ධතියේ තිබෙන මුදල් සැපයුම ආර්ථිකයට කාර්යක්ෂමව දායක වීමෙන්; velocity එක.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට තව විනාඩි දෙකතුනක් ලබා දෙන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, පුළුල් මුදල් සැපයුම වැඩිවීම සිද්ධ වෙන්නේ මෙන්න මේ ආර්ථික ක්‍රියාකාරකම නිසායි. දැන් වේගයෙන් ආර්ථිකය ඉදිරියට එනවා. මිනිස්සු ණය ගන්නවා. තමන්ගේ තැන්පතුවල තිබුණු මුදල් withdraw කරලා ව්‍යාපාර කටයුතුවල යෙදෙනවා. ඒක හොඳටම බලා ගන්න පුළුවන් කාරණය තමයි, පෞද්ගලික අංශයේ ණය ගැනීම් - credit - බිලියන ගණනාවකින් වැඩි වෙලා තිබීම. පෞද්ගලික අංශයේ ණය ගැනීම් වැඩි වීම ඉතාම හොඳ ලක්ෂණයක්. නමුත් අපි කවුරුත් දන්නවා, සමාජය මුදල් අච්චු ගැසීම වැරැදි ක්‍රියාවක් බවට පත් කරන්නේ අන්න ඒ විධියට පුළුල් මුදල් සැපයීම වැඩිවීමට, නැත්නම් reserve money වැඩිවීමට මම කලින් පැහැදිලි කරපු කාරණාවලට අමතරව තවත් කාරණයක් බලපාන නිසායි. ඒක තමයි ආණ්ඩුව විසින් සෘජුවම ආණ්ඩුවේ බැංකුකරු විධියට මහ බැංකුවට බැඳුම්කර හා බිල්පත් නිකුත් කරලා මුදල් ලබා ගැනීම. ඔන්න ඕකට තමයි මහා පරිමාණයෙන් මුදල් අච්චු ගහනවා කියලා සමාජය කියන්නේ. අපේ ආණ්ඩුවට පත් වුණාට පසුව කිසිම ආකාරයකට එවැනි මුදල් අච්චු ගැසීමක් හෝ මහ බැංකුවේ මුදල් අරගෙන එවැනි ප්‍රසාරණයක් සිද්ධ වෙලා නැහැ. ඒක වැරදි දෙයක් විධියට සමාජගත වුණේ ඇයි? අතීතයේ ආණ්ඩු වැඩ කරපු විධිය, වගකීම් විරහිතභාවය, මුදල් පරිහරණයේ, මූල්‍ය විනයේ ගැටලු තිබීම හේතුවෙන් ප්‍රශ්න පැන නැඟිලා තිබුණු නිසායි.

ඒ වාගේම අපි 2025 අය වැයෙන් ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 4,000කට සීමා කරලා තිබෙනවා. අය වැය පරතරය රුපියල් බිලියන 2,200යි. මෙන්න මේ අය වැය පරතරය පියවීමේදී අපේ දේශීය වෙළෙඳ පොළෙන්, මහජනතාවගෙන් තමයි වැඩිපුර ණය ලබා ගැනීම සිද්ධ කරන්නේ. එහෙම නැතුව මුදල් අච්චු ගහලා අය වැය පරතරය පියවන්න යන්නේ නැහැ. ඒක තමයි අපේ ක්‍රියාමාර්ගය. අතීතයේදී එහෙම මුදල් අච්චු ගහලා අය වැය පරතරය පියවලා තිබුණා. ඒ නිසා තමයි උද්ධමනකාරී බලපෑම් ආර්ථිකයට එකතු වෙලා තිබුණේ. හොඳටම මේ කාරණය ගැන බලන්න. පසුගිය ආණ්ඩු කාලයේ මුදල් අච්චු ගැසීම සිද්ධ කරනකොට අනවශ්‍ය විධියට Treasury Bills, Treasury Bonds issue කරලා සියයට 30ක් වාගේ ප්‍රමාණයකට ඉහළට අරගෙන ගියාට පස්සේ ආණ්ඩුවේ පොලී වියදම් වශයෙන් විශාල ප්‍රමාණයක් බැර කිරීම් කරන්න වුණා. ඒ විතරක් නොවෙයි. උද්ධමනය සියයට 70, සියයට 80 දක්වා ඉහළ යන්න එය හේතු වුණා. දැන් අපේ ආණ්ඩුව මුදල් අච්චු ගැහුවාය කියන අභූත චෝදනාව බැහැර කිරීම සඳහා මම එක දත්තයක් පමණක් සාමාන්‍ය ජනතාවට ඉදිරිපත් කරන්නම්. මේ විධියට මුදල් ප්‍රසාරණය වුණා නම්, මුදල් ප්‍රසාරණය නිසා උද්ධමනය වැඩි වුණා නම්, ඇත්තටම අපේ ආර්ථිකය තුළ උද්ධමනය වැඩි වෙලා තිබෙන්න ඕනෑ; මේ කියන

[ගරු අනිල් ජයන්ත මහතා]

විධියට ට්‍රිලියනයක් මුදල් අච්චු ගැහුවා නම් එහෙම වෙන්න ඕනෑ. බලන්න, අපි ආණ්ඩුව ගත්තු දා ඉඳලාම අපේ රටේ උද්ධමනය පාලනය වෙලා තිබෙනවා. තවමත් සෘණ; බින්දුවට ආසන්න ප්‍රමාණයක යන්නේ. ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව ඉතාම නිවැරදිව මූල්‍ය හසුරුවමින්, මූල්‍ය විනය පරිපාලනය කරමින්, රට ස්ථාවර කරමින් ඉදිරියට යනවා. ඒ අනුව ප්‍රමාණාත්මක ආර්ථික සංවර්ධනයක් අත්පත් කරමින් අපි ඉදිරියට යනවා කියන කාරණය මතක් කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අජිත් පී.පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. සල්ලි අච්චු ගැසීම වාගේ ඒවා නීත්‍යානුකූලව ගන්නේ නැහැ වාගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමා මුදල් ඇමති වශයෙනුත් ඒක ක්‍රියාත්මක කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔය කාරණය ඔබතුමාගේ කථාවේදී කියන්න.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.18]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කළා BYD මෝටර් රථ අර්බුදය ගැන. ඇත්තවශයෙන්ම මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා තමයි පාර්ලිමේන්තුවේදී මේ ගැටලුව පෙන්වා දුන්නේ. එකම ධාරිතාව සහිත එකම මෝටර් රථය පිළිබඳව රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී සිංගප්පූරුවෙන් එනවා නම් එක tax එකක්, නිෂ්පාදකයා සෘජුව එවනවා නම් එක tax එකක්, ඒ නිසා අසමතාවක් තිබෙනවා, අසාධාරණයක් තිබෙනවා, නීතිවිරෝධී දෙයක් සිද්ධ වෙනවා කියන ප්‍රශ්නය මතු කළේ මේ පාර්ලිමේන්තුවේදී මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඉන්පසුව රේගුව ඒ පිළිබඳව දැනුවත් වෙලා ඔවුන් මෝටර් රථ නවසිය ගණනක් රඳවා ගත්තා. ඒක විශාල ප්‍රශ්නයක් බවට පත් වුණා. එක පැත්තකින් ඒ රථ වාහන ගෙන්වන දේශීය නියෝජිත සමාගමත්, අනෙක් පැත්තෙන් දේශීය මධ්‍යම පාන්තිකයනුත් -ඔවුන් ඉතා අසීරුවෙන් මෝටර් රථයක් ඇණවුම් කරලා- විශාල අර්බුදයකට මුහුණ දුන්නා. ඇත්තටම මෙය ඉක්මනින්ම විසඳිය යුතු ප්‍රශ්නයක්. නීතිමය වශයෙන් මේ මොහොතේ එම කාරණය අධිකරණය ඉදිරියේ තිබුණත්, මෙවැනි ප්‍රශ්න මතු වීම වැළැක්වීම සඳහා විශේෂයෙන්ම නවීන තාක්ෂණය - ඒක ඉලෙක්ට්‍රික් වෙන්න පුළුවන්, හයිබ්‍රිඩ් වෙන්න පුළුවන් - හා සම්බන්ධ වෙමින් අලුත් ප්‍රවණතාවන්ට ගැළපෙන පරිදි මේ රෙගුලාසි යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍යයි. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ යාවත්කාලීන කිරීම ගැන. හැබැයි, අපි අවධානය යොමු කරන්න ඕනෑ අනාගතයේ අපට මුහුණ දෙන්න තිබෙන අභියෝග පිළිබඳව. විශේෂයෙන් විදුලි මෝටර් රථ සහ හයිබ්‍රිඩ් මෝටර් රථ සඳහා බදු අය කිරීමේදී වඩාත් ප්‍රායෝගික, වඩාත් ගැළපෙන, දූෂණයට ඉඩ නොතබන විධියේ ක්‍රමවේද අනුගමනය කිරීම ගැන. මොකද, මේ දූෂණය එක පැත්තකින් රේගුවේ නිලධාරින් අතින් වෙන්න පුළුවන්; දේශීය ඒජන්තයන් අතින් වෙන්න පුළුවන්. ඒ නිසා කවුරු මේ දූෂණයේ ඉන්නවාද, දෙගොල්ලන්ම ඉන්නවද කියලා හොයලා බලන්න අවශ්‍යයි.

අපි මීට කලින් දැක්කා ලැන්ඩ් රෝවර් මෝටර් රථ ලංකාවට අරගෙන එනකොට මේ විධියටම under-invoicing කරලා බිලියන ගණනක් රටට පාඩු කළ ආකාරය. ඒවාට බලගතු පුද්ගලයන් සම්බන්ධ නිසා ඒවා පිළිබඳව අපරාධ පරීක්ෂණ දක්වා ඉදිරියට ගියේ නැහැ. නමුත්, මේ රටේ අනාගතය වෙනුවෙන් කළ යුතුව ඇති, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කළ යුතුව ඇති ඒ නිවැරදි නීතිමය ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව දිගින් දිගටම පෙන්නුම් කරනවා. මේ BYD මෝටර් රථ පිළිබඳ ප්‍රශ්නය එයට කදිම උදාහරණයක්. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ අලුත් නීති සංශෝධන අරගෙන එන්න වෙන්නේ, ඉලෙක්ට්‍රික් මෝටර් රථත්, හයිබ්‍රිඩ් මෝටර් රථත්, මේවායේ තාක්ෂණික දියුණුවත්, විශේෂයෙන්ම අපේ රටේ මධ්‍යම පාන්තිකයන්ගේ වෙළඳපොළ අවශ්‍යතාවනුත් සලකන විට රජය පැත්තෙනුත් ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය නිසායි. දැන් ගැටලුව තිබෙන්නේ, මෝටර් රථවල නොවෙයි. ඉලෙක්ට්‍රික් මෝටර් රථ තාක්ෂණය, හයිබ්‍රිඩ් මෝටර් රථ තාක්ෂණය ලෝකයේ ඉතාම ශක්තිමත් වෙලා තිබෙන නිසා පාරිභෝගිකයා අද විශ්වාසවන්තව ඉලෙක්ට්‍රික් මෝටර් රථ මිලදී ගැනීම සිද්ධ කරනවා. නමුත් ගැටලුව තිබෙන්නේ, මේ මෝටර් රථ charge කරගන්න අවශ්‍ය කරන ස්ථාන මේ රටේ ප්‍රමාණවත් නොවීමයි. මේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 167වන පිටුවේ සඳහන් වෙනවා, "විද්‍යුත් රථවාහන ආරෝපණය සඳහා දිවයින පුරා බැටරි ආරෝපණ මධ්‍යස්ථාන ජාලයක් පිහිටුවීම" කියලා. ගරු ඇමතිතුමනි, ඊළඟ අය වැයකින් ප්‍රමුඛස්ථානය දීලා රාජ්‍ය සහ පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන, රජය සතු සම්පත් උපයෝගී කරගෙන, ලංකා විදුලිබල මණ්ඩලය, LECO ආයතනය වාගේම පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් සම්බන්ධ කරගෙන, විද්‍යුත් ආරෝපණය සඳහා charging stations ලංකාව පුරාම ඉක්මනින් පිහිටුවා අවසන් කරන එක ඉතාම වැදගත්. මොකද, අවසානයේදී ඉලෙක්ට්‍රික් මෝටර් රථ භාවිත කරනවා කියලා කියන්නේ බලශක්තිය ඉතිරි වෙනවා. අද වෙනකොට ඉලෙක්ට්‍රික් මෝටර් රථ charge කරන්නේ පුනර්ජනනීය බලශක්තියෙන්ම නොවෙයි. එක පැත්තකින් ගල්අඟුරුවලින්, එක පැත්තකින් ඩීසල්වලින් විදුලිය උත්පාදනය කරලා ඒකෙන් අපි මෝටර් රථ charge කරනවා. හැබැයි හොඳම දේ තමයි, පුනර්ජනනීය බලශක්තිය උපරිම වශයෙන් අපේ පද්ධතියට එකතු කරන එක. සූර්ය විදුලි බලය, සුළං විදුලි බලය වැඩි වැඩියෙන් අපේ පද්ධතිවලට එකතු කරලා එමඟින් අපට මෝටර් රථ පමණක් නොවෙයි, බස් රථ පවා

charge කරන්න පුළුවන්. ඒ වාගේම අපි දන්නවා, ආසියානු සංවර්ධන බැංකුවේ යෝජනාවක් තිබෙනවා, දුම්රිය විදුලියකරණය කරන්න. ඒක පැරණි යෝජනාවක්. මේ රටේ සම්පූර්ණ ප්‍රවාහන පද්ධතිය විදුලියකරණයට ලක් කිරීමෙන් අපට බලශක්තිය ඉතිරි කර ගන්න පුළුවන්; පරිසරය ආරක්ෂා කර ගන්න පුළුවන්; මේ රටේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, අපේ රට බලශක්තිය පැත්තෙන් යම් ආකාරයක දියුණුවක් ඇති වෙලා තිබෙන බව අපි කවුරුත් දන්නවා. මමත් ඒ ගැන සතුටු වෙනවා. ජාතික විදුලි පද්ධතියට මෙගාවොට් 1,700ක් එකතු කරපු සූර්ය බල සංග්‍රාමය 2016 සැප්තැම්බර් මාසයේ 6වැනිදා ආරම්භ කරලා, Net Plus, Net Metering, Net Accounting කියන ප්‍රතිපත්ති මේ රටට හඳුන්වා දීපු දේශපාලන නායකයා හැටියට මට ඒ ගැන සතුටක් තිබෙනවා. ඒ වාගේම, දූෂිත මිලදී ගැනීමේ ක්‍රියාදාමය අවසන් කරලා ටෙන්ඩර් මඟින් සූර්ය විදුලි බලයත්, සුළං විදුලි බලයත් ලබා ගැනීම පිළිබඳ ප්‍රතිපත්ති ස්ථාපනය කරපු නායකයා හැටියට මට ඒ ගැන සතුටක් තිබෙනවා. හැබැයි, පාරිභෝගිකයාට එහි ප්‍රතිලාභ ලැබෙන්න නම් අපේ ජාතික විදුලි පද්ධතිය smart grid එකක් බවට පත් වන්න ඕනෑ. මේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ජාතික විදුලි පද්ධතිය smart grid එකක් කරනවා කියලා තිබෙනවා. ඒක අපේත් ප්‍රතිපත්තිය. මේ ක්ෂේත්‍රය ගැන දන්නා හැමෝම කියන්නේ පුළුවන් තරම් ඉක්මනින් අපේ grid එක smart කරන්න ඕනෑ කියලායි. හැබැයි, smart grid එකක් බවට පත් කළොත් තමයි අපට උපරිම වශයෙන් පුනර්ජනනීය බලශක්තිය පද්ධතියට එකතු කර ගන්න පුළුවන් වන්නේ. ඒ වාගේම, පද්ධතියේ ඇතිවන මේ අසමතුලිතතා ඉවත් කරන්න පුළුවන්; ගල්අඟුරු සහ ඩීසල් මිලදී ගැනීම අඩු කරලා ජාතික විදුලි පද්ධතිය ස්ථායීතාවකට පත් කරන්න පුළුවන් වෙන්නේ අපි පුළුවන් තරම් ඉක්මනින් මේ පද්ධතිය යථාවත් කිරීම තුළින්. නමුත්, මෙය යාවත්කාලීන කිරීම සඳහා වන පුළුල් වැඩ පිළිවෙළක් අද භූමියේ නැහැ. ඒ සඳහා කල්පනා කරන්නේත් නැහැ. විදුලි ක්ෂේත්‍රයට සම්බන්ධ දේශීය සහ විදේශීය ආයෝජකයන් මේ රටට ඇවිල්ලා ජාතික විදුලි පද්ධතිය තුළට ඔවුන්ගේ සහභාගීත්වය ඇති කරගෙන ඒ ආයෝජන හරහා මේ රටේ විදුලි පද්ධතිය යථාවත් කිරීම සඳහා අවශ්‍ය කරන ඒ ව්‍යවස්ථාපිත නීතිමය රැකවරණයත් පසුගිය සතියේ සම්මත කරපු විදුලිබල සංශෝධන පනත මඟින් ඉවත් වුණා. එයින් ආයෝජකයන්ට විශාල අවදානමක් ඇති කර තිබෙනවා. ඒ වාගේම, මේ රටේ විදුලි පද්ධතිය තුළ විදේශීය ආයෝජකයන් වාගේම දේශීය ආයෝජකයන් වෙන් වෙන්ව සහ එක්ව කටයුතු කිරීමෙන් පමණයි අපේ පද්ධතිය දියුණු කර ගන්න පුළුවන්. ඒ නිසා අපි එක පැත්තකින් වාහන රටට අරන් එන්න අවශ්‍ය කරන රෙගුලාසි මේ ආකාරයෙන් හදන අතරේ අපේ විදුලි පද්ධතිය දියුණු කර ගන්න අවශ්‍ය කරන ආයෝජන අරන් එන්නත් ඕනෑ.

මම බලාපොරොත්තු වෙනවා මෙවර අය වැයෙන් charging stations සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශය එකතු වෙලා කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරයි කියලා. මේ charging stations අපේ රටට වැඩි වැඩියෙන් සීමිත කාලයක් තුළ හඳුන්වා දීම ප්‍රමුඛ කාර්යයක්. මේක අමාරු දෙයක් නොවෙයි. ඒක මහවැලිය හදනවා වාගේ අමාරු දෙයක් නොවෙයි. ඒක පහසුවෙන් කරන්න පුළුවන් දෙයක්. මොකද, ලංකාවේ සියයට සියයක්ම විදුලි පද්ධතිය ජාතික පද්ධතියට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ සඳහා පුනර්ජනනීය බලශක්තිය අපට පාවිච්චි කරන්න පුළුවන්. බැටරි තාක්ෂණය අද දියුණු වෙලා තිබෙනවා. ඒ වාගේම, ලංකාව තුළ පවා මේ charging stations හදන්න පුළුවන් දේශීය තාක්ෂණයක් තිබෙනවා. ඒ නිසා අපට පුළුවන්කම තිබෙනවා, වැඩි වැඩියෙන් විදුලි මෝටර් රථ සහ හයිබ්‍රිඩ් මෝටර් රථ පරිහරණය කිරීම දිරිමත් කරන්න. ඒ හරහා එක පැත්තකින් ආණ්ඩුවට ආදායමක් ලැබෙනවා. තවත් පැත්තකින් පරිසරය ආරක්ෂා වෙනවා. අනෙක් පැත්තෙන් අපේ විදුලි පද්ධතිය දියුණු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලසුනේ සිටියදී වැදගත්ම කරුණක් කියන්න අවශ්‍යයි. මේ රටේ දේශපාලකයන්ගේ වගකීම පිළිබඳව, වගවීම පිළිබඳව තිබෙන ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක්. මේ රටේ විධායකය අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආකෘතිය ඉතා පැහැදිලියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදයේ "විධායකය" යටතේ 42, 43, 44, 45, 46 කියන ව්‍යවස්ථාවලින් ජනාධිපතිවරයා, ජනාධිපතිවරයාගේ නියෝජිතයන් වන කැබිනට් ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු - නියෝජ්‍ය ඇමතිවරු- පාර්ලිමේන්තුවට වගකිව යුතුයි කියන මූලධර්මය ස්ථාපනය කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවට තිබෙන මේ වගකීම පරීක්ෂා කරන එක ක්‍රමයක් තමයි විශ්වාසභංග යෝජනා ගෙන ඒම. මීට කලින් මේ පාර්ලිමේන්තුවට රජයට විරුද්ධව විශ්වාසභංග යෝජනා ගෙනැල්ලා තිබෙනවා; අගමැතිවරුන්ට විරුද්ධව විශ්වාසභංග යෝජනා ගෙනැල්ලා තිබෙනවා; කථානායකතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනා ගෙනැල්ලා තිබෙනවා. 1981දී අමිර්තලිංගම් හිටපු විපක්ෂ නායකතුමාටත් විරුද්ධව - එතුමා අපේ පාර්ලිමේන්තුවේ ධුරයක් දරපු කෙනෙක් - විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම් නියෝජ්‍ය ඇමතිවරුන් සහ රාජ්‍ය ඇමතිවරුන් ද මේ පාර්ලිමේන්තුව තුළ විශ්වාසභංග යෝජනාවක් මඟින් ප්‍රශ්න කිරීමේ වගවීමට යටත් විය යුතුයි. විපක්ෂය විසින් විධිමත් වූ විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් කළාට පසුව මාධ්‍ය හරහා ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා, නියෝජ්‍ය ඇමතිවරයෙකුට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්න බැහැ, ස්ථාවර නියෝගවල එහෙම දෙයක් නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මගේ අතේ තිබෙන්නේ ස්ථාවර නියෝග සඳහන් පොත. මේ ස්ථාවර නියෝගවල කැබිනට් ඇමතිවරුන් ගැන සඳහන් කරලාත් නැහැ, නියෝජ්‍ය ඇමතිවරුන් ගැන සඳහන් කරලාත් නැහැ, රාජ්‍ය ඇමතිවරුන් ගැන සඳහන් කරලාත් නැහැ, ආණ්ඩුවට විරුද්ධව ගෙනෙන විශ්වාසභංග යෝජනා ගැන සඳහන් කරලාත් නැහැ. ඒ නිසා නියෝජ්‍ය ඇමතිවරුන්ට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්න බැහැ කියා ස්ථාවර නියෝගවල සඳහන් වෙන්නේ නැහැ කියන තර්කය අදාළ වන්නේ නැහැ. මොකද, කිසිම විශ්වාසභංග යෝජනාවක් ගැන හෝ දෝෂාරෝපණ යෝජනාවක් ගැන මේ Standing Ordersවල සඳහන් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු කථානායකතුමා දෙන්න යනවා තීරණයක්. පසුගිය අඟහරුවාදා එය මූලිකවම ප්‍රතික්ෂේප කරනවා. මේ රටේ ප්‍රධාන පුවත් පතක් වන "ලංකාදීප" පුවත්පතද ඇතුළුව ප්‍රධාන පෙළේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මාධ්‍යවේදීන් "විශ්වාසවන්ත මූලාශ්‍රවලින් කියයි" කියලා, සඳහන් කර තිබෙනවා. කථානායකතුමාගේ හිතත් කියවන්න පුළුවන් මාධ්‍යවේදීන් මේ රටේ ඉන්නවා. අංජුල මහීක මහත්මයාත්, හේවාජුලි මහත්මයාත් ජොෂ්ඨ මාධ්‍යවේදීන්. ඔවුන් නිකම්ම ලියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියන්නේ, ගරු කථානායකතුමා ඒක කළා වෙන්න බැහැ. එහෙම නම් මේ ආණ්ඩුවේ යම් මූලාශ්‍රයක් -පාර්ලිමේන්තුවේ ධුර දරන මූලාශ්‍රයක්- විසින් මේ රටේ වැදගත්ම ප්‍රශ්නයක් පිළිබඳව, එනම් පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉෂ්ට නොවී තිබියදී පාස්කු ඉරුදින ප්‍රහාරයේ සාක්ෂිකරුවන් වසන් කිරීම සහ පාස්කු ඉරුදින ප්‍රහාරයේ පරීක්ෂණ යටපත් කිරීම පිළිබඳව චෝදනා ලබා තිබෙන තැනැත්තෙකු රටේ නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය ධුරය දරන එක පිළිබඳව ප්‍රශ්න කරන්න පාර්ලිමේන්තුවට විශ්වාසභංග යෝජනාවක් අරගෙන ආවාම ඒ විශ්වාසභංග යෝජනාව යටපත් කරන්න, ඒක ගැන වාද නොකර මූලිකව ප්‍රතික්ෂේප කරන්න කටයුතු කරනවා විය යුතුයි. එහෙම කරන්න මේ රජයට වුවමනාවක් තිබෙනවා. මට පුදුමත් හිතෙනවා. මොකද, මන්ත්‍රීවරුන් 159දෙනෙක් ඉන්න ආණ්ඩුවක්, මේක. ඕනෑම යෝජනාවක් හරි වුණත්, වැරැදි වුණත් ඕනෑ නම් ප්‍රතික්ෂේප කරන්න මේ ආණ්ඩුවට පුළුවන්. එය විවාද කරන්නේත් නැතිව ප්‍රතික්ෂේප කිරීම සඳහා හැකියාවක් ද මේ ආණ්ඩුවට තිබෙනවා. මම දන්නේ නැහැ, ගරු සභානායකතුමාට එහෙම වුවමනාවක් තිබෙනවාද කියලා. හැබැයි, මේ පාර්ලිමේන්තුව තුළ පෙනෙන්න තිබෙන කාරණය එයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය පිළිගන්න පුළුවන් "Parliamentary Practice in Sri Lanka" පොත ලියා තිබෙනවා, ප්‍රියානි විජේසේකර මහත්මිය. අපි කවුරුත් පිළිගන්නවා, එතුමිය විශේෂඥතාවක් තිබෙන, නීති විශාරදවරියක බව. එතුමිය මොකක්ද කියන්නේ? එතුමිය කියනවා, Motion එකක කාර්යය සඳහා "Deputy Ministers are also deemed to be Members of the Cabinet" කියලා. ඒ කියන්නේ, Motion එකක් පිළිබඳ කාරණයේදී නියෝජ්‍ය ඇමතිවරුන්ද කැබිනට් ඇමතිවරුන් හා සමානව සලකන්න ඕනෑ කියන එකයි. ඒ විතරක් නොවෙයි. Motion එක පිළිබඳ කාරණය ගැන සඳහන් කරමින් කියනවා, 1981දී හිටපු විපක්ෂ නායක අමිර්තලිංගම් මහත්මයාට විරුද්ධවත් විශ්වාසභංග යෝජනාවක් අරගෙන ආවා කියලා. ඒ නිසා කැබිනට් ඇමතිවරුන්ට පමණක් විශ්වාසභංග යෝජනා ගෙනෙනවා කියලා එකක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා, එහෙම practice එකක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරු හරි මොනවා හරි හේතුවක් හින්දා විශ්වාසභංග යෝජනාව මූලිකව ප්‍රතික්ෂේප කිරීම සඳහා බලපෑම් කරනවා නම්, ඒ සඳහා වැඩ කටයුතු කරනවා නම් එය මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දැනුමක් නැතිකම, විශ්වාසයක් නැතිකම. ඒ වාගේම එය ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන්, රාජ්‍ය ඇමතිවරුන් මේ පාර්ලිමේන්තුවට වගකීම පිළිබඳ ඒ කාටත් පිළිගන්න පුළුවන් මූලධර්මය ප්‍රතික්ෂේප කිරීමක්.

චෝදනාවේ අන්තර්ගතය ගැන මම කථා කරන්නේ නැහැ. චෝදනාවේ අන්තර්ගතය පිළිබඳව වාද කරන්න පුළුවන්, ඡන්දය විමසීම් කරන්න පුළුවන්. හැබැයි මේ පාර්ලිමේන්තුව හරහා ලබන ධුරයකට, විධායකයේ කොටසක් වන තැනැත්තෙකුට එරෙහිව විශ්වාසභංගයක් අරගෙන එන්න තිබෙන අයිතිය අපි ස්ථාපිත කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය වැළැක්වීමට ගන්නා උත්සාහයක් තිබෙනවා නම්, ඒක සාධාරණ නැහැ. මම හිතන්නේ නැහැ බිමල් රත්නායක මහත්මයා එහෙම කරයි කියලා. එතුමාගේ කන්තෝරුව මාධ්‍යවලට මෙවැනි තොරතුරක් දුන්නා කියලාත් මම හිතන්නේ නැහැ. කවදාවත් එතුමා එහෙම කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා එම විශ්වාසභංගය විවාදයට ගන්න අවශ්‍යයි. විවාදයට අරගෙන අපි එහි අන්තර්ගත කරුණු ගැන වාද කරමු.

බොහොම ස්තුතියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ගෙදර යන ගමන් පොඩි ෂොට් එකක් දීගෙන ගිය නිසා යමක් කිව යුතුයි. නැත්නම්, මම කථා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකේ ඉදිරිපත් වෙලා තිබෙන content එක සම්බන්ධ විවාදයකට අපි ඇත්තටම එකඟයි. ප්‍රශ්නය තිබෙන්නේ, ඒක procedural වෙන්න ඕනෑ. මා හිතන්නේ ඒක අප මත තීරණය වන දෙයක් නොවෙයි කියලායි. ගරු කථානායකතුමා සහ ලේකම් මණ්ඩලය විසින් ඒ ගැන තීන්දුවක් අරගෙන කියන්න. අපි ඒ අනුව කටයුතු කරන්නම්. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ, ඒ සම්බන්ධයෙන්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, thank you so much.

රීති ප්‍රශ්නයක් අහන්න හදන්නේ. ඒ, Standing Order No. 83 (1) ගැනයි. ඊයේත් මේක කථා වුණා. මේක කරුණාකරලා පැහැදිලි කරන්න. Standing Ordersවල English version එක තියෙන හින්දා මා එය කියවන්නම්. මට තත්පර 10ක් දෙන්න, මම මේක කියලා ඉවර කරන්නම්. Standing Order No. 83.(1) states, I quote:

> "83. (1) The personal conduct of the President, or the Acting President, Members of Parliament, Judges or other persons engaged in the administration of justice shall not be raised except upon a substantive motion; and in any proceedings, question to a Minister, or remarks in a debate on a motion dealing with any other subject reference to the conduct of any such person shall be out of order."

Standing Order No. 83(2) කියවන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you had raised this yesterday also.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
But, Sir, there was no clear idea.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We will refer it to the Hon. Speaker's consideration, Hon. Member.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, please get this cleared in this august Chamber itself so that we would not have the same issues arisen again.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Secretary-General's Office says that this has already been referred to the Hon. Speaker's consideration, Hon. Member.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර මතුවෙච්ච කාරණයක් පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. අපේ ගරු මන්ත්‍රීතුමා මතු කළා, ඉලෙක්ට්‍රික් වාහන සම්බන්ධයෙන් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී මතු කළා කියන කාරණය. අපි ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, ඒ කාරණය මතු කිරීම ගැන. එතැනදී අදහසක් එනවා අපි ඒකට මැදිහත් වුණේ නැහැ කියලා. ඇත්තටම ඒක වැරදියි. ඒ ප්‍රශ්නය මාස එකහමාරකට දෙකකට පෙර පැන නැඟුණු වහාම මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිතුමා මට ඒක යොමු කළාම, අපි ආනයනකරුවන්, රේගු දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ගෙන්වා සාකච්ඡා වට ගණනාවක් පැවැත්වූවා. ඒ ලියවිලි දෙකම අපට ලැබුණා, ඒක ලබා දුන්නා. ඒ අනුව පරීක්ෂණ සිද්ධ වුණා. ඇත්තටම අපි ඒක මාධ්‍යයට එළිදරව් කළේ නැත්තේ එය වාහන වෙළෙඳ පොළේ තිබෙන price sensitivity එක වාගේ කාරණයක් වන නිසා. ඉතින් ඒ කාරණය මතු කරන්න ඕනෑ. ඒ කාරණය පාර්ලිමේන්තුවේදී මතු කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, make your comment very short, please. We are running out of time.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා මේ රටේ නීතිය සම ලෙස ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්. හැබැයි එක දෙයක් කළ යුතුව තිබෙනවා. මහා පරිමාණ සමාගම්වලටත්, සුළු පරිමාණ ඒජන්තවරුන්ටත් සම බිමක්, ඒ කියන්නේ සමානව මේ වෙළෙඳ පොළේ තරග කිරීමට වාතාවරණයක් සකස් කර දෙන්න ඕනෑ. විශේෂයෙන්ම රථ වාහන ලංකාවට ගෙන එන සුළු පරිමාණ ඒජන්තවරුන් විශාල ලෙස පීඩාවට පත් වෙලා සිටිනවා, මහා පරිමාණ සමාගම්වල ක්‍රියාකාරිත්වය නිසා. ඒ නිසා ඒ හැමෝටම සම බිමක් සකස් කිරීම, හැමෝටම නීතිය සමානව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Anura Karunathilaka. You have 14 minutes.

[පූ.භා. 11.36]

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව තීරකවරුන් ලියාපදිංචි කිරීමේදීත්, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදීත්, ඔවුන්ගේ වර්ගීකරණයේදීත් ශ්‍රේණිගත කිරීමට අදාළ නිර්ණායක වරින් වර ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. ඒ වාගේම ඒ පනතේම 52 වගන්තිය අනුව තීරකවරුන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව සහ ඒ පිළිබඳ නියෝග විෂය භාර අමාත්‍යවරයා විසින් වරින් වර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. ඒ වාගේම 58 (1) වගන්තියට අනුකූලව, 2025.04.01 දිනැති අංක 2430/15 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මේ කරුණු පිළිබඳ නිර්ණායක ගැසට් කර තිබෙනවා. ඒ අනුව අද අපි ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගැනීම තමයි බලාපොරොත්තු වෙන්නේ. මම මේ ගැසට් නිවේදනවලට අනුව අලුතින් නිර්ණායක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් කරන්නම්. උදාහරණයක් හැටියට ගත්තාම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තීරකවරුන් කියලා කියන්නේ සේවා යෝජකයන් සහ කොන්ත්‍රාත්කරුවන් අතර ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව යම්කිසි ගැටලුවක්, ආරාවුලක් පැනනැඟුණාම ඒවා නිරාකරණය කිරීම සඳහා කටයුතු කරන අය. එවැනි අවස්ථාවල ඒ තීරකවරුන්ගේ සහාය ලබා ගන්නවා. එතකොට, ඒ තීරකවරුන් හඳුනාගෙන ලියාපදිංචි කරන්නේ, ඔවුන්ගේ සුදුසුකම් ලියාපදිංචි කරන්නේ ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ CIDA එක. CIDA එක මේ අය ලියාපදිංචි කරනකොට, 2019 නිකුත් කරපු ගැසට් නිවේදනය අනුව ඒ තීරකයන් ලියාපදිංචි කිරීමේ ගාස්තුවයි, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුවයි එකම අගයක තිබුණේ, රුපියල් 20,000ක් ලෙස. එතකොට විශේෂයෙන් ඒ වෘත්තිකයන් අතර සාකච්ඡාවක් තිබුණා, මේ ලියාපදිංචි කිරීමේ ගාස්තුවත්, අලුත් කිරීමේ ගාස්තුවත් රුපියල් 20,000ක එකම අගයක පැවතීම සාධාරණ නැහැ කියලා. ඒ අනුව මේ අලුත් නියෝග මඟින් ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රුපියල් 5,000 දක්වා අඩු කරලා තිබෙනවා.

ඒ වාගේම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 35වැනි වගන්තිය අනුව කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී ඒ

[ගරු අනුර කරුණාතිලක මහතා]

ලියාපදිංචි කළ යුතු ආකාරය, ඔවුන් ශ්‍රේණිගත කිරීමේදී සැලකිය යුතු කාරණා පිළිබඳ නිර්ණායක ඉදිරිපත් කරන්න ඕනෑ. මේ පනත මඟින් ඒ නිර්ණායක සහ ලියාපදිංචි කිරීමේ ගාස්තුවලට අපි සංශෝධන ඉදිරිපත් කරනවා. විශේෂයෙන් ප්‍රධාන කොන්ත්‍රාත්තු වර්ගීකරණයේදී C9 ඉඳලා CS2 දක්වා ශ්‍රේණි 11ක් තිබෙනවා. විශේෂ කොන්ත්‍රාත් වර්ගීකරණයේදී තවත් ශ්‍රේණි 5ක් තිබෙනවා. භූ තාක්ෂණික ජම්බාර, ඒ කියන්නේ geotechnical pilingවල ශ්‍රේණි 4ක් තිබෙනවා. ඒ වාගේම, පෙරනිමි ජම්බාර - precast piling - ශ්‍රේණිගත කිරීම් එකක් තිබෙනවා. මේ ගැසට් නිවේදනය මඟින් අන්න ඒ කොන්ත්‍රාත්කරුවන් වර්ගීකරණයේදී යම් යම් නිර්ණායකවල සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙහිදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මේ කාරණයත්. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී ඒ ඒ කොන්ත්‍රාත්කරුවන් එක් නිශ්චිත කාලයක පවත්වාගත යුතු ව්‍යාපෘතිවල වටිනාකම සඳහන් වෙනවා. එතකොට කිසියම් කොන්ත්‍රාත්කරුවෙක් ටෙන්ඩරයකට ඉල්ලනකොට ඔහු ඒ වෙනකොට ක්‍රියාත්මක කරගෙන යන ව්‍යාපෘතිවල වටිනාකම කීයද කියන එක සේවායෝජකයාට ඉදිරිපත් කරන්න ඕනෑ.

අපි දන්නවා, පසුගිය කාලවල විවිධ හේතු නිසා ව්‍යාපෘතිවල වටිනාකම ඉහළ ගොස් තිබෙන බව. කලින් පාලමක් හදන්න ගිය මුදලට වඩා වැඩි මුදලක් ඒ හා සමාන පාලමක් හදන්න දැන් වැය වෙනවා. ඒ නිසා මේ නියෝග මඟින් අපි බලාපොරොත්තු වෙනවා, පැරණි සීමා තවදුරටත් පවත්වාගෙන යෑම ප්‍රායෝගික නැති නිසා ඒ සීමා ඉහළ දාන්න. උදාහරණයක් හැටියට ගත්තොත්, ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ගෙන් CS2වල ඉන්න අයගේ කලින් තිබුණු සීමාව අනුව රුපියල් මිලියන 3,000ට වැඩි ව්‍යාපෘති වටිනාකමක් තමයි ඔවුන්ට පවත්වාගෙන යන්න පුළුවන්කම තිබුණේ. මේ නව නියෝග මඟින් ඒ සීමාව රුපියල් මිලියන 6,000 දක්වා ඉහළ නංවලා තිබෙනවා. ඒ වාගේම, CS1වල ඉන්න අයගේ කලින් තිබුණු සීමාව රුපියල් මිලියන 1,500 සිට රුපියල් මිලියන 3,000 දක්වායි. මේ අලුත් නියෝග මඟින් එය රුපියල් මිලියන 3,000 සිට රුපියල් මිලියන 6,000 දක්වා වැඩි කරලා තිබෙනවා. අන්න ඒ විධියට ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ගේ, ඒ වාගේම විශේෂ ශ්‍රේණිවල ඉන්න කොන්ත්‍රාත්කරුවන්ගේ ඒ ව්‍යාපෘතිවල ව්‍යාපාරික වටිනාකම, මූල්‍ය වටිනාකම ඉහළ දැමීමට අපි කටයුතු කරලා තිබෙනවා. ප්‍රධාන වශයෙන් ඒ සඳහා කටයුතු කරන්න හේතුව තමයි ඒ ව්‍යාපෘතිවල මූල්‍ය වටිනාකම මේ වෙනකොට ඉහළ ගොස් තිබීම.

ඒ වාගේම අපි මෙහිදී බලාපොරොත්තු වුණා, මේ අලුත් නිර්ණායක මඟින් විශේෂ ශ්‍රේණියේ ඉන්න විදුලි යාන්ත්‍රික සේවා සපයන කොන්ත්‍රාත්කරුවන්ගේ නිර්ණායකවලත් කිසියම් සංශෝධනයක් කරන්න. මොකද, අද වෙනකොට පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ සාකච්ඡා වෙනවා. ඒ පිළිබඳ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අලුතින් සූර්ය බල පද්ධති, සුළං බල පද්ධති වැනි පුනර්ජනනීය බල පද්ධති ඇතුළත්ව විදුලි ස්ථාපන කියන category එක - කලින් තිබුණේ විදුලි ස්ථාපන කියන category එක විතරයි - තවදුරටත් විස්තර කරලා සූර්ය බල පද්ධති, සුළං බල පද්ධති ආදී පුනර්ජනනීය බලශක්ති පද්ධතිය ඇතුළත්ව මේ නිර්ණායක ගැසට් කරන්න, නියෝග නිකුත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපි මේ අලුත් නියෝග මඟින්, විශේෂයෙන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ කොන්ත්‍රාත්කරුවන්ගේ යෝග්‍යතාව සැලකිල්ලට ගන්නකොට ඒ යෝග්‍යතාවට අදාළව තිබෙන කරුණු වැඩිදුර විස්තර කිරීම කියන එක බලාපොරොත්තු වෙනවා. කලින් තිබුණු නියෝගවල ඒවා යම් ප්‍රමාණයකට තිබුණාට වඩා සවිස්තර විස්තර - ඔවුන්ගේ මූල්‍ය ධාරිතාව, තාක්ෂණික ධාරිතාව, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල ධාරිතාව ආදී - සලකා බැලිය යුතු අනෙකුත් කරුණු පිළිබඳ සවිස්තර සටහන් මේ අලුත් නියෝග මඟින් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, වර්තමානයේ ISO 9000 තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහතික කළ යුතු කාණ්ඩ මොනවාද, විවිධ තත්ත්ව සහතික කළ යුතු කාණ්ඩ මොනවාද කියන එක සම්බන්ධයෙන් අපි මෙතැනින් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන් ධාරිතා ක්ෂේත්‍රය පිළිබඳ වැඩි විස්තර ඉදිරිපත් කරනකොට ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍යය, අඛණ්ඩ ධාරිතා සංවර්ධනය, ඉදිරි පෙළ විශිෂ්ට සම්මාන, බාහිර අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව ලබා දීම, ආයතනික වශයෙන් සමාජයේ වගකීම, ශ්‍රී ලංකා ඉදිකිරීම් සංගමයේ සාමාජිකත්වය වාගේ කරුණු සම්බන්ධයෙන් ලකුණු ලබා දීමේ වැඩ පිළිවෙළක් හරහා අලුත් කරුණු කිහිපයක් මෙතැනට ඇතුළත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලියාපදිංචි කිරීමේ ගාස්තුවේ සංශෝධනයකුත් මෙහිදී කරන්න බලාපොරොත්තු වෙනවා. 2012දී තමයි අවසන් වරට මේ සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙන්නේ. 2022දී කරපු සංශෝධන මඟින් සමාජ ආරක්ෂණ බද්ද ඉදි කිරීම් ක්ෂේත්‍රයට හඳුන්වා දීලා තිබෙනවා. මෙන්න මේ අතිරේක වියදම ගාස්තු පද්ධතියට අවශෝෂණය කරන්න පුළුවන් වන විධියට ඒ අවශ්‍ය ගාස්තු සංශෝධනය සඳහා අපි කටයුතු කරලා තිබෙනවා. ඒ තත්ත්වය තමයි අපි අලුත් නියෝග මඟින් ඇති කරන්න බලාපොරොත්තු වෙන්නේ. ආර්ථිකය කොයි තරම් දුරට ශක්තිමත්ව ගලාගෙන යනවාද, නැද්ද කියන එක පෙන්නුම් කරන එක සාධකයක් තමයි ඒ රටේ ඉදි කිරීම් ක්ෂේත්‍රය කොයි තරම් දුරට ශක්තිමත්ව තිබෙනවා ද නැද්ද කියන එක. සාමාන්‍යයෙන් පසුගිය කාලයේ ඇති වූ ආර්ථික අර්බුදයත් එක්ක පළමුවෙන්ම බලපෑමට ලක් වෙච්ච ක්ෂේත්‍රයක් තමයි ඉදි කිරීම් ක්ෂේත්‍රය. අලුත් ආණ්ඩුව බලයට පත් වෙනකොට අපි දැන ගෙන හිටියා මේ ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීමේ අභියෝගය අපට තිබෙනවා කියලා. රුපියල ස්ථාවරව පවත්වා ගෙන යෑම, පොලී අනුපාතය තනි ඉලක්කමට ගෙනෙන එක, උද්ධමන අනුපාතය පාලනය කරන එක -ඒක තනි ඉලක්කමට ගෙනැල්ලා තිබෙනවා- රාජ්‍ය වියදම ඉහළ ගියත් ඊට සාපේක්ෂව ආදායම් වැඩි කර තිබෙන නිසා රාජ්‍ය ආදායම සහ වියදම අතර තිබෙන පරතරය අඩු කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ වාගේම රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදායම් ඉලක්ක සපුරා ගැනීමට සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම නාස්තිය, දූෂණය අවම කරන්නත් කටයුතු කරලා තිබෙනවා. මෙන්න මේවාත් එක්ක ඇති වෙච්ච මහජන විශ්වාසය නිසා විදේශීය ප්‍රේෂණ වැඩි වැඩියෙන් දැන් ලංකාවට එනවා. ඒ වාගේම සංචාරකයන්ගේ පැමිණීම ඉහළ ගිහිල්ලා තිබෙනවා. ආර්ථිකයේ ස්ථාවරත්වය ඇති වෙලා තිබෙනවාය කියන එකට සමහර නිර්ණායක තමයි, අපට මේ හුදු සංඛ්‍යාවලට වඩා ඒ ආර්ථික ස්ථාවරත්වය පත් වෙන බව සඳහන් කරන්න පුළුවන් බව සහතික කරන නිර්ණායක. ඒ විතරක් නොවෙයි, මේ ආර්ථික ස්ථාවරත්වය වාගේම ආණ්ඩුව තුළ තිබෙන විශ්වාසය නිසා තමයි සමහර ඍජු, bold decisions ගන්න පුළුවන්කම ලැබුණේ. රජයේ සේවකයන්ගේ වැටුප් ඉහළ නංවන එකත් එක්කම, දැනටත්මත් අපි තීරණය කරලා තිබෙනවා රජයේ සේවයේ 62,000ක් පුරප්පාඩු පුරවලා අලුතින් සේවකයන් බඳවා ගන්න, ඒ වාගේම දැනට නතර කර තිබෙන මහා පරිමාණයේ සමහර ව්‍යාපෘති නැවත ආරම්භ කරන්න. ඉදිරියේදී මේ ප්‍රමාණය තවදුරටත් වැඩි වෙයි. මෙන්න මේ වාගේ කරුණු පිළිබඳව අපට ඍජු තීරණ ගන්න පුළුවන්කම ලැබුණේ ආර්ථිකයේ ස්ථාවරත්වය පිළිබඳව අපට තිබෙන විශ්වාසය නිසායි.

නමුත් අපි දන්නවා, සමහර ක්ෂේත්‍ර අපි බලාපොරොත්තු වුණු ප්‍රමාණයටම ඉහළ නංවන්න තවමත් අපට පුළුවන්කමක් ලැබිලා

නැති බව. ඉදිකිරීම් ක්ෂේත්‍රය කියන්නේත් අන්න ඒ වාගේ ක්ෂේත්‍රයක්. මේ අවුරුද්දේ පළමුවැනි මාස හයට සාපේක්ෂව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යම් ප්‍රගතියක් දකින්න තිබුණත්, රජයක් හැටියට අපි බලාපොරොත්තු වෙන මට්ටමට ළඟා වෙන්න තවමත් අපි සමත් වෙලා නැහැ. ඒ නිසා ඉදිරි අවුරුද්ද තුළ ජල සම්පාදන, අධ්‍යාපන, සෞඛ්‍ය, වාරි මාර්ග, මහා මාර්ග වාගේ ක්ෂේත්‍රවල කටයුතු සඳහා තවදුරටත් අවස්ථාව ලබා දෙමින්, ඒ අවස්ථාවන් පුළුල් කරමින්, ඉදිකිරීම් ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ප්‍රතිපත්තිමය තීන්දු කිහිපයක් ගන්න මේ වෙනකොටත් අපි සාකච්ඡා කරලා තිබෙනවා. මේ වෙනකොට අපි සාකච්ඡා කරමින් ඉන්නවා, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - CIDA - සම්බන්ධ පනත සංශෝධනය කරන්න. සැලසුම් අනුමත කිරීම, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම වාගේ කටයුතු දැනට ඔවුන්ට කරන්න පුළුවන්. නමුත් ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සහතික කිරීම සඳහා ඔවුන්ට ශක්තිමත්භාවයක්, arm එකක් නැහැ. ඒ නිසා පනත සංශෝධනයෙන් ඒ ශක්තිය CIDA එකට ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපට තිබෙන තවත් ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් නොමැති වීම. අපි මේ වෙනකොට ඒ අදාළ වෘත්තිකයක් සමඟ සාකච්ඡා කරලා, CIDA එක හරහා ඉදිකිරීම් ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඔක්තෝබර් මාසය අවසන් වෙනකොට green paper එකක් introduce කරන්න අපට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ green paper එක introduce කරලා, ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ විවිධ ආයතන - associations - වාගේම වෘත්තිකයන් සමඟත් සාකච්ඡා කරලා, ඒ ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කරලා ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කරන්න කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, මේ වන විට ඉදිකිරීම් ක්ෂේත්‍රය ශක්තිමත්ව ඉදිරියට ගලා යාම සඳහා පවතින යම් යම් බාධාවන් පිළිබඳව සාකච්ඡාවක් ක්ෂේත්‍රය තුළ ඇති වෙලා තිබෙන බව. සමහර Procurement Guidelines වාගේම, Procurement Manual එකේ තිබෙන සමහර කාරණා ඍජු හා කාර්යක්ෂම තීරණ ගැනීමට කොයි තරම් දුරට බලපෑමක් ඇති වෙනවාද, ඒ වාගේම ඍජු හා කාර්යක්ෂම තීරණ ගැනීමේදී ඒ නිලධාරීන්ට විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමට ඒ තුළින් යම් බාධාවක් එනවාද යනාදිය පිළිබඳවත් සාකච්ඡා කරලා, ඒ සඳහා යම් යම් සංශෝධන ගෙන එන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශක්තිමත් ආර්ථිකයක් හදන්න, ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යන්න අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා. ඒ තුළින් මහ ජනතාවට ලැබිය යුතු ප්‍රතිඵල ලබා දීම, අත්පත් කර දීම තමයි අපේ ඊළඟ කාර්යභාරය වෙන්නේ. ඒ නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමෙන් අපේ ආර්ථිකය ඉදිරියට ගලා යාම සඳහා අවශ්‍ය, සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගන්න අපි බලාපොරොත්තු වෙන බව සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Thurairasa Ravikaran. You have 16 minutes.

[மு.ப. 11.50]

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் இச்சபையில் சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம், உற்பத்தித் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளை, நிதிச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் என்பன தொடர்பான விவாதம் இடம்பெறுகின்றது. இவை தொடர்பில் இங்கு நல்ல பல கருத்துக்கள் சொல்லப்பட்டன. அந்தக் கருத்துக்கள் எங்களாலும் ஏற்றுக்கொள்ளப்படுகின்றன. இருந்தாலும், எனக்குக் கிடைத்திருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில் எங்களுடைய மக்களால் தாங்கிக்கொள்ள முடியாத சில விடயங்கள் பற்றி கருத்துச் சொல்ல விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மன்னார் மக்கள் இன்றோடு 19 நாட்களாகத் தொடர் போராட்டத்தில் ஈடுபட்டு வருகின்றனர். மன்னார் தீவில் காற்றாலை மின் உற்பத்திக் கோபுரங்களை அமைக்கக்கூடாதென வலியுறுத்தியே அவர்களால் இவ்வாறு தொடர் போராட்டம் முன்னெடுக்கப்பட்டு வருகின்றது. இந்த விடயம் தொடர்பாக இம்மாதம் 13ஆம் திகதி மாண்புமிகு சனாதிபதியைச் சந்தித்துக் கலந்துரையாடி இருந்தோம். அதற்கமைய, இக்காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை ஒருமாத காலத்துக்கு இடைநிறுத்தி வைப்பதெனவும் இத்திட்டம் தொடர்பில் உரிய தரப்பினர், மக்களிடம் அபிப்பிராயங்களைப் பெற வேண்டுமெனவும் தீர்மானிக்கப்பட்டது. இந்த நிலையில், ஏற்கெனவே மன்னார் தீவின் தெற்குக் கரையில் கடந்த 2020ஆம் ஆண்டு 'தம்பபவனி' எனும் பெயரில் 30 நவீன விசையாழிகளை உள்ளடக்கி இலங்கையின் முதலாவது பெரிய காற்றாலை மின் சக்திப் பூங்கா அமைக்கப்பட்டுள்ளது. இதனைவிட, மன்னார் தீவுக்கு வெளியேயும் வங்காலை மற்றும் நறுவிலிக்குளம் ஆகிய பகுதிகளிலும் 6 காற்றாலை மின் உற்பத்திக் கோபுரங்கள் அமைக்கப்பட்டுள்ளன. அந்த வகையில், நாட்டின் பொருளாதாரத்துக்கும் நாட்டின் மின்சாரத் தேவைக்குமென ஏற்கெனவே தம்மால் பாரிய பங்களிப்பு வழங்கப்பட்டுள்ளது என்பதே மன்னார் தீவு மக்களின் அபிப்பிராயமாகும். அத்தோடு, சிறிய அளவிலான நிலப்பரப்பைக் கொண்ட மன்னார் தீவில் மீண்டும் காற்றாலை மின் உற்பத்திக் கோபுரங்களை நிறுவினால், மக்கள் அங்கு வாழ முடியாத துர்ப்பாக்கிய நிலை ஏற்படுமென்பது அம்மக்களின் அபிப்பிராயமாக உள்ளது. எனவே, இந்த விடயத்தில் மன்னார் தீவு மக்களின் இந்த அபிப்பிராயங்களைக் கருத்திலெடுத்து, உரிய நடவடிக்கைகளை முன்னெடுக்குமாறு வலியுறுத்திக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, எம்மையெல்லாம் உலுக்கிக்கொண்டு இருக்கும் ஒரு விடயம் பற்றி சொல்ல வேண்டும். செம்மணி சிந்துபாத்தி மனிதப் புதைகுழி அகழ்வாய்வில் பன்னாட்டுக் கண்காணிப்பு அவசியம் என்பதை வலியுறுத்துவதுடன், பன்னாட்டு நிபுணத்துவம் பின்பற்றப்பட்டு அகழ்வுப் பணிகள் முன்னெடுக்கப்பட வேண்டுமெனவும் இந்த உயரிய சபையில் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அத்தோடு, செம்மணி அகழ்வாய்வுப் பணிகளுக்குரிய தொழில்நுட்பம்சார் நிபுணத்துவத்தை வழங்குவது தொடர்பில் ஆராய்ந்து வருவதாக பிரித்தானியாவின் வெளியுறவு மற்றும் அபிவிருத்தி விவகாரங்கள் இராஜாங்கச் செயலாளர் டேவிட் லமி அண்மையில் தெரிவித்துள்ளார். அவரின் இக்கருத்தை வரவேற்பதுடன், அவருக்கு எனது நன்றிகளையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Sir, I propose that the Hon. (Prof.) Sena Nanayakkara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

இவ்வாறாக செம்மணி மனிதப் புதைகுழி விவகாரத்தில் தமது நிபுணத்துவத்தை வழங்குவதற்கு முன்வரும் பன்னாடுகளுக்கு இந்த அரசாங்கம் தனது பூரண ஒத்துழைப்பை வழங்க வேண்டுமெனவும், அகழ்வாய்வில் அனைத்து விதமான பன்னாட்டு நிபுணத்துவங்களும் பின்பற்றப்பட வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். அத்தோடு, பன்னாட்டு தடயவியல் நிபுணர்களும் பன்னாட்டு மனித உரிமைகள் நிபுணர்களும் இந்த அகழ்வாய்வில் பங்கேற்க வேண்டுமெனவும் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அதேவேளை செம்மணி சிந்துபாத்தி மனிதப் புதைகுழி விவகாரத்துக்குச் சுயாதீனமானதும் நம்பிக்கைத் தன்மை மிக்கதுமான பன்னாட்டு நீதி விசாரணையை மேற்கொள்ளுமாறு இவ்வுயரிய சபையைக் கோருகின்றேன்.

தற்போது இந்த நாட்டில் பெரும் பேசுபொருளாக யாழ்ப்பாணம், செம்மணி சிந்துபாத்தி மனிதப் புதைகுழி விவகாரம் மாறியிருக்கின்றது. செம்மணி மனிதப் புதைகுழி அகழ்வாய்வுகள் இதுவரை இரண்டு கட்டங்களாக முன்னெடுக்கப்பட்டுள்ளன. அந்த வகையில், செம்மணி மனிதப் புதைகுழியின் முதலாம் கட்ட அகழ்வாய்வுப் பணிகள் பரீட்சார்த்த அகழ்வுப் பணியாக 9 நாட்கள் இடம்பெற்று, கடந்த யூன் மாதம் 7ஆம் திகதியுடன் நிறைவடைந்தது. அதனைத் தொடர்ந்து இரண்டாம் கட்ட அகழ்வாய்வுப் பணிகளை மேற்கொள்வதற்கு நீதிமன்றத்தால் 45 நாட்கள் அனுமதி வழங்கப்பட்ட நிலையில், கடந்த யூன் மாதம் 26ஆம் திகதி இரண்டாம் கட்ட அகழ்வாய்வுப் பணிகள் ஆரம்பிக்கப்பட்டன. இவ்வாறு ஆரம்பிக்கப்பட்ட இரண்டாம் கட்ட அகழ்வாய்வுப் பணிகள் கடந்த யூலை மாதம் 10ஆம் திகதி அகழ்வாய்வாளர்களின் ஓய்வுக்காக இடைநிறுத்தப்பட்டு, 21.07.2025 அன்று மீள முன்னெடுக்கப்பட்டு வந்த நிலையில், 06.08.2025 அன்று 32ஆவது நாளுடன் இரண்டாம் கட்ட அகழ்வாய்வுப் பணிகள் இடைநிறுத்தப்பட்டன.

அந்த வகையில், இதுவரை குறித்த செம்மணி மனிதப் புதைகுழியிலிருந்து மொத்தம் 147 மனித எலும்புக் கூட்டுத் தொகுதிகள் கண்டெடுக்கப்பட்டுள்ளன. அவற்றில் 140 மனித எலும்புக் கூட்டுத் தொகுதிகள் முழுமையாக அகழ்ந்து எடுக்கப்பட்டுள்ளன. இந்நிலையில், எதிர்வரும் 22ஆம் திகதி மீண்டும் அகழ்வாய்வுப் பணிகள் முன்னெடுக்கப்பட உள்ளன. மேலும், இந்த அகழ்வாய்வுகளில் ஈடுபடும் தொல்லியல் பேராசிரியர் ராஜ்சோமதேவ 14.08.2025 அன்று நீதிமன்றுக்குச் சமர்ப்பித்த அறிக்கையில், அகழ்வாய்வுக்கு இன்னும் குறைந்தது 8 வாரங்கள் தேவைப்படுமெனச் சுட்டிக் காட்டியுள்ளார். அதேவேளை, இதுவரை மேற்கொள்ளப்பட்ட குறித்த அகழ்வாய்வில் பெண்கள், சிறார்கள், குழந்தைகள் என பலதரப்பட்டோருடைய எலும்புக்கூடுகள் மீட்கப்பட்டுள் ளதுடன், குழந்தைகள் பால் அருந்தும் போத்தல், சிறார்களின் விளையாட்டுப் பொம்மைகள், சிறுமிகளின் ஆடைகள், காலணிகள், கண்ணாடி வளையல்கள், பாடசாலைப் புத்தகப்பை என்பனவும் சான்றுப் பொருட்களாக மீட்கப்பட்டிருந்தன. இவ்வாறான கொடூரங்களைக் காணும்போது நெஞ்சமெல்லாம் பதைபதைக்கின்றது; கண்களில் நீர் நிறைகின்றது.

மேலும், இதுவரை இனங்காணப்பட்ட 147 மனித எலும்புக்கூட்டுத் தொகுதிகளில் 90 சதவீதத்துக்கும் அதிகமானவை நிர்வாணமாக்கப்பட்டுப் புதைக்கப் பட்டவர்களுடையதென கடந்த 14ஆம் திகதி சட்ட வைத்திய அதிகாரியால் நீதிமன்றுக்கு சமர்ப்பிக்கப்பட்ட அறிக்கை சுட்டிக்காட்டுகின்றது. இதன்மூலம் இங்கு பாரிய குற்றச்செயல்கள் இடம்பெற்றுள்ளன என்பதும், இந்தப் புதைகுழியில் பெண்கள், சிறுவர்கள், குழந்தைகளென பல்வேறு தரப்பினரும் மிகக் கொடூரமாகப் படுகொலை செய்யப்பட்டு புதைக்கப்பட்ட விடயமும் தற்போது அம்பலமாகி இருக்கின்றது. வார்த்தைகளில் கூறிவிட முடியாத கொடுமையான, கொடூரமான தமிழினப் படுகொலை இடம்பெற்று இருக்கின்றது என்பதற்கான மிக முக்கியமான ஆதாரமாகவே செம்மணி மனிதப் புதைகுழியைப் பார்க்க முடிகின்றது.

மேலும், வாக்குமூலம் வழங்குவோரை குற்றப்புலனாய்வுத் திணைக்களம் அச்சுறுத்துகிறது. செம்மணியில் எலும்புக் கூடுகளை அடையாளங்காணும் பணி தொடர்பான விசாரணைகளின்போது வாக்குமூலம் அளிக்க வரும் மக்கள் குற்றப்புலனாய்வுத் திணைக்களத்தினரால் அச்சுறுத்தப் பட்டுள்ளனர். இவ்விடயம் தொடர்பில் கடந்த 14ஆம் திகதி சட்டத்தரணிகளான எம்.ஏ. சுமந்திரன், கே. குருபரன், வி. மணிவண்ணன் ஆகியோரால் நீதிமன்றிலும் முறையீடு செய்யப்பட்டுள்ளது. இவ்வாறு அச்சுறுத்தி, சிரமத்துக்குள்ளாகி வாக்குமூலம் அளிக்கவரும் மக்களை அங்கு வரவிடாமல் தடுக்கும் நோக்குடன் செயற்படும் குற்றப்புலனாய்வுத் திணைக்களத்தின் இச்செயற்பாட்டை வன்மையாகக் கண்டிக்கின்றேன். இவ்வாறான அச்சுறுத்தல் செயற்பாடுகள் இனிமேல் இடம்பெறக்கூடாது எனவும் கேட்டுக் கொள்கின்றேன்.

அது மாத்திரமல்ல, படுகொலைகளோடு தொடர்புடைய படையினர் தப்பிக்காமல் இருக்க உரிய நடவடிக்கை தேவை. 1999இல் யாழ்ப்பாணத்தில் காணாமல்போனோர் குறித்து விசாரிக்க இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவால் கலாநிதி தேவநேசன் நேசையா தலைமையில் கே.எச். கமிலஸ் பெர்னாண்டோ, ஜெஸீமா இஸ்மாயில், சி.எம். இக்பால் ஆகிய நால்வர் அடங்கிய விசாரணைக் குழு நியமிக்கப்பட்டது. குறித்த விசாரணைக் குழுவால் 210 பக்கங்கள் கொண்ட நீண்ட விசாரணை அறிக்கை 2003 ஒக்ரோபர் 28ஆம் திகதி வெளியிடப்பட்டது. அவ்வறிக்கையில் காணாமல்போனவர்

களில் பெருமளவானோர் இராணுவத்தினால் கொல்லப்பட்டு இருக்கலாமெனக் குறிப்பிடப்பட்டு உள்ளதுடன், படுகொலையுடன் தொடர்புடைய இராணுவ முகாம்களின், இராணுவ அதிகாரிகளின், இராணுவத்தினரின் பெயர்களும் சுட்டிக்காட்டப்பட்டு உள்ளன. இந்த மனிதப் புதைகுழி விசாரணைகள் மும்முரமாக இடம்பெறும்போது அந்தச் சம்பவங்களுடன் தொடர்புடைய படையினர் தப்பியோட வாய்ப்புள்ளது. எனவே, அதற்கு முன்னர் உரிய நடவடிக்கைகளை மேற்கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

1996ஆம் ஆண்டு காலப் பகுதியில் செம்மணி சோதனைச் சாவடியில் இராணுவத்தினரால் மேற்கொள்ளப்பட்ட கிருஷாந்தி குமாரசாமி படுகொலை வழக்கில் குற்றவாளிகளாக இனங்காணப்பட்ட இராணுவ லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ உட்பட ஆறு இராணுவத்தினருக்கு trial-at-bar நீதிமன்றம் 1998ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 03ஆம் திகதி மரணதண்டனை வழங்கியிருந்தது. நீதிமன்றத்தின் இத்தீர்ப்பை அடுத்து, இராணுவ லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ செம்மணியில் 300 தொடக்கம் 400 வரையான மக்கள் கொன்றுகுவிக்கப்பட்டதாக நீதிமன்றில் தெரிவித் திருந்தார். இவ்வாறு சோமரத்ன ராஜபக்ஷ நீதிமன்றில் சாட்சியம் அளித்ததற்கு அமைய அப்போது மேற்கொள்ளப்பட்ட விசாரணைகள் மற்றும் அதனைத் தொடர்ந்து செம்மணியில் முன்னெடுக்கப்பட்ட அகழ்வுப் பணிகளின்போது 15 எலும்புக்கூட்டுத் தொகுதிகள் மீட்கப்பட்டிருந்தன. அந்த வகையில், சோமரத்ன ராஜபக்ஷ பன்னாட்டு விசாரணைக்கு உட்படுத்தப்பட வேண்டும்.

அதன் பின்னர் இந்த விசாரணைகள் கொழும்பு நீதிமன்றத்துக்கு மாற்றப்பட்டதைத் தொடர்ந்து இது தொடர்பான வழக்கு விசாரணைகள் கிடப்பில் போடப்பட்டுள்ளன. இந்நிலையில், இராணுவ லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ அப்போது நீதிமன்றுக்கு வழங்கிய சாட்சியத்தை ஆதாரப்படுத்தும் வகையில் தற்போது செம்மணியில் மனித எழும்புக்கூடுகள் அதிகளவில் கண்டெடுக்கப்படுகின்றன. எனவே, குறித்த வழக்கு மீள எடுத்துக்கொள்ளப்பட்டு தற்போதைய மனிதப் புதைகுழி வழக்குடன் தொடர்புபடுத்தப்பட வேண்டும். யாழ். நீதவான் நீதிமன்ற வழக்கு ஏட்டிலிருந்து கொழும்பு நீதிமன்றுக்கு அனுப்பப்பட்ட 'பி 2899' என்னும் வழக்கை மீளவும் யாழ்ப்பாணம் நீதிமன்றுக்குப் பாரப்படுத்த உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டுமெனக் கோருகின்றேன்.

இத்தகைய சூழலில் பன்னாட்டு விசாரணையொன்று முன்னெடுக்கப்படும் பட்சத்தில், 1996 காலப் பகுதியில் செம்மணி தொடக்கம் துண்டி இராணுவமுகாம் வரை இராணுவத்தால் யாழ்ப்பாணத்தில் மேற்கொள்ளப்பட்ட படுகொலைகள், 'பலசேனா' தலைமையகம் முதல் இராணுவத்தால் சித்திரவதைக் கூடங்கள் நடாத்தப்பட்ட விதம் பற்றிய விபரங்கள், மனியம் தோட்டம் பகுதியிலுள்ள புதைகுழி உள்ளிட்ட விடயங்கள் தொடர்பிலும் சாட்சியமளிக்கத் தயாராக இருப்பதாக அண்மையில் இராணுவ லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ தெரிவித்துள்ளார். முன்னாள் அரச தலைவர் சந்திரிக்கா அம்மையார், அப்போதைய பாதுகாப்புச் செயலாளர் உள்ளிட்ட தரப்பினரும் இத்தகைய வதைமுகாம்கள் தொடர்பில் அறிந்திருந்ததாகவும் குறிப்பிட்டுள்ளார். அக்காலப் பகுதியில் இத்தகைய குற்றச்செயல்களில் ஈடுபட்டவர்களாக 7ஆவது படைத் தலைமையகத்தின் புலனாய்வு அதிகாரிகளான கப்டன் லலித் ஹேவாகே, கப்டன் பெரேரா, லெப்டினன் துடுகல, லெப்டினன் உதயகுமார ஆகியோருடன் பொலிஸ் பரிசோதகர்களான அப்துல் ஹமீட் நஸார், சமரசிங்க ஆகியோரின் பெயர்களும் சுட்டிக்காட்டப்பட்டுள்ளன.

எனவே, இந்த செம்மணி சிந்துபாத்தி மனிதப் புதைகுழி விவகாரம் தொடர்பாக தலையீடுகளற்ற, சுயாதீன பன்னாட்டு நீதி விசாரணை மேற்கொள்ளப்பட வேண்டும். அந்தப் பன்னாட்டு நீதி விசாரணைகளில் லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷவின் சாட்சியங்களும் பெறப்பட்ட வேண்டுமென நான் இந்த உயரிய சபையைக் கோருகின்றேன். அவ்வாறு மேற்கொள்ளப்படுகின்ற பன்னாட்டு நீதி விசாரணைக்கு இந்த அரசானது தனது முழுமையான ஒத்துழைப்பை வழங்க வேண்டுமென பாதிக்கப்பட்ட எமது மக்களின் பிரதிநிதியாகக் கேட்டுக் கொள்கின்றேன். இதற்குச் சரியான முடிவை இந்த அரசு பெற்றுத்தருமென நாம் நம்புகின்றோம். பன்னாட்டு நீதி விசாரணை மாத்திரமே பாதிக்கப்பட்ட எமது தமிழ் மக்களுக்கு நீதியைப் பெற்றுத்தரும் ஒரே மார்க்கமாகும். அதேவேளை, செம்மணி சிந்துபாத்தி மனிதப் புதைகுழியில் தொடர்ந்து மேற்கொள்ளப்படுகின்ற அகழ்வாய்வுப் பணிகளில் பன்னாட்டுப் பிரதிநிதிகளின் பங்களிப்பு மற்றும் பன்னாட்டு கண்காணிப்புகள் இருக்க வேண்டும் என்பதை வலியுறுத்திக் கேட்டுக்கொள்வதுடன், பன்னாட்டு நிபுணத்துவம் பின்பற்றப்பட்டு, அகழ்வாய்வுப் பணிகள் முன்னெடுக்கப்பட வேண்டுமெனவும் மீண்டும் மீண்டும் வலியுறுத்திக் கேட்டுக் கொள்கின்றேன். இதேபோல, கொக்குத்தொடுவாய் மனிதப் புதைகுழி சம்பந்தமாகவும் பன்னாட்டு நீதி விசாரணை தேவை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
எனது நேரம் முடிவுற்றதால் கொக்குத்தொடுவாய் மனிதப் புதைகுழி சம்பந்தப்பட்ட விடயத்தைக் கூற முடியாதுள்ளது. எனவே, அதை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பித்து** விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.06]

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කථා කරනවා වාහන ආනයනයේදී බදු අය කිරීමේ ක්‍රමවේද සම්බන්ධයෙනුත්. 2025 පෙබරවාරි මාසයේ 1වැනි දා අපි මෙරටට වාහන ආනයනය කිරීම නැවත ආරම්භ කළා. එසේ ආරම්භ කරද්දී පෙට්‍රල් සහ ඩීසල්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

වාහනවලට පරිබාහිරව බැටරි මඟින් ක්‍රියා කරන වාහන ආනයනයත් ආරම්භ වෙලා තිබුණා. දැන් මේ රටේ පෙට්‍රල්, ඩීසල් සහ හයිබ්‍රිඩ් කියන categories අතරට, ඒ වාහන පද්ධතිය අතරට බැටරිවලින් ක්‍රියාත්මක වන වාහන පද්ධති අලුතින් එකතු වෙනවා. මේ සියල්ල සම්බන්ධයෙන් අපි නිසි ක්‍රමවේදයක් අනුව බදු අය කිරීම් ක්‍රමානුකූලව කරගෙන එද්දී, "අනෙකුත්" කියන ක්‍රමවේදයත් මේකට එකතු වෙලා තිබුණා. ඒ, "අනෙකුත්" කියන ක්‍රමවේදය යටතේ ආනයනය කළ ගැටලු සහගත වාහන ප්‍රමාණයක් එතෙක් තිබුණු බදු ප්‍රතිපත්තිය යටතේ අපට නිකුත් කරන්න අපහසු වෙලා තිබුණා. මෙන්න මේ කාරණයත් එක්ක තමයි අපට අලුත් බදු ප්‍රතිපත්තියකට, නැත්නම් ක්‍රමවේදයකට, එහෙම නැත්නම් අලුත් විධිවිධානවලට යන්න සිද්ධ වුණේ. එම නිසා 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/04 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනා සම්මතය මඟින් වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් වූ අලුත් බදු ප්‍රතිපත්තියකට යන්න අපට සිද්ධ වුණා. අද මේ රටට වාහන ආනයනය කිරීමේදී පෙර පැවැති ක්‍රමයන් අනුව අපි වාහන සඳහා බදු අය කිරීම් දිගටම කරගෙන ආවා. නමුත්, මෙන්න මේ "අනෙකුත්" කියන ක්‍රමවේදයත් එක්ක ඇති වුණු ගැටලුත් සමඟ තමයි මෙන්න මේ නව ක්‍රමවේදයට අනුගත වෙන්න අපට සිද්ධ වුණේ. මේ ක්‍රමවේදය අපි ආපසු අනුගමනය කරන අතරතුර, අලුත් බදු ක්‍රමවේදයකට යෑම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන නියමය තමයි අද අපට පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර පහකට ආසන්න කාලයක් අපි මේ රටට වාහන ආනයනය කිරීම සම්පූර්ණයෙන් නවත්වලා තිබුණේ. පසුගිය රජය පැවැති කාල සීමාව තුළ මේ රටට වාහන ආනයනය කළේ නැහැ. වාහන ආනයනය සම්පූර්ණයෙන්ම ඇනහිටලා තිබුණා. හැබැයි, අපේ රජය බලයට පත් වෙලා මාස කිහිපයක් තුළ මේ රටේ වාහන ආනයනය ශක්තිමත් කරන්න අපට පුළුවන්කම ලැබුණා. වාහන ආනයනය ශක්තිමත් කරන්න සූදානම් වුණු වෙලාවේදී විපක්ෂයේ හිටපු සමහර මන්ත්‍රීවරු බොහොම ත්‍රාසයට පත්වෙලා පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශ ගණනාවක් සිද්ධ කළා. සමහර මන්ත්‍රීවරු කිව්වා අපට මතකයි, "වාහන ආනයනය කරන්න එපා. ඒක ක්‍රියාත්මක කරන්න එපා. ක්‍රියාත්මක කළොත් අපේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙනවා. කඩාගෙන වැටෙනවා. මේ සියල්ල එක්ක අපට මේ රටේ ආර්ථිකය ඉස්සරහට අරගෙන යන්න බැරි වෙයි" කියලා. මොකද, ඒගොල්ලන් අරගෙන ඇවිල්ලා තිබුණේ විනාශයට පත් වුණු ආර්ථිකයක්. අවුරුදු 76ක් පුරා විනාශ කරපු ආර්ථික රටාවක් මේ රට තුළ ක්‍රියාත්මක වෙමින් පැවතුණා. එසේ ක්‍රියාත්මක වුණු ආර්ථික රටාව ඉස්සරහට අරගෙන යද්දී මේ රට දැන් තිබෙන තත්ත්වයට පත් වෙයි කියලා ඒගොල්ලන්ට සත පහකවත් විශ්වාසයක් තිබුණේ නැහැ. හොරකම, වංචාව, දූෂණය, නාස්තියත් එක්ක තමයි ඒගොල්ලන්ගේ ක්‍රමවේදය ඉස්සරහට අරගෙන ගිහිල්ලා තිබුණේ. ඒ නිසා ඒගොල්ලන්ට ඇත්තටම භයක් තිබෙන්න ඇති, වාහන ගෙනාවොත් එහෙම මේ රටේ ඩොලර් සංචිතය හිඳෙයි කියලා. හැබැයි, අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට කියනවා, ඔබතුමන්ලා සමහර හීන දකිනවා, ඒවා හීනම විතරයි, යථාර්ථයක් බවට පත් වෙන්නේ නැහැ කියලා. මොකද, පසුගිය කාල සීමාවේදී ඇමෙරිකාව අපට බදු පනවද්දී ඒ මන්ත්‍රීවරයාම බොහොම භීතියට පත්වන ප්‍රකාශ ඉදිරිපත් කළා. එහිදී කිව්වා, "ඇමෙරිකාව අපේ රටට සියයට 50, 60 දක්වා බදු ප්‍රමාණයක් නියම කරයි. අන්න, ඉන්දියාවේ කට්ටිය ගිහිල්ලා එහේ පදිංචි වෙලා වැඩේ කථා කරනවා. අපේ කට්ටිය ඒ සම්බන්ධයෙන් මැදිහත්වීම් කරන්නේ නැහැ." කියලා. අපි මෙතැනදී කිව යුතු විශේෂ කාරණයක් තිබෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු, සමහර මහත්වරු, මේ විෂය සම්බන්ධයෙන් මහා දැනුම් සම්භාරයක් තිබෙනවාය කියන සමහර පුද්ගලයෝ මේ පාර්ලිමේන්තුව තුළ කරන සමහර සාකච්ඡා - සංවාද - සමහර අදහස්, සමහර දේවල් සම්බන්ධයෙන් අපි ත්‍රාසයට - භීතියට - පත් වෙනවා කියලා ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, හොඳට මතක තියාගන්න, අපට ක්‍රමවේදයක් තිබෙනවා, අපට අපි ගැන විශ්වාසයක් තිබෙනවා, ඔබතුමන්ලාගේ සමහර ඔස්තාර්ලාය කියන මහත්වරු සම්බන්ධයෙන් තමුන්නාන්සේලාට තිබෙන විශ්වාසයට වැඩිය අපට, අපේ අය ගැන විශ්වාසයක් තිබෙන බව. අපි මෙහෙමත් දැකලා තිබෙනවා. ඒ මහත්වරු සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමාත් සමහර වෙලාවට සත පහකවත් විශ්වාසයක් නොකරන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒක නිසා ඔබ පිළිබඳව තිබෙන ප්‍රශ්නය ඔබතුමන්ලා විසඳා ගන්න. වාහන ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් තිබෙන අණපනත්, චක්‍රලේඛ සහ ඒවායේ තිබෙන ගැටලු අපි හරියට විසඳා ගන්නම්.

පසුගිය කාල සීමාවේදී අපි දැක්කා, මේ රට අස්ථාවර කරන තැනට පත් කරන්න මේ රටේ සමහර තැන්වල සිටින විවිධ කණ්ඩායම් උත්සාහ කරන අවස්ථා වාගේම විවිධ කණ්ඩායම් විවිධ දේවල් කථා කරමින් නැවතත් ජාතිවාදය අවුස්සන්න උත්සාහ කරන අවස්ථා. ඒ වෙනුවෙන් එතුමන්ලා උත්සාහයක් දැරුවා. අපට කනගාටුයි, උතුර, නැඟෙනහිර පළාත්වල ඉන්න සමහර මහත්වරු උත්සාහ කරනවා, නැවත වටයකින් ජාතිවාදය අවුස්සන්න. හැබැයි, ඒක අසාර්ථකයි. අපි රජය භාර අරගෙන මේ වනකොට අවුරුද්දක් ගත වෙලාත් නැහැ. හැබැයි, අවුරුද්දක් ගත වෙලා නැතුවත් දිගින් දිගටම මේ රජය යන ප්‍රතිපත්තිමය රටාව, මේ යන ක්‍රමවේදය සම්පූර්ණ විකෘතියක් බවට පත් කරන්න ඒගොල්ලන් උත්සාහ කරනවා. අපි කියනවා, sorry, ඒක කරන්න අමාරුයි, අපි හොඳ ස්ථාවර රජයක් හදාගෙන තිබෙනවා, හොඳ ස්ථාවර මැති ඇමතිවරු වාගේම මේ රට පාලනය කරන්න පුළුවන් හොඳ යහපත් පුද්ගලයෝ ටිකක් අපි ස්ථානගත කරගෙන තිබෙනවාය කියන එක.

උතුර, නැඟෙනහිර පුද්ගලයින්ටත් මේක අලුත් ප්‍රශ්නයක් නොවෙයි. විපක්ෂයේ මහත්වරු කාලයකදී කිව්වා, "අපට තරම් අත්දැකීම් නැහැ, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මැති ඇමතිවරුන්ට" කියලා. විපක්ෂයේ ඔබතුමන්ලාට අත්දැකීම් තිබුණා නම් දැන් තේරෙන්න ඕනෑ. මේ රට වට්ටන්න තැපැල් ස්ට්‍රයික්, වෙන අරවා මේවා සංවිධානය කරන ඒවා ඔක්කෝම විගඩම්; නාඩගම්. අපි මේ රට ශක්තිමත්ව ඉස්සරහට ගෙන යනවා. රටේ මහජනතාව අපේ ආණ්ඩුවත් එක්ක, අපේ රජයත් එක්ක එකට අත්වැල් බැඳගෙන ඉන්නවා; එකට එක්කහු වෙලා ඉන්නවා. රටේ විශ්වාසය ගොඩනැඟෙමින් පවතිනවා. අපි බොහොම පැහැදිලිව රජයක් විධියට ඉස්සරහට යනවා. ඒක හොඳට තේරුම් ගන්න. නැත්නම් ඔබතුමන්ලාට තව ටික කාලයකින් විපක්ෂයත් නැතුව යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වයඹ පළාතේ ඉන්නවා, "අම්මට සිරි" වෙච්ච මහත්වරු. ඒගොල්ලන්ට දැන් මළ ගෙදරකටවත් යන්න බැරි වෙලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ නටන විගඩම්, නාඩගම් එක්ක. ඒ මහත්වරුන්ට අපි කියනවා, තව පොඩි කාලයක් ඉවසන්න, ඔයගොල්ලන් වයඹ පළාතේ කරපු සමහර කාරණා සම්බන්ධයෙන් අපි කරුණු හෙළිදරව් කරන්න සූදානමක ඉන්නවා කියන එක. අපි ආණ්ඩු පක්ෂය විධියට මේ රට තුළ දැවැන්ත කාර්යභාරයක් කරගෙන යද්දී ඒවා සම්බන්ධයෙන් බොහොම භීතියට පත් වෙච්ච විපක්ෂයේ මහත්වරු දැන් උත්සාහ කරමින් ඉන්නවා, අපි යන මේ ගමන නවත්වන්න. ඕන්න ඕක තමයි ඔබතුමන්ලාගේ අත්දැකීම් නැතිකම. මොකද, අත්දැකීම් තිබුණා නම් මේ රට ඉස්සරහට යන්න දෙනවා. මොනවා හරි

දුර්වලකම් පොඩ්ඩක් හෝ දැක්කොත් ඒ සම්බන්ධව මැදිහත් වීම තමයි ඔබතුමන්ලාට කරන්න තිබුණේ. හැබැයි, ඒක කරනවා වෙනුවට විපක්ෂයේ ඔබතුමන්ලා දැනට සතියකට එකක් ගානේ ප්‍රශ්න හදමින් මේ යන ගමන නිසා තමුන්නාන්සේලාගේ අඥබාලකම, නොදන්නාකම පෙන්නුම් කරනවා. විපක්ෂයේ ඔබතුමන්ලා කියපු පණ්ඩිතකම් එකක්වත් නැති යථාර්ථයක් තිබෙනවා. අපි පාර්ලිමේන්තුවට මේ වාගේ අණපනත්, චක්‍රලේඛ විශාල ප්‍රමාණයක් මේ මාස දෙක, තුන ඇතුළත ගෙනාවා, රටේ අභිවෘද්ධිය, අනාගතය වෙනුවෙන්. ඒ සඳහා අත ඔසවලා, අපි යන ගමනට ආශීර්වාදයක් කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.16]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් රේගුවට ගෙනෙන වාහන සම්බන්ධව අලුත් HS codes වර්ගීකරණය අද ඉදිරිපත් කරලා තිබෙනවා. අපි දැක්කා, ඇමතිතුමාගේ කථාව තුළත් රේගු ආදායම වැඩි වෙලාය කියන අදහස මතු කළා. ඒ වාගේම එතුමා උත්සාහ කළා, ඒ වාහනවලට ගහන බද්ද සාධාරණීකරණය කරන්න. විශේෂයෙන්ම අපි දැක්කා, පසුගිය සතියේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂතුමා ඇවිල්ලා කියනවා, රේගුවේ ආදායම ට්‍රිලියන 1ක් දක්වා වැඩි වෙලා කියලා. එතකොට මේ ආදායම ට්‍රිලියන එකක් දක්වා වැඩි වුණේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රේගුවේ ආදායම වැඩි වුණේ ආණ්ඩුව විසින් අසීමිත බදු ප්‍රමාණයක් ගහලා තිබෙන නිසා. එහෙම නැතුව නිෂ්පාදනයක් කරලා, භාණ්ඩ විකුණලා රේගුවේ ආදායම වැඩි වෙලා නැහැ. දැන් ආණ්ඩුව ආනයනකරුවෝ ගෙනෙන භාණ්ඩවලට විශාල බදු මුදලක් ගහනවා. එහෙම ගහන හින්දා තමයි රේගුවේ ආදායම ට්‍රිලියන 1ක් දක්වා වැඩි වෙලා තිබෙන්නේ. ඒක ලොකු කාර්යයක් නොවෙයි. මොකද, පාර්ලිමේන්තුවෙන් තමුන්නාන්සේලා බදු වැඩි කළාම, ආනයනකරුවන් බදු වැඩියෙන් ගෙවනවා. බදු වැඩියෙන් ගෙව්වාම රේගුවේ ආදායම වැඩි වෙනවා. අපි දන්නවා, වාහනවලට සියයට 200 ඉඳන් සියයට 600ක් වෙනකම් බදු ගහලා තිබෙන බව; වාහනවල බද්ද සියයට 200 සිට 600ට වැඩි වෙලා. ඒ වාගේම අපට පෙනෙන්න තිබෙනවා, විශේෂයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩවලට, හැම භාණ්ඩයකටම බද්ද වැඩි වුණා; බදු වැඩි කරලා තිබෙනවා. ඉතින්, බදු වැඩි කළාම රේගුවේ ආදායම වැඩි වෙනවා. ඒක ගැන නැවත ඇවිල්ලා ප්‍රවෘත්ති සාකච්ඡා තියන්න, ඒවා මේවා කරන්න තරම් ඒක ලොකු දෙයක් නොවෙයි. මොකද, ඒ බදු නැවත ගෙවන්නේ මේ රටේ ජනතාව. මොකද, ආනයනකරුවාට ගහන ඒ හැම බද්දක්ම දාන්නේ පාරිභෝගිකයාගේ ඇඟට. ඒ හින්දා තමයි අපේ රටේ ජනතාවගේ ක්‍රය ශක්තිය අද අඩු වෙලා තිබෙන්නේ. අද ජනතාවට භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව අඩු වෙලා තිබෙනවා. ඒ හින්දා තමයි අද වෙනකොට රටේ අඩු ආදායම්ලාභීන් ප්‍රමාණය වැඩි වෙලා තිබෙන්නේ. ඒ හින්දා තමයි තමුන්නාන්සේලා නැවත නැවත අස්වැසුම වැඩි කරන්නේ. මොකද, අස්වැසුම වැඩි කරලා දෙන්නේ? දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා; දුප්පත්කම ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඇයි? හැම භාණ්ඩයකම බද්ද වැඩි කරලා තිබෙන හින්දා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, 2020දී සාමාන්‍ය මධ්‍යම පාන්තිකයාත්, පහළ මාධ්‍ය පාන්තිකයාත් පාවිච්චි කරපු වාහන, ඒ කියන්නේ Suzuki Buddy van, Wagon R, Spacia, Alto Auto, 650 cc වාහනයක් තිබුණේ, රුපියල් ලක්ෂ 25ට බව. නමුත් දැන් Suzuki Buddy van එක කීයද? දැන් Suzuki Buddy van එක යනවා, ලක්ෂ 75ට. Wagon R එක තිබුණා, ලක්ෂ 33ට. දැන් Wagon R එක යන්නේ ලක්ෂ 95ට. Spacia එක තිබුණා, රුපියල් ලක්ෂ 35ට. දැන් ඒක යනවා, ලක්ෂ 100ට. ජපානයේ හදන Alto එක ලක්ෂ 25ට තිබුණේ. දැන් ඒ වාහනය ලක්ෂ 72යි. Vitz එක තිබුණේ, ලක්ෂ 40යි. ඔබතුමන්ලාගේ නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, Vitz එක ලක්ෂ 12ට දෙන්නම් කියලා. දැන් ජපානයේ Vitz එක හදන්නෙත් නැහැ. දැන් එන්නේ Yaris එක. එතුමා ලක්ෂ 12ට දෙනවා කිව්ව හින්දා ද දන්නේ නැහැ, Vitz කාර් එක එන්නේ නැත්තේ. දැන් Yaris එකේ මිල කීයද? Yaris 1000 cc එක ලක්ෂ 110යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට සියයට 200 ඉඳන් සියයට 600 දක්වා මේ විධියට වාහනවල බද්ද වැඩි කරලා දැන් ඔබතුමන්ලා ඇවිල්ලා කියනවා, සාධාරණ මිලකට වාහන දෙනවා ලු.

අපි මෝටර් සයිකල්වල මිල බැලුවොත්, සාමාන්‍ය මිනිස්සු පාවිච්චි කරන ඉන්දියාවේ හදන ඩිස්කවරි මෝටර් බයිසිකලය 2020දී රුපියල් ලක්ෂ දෙකහමාරට තිබුණේ. දැන් එය ලක්ෂ 5යි. Bajaj CT 100 එක, ලක්ෂ එකහමාරට තිබුණු මෝටර් බයිසිකලය දැන් යන්නේ ලක්ෂ තුනහමාරට. කාන්තාවෝ පදින Scooty Pep එක 2020දී ලක්ෂ දෙකහමාරයි. දැන් එය ලක්ෂ හයයි. ජනාධිපතිතුමා මැතිවරණ වේදිකාවලදී තරුණයන්ගෙන් ඇහුවේ, ජපන් වාහනයක් පදින්න, ජපන් මෝටර් සයිකලයක් පදින්න ආසා නැද්ද කියලා. ජපන් මෝටර් සයිකල් පදින්න තියා දැන් pushbike එකක්වත් ගන්න බැහැ. හැම එකක්ම දැන් ලක්ෂ ගාණකින් වැඩි වෙලා තිබෙනවා. ඇයි ඒ? බද්ද වැඩි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අසීමිතව බදු වැඩි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා සහල් කිලෝවට රුපියල් 65ක් බදු ගැහුවා. මාර්කට් එකේ සහල් කිලෝව රුපියල් 220 නම්, ඒකෙන් සියයට 65ක් බද්ද. ටොන් ලක්ෂ ගාණක් සහල් ගෙනාවා. එතකොට බලන්න, රුපියල් 65 ගාණේ. ඊළඟට ලූනු. ලූනු කිලෝවකට රුපියල් 40ක් බද්ද ගැහුවා. කිලෝවකට රුපියල් 40ක්. ඒ වාගේම පිටි කිලෝවකට රුපියල් 46ක බද්දක් තවම ගහනවා. මෙන්න මේ වාගේ විශාල බදු ආදායමක් එකතු කරලා තිබෙනවා, ජනතාවගේ ඇඟට දාලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලා දැන් මාස 9ක් වෙනවා. රාජ්‍ය ආදායම වැඩි කර ගත්තාද, මේ තිබෙන සංස්ථාවලින්, මේ තිබෙන අර්ධ රාජ්‍ය සංස්ථාවලින්? ඒවාවලින් බදු ආදායම් වැඩි කර ගත්තාද? ඒවාවලින් ආදායම් වැඩි වුණේ නැහැ. වරායට ආනයනය කරන භාණ්ඩ හැම එකකින්ම බදු වැඩි කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා නේ, BYD වාහන ගැන ප්‍රශ්නය ආවා. BYD වාහන ගැන ප්‍රශ්නය ආවාම උසාවියේදී එකඟත්වයකට ඇවිල්ලා, මේ BYD වාහන release කළා. ඒක කමක් නැහැ. දැන් bank guarantee එකක් තියලා ඒගොල්ලන් එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, පරීක්ෂණ බලලා තීන්දුවක් ගන්නවා කියලා. දැනට අනෙක් වාහන, ඒ කියන්නේ පාවිච්චි කළ වාහන 1,000කට අධික ප්‍රමාණයක් තිබෙනවා, හම්බන්තොට වරායේ. මේ වනකොට ජපානයෙන් නැව් ඇවිල්ලා තිබෙනවා. හම්බන්තොට වරායෙන් ජපානයට දන්වලා තිබෙනවා, වාහන දමන්න ඉඩ නැහැ කියලා. ඒ නිසා නැව් දෙක තුනක් ආයෙත් හැරිලා ජපානයට ගිහිල්ලා තිබෙනවා. ඇයි ඒ? මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Sri Lanka Customs තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය යටතේ. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව තිබෙන්නේත් මුදල් අමාත්‍යාංශය

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

යටතේ. ඒ ආයතන දෙකම තිබෙන්නේ ජනාධිපතිතුමා යටතේ. ජනාධිපතිතුමාට මේ දෙගොල්ලන්ව එක මේසයකට ගෙනැල්ලා, සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණේ ඇයි? ඒක තමයි කියන්නේ, කාර්යක්ෂමතාව නැහැ කියලා. Capacity එක නැහැ, හැකියාව නැහැ. ආයතන දෙකම තිබෙන්නේ ජනාධිපතිතුමා යටතේ. නමුත්, දෙගොල්ලන්ම වැඩ කරන්නේ දෙවිධියකට. වාහන 1,000ක් හිර වෙලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහන ගෙනාවේ අවුරුදු 5කට පස්සේ. මේ ආනයනකරුවන්ට වෙළෙඳාම කරන්න ලැබුණේ අවුරුදු 5කට පස්සේ. අවුරුදු 5කට පස්සේ ගෙනාපු වාහන ටික, මේ. මෙය 2006 ඉඳන් ගිය ක්‍රමවේදයක්. ඒ ක්‍රමවේදයට ගිහිල්ලා අද ඒ cross-boarder වාහන ටික තාක්ෂණික කරුණක් මත නවතාගෙන ඉන්නවා. බලන්න, එතැන වාහන 1,000ක් තිබෙනවා. අද ඒකට demurrage ගෙවන්න ඕනෑ. හම්බන්තොට වරාය demurrage ගෙවන්න ඕනෑ, ඩොලර්වලින්. ඒක යන්නේ චීනයට. ඊළඟට, ඒ demurrage ඔක්කොම එන්නේ නැවත පාරිභෝගිකයාට. එතකොට ආයෙත් මේ වාහනවල මිල වැඩි වෙනවා. එහෙම නම්, ඇයි, මාස ගණනක් ඒ වාහන තියාගෙන ඉන්නේ? ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කරනවා, අර BYD වාහන release කළා වාගේ මේ ඉන්න ආනයනකරුවන්ටත් ඒ පහසුකම දීලා ඒගොල්ලන්ගේ වාහන ටිකත් එළියට දමන්න කියලා. එහෙම කළොත් අඩු ගානේ demurrage එකවත් අඩු කර ගන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අමතර විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතකොට මේ වාහනවලට යන වියදම අඩු කරගන්න පුළුවන්. එතකොට පාරිභෝගිකයාට ඒ වාසිය ලැබෙනවා. මේක රඳවා ගැනීම තුළ පාරිභෝගිකයාට කිසිම වාසියක් ලැබෙන්නේ නැහැ නේ. ඕනෑ නම් ජනාධිපතිතුමාට පුළුවන්, backdate කරලා ගැසට් එකක් ගහන්න. ජනාධිපතිතුමා එහෙම ගැසට් එකක් ගැහුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කවදාද ඒ ගැහුවේ? ජනාධිපතිතුමා backdate කරලා ගැසට් එකක් ගැහුවා, 2025 මාර්තු 19වැනි දා. ඒ මොකක් සඳහාද? ඒක ගැහුවේ, වාහන තොගයක් වරායට ආවා, ඒ ආපු වාහන තොගය inspect කරලා verification certificate එක දෙන්න පුළුවන් ආයතන දෙකයි ජපානයේ තිබුණේ. 2013දී ආයතන දෙකයි ගැසට් කරලා තිබුණේ. නමුත්, මේ පසුගිය මාස 2, 3කට කලින් වාහන තොගයක් ආවා. ඒ ආපු වාහන තොගයේ verification certificate එක දෙන්න තිබුණේ අර කලින් ගැසට්වල තිබුණු ආයතනයකින් නොවෙයි. මොකක්ද ජනාධිපතිතුමා කළේ? ඒ වාහන තොගය එළියට දමන්න ජනාධිපතිතුමා ගැසට් එකක් ගැහුවා, 2025 මාර්තු 19වැනි දා. ඒ verification certificate එකේ තිබුණේ Bureau Veritas කියලා ජපානයේ කොම්පැනියක්. ඒගොල්ලන්ගේ verification certificate එක වලංගුයි කියලා වලංගු දිනය දැම්මා, 2025.01.31වැනි දා ඉඳලා. කොහොමද? Backdate කළා. ඇයි, ඒක backdate කළේ? එතැන වාහන තොගයක්. ගෙන්වපු කෙනා ගියා, ජනාධිපති ලේකම් කාර්යාලයට. ඩීල් එක දැම්මා. ජනාධිපතිතුමා ගැහුවා, backdate කරලා ගැසට් එක. ඒක කරන්න පුළුවන්. නමුත් මේ වාහන ආනයනකරුවන් ගෙනෙන පාවිච්චි කරපු වාහනවලට backdate කරලා ගැසට් එකක් ගහන්න ජනාධිපතිතුමාට බැහැ. අපි දන්නේ නැහැ, ඒකට හේතුව මොකක්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය නම් හැම කෙනාටම එක වාගේ තිබෙන්න ඕනෑ. නීතියේ ආධිපත්‍යය හදනවා කියලා තමයි එතුමා ඔබතුමා ඉන්න මූලාසනයේ ඉඳගෙන කිව්වේ. ජනාධිපතිතුමාගේ හිත මිත්‍රයන්ට වෙන නීතියකුයි, අනෙක් අයට වෙනත් නීතියකුයි ක්‍රියාත්මක කරන්න බැහැ. මම මෙහෙම කියන්නේ, ලාල් කාන්ත ඇමතිතුමා හැම දාම කියනවා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය හදනවා කියලා. කොහේද ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ කියලා මට කියන්න. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය නැහැ. ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඉඳන් කියපු ගජ මිතුරු ආර්ථිකය නම් ඉස්සරහට ගෙනියනවා. ජනාධිපතිතුමාගේ වටේ ඉන්න කට්ටියට පහසුකම් දෙනවා, ඒගොල්ලන්ගේ ටෙන්ඩර් ප්‍රතික්ෂේප වුණාම ඒගොල්ලන්ට wind power project එක දෙනවා, ඒගොල්ලන්ගේ ලුණු කන්ටේනර් ආවාම අනෙක් අයගේ ලුණු කන්ටේනර් ටික නවතාගෙන ඒ අයගේ කන්ටේනර් 6ක්, 7ක් release කරනවා. ඒවා කරනවා. ඒවා ගජ මිතුරු ආර්ථිකය. ඒක කියලා තමයි ජනාධිපතිතුමා පසුගිය කාලයේ මේ රටේ හිටපු ජනාධිපතිවරුන්ට චෝදනා කළේ. ඒගොල්ලන් කරපු දේම තමයි තමුන්නාන්සේලා system change කියලා ඇවිල්ලා දැන් මේ කරගෙන යන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ලාල් කාන්ත මහත්මයාට ආතතිය ද දන්නේ නැහැ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම දන්නේ නැහැ. ලාල් කාන්ත ඇමතිතුමා එක එක ඒවා කියනවා. එතුමා කියන හුඟක් කථා ඇත්ත. *[බාධා කිරීමක්]* මම කියන්නේ දැන් එහෙම කරන්න එපා කියලා. ඒ ව්‍යාපාරිකයෝ අවුරුදු ගණනාවක් ව්‍යාපාරය නැතිව ඉඳලා බැංකු loan එකක් අරගෙන බොහොම අමාරුවෙන් තමයි මේ නැවත වාහන ආනයනය කරන්න පටන් අරගෙන තිබෙන්නේ.

ඒ වාගේමයි, තමුන්නාන්සේලාගේ අර නියෝජ්‍ය ඇමතිතුමා. Video එකක මම දැක්කා එතුමා අඬනවා, මේ රටේ මිනිසුන්ට වාහනයක් ගන්න බැහැ කියලා. *[බාධා කිරීමක්]* ඔව්, ඇඬුවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්.

එතුමා ඇඬුවා. එතකොට නිවේදකයා අහනවා, "ඇයි අඬන්නේ?" කියලා. එතුමාට දුකයි ලු. දැන් tax එක ගහනවා, සියයට 200 ඉඳන් සියයට 600 දක්වා. දැන් දුක නැද්ද කියලා අහන්නකෝ. පහළ මධ්‍යම පන්තියේ මිනිස්සු පාවිච්චි කරපු ලක්ෂ 33ට තිබුණු පොඩි Wagon R එකක් දැන් ලක්ෂ 95යි. ලක්ෂ 25ට

තිබුණු Japanese Alto පොඩි කාර් එක - ත්‍රීවිල් එක වාගේ තිබෙන කාර් එක - ලක්ෂ 72යි. මේ තරම් බදු ප්‍රමාණයක් ගහලා මේ විධියට නම් ආදායම් හොයන්න පුළුවන්. රේගුවට ට්‍රිලියන එකක් නොවෙයි, මේ ගහන බදු අනුව මේ අවුරුද්ද අන්තිම වෙනකොට ට්‍රිලියන 2ක් දක්වා යන්න පුළුවන්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසානයේදී මේ හැම බද්දක්ම ගෙවන්නේ මේ රටේ ජනතාවයි කියන එක අපි ආණ්ඩුවට මතක් කර දෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ වැඩ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.
அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, THE HON. DEPUTY SPEAKER in the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Kitnan Selvaraj. You have 10 minutes.

[பி.ப. 1.00]

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைதினம் இந்தச் சபையில் முன்வைக்கப்பட்டுள்ள வாகன இறக்குமதி சம்பந்தமான சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம், நிர்மாணத்தொழில் அபிவிருத்திச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் என்பன இந்த நாட்டின் எதிர்கால அபிவிருத்தியை இலக்காகக் கொண்டே கொண்டுவரப்பட்டுள்ளன. இவை இரண்டையும் தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்தச் சபையில் முன்வைத்த பின்னர், எதிர்க்கட்சியினர் இவற்றுக்கு ஆதரவளிக்கும் வகையில் தங்களுடைய கருத்துகளை முன்வைக்கின்ற அதேவேளை, உயர்ந்தபட்ச விமர்சனத்தையும் முன்வைக்கிறார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டைத் தேசிய மக்கள் சக்தி அரசாங்கத்திடம் கையளிக்கும்போது, நாடு வங்குரோத்து நிலையில் இருந்ததை எவரும் மறந்துவிட முடியாது. ஆனால், இன்று எங்களுடைய நாடு பொருளாதாரத்தில் ஸ்திரத்தன்மை அடைந்துள்ள ஒரு நாடாக மாறியிருக்கிறது. இது இந்த நாட்டு மக்களுக்கும் தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கும் கிடைத்திருக்கின்ற மிக உன்னதமான வெற்றியாகும். இன்றைய தினம் மேற்குறிப்பிட்ட சட்ட ஏற்பாடுகளை முன்வைத்து கருத்துகளைத் தெரிவிக்கும்பொழுது, எதிர்க்கட்சியினர் கொஞ்சம் ஆடிப்போய் இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கிறது.

கோட்டாபய ராஜபக்ஷ அவர்களின் ஆட்சிக் காலத்தில் எமது தேசம் பொருளாதார ரீதியாக பாரிய வீழ்ச்சியடைந்து வங்குரோத்து நிலையை அடைந்திருந்தது. அதன் விளைவாக, வாகன இறக்குமதிக்கு முழுமையாகத் தடைவிதிக்கப்பட்டு இருந்ததுடன், நிர்மாணத்துறையும் வீழ்ச்சியடைந்து இருந்தது. கட்டிட நிர்மாணத்துறை மூடுவிழா கண்டிருந்த கோட்டாபய ராஜபக்ஷவின் அரசாங்க காலத்தில் இந்த நாட்டில் அநேகமான தொழிலாளர்களும் உழைக்கும் வர்க்கத்தினரும் தமது தொழிலை இழந்திருந்தார்கள். இவ்வாறு வலுவிழந்து இருந்த நிர்மாணத் துறைக்குப் புத்துயிரளித்து, வழமை நிலைக்குக் கொண்டுவரும்பொழுது, எதிர்க்கட்சியினரால் முன்வைக்கப்படும் வாதங்கள் செல்லுபடியற்றது என்றே நான் நினைக்கின்றேன்.

வடபுலத்தைப் பிரதிநிதித்துவம் செய்யும் மக்கள் பிரதிநிதிகள் இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள விடயங்களுக்குப் புறம்பாக செம்மணி விவகாரத்தைக் கையிலெடுத்து இருக்கிறார்கள். எங்களுடைய பாராளுமன்றச் சபை முதல்வர் அவர்கள், “தேசிய மக்கள் சக்தி அரசாங்க காலத்தில் செம்மணி மனிதப் புதைகுழி விவகாரம் தொடர்பில் நீதியான விசாரணை முன்னெடுக்கப்பட்டு, குற்றவாளிகளுக்குத் தண்டனை பெற்றுக்கொடுப்பதற்கு ஏதுவான நடவடிக்கைகள் முன்னெடுக்கப்படும்” என்று அன்று தெளிவாகக் கூறியிருந்தார். வடக்கு, கிழக்கில் உள்ள தமிழ் அரசியல் தலைமைகள் தொடர்ந்தும் இனவாதத்தைத் தூண்டக்கூடிய கருத்துகளை முன்வைப்பார்களேயானால், தென்னிலங்கையில் எவ்வாறு பேரினவாதிகளின் அரசியலுக்குச் சாவுமணி அடிக்கப்பட்டதோ, அதே நிலைமைதான் அவர்களுக்கும் எதிர்காலத்தில் ஏற்படும். வடக்கிலுள்ள தமிழ் மக்களின் பொருளாதாரத்தை மேம்படுத்துவது எப்படி? பொருளாதார மேம்பாட்டினூடாக ஒட்டுமொத்த தமிழ் மக்களையும் அபிவிருத்திப் பாதையில் இணைத்து முன்னேற்றுவது எப்படி? என்பன பற்றிய கருத்துகளை அவர்கள் இந்தச் சபையில் முன்வைப்பதை விடுத்து, வெறுமனே இனவாத ரீதியான கருத்துகளை முன்வைப்பார்களேயானால், ராஜபக்ஷ அணியினருக்கு தென்னிலங்கையில் ஏற்பட்டதுபோல் வட, கிழக்கில் இவர்களுக்கு ஏற்படும் என்பதை அவர்கள் ஞாபகத்தில் வைத்துக்கொள்ள வேண்டும்.

இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற சட்ட ஏற்பாடுகள் ஊடாக நடுத்தர வர்க்கத்தைச் சார்ந்தவர்களுக்கு ஓரளவு சலுகை அல்லது நிவாரணம் கிடைத்திருக்கிறது. தொழில்நுட்ப வளர்ச்சிக்கு முன்னைய காலத்தில் dieselமூலமாக அல்லது petrol மூலமாக இயங்கக்கூடிய வாகனங்களே இறக்குமதி செய்யப்பட்டன. அப்பொழுது அதற்கான சட்டதிட்டங்கள் இருந்தன. அதற்குப் பிறகு, hybrid வாகனம் அறிமுகப்படுத்தப்பட்டது. அப்போது hybrid வாகனங்களை இறக்குமதி செய்வதற்கான சட்டதிட்டங்கள் முன்மொழியப்பட்டன. தற்பொழுது அந்த நிலை முழுமையாக மாறி, தொழில்நுட்ப வளர்ச்சி அடைந்திருக்கின்ற நிலையில், வேறு விதமான சட்டதிட்டங்களை உருவாக்க வேண்டிய அவசியம் ஏற்பட்டிருக்கிறது. அதனால் குறித்த சட்டத்தில் இருக்கக்கூடிய "வேறு" என்ற பதத்தை முன்னிலைப்படுத்தி, அதாவது கூடுதலான வரியை அறவிடுவதற்குப் பதிலாக கடந்த காலங்களில் இறக்குமதி செய்யப்பட்ட வாகனங்களுக்கு அறவிடப்பட்ட அதே வரியையே தற்பொழுது இறக்குமதி செய்யப்படுகின்ற மின்சார வாகனங்களுக்கும் அறவிடுவதற்கு அரசாங்கத்தால் முன்மொழியப்பட்டு இருக்கின்றது.

கடந்த காலத்தில் எதிர்க்கட்சியினர் முன்னெடுத்த அதே வங்குரோத்து அரசியலையே இன்றும் முன்னெடுக்கிறார்கள். அதன் எதிரொலியாக கடந்த காலங்களைப்போன்று ஒவ்வொரு தொழிற்சங்கத்தையும் பயன்படுத்தி, இந்த

[ගරු කිට්නන් සෙල්වරාජ් මහතා]

அரசாங்கம் இந்த நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்ல முடியாதளவுக்கு பலவீனம் அடைந்திருப்பதாகக் கூறி, ஒவ்வொரு காலப்பகுதியிலும் வெவ்வேறு விதமான போராட்டங்களை முன்னெடுப்பதற்குத் தயாராகி வருகின்றார்கள். அதில் ஒன்றுதான், கடந்த சில நாட்களுக்கு முன்னர் ஆரம்பிக்கப்பட்ட தபால் ஊழியர்களின் பணிப்பகிஷ்கரிப்பு!

அரச தொழிற்றுறையை அபிவிருத்தி செய்வதற்கும், அரச துறையை நவீன மயப்படுத்துவதற்கும், அதனை மக்களுக்குச் சார்பான துறையாக மாற்றுவதற்கும் அரசாங்கம் நடவடிக்கைகளை முன்னெடுக்கும்பொழுது, அவற்றைத் தடுப்பதற்காக எதிர்க்கட்சியினர் சிற்றூழியர் வட்டத்தினருடைய தொழிற்சங்கத்தைப் பயன்படுத்தி முன்னெடுக்கின்ற வேலைகளை இன்று நாட்டு மக்கள் நன்றாக அவதானித்துக்கொண்டு இருக்கிறார்கள். இதனால் இன்று தோற்றுப்போயுள்ள எதிர்க்கட்சியினர் தங்களுடைய கருத்துகளை முன்வைப்பதற்குப் பதிலாக அரச ஊழியர்களின் தொழிற்சங்கங்களைத் தவறான வழிக்குத் திசைதிருப்பி இருக்கின்றார்கள். இவ்வாறு நிலைமை இருக்கும்பொழுது, மாதன முத்தாவின் பாத்திரத்தையோ இன்று எதிர்க்கட்சியினர் வகிக்கின்றார்கள். தாங்கள் செய்யவேண்டிய போராட்டத்துக்கு மாற்றீடாக நிர்வாணத்தோடு போராட்டம் செய்து, தங்களது இயலாமையை வெளிக்காட்டக்கூடிய நிலையிலேயே இன்று எதிர்க்கட்சியினர் உள்ளனர். அதாவது, பரமார்த்த குருக்களின் சீடர்கள் போலவே இந்தச் சபையில் எதிர்க்கட்சியினர் அமர்ந்திருக்கின்றனர்.

அரசாங்கம் முன்னெடுக்கின்ற நல்ல வேலைத்திட்டங்களுக்கு ஆதரவளிப்பதும், பிழையான வழியில் செல்லுமாக இருந்தால் விமர்சித்து நல்வழிக்குக் கொண்டு வருவதுமே எதிர்க்கட்சியினரின் கடப்பாடாக இருக்கின்றது. கடந்த காலங்களில் இந்த நாட்டின் வளங்களை விற்று, நாட்டை வங்குரோத்து நிலைக்குக் கொண்டுசென்று, நாட்டின் ஒட்டுமொத்த பொருளாதாரத்தையும் சீரழித்து, பொருளாதாரம் எனும் முதுகெலும்பை உடைத்தவர்கள் ஒன்றை விளங்கிக்கொள்ள வேண்டும். இன்று அவர்கள் எதிர்க்கட்சியில் சஜித் அணியாகவும், ரணில் அணியாகவும், மஹிந்தவின் அணியாகவும் தனித்திருந்து -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kitnan Selvaraj, your time is up now.

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
நான் முடிக்கிறேன்.

இன்றைய தினம் இந்த அதியுயர் சபையில் மக்களின் நலனுக்காகக் கொண்டுவரப்பட்டுள்ள சட்ட ஏற்பாடுகள் ஊடாக எங்களுடைய அரசாங்கம் உயரிய பணியை ஆற்றுமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். வணக்கம்!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Nalin Bandara Jayamaha. You have ten minutes.

[අ.භා. 1.10]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද දින පනත් කීපයක් යටතේ ගෙනෙන යෝජනා සම්මතය, නියමය, නියෝග ගැන කථා කරන මේ වෙලාවේ අපි විශේෂයෙන්ම වාහන ආනයන බදු පිළිබඳව කථා කරනවා. අපේ රටේ ආර්ථිකය කඩා වැටීමත් එක්ක රටේ ජනතාවගේ වාහන සිහිනය බොඳවෙලා, නැවත වාහනයක් ගන්න පුළුවන් වන දිනය පිළිබඳව ඔවුන් දින ගනිමින් හිටපු බව අපි දන්නවා. ඒ වාගේම පසුගිය මැතිවරණවලදී ඔබතුමන්ලා ඇතුළු නොයෙක් දේශපාලන ව්‍යාපාර විවිධ පොරොන්දු දුන්නා. වාහනයක් ලක්ෂ 12ට, 13ට ගන්න පුළුවන්, මෙසා විශාල බදු ප්‍රමාණයක් අය කරන්නේ ඇයි, ජපානයේවත් වාහනයක් මෙච්චර මිල නැහැ ආදී වශයෙන් ජනාධිපතිවරණයේදී දේශපාලන වේදිකාවල බොහොම රස කථා කියනවා අපට ඇහුණා. හැබැයි, අද සාමාන්‍ය මිනිහෙකුට, රජයේ සේවකයෙකුට, පෞද්ගලික අංශයේ වැඩ කරන තරුණයෙකුට වාහනයක් ලබා ගැනීම සිහිනයක්වෙලා තිබෙනවා. පොඩි වාහනයක් පවා ලක්ෂ 75ට, 80ට වඩා වැඩියි. තමන්ගේ වැටුපෙන් lease එක ගෙවලා ගන්න පුළුවන් වාහනයක් අද වෙළඳ පොළේ නැහැ. ලක්ෂ එකහමාරක්, දෙකක් වැටුප් ගන්න කෙනෙකුට ලීසිං වාරිකය ගෙවා ගන්න තමන්ගේ වැටුප ප්‍රමාණවත් නැහැ. ඒ නිසා රටේ ජනතාවගේ; විශේෂයෙන්ම පහළ මධ්‍යම පන්තියේ රැකියා කරන තරුණ අයගේ, රජයේ සේවයේ රැකියා කරන අයගේ වාහන සිහිනය බොඳවෙලා තිබෙනවා. ඒ නිසා කුඩා වාහනයක් සාධාරණ මිලට ලබා ගන්න පුළුවන් විධියට, අය කරන බදු වෙනස් කරන්න කියන එක ගැන අපි රජයේ අවධානය යොමු කරවනවා.

අපි දන්නවා, මේ දවස්වල තැපැල් සේවක වර්ජනයක් තිබෙන බව. මේක විශාල කඹ ඇදිල්ලක්. ආණ්ඩුව කියනවා, fingerprint එක තියන්න කියපු නිසා තමයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ කියලා. වෘත්තීය සමිති කියනවා ඒක විතරක් නොවෙයි, තව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා කියලා. හැබැයි, අද මේ පිළිබඳව කතිකාවක් නැහැ. මුරණ්ඩු පිළිවෙතක් තමයි ආණ්ඩුව අනුගමනය කරමින් සිටින්නේ. ඒ නිසා විශේෂයෙන්ම වෘත්තීය සමිති මතින්, රජයේ සේවකයෝ මතින් බලයට පැමිණි ඔබතුමන්ලා මීට වඩා නම්‍යශීලී වෙලා මේ තැපැල් සේවක ප්‍රශ්නය ගැන අවධානය යොමු කරන්න කියලා අපි අවධාරණය කරනවා.

අද හැම තැනම - මේ වෙලාවේත් - කෑම පැයේත් RDA එකේ මූලස්ථානයේ සංකේත වැඩ වර්ජනයක් ක්‍රියාත්මක වෙන බව අපි දන්නවා. මොකද, වැටුප් පිළිබඳව ඔවුන්ට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. Senior engineersලා 191ක් RDA එක අත හැරලා ගිහිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුව ආවාට පස්සේ engineersලා 32ක් RDA එක අත හැරලා තිබෙනවා. මොකද, වැටුප් තල බලනකොට විදුලිබල මණ්ඩලයේ හා National Water Supply and Drainage Board එකේ ඉන්න engineersලාට සාපේක්ෂව RDA එකේ වැටුප් අඩුයි. RDA එකේ DGගේ වැටුප පහළ ශ්‍රේණිවල ඉන්න ඉංජිනේරුවෙකුගේ වැටුපට වඩා අඩුයි. ඒකට හේතුව විධියට ආණ්ඩුව, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශය කියන්නේ Ceylon Electricity Board එක, National Water Supply and Drainage Board එක මුදල් උපයනවා, RDA එක මුදල් උපයන්නේ නැහැ කියලායි. RDA එක මුදල් උපයන්න නම්, RDA එකට නීතිරීති ගෙනෙන්න ඕනෑ. මොකද, RDA එක සතුව විශාල මාර්ග පද්ධතියක් තිබෙනවා. පළාත් මාර්ගවලට අමතරව "A" සහ "B" මාර්ග පද්ධතිය තිබෙන්නේ RDA එක සතුවයි. ඔවුන් highwaysවලින් විතරයි

මුදල් උපයන්නේ. එහෙම නම් ආණ්ඩුව RDA එක මුදල් උපයන ආයතනයක් බවට පත් කරන්න ඕනෑ. මම හිතන විධියට RDA එක විශාල වැඩ කොටසක් කරනවා. අපි අය වැයෙන් වෙන් කරන මුදල්වලින් විශාල ප්‍රමාණයක් වෙන් කරන්නේ RDA එකට. බිමල් රත්නායක ඇමතිතුමා පවා පිළිගන්නවා, RDA එකේ වැටුප් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. හැබැයි, ඒකට විසඳුම් හොයන්න වැඩ පිළිවෙළක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරවනවා.

ඒ වාගේම වී මිල සම්බන්ධව ගත්තොත්, මේ දවස්වල අපේ ප්‍රදේශවල ගොයම් කපලා වී ටික දීලාත් ඉවරයි. හැබැයි, වී කීයටද දුන්නේ? තෙත වී දෙන්න වුණේ රුපියල් 92ට, රුපියල් 93ට, රුපියල් 94ට, රුපියල් 95ට. ආණ්ඩුව මොකක්ද කිව්වේ? වී කිලෝවකට රුපියල් 120ක පාලන මිලක් නියම කරනවා කිව්වා. තෙත වී කිලෝවකට රුපියල් 102ක සහතික මිලක් නියම කළා. හැබැයි, ආණ්ඩුව වී මිලදී ගත්තාද? මේ දක්වා වී අලෙවි මණ්ඩලය මිලදී ගෙන තිබෙන්නේ වී මෙට්‍රික්ටොන් 16,000ක වාගේ ප්‍රමාණයක්. පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ආණ්ඩුව ගොවීන්ගෙන් මිලදී ගෙන තිබෙන්නේ, වී මෙට්‍රික්ටොන් 4,362යි. එය ඉතාම සොච්චම් ප්‍රමාණයක්; ඉතාම සුළු ප්‍රමාණයක්. ඇයි එහෙම වුණේ? ඔබතුමන්ලා බලයට පත් වුණාට පසුව වී ගබඩා ටික සුද්ද කරලා විශාල වැඩ පිළිවෙළකට සූදානම් වනවාය කියලා පෙන්වුවා, අපට මතකයි. එහෙම නම් මිලදී ගත්ත වී කෝ? ඔබතුමන්ලා පෙන්වූයේ කොහොමද? ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මොනවාද තිබුණේ? "ආණ්ඩුව වී මිලදී ගන්නවා. ආණ්ඩුව වී කොටනවා. ආණ්ඩුව සහල් වෙළෙඳ පොළට එවනවා" මේ වාගේ දැවැන්ත චිත්‍රයක් පෙන්වූවා. ගොවියෝත් බැලුවා, දැන් ආණ්ඩුවට වී ටික දෙන්න ඕනෑ කියලා. ඒ වාගේම පාරිභෝගිකයෝත් බැලුවා ආණ්ඩුවෙන් සහල් මිල පාලනය කරයි කියලා. ගොවියාටත්, පාරිභෝගිකයාටත්, සාධාරණයක් ඉෂ්ට වන අයුරින් සහල් මිලේ පාලනයක් ඇති වෙයි කියලා සියලුදෙනා හිතුවා. හැබැයි, වී මෙට්‍රික්ටොන් 16,000ක් කියන්නේ ඉතා සුළු ප්‍රමාණයක්. ඒ කියන්නේ, වී අලෙවි මණ්ඩලය සතු ගබඩාවල රටේ එක දවසක සහල් පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණයවත් නැහැ. එහෙම නම්, එදා නාමල් කරුණාරත්න මහත්මයලා කියපු ඒ සුරංගනා කථා ටික අද යථාර්ථයක් බවට පත් වෙලා නැහැ.

වී ගොවියා අද වී කිලෝව රුපියල් 92ට දෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හැබැයි, පාලන මිල කීයද? සහල් කිලෝවකට රුපියල් 230යි. විශාල පරතරයක් තිබෙනවා. මේ නිසා මහා පරිමාණ වී මෝල් හිමියෝ විශාල ලාභයක් ලබන තැනට අද තවදුරටත් පත් වෙලා තිබෙනවා. සහල් වෙළෙඳ පොළ පාලනය කරන්න ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. පාරිභෝගිකයාත්, වී ගොවියාත් කියන දෙදෙනාම අද කබලෙන් ළිපට වැටිලා තිබෙනවා. වී ටික විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. දැන් පොළොන්නරුවේ ගොයම් කැපෙන කාලය. එම නිසා මේ ප්‍රශ්නය තවදුරටත් වැඩි වෙයි. වී ගොවියාට සාධාරණ මිලක් ලැබෙන්නේ නැහැ. වී අලෙවි මණ්ඩලයේ ගබඩාවලින් මිලදී ගැනීම් හරියට සිදු වෙන්නේ නැහැ. ආණ්ඩුව එයට අවශ්‍ය වැඩ පිළිවෙළක්, යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරලා නැහැ. එම නිසා ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මේ කන්නයේ වී මිලදී ගැනීම අසාර්ථකයි කියලා අපි පැහැදිලිව කියනවා. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශවල සඳහන් වී ගොවියා ආරක්ෂා කරන වැඩ පිළිවෙළ සුරංගනා කථාවලට පමණක් සීමා වෙලා තිබෙනවා කියන එක මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අයත් අමාත්‍යාංශයේ හිටිය නියෝජ්‍ය ඇමතිවරයෙක්. එදා බිංගිරිය අපනයන සැලසුම් කලාපය අපි ආරම්භ කළා. ඊයේ පෙරේදා දවසක මම දැක්කා, ඔබතුමන්ලා කංසා වගා කරන්න මීරිගම ප්‍රදේශයේ තිබෙන භූමියක් ලබා දෙන්න කටයුතු කරනවාය කියලා. ඔබතුමන්ලා කංසා වගා කළාට මම පෞද්ගලිකව විරුද්ධ වෙන්නේ නැහැ. රටට ආයෝජන ගෙනෙන්න පුළුවන් නම්, අපනයන ආර්ථිකයට ගැළපෙනවා නම්, ඔබතුමන්ලා ඉස්සර කියපු ඒ පරණ කථා පැත්තකට දාලා කංසා වැව්වාට කමක් නැහැ. හැබැයි, BoI එක සතු මීරිගම වාගේ ප්‍රදේශයක භූමියක් ඒකට සුදුසු වෙන්නේ නැහැ. මොකද, අපේ අපනයන සැලසුම් කලාප ආශ්‍රිතව අද ඉඩම් නැහැ. අපේ මීරිගම zone එක තිබෙනවා, කටුනායක අපනයන සැලසුම් කලාපය තිබෙනවා, බියගම අපනයන සැලසුම් කලාපය තිබෙනවා. කොග්ගල අපනයන සැලසුම් කලාපය තිබෙනවා, ඒ වාගේම මල්වතු හිරිපිටිය තිබෙනවා. කොළඹට ආසන්නයේ තිබෙන zonesවල අද ඉඩම් නැහැ. ආයෝජකයෙක් ආවොත් දෙන්න ඉඩම් නැහැ. මම හදපු බිංගිරිය අපනයන සැලසුම් කලාපයේ ඉඩම් තිබෙනවා. හැබැයි, සමහර ආයෝජකයෝ හොයන්නේ කොළඹට ආසන්න, තදාසන්න ප්‍රදේශයක ඉඩම්. මීරිගම තිබෙන zone එක දැනට තිබෙන භූමියේ සියයට 99ක්ම ආයෝජනවලින් පිරිලා තිබෙනවා. මේ ඔබතුමන්ලා හඳුනා ගත් භූමිය කංසා වගාවට දෙන එක නොවෙයි, ඒකේ යටිතල පහසුකම් වැඩිදියුණු කරලා, එම ප්‍රදේශය ආශ්‍රිතව අපනයන ඉලක්ක කරගෙන කර්මාන්තශාලා හදන්න බලාපොරොත්තු වන ආයෝජකයන්ට ලබා දෙන්න කටයුතු කිරීමයි කළ යුත්තේ. එසේ කරනවා මිසක් කංසා වගා කරන්න මීරිගම කොහෙත්ම ගැළපෙන්නේ නැහැ. කංසා වගා කරන්න ඕනෑ තරම් ඉඩ කඩම් තිබෙනවා. කංසාවලට ප්‍රසිද්ධ වැල්ලවාය, පහළ ඌව වාගේ ප්‍රදේශ. ඔබතුමන්ලාට එම ප්‍රදේශවලින් ඕනෑ තරම් ඉඩම් හොයා ගන්න පුළුවන්. එම නිසා, BoI එක සතු එම මීරිගම ඉඩම වෙනත් කර්මාන්තශාලාවලට, වෙනත් ආයෝජනවලට යොදවනවා මිසක්, කංසා වගා කිරීමට කටයුතු කරනවා නම් ඒක මහා විහිළුවක් විධියට තමයි මම දකින්නේ. එම නිසා ඒ ගැනත් මා අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ පළාත් සභා සියල්ල අසාර්ථක වෙලා තිබෙනවා. ඒවා අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒකට යහ පාලන ආණ්ඩුවත් වග කියන්න ඕනෑ. පළාත් සභා අඛණ්ඩව පවත්වාගෙන යන්න කටයුතු නොකර, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ වුවමනාවක් මතු කළා. ඒ වෙලාවේ පාර්ලිමේන්තුවේ එය අර්බුදයක් බවට පත් වුණා. එදා ඉඳලා දිගටම පළාත් සභා ක්‍රියාත්මක නැහැ. පළාත් සභා සතුව ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. පළාත් සභා සඳහා විශාල මුදලක් මධ්‍යම රජයෙන් සහ පළාත් සභාවේ අරමුදල්වලින් යොදවනවා. අද මහජන නියෝජිතයන්ගෙන් තොරව තමයි මේවා ක්‍රියාත්මක වෙන්නේ. ලබන මාසයේ 21වැනි දාට ජනාධිපතිවරයා පත් වෙලා අවුරුද්දක් සම්පූර්ණ වෙනවා. හැබැයි අපට පෙනෙන්නේ නැහැ, වත්මන් රජය මේ තිබෙන නෛතික ප්‍රශ්න විසඳා පළාත් සභා සක්‍රිය කරන්න, පළාත් සභා නැවත ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුතලය, ඉඩකඩ නිර්මාණය කරන බවක්.

පළාත් සභා විශේෂයෙන් නිර්මාණය වෙන්නේ උතුරු-නැඟෙනහිර ජනතාව මූලික කර ගත්, බලය බෙදීම අරමුණු කරගත් වැඩ පිළිවෙළක් විධියටයි. විශේෂයෙන් උතුරු-නැඟෙනහිර මිනිස්සු පළාත් සභාව දෙස බලාගෙන ඉන්නේ ඒක තමන්ට යම් හෝ බලයක් ලබා දෙන ආයතනයක් විධියටයි. අපි දීර්ඝ කාලීන යුද්ධයකට මැදිවෙලා බැට කාපු රටක්. අද උතුරු-නැඟෙනහිර පළාත් සභා ක්‍රියාත්මක නොවීම හරහා ඒ මිනිස්සු යම් කලකිරීමකින් ඉන්නවා. ඒ නිසා පළාත් සභා නැවත සක්‍රිය කරන්න අවශ්‍ය සංශෝධන කඩිනමින් මේ පාර්ලිමේන්තුවට ගේන්න අවශ්‍යයි. අඩුම ගණනේ ලබන අවුරුද්දේ මුල් මාස කිහිපය ඇතුළතවත් පළාත් සභා මැතිවරණය පවත්වන්න අවශ්‍ය නීති රීති, අණ පනත් ගෙනෙන්න කියා මතක් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. අපේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, වී මිලදී ගැනීම් සම්බන්ධයෙන් තොරතුරු. අද වෙනකොට මිලදී ගෙන තිබෙන්නේ වී මෙට්‍රික් ටොන් 16,000ක් කියලා එතුමා කිව්වා. ඒක අසත්‍යයක්. මම දැන් එම වාර්තාව ගෙන්වා ගත්තා. මේ වෙනකොට වී මෙට්‍රික් ටොන් 25,000කට වැඩි ප්‍රමාණයක් මිලදී ගෙන තිබෙනවා. රට පුරා ස්ථාන 140කට වඩා ප්‍රමාණයක වී මිලදී ගැනීම් කරනවා. පසුගිය කාලයේ කාබාසිනියා කර, හොරා කාලා විනාශ කර දමා තිබුණු ඒ ස්ථාන ටික මේ වෙනකොට අපි පියවරෙන් පියවර සූදානම් කරමින් යනවා. ඒ නිසා තව තවත් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න එපා කියා අපි කියනවා. මෙතුමන්ලා පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරමින් අසත්‍ය ප්‍රකාශ කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Nalin Bandara Jayamaha. You mentioned his name, Hon. Nawarathna.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025.08.13වන දිනට තමයි මෙට්‍රික් ටොන් 16,000ක් වශයෙන් සඳහන්ව තිබෙන්නේ. එතැනින් පසු යම් ප්‍රමාණයක් වැඩිවෙන්න ඇති. මා සතු මෙම ලේඛනයේ සඳහන් වන්නේ 2025.08.13 දක්වා වී මිලදී ගැනීම් පිළිබඳ විස්තර. 2025 යල කන්නයට අදාළව වී මිලදී ගැනීම් ඇතුළත් එම ලේඛනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ruwanthilaka Jayakody. You have 10 minutes.

[අ.භා. 1.22]

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසට නියමිත මාතෘකා පිළිබඳව කථා කරන්නට පෙර මට යම් කාරණයක් කියන්න හිතුණා. අපි දන්නවා, වෙන්නප්පුවේ බැංකුවලින් ණය අරගෙන පොලු තියපු මහත්වරුන් ජනතාව ගැන කිඹුල් කඳුළු හෙළන බව. අවශ්‍ය නම් ඒ බැංකුවේ නම ඇතුළු ඒ ගැන ඔක්කෝම විස්තර අපට දෙන්න පුළුවන්. ඇත්තටම හරිම කනගාටුයි.

අද විවාද වන මාතෘකාව ගැන කථා කළොත්, ඉදිකිරීම් ක්ෂේත්‍රය වාගේම වාහන ආනයනය කියන්නේ, රටක සංවර්ධනය මනින්න පුළුවන් දර්ශක දෙකක්. අපි අද දවසේ පාර්ලිමේන්තුව තුළ මේ ක්ෂේත්‍රවලට අදාළ නියම, නියෝග සාකච්ඡා කර සම්මත කරගන්න හදන්නේ. ඒ පිළිබඳව තමයි අපි අද විවාද කරන්නේ. වාහන ආනයනය මෙන්ම, ඉදිකිරීම් කියන්නේ ආවට ගියාට, පුද්ගල බද්ධව, එක් එක්කෙනාගේ අවශ්‍යතා අනුව ඉෂ්ට සිද්ධ කරන දෙයක් නොවෙයි. පසුගිය කාලය පුරාම අපි දුටුවේ අවිද්‍යාත්මක වැඩ පිළිවෙළක්. ඒ වාගේම වාහන ආනයනය කිරීමේ මාර්ග පද්ධති පිළිබඳව අපි ගැඹුරින් සිතා බැලිය යුතුයි. නමුත්, අවාසනාවකට අපේ රටේ එහෙම සිද්ධ වුණේ නැහැ. මම කියන්න කැමැතියි, පසුගිය දවස්වල රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මේ විද්‍යුත් වාහන ආනයනය සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදු වුණු බව. වැඩි විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් ගෙන්වා ගැනීමේ අවශ්‍යතාව මත විදේශ රටවල සේවය කරන අයට විද්‍යුත් වාහන ගෙන්වීමට ඉඩ ලබා දීමේ ක්‍රමයක් 2022 මැයි මාසයේ සිට 2023 සැප්තැම්බර් 05වන දින දක්වා ක්‍රියාත්මක කළා. ඒ ක්‍රමය යටතේ විදේශ රටවල සිටි අයට ඒ සඳහා අවස්ථාව සලසා දුන්නා. කියන්න කනගාටුයි, ඒ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන ඒ කාලයේ හිටපු සමහර මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුන් කරපු දේවල් ගැන. අපි ඒ සම්බන්ධවත් සාකච්ඡා කළා. එම බලපත්‍ර ලබා ගත් පිරිස අතර සිටි හතරදෙනෙක් ඒ කාල සීමාව තුළ විදේශයකට තබා ලංකාවට අයත් දූපතකටවත් ගිහිල්ලා තිබුණේ නැහැ. එහෙම හතරදෙනෙකුටත් බලපත්‍ර දීලා තිබුණා. ඒ වාගේම එම කාල සීමාව තුළදී එම බලපත්‍ර නිකුත් කිරීම ආනයන හා අපනයන පාලක වෙත පැවරීමකින් තොරව එම අධිකාරි බලය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් භාවිත කර තිබුණු බවත් කියන්නට ඕනෑ.

ඒ වාගේම එම බලපත්‍ර නිකුත් කිරීමේදී විදේශ රැකියාවල නියුතු අයට විදේශ රටක සේවය කිරීම සම්බන්ධව නිශ්චිත කාල සීමාවක් ලබා දී තිබුණා. නමුත් ඒ කාල සීමාව සම්පූර්ණ කර නැති අයට පවා - මාස 3ක් හිටපු අයට පවා - එම බලපත්‍ර ලබා දීලා තිබුණා. ඒ වාගේම විදේශ ප්‍රේෂණ යම් ප්‍රමාණයක් එවිය යුතුයි, ඒ වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා. ඔවුන්ට ඒ වත්කම තිබිය යුතුයි. නමුත් අපි දැක්කා, සමහර අය විදේශ ප්‍රේෂණ එවපු ක්‍රමවේදය සම්බන්ධව ගැටලු තිබුණු බව. ඔවුන් කළ රැකියාවලට අදාළව ගත්තාම, ඔවුන් එවා තිබුණු මුදල් ප්‍රමාණය සහ එම රැකියාව අතර ගැළපීමක් තිබුණේ නැහැ. නමුත් එවැනි අයත් accountsවලට විශාල වශයෙන් මුදල් එවා තිබුණා. එවැනි අයටත් වාහන බලපත්‍ර දීලා තිබුණා. අපට මෙතැනදී හිතන්න වෙන්නේ වෙනත් අයත් ඒවා භාවිත කර තිබුණු බවයි. එතැනදී මුදල් විශුද්ධිකරණයක් සිදුවී තිබෙන බව අපට හිතන්න වෙනවා. නමුත් ඒ සම්බන්ධව කිසිම ආකාරයකින් සලකා බලා නැහැ. එහෙම තත්ත්වයක් තමයි පැවති තිබෙන්නේ. වාහන ගෙන්වීමේ ක්‍රමවේදය මේ විධියට කාලයක් තිස්සේ අවභාවිත කරලා තිබුණේ.

විපක්ෂයේ සමහර මහත්වරුන් අද මෙතැනදී කෑ ගැහුවා, රේගු ආදායම වැඩි වුණේ බදු වැඩි කිරීම නිසා කියලා. හැබැයි මම

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එතුමන්ලාට කියන්න කැමැතියි, එම දත්ත ඉදිරිපත් කරද්දී නිවැරදිව කාල වකවානු ඉදිරිපත් කරන්න කියලා. කොච්චර කාලයක් වාහන ගෙන්වීම නවත්වා තිබුණාද? ඒකට හේතුව මොකක්ද? ඒ වාගේම බදු ආදායම වැඩි වෙන්න හේතුව මොකක්ද? ලංකාවට වාහන සහ වෙනත් භාණ්ඩ වර්ග ගෙන්වන මගේ හිතවතෙක් දැන් ටිකකට කලින් මට කථා කළා. ඔහු යම් සිද්ධියක් සම්බන්ධ විස්තරයක් මට කිව්වා. ඔහු කිව්වේ, වෙනදා ඔවුන් භාණ්ඩ නිදහස් කරගන්න ගියාම, සමහර අමාත්‍යාංශවල නිලධාරින්ගේ ලාච්චු ඇර තිබුණා, නමුත් දැන් ඒවා වසා තිබෙන්නේ, ඒ නිසා ඔවුන්ට දැන් ඒ නිශ්චිත බදු ගෙවා එන්න වෙනවා කියලායි. මම මේ කාරණය ගැන කියන්නේ රාජ්‍ය සේවය තුළ නිවැරදිව වැඩ කරන නිලධාරින්ට ගෞරවයක් ලබා දෙන ගමන්මයි. මොකද ඒගොල්ලන් එසේ නිවැරදිව කටයුතු කළාට, යම් සීමිත පිරිසක් හිටපු දේශපාලන අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා මුදල් සහ දේපළ අවභාවිත කර තිබෙනවා. ඒ ගැන මතක් කිරීමක් තමයි මම මේ කළේ. ඒ පැවති අවිද්‍යාත්මක වැඩ පිළිවෙළ නිසා මේ රටේ ආර්ථිකයට ඉතිහාසයේ විශාල බලපෑමක් එල්ල වුණා. ඒ නිසා තමයි වාහන ගෙන්වීම ඇතුළු සියලු දේවල් සම්බන්ධයෙන් අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවස තුළ විවාදයට ගන්නා මාතෘකා අතර තිබෙන ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්තාම, ඒ තුළට මාර්ග, ගොඩනැඟිලි, ඒ වාගේම වරාය, ගුවන් තොටුපොළවල් වැනි සියලු අංශ ඇතුළත් වෙනවා. ඒ සියලු අංශ රටකට අත්‍යවශ්‍ය බව අපි දන්නවා. මොන රජයක් බලයේ හිටියත් එවැනි කටයුතු සිදු කරන්න ඕනෑ, අනිවාර්යයෙන්ම. ඉතිහාසය තුළත් එවැනි ඉදිකිරීම් වුණා. හැබැයි, ඒවා විය යුත්තේ ජනතාවගේ අවශ්‍යතා මුල් කර ගනිමින්, ජනතාවගේ මුදල්වලට සාධාරණ වටිනාකමක් දෙමින්. එහෙම නැතුව එක එක පුද්ගලයන්ගේ හිත්වල පැළ වුණු අදහස්වලට නොවෙයි. අපි දන්නවා, ඉතිහාසය පුරාම ඉදිකිරීම් සිදු වුණේ නිවැරදි විද්‍යාත්මක ක්‍රමවේදයකට නොවෙයි කියන කාරණය. ජනතාවගේ අවශ්‍යතාවට නොවෙයි, ඒ ඉදිකිරීම්වලදී තැන දුන්නේ. මුදල් කුට්ටියට, කොමිස්වලට තමයි වැඩි අවස්ථාවක් ලබා දීලා තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, පසුගිය කාලයේ සමහර ඉදිකිරීම් කටයුතුවලදී ඒවාට අදාළව සියයට 5, 10, 15 යනාදී වශයෙන් කොමිස් මුදල් ලබා ගත් බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට ඉස්සෙල්ලා පැමිණි සමහර ආයෝජකයන් මේ කොමිස් මගඩිය දරා ගන්න බැරිව ආපහු ගියා කියලා ඔබතුමා දන්නවා. ඒ වාගේම, නව රජය එක්ක ඒ ආයතන සාකච්ඡා කරලා, ඒගොල්ලන්ගේ ඉදිකිරීම් කටයුතු ඇතුළු සියලු දේවල් නැවත පටන් ගෙන, අපිත් එක්ක එකඟ වෙලා වැඩ කටයුතු කිරීමේ කාලය තමයි දැන් උදා වෙලා තිබෙන්නේ. සමහර සංවර්ධන ව්‍යාපෘති ගත්තාම අපට පෙනෙන දෙයක් තිබෙනවා. අපි අධිවේගී මාර්ග හැදුවා; හැබැයි, අපි නිශ්චිතව ආර්ථිකය දියුණු කළේ නැහැ. අපි වරායන් හැදුවා; නමුත්, අපනයනය දියුණු කළේ නැහැ. අපි නෙළුම් කුලුන හැදුවා; නමුත්, සංචාරක කර්මාන්තය නිශ්චිතව, හොඳ මට්ටමකට ඔසවා තැබුවේ නැහැ. ඒ විධියට කළාම තමයි, ඒ ඉදිකිරීම්වල වටිනාකම නැති වෙන්නේ. ඒවායෙන් සමහර ඒවා සුදු අලි බවට පත් වෙලා තිබෙනවා. අපි ග්‍රාමීය නිෂ්පාදනය ඉහළ නංවන්න ඕනෑ. ඒ වාගේම, අධිවේගී මාර්ග ඔස්සේ නිෂ්පාදන වරායන්ට යන්න ඕනෑ. එමෙන්ම ඒ වරායන්වලින් නැවත ඒවා නැව්ගත වෙන්න ඕනෑ. එහෙම වුණාම තමයි, ආර්ථිකයේ ඉදිකිරීම්වල ප්‍රතිලාභ ජනතාවට ලැබෙන්නේ. නමුත්, පසුගිය කාලයේ ඒ ඉදිකිරීම් සිද්ධ වුණේ ඒකපාර්ශ්විකවයි. ඒ කියන්නේ, ප්‍රතිලාභ ලැබුවේ එක පිරිසක් විතරයි. සාධාරණ විධියට නොවෙයි, වංචා කරලා, හොරකම් කරලා තමයි ඒ ප්‍රතිලාභ ලබා ගත්තේ. නමුත්, කියන්න සතුටුයි, දැන් ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා. අපි නිෂ්පාදන ආර්ථිකය දියුණු කරමින් තමයි, ඉදිකිරීම් සිදු කරන්නේ. අපිට ලබන අවුරුද්ද කියන්නේ, මේ රටේ ග්‍රාමීය කර්මාන්තය අලුත් තලයකට ඔසවා තබන අවුරුද්දක්. ඒ ආර්ථික ප්‍රගමනයට සාපේක්ෂව අපි රටේ යටිතල පහසුකම් පුළුල් කරන්න ඕනෑ. අපි ඉදිකිරීම් ක්ෂේත්‍රය මත පදනම් වෙලා, ආර්ථිකය සහ ඉදිකිරීම් අතර පවතින මේ අවියෝජනීය සම්බන්ධතාව බිඳ දමන්න බැහැ. ඒ නිසා අපි ඒක ශක්තිමත් කරන්න ඕනෑ. ආණ්ඩුව මේ සිදු කරමින් ඉන්නේ එයයි. ඒක තමයි ජනතාව ඉල්ලන්නේ. ඒ වෙනුවෙන් තමයි අපි වැඩ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව එක කාරණයක් කියන්න තිබෙනවා. අපි මේ දිනවල ග්‍රාමීය මාර්ග කොන්ක්‍රීට් කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. දැන් අපේ ගම්වලට ගිහිල්ලා බලන්න. ඒ ග්‍රාමීය මාර්ග, කොන්ක්‍රීට් පාරවල් දැන් හදමින් පවතිනවා. ඒ අදාළ කොන්ත්‍රාත්තුවේ විධියට වෙන දා අඩි 100ක් දැම්මා නම්, අද අපි අඩි 120ක් දමන මට්ටමට ඒ දූෂණය, වංචාව නැති කරලා නිවැරදි මාර්ගයේ ඒ කටයුතු කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chathura Galappaththi. - *[Not in the Chamber.]*

The Hon. J.C. Alawathuwala. - *[Not in the Chamber.]*

Then, the Hon. Suranga Rathnayaka. You have nine minutes.

[අ.භා. 1.32]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රේගු ආඥාපනත යටතේ ගෙනෙන යෝජනා සම්මතය පිළිබඳවත් විවාද කරන අද දිනයේ ආනයන තීරු බදු සම්බන්ධව හා වාහන ආනයනය සම්බන්ධව විශේෂ කතිකාවක් ඇති වෙලා තිබෙනවා. මේ රටේ පුරවැසියෙක් විධියට, වාහන ආනයනය කරන්නට ජනතාවට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ රටේ ජනතාව තමන්ට වාහනයක් ගන්න බැරිව, වාහන ආනයනය කරන්න බැරිව දීර්ඝ කාලයක් තිස්සේ විශාල පීඩාවකට පත් වෙලා හිටියා. ඒ වාගේම, වාහනයක් අරගෙන තමන්ගේ ගමනක් බිමනක් යන්න බැරිව හිටපු ජනතාවට, ආර්ථිකය ක්‍රමයෙන් ප්‍රකෘතිමත්භාවයට පත් වෙලා අද වාහන ගන්නට ලැබීම පිළිබඳව වාගේම රටට වාහන ආනයනය කරන්නට ලැබීම සම්බන්ධව මේ රටේ පුරවැසියෙක් විධියට මම වර්තමාන රජයට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, එලෙස ස්තුතිවන්ත වෙන ගමන්ම අපි බලන්න ඕනෑ, අද මේ රටට වාහන ගෙන්වලා, මේ රටේ පුරවැසියන්ගේ ආර්ථිකයට දරා ගන්න පුළුවන් මට්ටමකද මේ වාහනවල මිල පවතින්නේ කියන එක. අපි දැක්කා, අද ලෝකයේ වාහන සඳහා වැඩිම බදු අය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානයට පත් වෙලා තිබෙන බව. වාහන සඳහා දෙවැනියට වැඩිම බදු අය කරන රට තමයි, ලංකාව. හැබැයි, ජනතාව බලාපොරොත්තු වුණේ මෙවන් රාජ්‍යයක් නොවෙයි. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල වාගේම ඔබතුමන්ලා වේදිකාවල කථා කළේ මෙවන් රාජ්‍යයක් ගැන නොවෙයි. රාජ්‍ය සේවකයින්ට, ඉතා අවම වැටුපක් ගන්නා මධ්‍යම පාන්තිකයන් සියලුදෙනාට වාහනයක සිහිනය සැබෑ කරනවා කියන පොරොන්දුව දීලා තමයි ඔබතුමන්ලා බලයට ආවේ. හැබැයි, අද ඒ සිහිනය නැති වෙලා තිබෙනවා.

[ගරු සුරංග රත්නායක මහතා]

ඔබතුමන්ලා වාහන ආනයනය, ආර්ථිකය ප්‍රකෘතිමත් වීම සම්බන්ධව කථා කරනවා වාගේම පැවැති රජයන්වලටත් ඒකේ යම්කිසි credit එකක් දෙන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා හැම වෙලාවේදීම කියනවා, ඔබතුමන්ලා භාර ගත්තේ බංකොලොත් ආර්ථිකයක් කියලා. හැබැයි, ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා විධියට පසුගිය අවුරුද්දේ අය වැය වෙලාවේදී ඉදිරිපත් කරලා තිබුණු මූල්‍ය ප්‍රකාශනයේදී පිළිගන්නවා, 2024 පළමුවැනි කාර්තුව වෙද්දී ක්‍රමයෙන් ප්‍රකෘතිමත් වෙමින් තිබුණු ආර්ථිකයක් තමයි ඔබතුමන්ලා භාර ගත්තේ කියලා. එහෙනම්, ඔබතුමන්ලා ප්‍රකෘතිමත් වෙන්නට ඒ අවස්ථාව හදලා දීපු පැවැති රජයන්වලටත් ඒ credit එක ලබා දෙන්න ඕනෑ කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම පසුගිය සතියේ ජනාධිපතිවරයා ප්‍රකාශ කළා, රටේ මුදල් සංචිතය රුපියල් ට්‍රිලියනය ඉක්මවා තිබෙනවා කියලා. ඒ ගැන අපි සතුටු වෙනවා. හැබැයි අපි බලනවා, මේ මුදල් සංචිතය රුපියල් ට්‍රිලියනය ඉක්මවා තිබෙන්නේ කොහොමද කියලා. මොකද, රාජ්‍ය ආදායම් වැඩි වෙලා තිබෙන්නේ වක්‍ර බදුවලින්; වක්‍ර බදුවලින් තමයි රාජ්‍ය ආදායම් වැඩි කරගෙන තිබෙන්නේ. එහෙම නැතුව සෘජු විදේශ ආයෝජනවලින්වත්, රජයේ වෙනත් ආදායම් මාර්ගවලින්වත් නොවෙයි. වක්‍ර බදුවලින් තමයි මේ ආදායම වැඩි කරගෙන තිබෙන්නේ. එහෙම නම් මේ වක්‍ර බදු ගහලා තිබෙන්නේ කාටද? එදා තමුන්නාන්සේලා විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට චෝදනා කළා, මේ රටේ ජනතාව නොමරා මරමින් බදු ගන්නවා කියලා. ඔබතුමන්ලා බලන්න, 2024 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා සහ 2025 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා වක්‍ර බදුවල වැඩිවීම කොච්චරද කියලා. මේ වක්‍ර බදු ගෙවන්නේ කවුද? විශාල වශයෙන් ආදායම් ලබා ගන්න රටේ පුරවැසියාද? නැහැ. එදිනෙදා ජීවත් වෙන්න බැරිව, තුන් වේල කන්න බැරිව කහට කෝප්පය බීලා, කුලී වැඩ කරලා ජීවත් වෙන අහිංසක ජනතාව තමයි මේ වක්‍ර බදු විධියට රජයට ආදායම් එකතු කරලා දීලා තිබෙන්නේ. එහෙම නම් ඒ ජනතාව තමයි තව තවත් පීඩාවට පත් කරලා තිබෙන්නේ. එදා ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කිව්වා, බදු ගහලා, බදු ගහලා ජනතාව පීඩාවට පත් කරනවාය කියලා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිල්ලා ඒ ජනතාවගේ පීඩාව නැති කරන්නට දීපු සහන මොනවාද?

විශේෂයෙන් තවත් කාරණයක් මම මතක් කරන්න ඕනෑ. ඔබතුමන්ලා පසුගිය අප්‍රේල් මාසයේදී මේ රටේ අඩු ආදායම්ලාභීන්ට රුපියල් 5,000ක බඩු මල්ලක් දෙන්න යෝජනා කරලා තිබුණා; මැතිවරණය වෙලාවේදී රුපියල් 5,000ක බඩු මල්ලක් දෙන්න යෝජනා කළා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 10,000ක් වෙන් කළා. හැබැයි, මැතිවරණ කොමිෂන් සභාව ඒක නතර කළා. ඒ අවස්ථාවේදී ඔබතුමන්ලා ප්‍රකාශ කළා, මැතිවරණය බලාගෙන නොවෙයි ඒක කළේ කියලා. නමුත් මැතිවරණය ඉවර වුණාට පස්සේ ඔබතුමන්ලාගේ කවුරුවත් ඒ ගැන කථා කළාද? ඒ මැතිවරණය වෙලාවේදී ඒ ජනතාවට ප්‍රශ්න තිබුණා නම්, අද ඒ ජනතාවට ප්‍රශ්නයක් නැද්ද? හැබැයි, ඔබතුමන්ලා කවුරුවත් අද ඒ ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය දන්නවා, ඔබතුමන්ලා මැතිවරණය ඉලක්ක කරගෙන ඡන්ද අල්ලසක් තමයි ඒ දෙන්න හැදුවේ කියලා. ඒ නිසා ඔබතුමන්ලා කියපු කාරණායි, අද කටයුතු කරන විධියයි අතර විශාල වෙනසක් තිබෙනවා. මේ රටේ ජනතාව මේවා ඔක්කොම බලාගෙන ඉන්නේ. ඒ නිසා ඔබතුමන්ලා හිතන්න එපා, මේ රටේ ජනතාව මෝඩයෝ කියලා. මේ රටේ ජනතාව ඉතාම බුද්ධිමත්. ජනතාව බලාගෙන ඉන්නවා, මේවාට උත්තර දෙන්න වෙලාව එනකම්; ජනතාවගේ වාරය එනකම්. ඒ නිසා ඔබතුමන්ලා දැන් හරි එදා මැතිවරණ වේදිකාවල පොරොන්දු වුණු කාරණා පිළිබඳව අවධානය යොමු කරන්න කියලා අපි විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම අවුරුද්දකම වාගේ, හැම කන්නයකම වාගේ අපේ රටේ ගොවි ජනතාවට මෙවරත් ප්‍රශ්න විශාල ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. මෙවරත් ගොවි ජනතාව තමන්ගේ වී අස්වැන්න අළෙවි කරගන්න බැරිව, ණය බරින් පීඩනයට පත් වෙලා ඉතාම අමාරුවෙන් තමයි කාලය ගත කරන්නේ. මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා, සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපතිවරයායි, ලේකම්වරයායි. දැන් ඒ දෙදෙනාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. හැබැයි, ගොවි ජනතාවගේ වී ටික අළෙවි කරගන්නට - විකුණා ගන්නට -, වී ටික ගන්නට හදලා තිබෙන ක්‍රමවත් වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපි ඔබතුමන්ලාගෙන් අහනවා.

ඒ වාගේම ඔබතුමන්ලාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. රුපියල් 110ට, 115ට ගොවි ජනතාවගේ වී අස්වැන්න ගනිමින් හිටියා. හැබැයි, ඔබතුමන්ලා කිසිම තේරුමක් නැතුව, කිසිම දෙයක් හොයා බලන්නේ නැතුව එක වතාවටම තෙත වී මිල කියලා මිලක් නියම කළා. ඒ තෙත වී මිල නියම කිරීම නිසා තමයි නැවත වතාවක් වී මිල පහත වැටුණේ. මේ බොහෝදෙනා ගොවි ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරලා, ගොවි ජනතාව වෙනුවෙන් පෙනී ඉඳලා, ගොවි ජනතාවගේ කර මතින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආපු අය. හැබැයි, ගොවි ජනතාවගේ ප්‍රශ්නවලදී ඔබතුමන්ලා ක්‍රියා කරන විධිය ගැන නැවත වතාවක් හිතා බලන්න කියන ඉල්ලීම අපි කරනවා.

පසුගිය මහ කන්නයේ වී අස්වැන්න මෙට්‍රික්ටොන් ලක්ෂ 24යි. මෙවර කෘෂිකර්ම අමාත්‍යාංශය ඇස්තමේන්තු කර තිබෙනවා, මෙට්‍රික්ටොන් ලක්ෂ 22ක්. මේ රටේ පරිභෝජනයට ඕනෑ ලක්ෂ 30යි නම්, අතිරේක වී අස්වැන්නක් අපට තිබෙනවා. එක වෙලාවක කෘෂිකර්ම අමාත්‍යවරයා මහ මෝල් හිමියන්ට තර්ජනය කරනවා, "ඔව්, අපි හාල් ටික පිටරටින් ගෙන්වනවා" කියලා. හාල් ටික පිටරටින් ගෙන්වනවා කියපු ගමන්ම මහ මෝල් හිමියන් වී මිලදී ගැනීම අඩු කර තිබෙනවා. මේ හැම ප්‍රශ්නයක්ම ගොවි ජනතාව පිට තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා ගොවි ජනතාවගේ කරපිටින් බලයට ආපු ඔබ සියලුදෙනා ගොවි ජනතාවගේ වී මිල ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබා දෙන්න කියා අපි ඉල්ලා සිටිනවා. ගමේ භාෂාවෙන් කියනවා නේ, "ටෝක්" විතරයි වැඩ නැහැ කියලා. කථාව තිබෙනවා. කථාව දෝලාවෙන් ගමන පයින් වාගේ තමයි ඔබතුමන්ලා කටයුතු කරන්නේ. එක්වරක් සහල් නිෂ්පාදකයන් සමඟ පැවැත්වූ සාකච්ඡාවකදී හාල් මිල රුපියල් 10කින් ඉහළ දැම්මා. ජනාධිපතිතුමා මේසෙට ගහලා එහෙම තීන්දුවක් තමයි ප්‍රකාශයට පත් කළේ. වී මෝල් හිමියන්ව පාලනය කරනවා කිව්වා. කෘෂිකර්ම ඇමතිවරයාත් කිව්වා. හැබැයි ඒ එකක්වත් වෙන්නේ නැහැ. අවසාන වශයෙන් ඔබතුමන්ලායි, වී මෝල් හිමියනුයි අතර තිබෙන ප්‍රශ්නයෙන් තැළෙන්නේ, ගොවි ජනතාව. ගොවි ජනතාව තමයි අද නන්නත්තාර වෙලා තිබෙන්නේ. ඒ නිසා ගොවි ජනතාවගේ පිහිටෙන් පාර්ලිමේන්තුවට ආපු බොහෝදෙනාට අද ගොවි බිම්වලට යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ පිළිබඳව ආණ්ඩුවක් විධියට අවධානය යොමු කරන්න. ඒ වාගේම ඔබතුමන්ලා බලයට එනකොට මේ රටේ ජනතාවට දීපු පොරොන්දු ටික ඉෂ්ට කරන්න කියන ඉල්ලීමත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Padmasiri Bandara. You have ten minutes.

[අ.භා. 1.41]

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විවාදය තුළ 2018 අංක 35 දරන මුදල් පනත යටතේ ගෙනෙන නියෝගය සහ 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග ගැනත් සාකච්ඡා වෙනවා. විපක්ෂයේ බොහෝ අය මේ පනත් ගැන කථා කරනවාට වඩා තම තමන්ගේ පරාජිතත්ත්වය මත ශෝක වෙමින්, ආණ්ඩු පක්ෂයේ තිබෙන බොහෝ දේවල් කථා කරමින්, වැඩිම ප්‍රමාණයක් බොරු කියමින් ආණ්ඩු පක්ෂයට විවේචනයක් එල්ල කරන බවක් මම දැක්කා.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාගෙන් කියැවුණා වී මිලදී ගැනීම සම්බන්ධයෙන් යම් අදහසක්. මම පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. පොළොන්නරුවේ තිබෙන සියලුම ගබඩා මේ සතියේ සඳුදා ඉඳලා විවෘත කරලායි තිබෙන්නේ. එතුමාගෙන් කියැවුණා වී මිලදී ගැනීම සඳහා මධ්‍යස්ථානයක් නැහැ කියලා. අපි කියනවා, මේ සතියේ සඳුදා ඉඳලා දිස්ත්‍රික්කයේ සියලුම මධ්‍යස්ථාන ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා කියලා. ඒ වාගේම මහ මෝල් හිමියන්ට ආණ්ඩුව යට වෙලා නැහැ. පසුගිය ආණ්ඩු කාලයේ මහ මෝල් හිමියන් ආණ්ඩු යට කරලා යම් බලයක් අත්පත් කර ගත්තා. ඒක බිඳීමේ ක්‍රියාවක් තමයි අපේ ආණ්ඩුව තුළ සිදු කරමින් තිබෙන්නේ.

සතොස ගබඩා 30කට වැඩි ප්‍රමාණයක් අපේ දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. සමුපකාර ගබඩා 100කට වැඩි ප්‍රමාණයක් අපේ දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. හැබැයි, පසුගිය ඉතිහාසයේ ඒ සියලු ගබඩා වසා දමලායි තිබුණේ. විශේෂයෙන්ම වී අලෙවි මණ්ඩලයේ ගබඩා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා සියල්ලම වසා දමලායි තිබුණේ. නමුත්, අපි පසුගිය කන්නයේ ඉඳලා වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය ගබඩා සියල්ලම අපේ ගොවි මහතුන්ගේ ශ්‍රම දායකත්වයෙන් සුද්ද කළා. අපි බලාගෙන හිටියා, ගොවි මහත්වරු වී ලබා දෙයි කියලා. නමුත්, ඒ කන්නයේ වී නොදුන්නාට මෙවර යල කන්නයේදී අපි මේ වෙනකොට මෙට්‍රික්ටොන් 26,000කට වැඩි ප්‍රමාණයක් වී මිලදී අරන් තිබෙනවා. ඒ වාගේම, පොළොන්නරුව දිස්ත්‍රික්කය තමයි මෙවර යල කන්නයේ වැඩිම වී අස්වැන්නක් වාර්තා කරන්නේ සහ වැඩිම වී ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ නිසා ඊට අවශ්‍ය කරන සියලුම පසුබිම් තත්ත්වයන් අපි මේ වෙනකොට සම්පාදනය කරලා, ගොවියාගේ වී ටික කිලෝව රුපියල් 120 ගණනේ ලබා ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා. මොකද, පසුගිය කාලය පුරා සතොස ගබඩා ඇතුළේ වී කිලෝ දහස් ගණනක් ගුල්ලෝ ගහලා විනාශ වුණා. හේතුව මොකක්ද? අත යට ගනුදෙනු ඇතුළේ තෙත වී අරගෙන, ඒවා ගබඩාවල තැන්පත් කළාට පස්සේ මාසයක් දෙකක් යද්දී එම වී සියල්ලම ගුල්ලෝ ගහලා විනාශ වෙනවා. අපි වියළි බර සහිත වී මිලදී ගැනීම ආරම්භ කර තිබෙනවා. එම නිසා විපක්ෂයේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරන ඒ යෝජනාව සහ චෝදනාව ප්‍රතික්ෂේප කරනවා.

විශේෂයෙන්ම අපි අද උදේ ඉඳන් මේ සභාවේ දැකපු දේ මොකක්ද? අදාළ මාතෘකාව ගැන කථා නොකරමින්, තම තමන්ගේ දේශපාලන මත කියමින්, තමන්ට වාසිසහගතව යමක් දිනා ගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය මත බොහෝ කරුණු ඉදිරිපත් කිරීම් තිබුණා. නමුත්, මම මේ මොහොතේ බලාපොරොත්තු වන්නේ අපේ මාතෘකාවට අදාළව යම් අදහසක් ඉදිරිපත් කරන්නයි.

විශේෂයෙන් අපි දන්නවා, මෑත කාලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කඩා වැටීමක් තිබුණු බව. ඒ කාලපරාසය ඇතුළේ ඉදිකිරීම් සියල්ලම විනාශ වෙච්ච තත්ත්වයක් තිබුණා. වසර 5කට වැඩි කාලයක් මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය බරපතළ බිඳ වැටීමකට ලක් වෙලායි තිබුණේ. නමුත්, අද වෙනකොට ගම්මාන ඇතුළේ නිවාස ඉදිකිරීම් ආරම්භ වෙලා තිබෙන බව අපට පේනවා. රජයේ ගොඩනැඟිලි ඉදිකිරීම් ආරම්භ වෙලා තිබෙනවා, මහාමාර්ග ඉදිකිරීම් ආරම්භ වෙලා තිබෙනවා, වාරිමාර්ග ඉදිකිරීම් ආරම්භ වෙලා තිබෙනවා. ඒත් එක්ක ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල පිම්මක් පැනීම සඳහා අවශ්‍ය කරන මූලික පදනම වැටෙමින් තිබෙන වෙලාවක තමයි මේ සංශෝධන අපි මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ.

පසුගිය කාලයේ කොන්ත්‍රාත් ලබා ගැනීමේදී විශාල මුදල් අය කිරීමක් තිබුණා. කුඩාම ව්‍යාපාරිකයාගේ, ආයෝජකයාගේ ඉඳලා මහා පරිමාණ ආයෝජකයා දක්වා තමන්ට හිමි, තමන් සතු වත්කම් මූලික කරගෙන ඒ කොන්ත්‍රාත් සාධාරණ ලෙස ලබා ගැනීම සඳහා කටයුතු කරන්න අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම තමයි අපි මේ සංශෝධන ගෙන ඒමෙන් බලාපොරොත්තු වන්නේ. මොකද, පසුගිය කාලයේ කෙටුම්පත් වුවමනා වුණේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට තමයි කොන්ත්‍රාත් එකේ මූලික යෝජනාව එන්නේ. ඔහු තමයි තීන්දු කරන්නේ. මේ දවස්වල අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පවත්වනකොට ඒ සම්බන්ධයෙන් අත්දැකීම් සහිත ප්‍රාදේශීය ලේකම්වරු, අත්දැකීම් සහිත ඉංජිනේරු මහත්වරු කියන දේ තමයි, "වෙනදා නම් මේ කාලය වෙනකොට සම්බන්ධීකරණ කමිටුවේ ලොකුම කලබලය තමයි මන්ත්‍රීවරු පාරවල් බෙදා ගන්න එක. මේ ඉදිකරන ගොඩනැඟිලිවල කොන්ත්‍රාත් එක ගන්න එක ගැන තමයි සම්බන්ධීකරණ කමිටුවේ විශේෂයෙන් සාකච්ඡා වෙන්නේ." කියලා. මොකද, අපි ඒ කාගෙන්වත් එක රුපියලක්වත් ගන්නේ නැතිව ඉතාම සාධාරණ ලෙස මේ වෙනකොට ඒ කොන්ත්‍රාත් කරන අයට අවශ්‍ය පසුබිම සකස් කරමින් තිබෙනවා. ඔවුන්ට තවත් සාධාරණයක් ඉටු කිරීම සඳහා තමයි මේ සංශෝධන අපි පාර්ලිමේන්තුවට ගේන්නේ.

විශේෂයෙන්ම අපේ ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පාරක් ඉදිකරනකොට, ඒ වාගේම පාරක් කොන්ත්‍රාත් ගන්නකොට පසුගිය කාලය පුරාවට තිබිච්ච ඒ දූෂිත තත්ත්වයන් සමාජයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමත් එක්ක, අපේ සමාජ ප්‍රගමනය සඳහා, ව්‍යාපාරික කටයුතු කරන අය දිරිගැන්වීම සඳහා මේ සංශෝධනවලින් විශාල පහසුකමක් ලබාදීමේ හැකියාවක් අපට තිබෙනවා. ඒත් එක්ක රටේ ආර්ථික ස්ථාවරත්වය, දේශපාලන ස්ථාවරත්වය ඇති වී, රට තුළ තිබිච්ච දූෂිත තත්ත්වය සමාජයෙන් ඉවත් වීම නිසා, ඒ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ජනතාව තමන්ගේ යහපත වෙනුවෙන්, උන්නතිය වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරමින් ඉන්නා මොහොතකයි මේ සංශෝධනය අපි පාර්ලිමේන්තුවේ සම්මත කරන්න සූදානම් කර තිබෙන්නේ.

විපක්ෂයේ මහත්වරුන්ට මේ සම්බන්ධයෙන් බොහොම හිත්වේදනාවක් තිබෙනවා. මොකද, විශාල මුදල් කන්දක් වෙනදා මේ කාලය වෙනකොට තමන්ගේ අතට ගත්තා. අද වෙනකොට ඒවා අහිමි වෙලා තිබෙනවා. විපක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා, විශාල බදු මුදලක් ජනතාව මත පටවා තිබෙනවා, විශාල ලෙස බදු මුදල් අය කරමින් තිබෙනවා, ඒවා වක්‍ර බදු හැටියට ජනතාවගෙන් අත්පත් කර ගනිමින් තිබෙනවා කියලා. ඔව්, යම් ප්‍රමාණයක බදු මුදලක් ජනතාව මත පැටවිලා ඇති.

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

හැබැයි, පසුගිය ඉතිහාසයේත් බදු මුදල් පැනෙව්වා; බදු මුදල් ජනතාවගෙන් අය කළා. ඒ කාලයේ අය කරපු බදු මුදල් ඒ හිටපු අය හොරා කෑවා. නමුත්, අපි අද ජනතාවගෙන් අය කරන බදු මුදල ජනතාවගේ උන්නතිය වෙනුවෙන් මේ අවස්ථාවේදී යොදවනවා. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ එවැන්නක්. මොකද, බදු නැතිව, දඩ නැතිව, ලෝකයේ කිසිම රටකට, කිසිම රාජ්‍යයකට ගොඩ නැඟීමට වටපිටාවක් හැදෙන්නේ නැහැ. එහෙම බදු අය නොකර ඉන්න බැහැ. අපේ ආණ්ඩුව කියන්නේ විශේෂ ආණ්ඩුවක් නොවෙයි. අපි කළේ මොකක්ද? හොරා කාපු එක නතර කරලා තිබෙනවා, අල්ලස නතර කරලා තිබෙනවා, මන්ත්‍රීවරයා කරපු කොන්ත්‍රාත් එක නතර කරලා තිබෙනවා. ඒක තමයි අපේ තිබෙන විශේෂත්වය. ඒ විශේෂ තත්ත්වයන් දැක දැකත් සමහරු කියනවා, අපි ජනතාවගේ බදු මුදල් හොරා කනවා කියලා. හොරා කෑමක් නොවෙයි අපි කළේ. නමුත් ඉතිහාසය පුරා නම් හොරා කෑමක් කළා.

විශේෂයෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්තාම, පොළොන්නරුව දිස්ත්‍රික්කයට අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 10,200ක් වෙන් කර තිබෙනවා. ඒකෙන් සියයට 60ක් අපි යොදවා තිබෙන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට. ඒ ප්‍රදේශවල ජීවත් වන ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ඒ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දියුණුවත් එක්ක ශක්තිමත් වෙනවා; ඒ දියුණු වන ආර්ථිකයත් එක්ක ජන ජීවිතය ශක්තිමත් වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ඔබගේ විවේචන බලාපොරොත්තු වෙනවා. හැබැයි, ඒ විවේචනය ඔය විධියේ ඍණාත්මක විවේචනයක් නොවිය යුතුයි. ධනාත්මක විවේචනයක් ඉදිරිපත් කරන්න කියා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. D.V. Chanaka. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA]took the Chair.

[අ.භා. 1.52]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද මේ අවස්ථාවේ විශේෂයෙන්ම වාහන ආනයනය පිළිබඳව, බදු පිළිබඳව, HS codes කිහිපයක් පිළිබඳව වාගේම ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳව මෙහිදී වාද විවාද කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි එක පැත්තකින් ස්තුතිවන්ත වෙනවා, වාහන ආනයනය ආරම්භ කිරීම පිළිබඳව. ඒ වාගේම ඔබතුමන්ලා ලබා දීපු පොරොන්දුත් මතක් කර දෙන්න කැමැතියි. මොකද, ඒ දවස්වල ඔබතුමන්ලා කිව්වා, ලෝකයේ වැඩිම බදු අය කරන රටවලින් එකක් තමයි ලංකාව කියලා. හැබැයි, ඔබතුමන්ලා එහෙම චෝදනා කරපු අවස්ථාවේත් ලංකාව, වැඩිම බදු අය කරන රටවල් 20 අතරේ නම් හිටියේ නැහැ. ඔබතුමන්ලා ආපු ගමන් මොකද කළේ? ඔබතුමන්ලා ආපු ගමන්ම Luxury Tax එකක් සුඛෝපභෝගී වාහනවල මිලට ඇතුළත් කළා; සියයට 60ක බද්දක් අලුතින් එකතු කළා. Vitz cars අඩුවට දෙනවා කියලා ඇවිල්ලා අන්තිමට තිබුණු බද්දටත් වඩා වැඩි බද්දක් අලුතින් එකතු කළා. මේ මොකක්ද වුණේ? එක පැත්තකින්, වාහන ආනයනයට අවසර දෙනවා; අනෙක් පැත්තෙන්, සාමාන්‍ය ජනතාවට, මධ්‍යම පාන්තිකයාට වාහනයක් ගැනීමට තිබුණු අයිතිය සම්පූර්ණයෙන් නැති කර තිබෙනවා. වාහනවලට අය කරන බදු අතින් ගත්තාම, අද ලෝකයේම දෙවැනි තැනට ලංකාව ඇවිත් තිබෙනවා. ඔබතුමන්ලා බලයට ආවේ, තිබුණු බදු ටික අයින් කරන්න. හැබැයි, අන්තිමට තිබුණු බදු අයින් කිරීම කෙසේ වෙතත්, සියයට 60ක බද්දක් අලුතින් අය කරන්න කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද උදේ ඉඳන්ම මෙතුමන්ලා ආර්ථිකය දියුණු කරපු ආකාරය පිළිබඳව දිගින් දිගටම කථා කළා. හැබැයි මහ බැංකු වාර්තාව - Central Bank Report එක - අනුව බැලුවාම නම් එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ. ලංකාවේ විතරක් නොවෙයි මුළු ලෝකයේම රටවල ආර්ථිකය මනින ප්‍රධාන ඒකකය තමයි ආර්ථික වර්ධන වේගය. ඔබතුමන්ලා මේ රට භාර ගනිද්දී තිබුණු සියයට 5.3ක ආර්ථික වර්ධන වේගය අද සියයට 4.8ක් දක්වා කඩාගෙන වැටිලා තිබෙනවා; එහෙම නැත්නම් දශම පහකින් අඩු වෙලා තිබෙනවා. ඒ තිබුණු වර්ධනය සියයට 15කින් විතර අඩු වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, කෘෂි කර්මාන්තයේ වර්ධනය ඍණ පැත්තට ගිහින් තිබෙනවා. ඔබතුමන්ලා බලයට ආවේ වර්ධනය වැඩි කරන්න. හැබැයි ආර්ථික වර්ධනය ඍණ පැත්තට ගිහින් තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා කියනවා මම දැක්කා Central Bank එකේ ට්‍රිලියනයක - බිලියන 1,000ක - reserve එකකුත් තිබෙනවා කියලා. මා දන්නා විධියට නම් සාමාන්‍යයෙන් Central Bank එක එවැනි reserve maintain කිරීමක් කරන්නේ නැහැ. Dollar reserve එකක් තමයි maintain කරන්නේ. ඒ වාගේම පොඩි cash ප්‍රමාණයක් printed money හැටියට තබාගන්නවා. ඒ හැරෙන්න ඔය කියන විධියට නම් maintain වෙන්නේ නැහැ. හැබැයි අපේ Treasury එකට, එහෙම නැත්නම් Primary Account එකට ගිහින් බැලුවත් බිලියන 1,000ක් කොහේවත් නැහැ. දැන් හරි නම් තිබෙන්න ඕනෑ surplus එකක්. ජනාධිපතිතුමා කියනවා වාගේ Primary Account එකේ surplus එකක් තිබෙන්න ඕනෑ. හැබැයි අපි මහ බැංකු වාර්තාව ගත්තාම, ඒකේ කොහේවත් එහෙම සඳහන් වෙන්නේ නැහැ; එහෙම ට්‍රිලියනයක් කොහේවත් තිබෙනවා කියලා පේන්නේ නැහැ. එහෙම නම්, ජනතාව නොමග යැව්වාද කියන ප්‍රශ්නය එක පැත්තකින් තිබෙනවා. අනෙක් අතට, ඔබතුමන්ලා උදේ ඉඳන් දිගින් දිගටම money printing - මුදල් අච්චු ගැසීම - ගැන කථා කළා, එය සාධාරණීකරණයත් දිගින් දිගටම කළා. හැබැයි, එක පැත්තකින් money printing කෙරෙනවා, අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා ආණ්ඩුව අරගෙන අන්තිම මාස 7 රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා, rupee එක depreciate වෙලා තිබෙනවා සියයට 3කින්. එක පැත්තකින්, ආර්ථික වර්ධන වේගය අඩු වෙනවා, කෘෂි වර්ධන වේගය අඩු වෙනවා, රුපියල සියයට 3කින් අඩු වෙනවා; ආර්ථිකය ක්‍රමානුකූලව කඩාගෙන වැටෙනවා. දැන් money print කරන්නේ - මුදල් අච්චු ගහන්නේ - කවුද කියලා ඇහුවාම ආණ්ඩුව කියන්නේ මොකක්ද? එහෙම කරන්නේ Central Bank එක ලු.

ඒක මහ බැංකුවේ වැඩක් ලු; ආණ්ඩුවේ වැඩක් නොවෙයි ලු. හැබැයි මහ බැංකුවේ තිබෙන ඩොලර් බිලියන 6.5ක reserve එක ගැන කථා කළාම, ඒක ආණ්ඩුවේ ජයග්‍රහණයක් ලු. එකතු කරන ඩොලර් ටික ආණ්ඩුවේ ජයග්‍රහණයක් වෙනවා, හැබැයි money printing කළොත්, Treasury Bills issue කළොත්, Treasury Bonds issue කළොත්, ණය ගත්තොත්, ඒක Central Bank එකේ කටයුත්තක් වෙනවා. මේක අමුතුම එකක්. Credits ආවොත් ඒක ආණ්ඩුවට ලු; මොනවා හරි ණයක් ගත්තොත්, money print කළොත් ඒක කරන්නේ ආණ්ඩුව නොවෙයි ලු, Central Bank එක ලු. හැබැයි වාසනාවට මේ ආණ්ඩුව එන්න කලින් මහ බැංකුවට ස්වාධීනව වැඩ කරන්න පුළුවන් අයිතිය හදලා දුන්නා. ඒ හින්දා යන්තම් මේ තත්ත්වයෙන්වත් රට කරගෙන යනවා. එදා හිරේ දානවා කියපු මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහ බැංකුවේ සභාපතිතුමා තියාගත්තු හින්දා අද මේ ආකාරයෙන් හෝ රට කරගෙන යනවා.

මට කලින් කථා කළ ආණ්ඩුවේ ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම කියපු දෙයක් තමයි දැන් දූෂණ, වංචා නැති වෙලා තිබෙනවා කියන එක. කොහේද දූෂණ වංචා නැති වෙලා තිබෙන්නේ? කන්ටේනර් වංචාව ගැන පැමිණිලි කරලා තිබෙනවා. අද වනකල් ඒ එකක් ගැනවත් ප්‍රශ්න කරලා නැහැ. ලුණු වංචාව පිළිබඳව පැමිණිලි කරලා තිබෙනවා. අඩුම ගානේ තවම පැමිණිලිකරුගෙන් statement එකක්වත් අරගෙන නැහැ. අනෙක් පැත්තෙන්, ඔය ඉස්සරහා පෙළේ ඉන්න අමාත්‍යවරයකුට - බලශක්ති අමාත්‍යවරයාට - අල්ලස් පිළිබඳව ලොකු චෝදනාවක් එල්ල වෙනවා. හැබැයි අද වනකල් ඒ ගැන පරීක්ෂණයක් නැහැ. අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන නම්, ඇයි ඇමතිවරුන්ට පරීක්ෂණ එන්නේ නැත්තේ? තව ඇමතිවරයෙකුට උසාවියෙන් නියෝගයක් දෙනවා, කටඋත්තරයක් දෙන්න කියලා. දැනට මාස 4ක් වෙනවා, අද වනකල් කටඋත්තරය දීලා නැහැ. ඒ, හොර ඔප්පු හැදීම පිළිබඳවයි. එහෙම නම් කොහේද දූෂණ, වංචා නැවතිලා තිබෙන්නේ?

අද මේ මොහොතේ මම හෙළි කරන්න යන්නේ ඊටත් වඩා බරපතළ වංචාවකට පාර කපා ගැනීමක් පිළිබඳවයි. ලංකාවේ තිබෙනවා international tendersවලට අදාළ guidelines; ලංකාවේ ජාත්‍යන්තර ප්‍රසම්පාදන කටයුතුවලට guideline එකක් තිබෙනවා. ඒ guideline එක අනුව, මොකක් හරි ප්‍රසම්පාදනයක් කරනවා නම්, ටෙන්ඩර් එකක් කරනවා නම් සති 6ක කාලයක් දෙන්න ඕනෑ ඒ ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය කටයුතු කර ගන්න. ටෙන්ඩරය issue කළාම එතැන ඉඳලා සති 6ක කාලයක් දෙන්න ඕනෑ. හැබැයි ලංකාවේ ගල් අඟුරු ටෙන්ඩරයට මොකද කරන්නේ? මෙතුමන්ලාගේ අලුත් ආණ්ඩුව කැබිනට් එකට ගිහින් මේ සති 6 අඩු කර ගන්නවා සති 5කට. හැබැයි, එහෙම අඩු කරගෙන එතැනින් නවතින්නේත් නැහැ. සති 5කට තමයි කැබිනට් එක approval එක දෙන්නේ. එහෙම තිබියදී නැවත වතාවක් ජාතික ප්‍රසම්පාදන කොමිසමට ගිහින් කියනවා, සති 5ක් බැහැ, ලංකාවේ ගල් අඟුරු නැති වෙනවා, ඒක හින්දා ඒක සති 3කට අඩු කරලා දෙන්න කියලා. මොකක්ද මේ වැඩේ? ජාත්‍යන්තර ටෙන්ඩරයක් පළමුවැනි වතාවට සති තුනකින් close වෙනවා. ඇයි ටෙන්ඩරය වෙලාවට දැම්මේ නැත්තේ? ටෙන්ඩරය ඉස්සෙල්ලාම මාස එකහමාරක් පරක්කු කරනවා. ගිය ආණ්ඩුවේ ගල්අඟුරු ගෙනාපු අය දූෂිතයි කිව්වා, වංචාකාරයෝ කිව්වා. හැබැයි ඒ සමාගමටම මෙතුමන්ලා තව 6ක් අලුතින් ගහලා දෙනවා. තව 6ක් අලුතින් ගහලා දීලා ඒ මිල ගණන්වලටම ටෙන්ඩරය දීලා, ටෙන්ඩරය පිටිපස්සට දානවා. මාස එකහමාරක් ටෙන්ඩරය පරක්කු කරලා ප්‍රසම්පාදන කමිටුවට ගිහිල්ලා කියනවා, "සති තුනෙන් අපට ටෙන්ඩරය ඉවර කරන්න දෙන්න, නැත්නම් ලබන අවුරුද්දේ විදුලිය නැහැ" කියලා. මොකක්ද මේ කරන්නේ? තමන්ට සුදුසු, තමන්ගේ ගජ මිතුරෙකුට ටෙන්ඩර් එක දෙන්න පුළුවන් ක්‍රමය හදනවා. මේ ජාත්‍යන්තර ටෙන්ඩරය කවදාවත් සති තුනෙන් ඉවර කරන්න බැහැ. මේවායේ performance bond එක විතරක් සාමාන්‍යයෙන් ඩොලර් මිලියන 15ත්, 30ත් අතර තියන්න ඕනෑ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන කාරණය ඩොලර් බිලියනයකට වඩා වටින, බරපතළ දූෂණයක් ගැන ප්‍රශ්නයක්. ඔබතුමා වගකීමෙන්ද ඒක කියන්නේ? මොනවාද තිබෙන සාක්ෂි ඔබොම කියන්න? ඔබතුමා හිතනවාද, මේ වාගේ දූෂණයට විරුද්ධ ඇමතිවරයෙක් කවදාහරි ඔය වාගේ වැරදි වැඩක් කරයි කියලා?

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මම අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරය දෙන්න ඕනෑ Cabinet Paper අංකය 78/2025-P. මෙන්න මේ Cabinet Paper එකෙන් තමයි මේ සති 6ක් තිබෙන එක සති 5කට අඩු කරගන්නේ. අජිත් පී පෙරේරා මන්ත්‍රීතුමා, තවම හොඳම ටික කිව්වේ නැහැ. මේ ටෙන්ඩරයට අනිවාර්යයෙන් සභාපතිතුමා අත්සන් කරන්න ඕනෑ. මේ ගල්අඟුරු ටෙන්ඩරයට සාමාන්‍යයෙන් සභාපතිතුමා අත්සන් කරන්න ඕනෑ. ගිය සතියේ සඳුදා ඉඳන් සභාපතිතුමා අතුරුදහන්. ඔන්න අද එවලා තිබෙනවා resignation එක. මේක අත්සන් කරන්න බැහැ කියලා ඉල්ලා අස්වීමේ ලිපිය එවලා තිබෙනවා. පළමුවැනියෙන් ටෙන්ඩරය කල් දානවා. ඊට පස්සේ register වෙන්න තමන්ගේ යාළුවන්ට, කොම්පැනිවලට ඉඩ දෙනවා. ඊට පස්සේ කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා සති 5 කරගන්නවා. ඊට පස්සේ Procurement Committee එකට ගිහිල්ලා සති 3 කරගන්නවා. අන්තිමට ගල්අඟුරු ටික stock කරගත්ත, performance bonds කලින් හදාගත්ත තමන්ගේ ගජ මිතුරෙකුට අර පොහොර එකේදි වාගේම ටෙන්ඩරය ලබා දෙන්න පුළුවන් වංචාවට අවශ්‍ය කටයුතු ටික සූදානම් කරගෙන මේ ආණ්ඩුව ඉන්නවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.02]

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද මෝටර් වාහන මත පැනවෙන සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන නියෝගය සම්බන්ධයෙනුත්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග සම්බන්ධයෙනුත්, ඒවාට අදාළ ගැසට් නිවේදන සම්බන්ධයෙනුත් සාකච්ඡා කරනවා.

[ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා]

මම මේ වෙලාවේ කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි ආර්ථිකයේ යම් කළමනාකරණයක් කරමින් ඉන්නවා. මම හිතන විධියට, මේ ආර්ථික කළමනාකරණය පිළිබඳව විපක්ෂය අද ගොඩක් කලබල වෙලා. ඒ කලබල වෙලා තිබෙන්නේ මේ නිසායි. එතුමන්ලා හිතාගෙන හිටියේ මේ රට ඉක්මනට කඩාගෙන වැටෙයි, ආණ්ඩුවට ඉස්සරහට යන්න බැරි වෙයි කියලා. එහෙම සිහින දකිමින් හිටියේ. ඒ සිහින බොඳ වෙනවා. එකින් එක දවසින් දවස ඒ සිහින බොඳ වෙනවා. ඒ සිහින බොඳ වෙනකොට විපක්ෂය කලබල වෙනවා. මීට කලින් කථා කරපු මන්ත්‍රීවරයාගෙනුත් අපි දැක්කේ ඒ කලබල වීම. ඒ කලබල වීම නිසා තමයි මේ රටේ සංවර්ධනය පිළිබඳව, දළ ජාතික නිෂ්පාදනය පිළිබඳව කථා කරනකොට අනෙක් සියලු දේවල් අද ගොඩක් අමතක කරන්න වෙලා තිබෙන්නේ.

මහා භාණ්ඩාගාරය ගැන කථා කළා. මහා භාණ්ඩාගාරය කඩා වැටිලා කිව්වා. හැබැයි අපි අද දන්නවා, ඉතාම නිවැරදිව මේ ආර්ථිකය කළමනාකරණය කිරීම නිසා තමයි අද අපට රට මේ වාගේ ස්ථාවර තැනකට ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියලා. මේ රටේ වාහන ආනයනය නවත්වලා තිබුණේ; දින නියමයක් නැතුව කල් දමලා තිබුණේ. අපට පුළුවන්කම ලැබුණා, අපේ ආණ්ඩුව යටතේ ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න, නැවත වාහන ආනයනය කිරීමේ අවස්ථාව විවර කරන්න. ඒක අපි අද මහ පාරට බැස්සාට පස්සේ පේනවා. මේ ගරු මන්ත්‍රීතුමන්ලාට පේනවා ඇති අද අලුතින් කොච්චර වාහන පාරේ ගමන් කරනවාද කියලා. එතකොට ඒවා නැවතිලා නැහැ. ඒවා අලුතින් පටන් ගෙන තිබෙනවා. ඒකට කිඹුල් කඳුළු හෙළන තැනට අද පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඉදිකිරීම් කර්මාන්තය මේ රටේ මාෆියාවක් බවට පත් වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීගේ ඉඳලා පාර්ලිමේන්තු මන්ත්‍රී, ඇමති දක්වා මේවාට මැදිහත්වීම් කරමින්, කොමිස් අරගනිමින්, කොන්ත්‍රාත් කරමින් තිබුණු යුගයක් තමයි අපි පහු කරමින් ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මේ ඉදිකිරීම් කර්මාන්තය නිවැරදි කරන්න ඕනෑ. ක්‍රියා පටිපාටියකට අනුව හැම ටෙන්ඩරයක්ම පිරිනමන්න පුළුවන් විධියට මේවා විධිමත් කරන්න අවශ්‍යයි. ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් දැන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

CIDA එක විසින් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී ගාස්තු අය කළා. ඒ එක්කම ලියාපදිංචි වෙලා තිබුණු කොන්ත්‍රාත්කරුවන් අක්‍රිය වෙලා තිබුණා. ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කර ගන්න ඕනෑ වෙලා තිබුණා. අන්න ඒ වෙලාවේත් ඒ සඳහා සමාන මුදලක් තමයි අය කළේ. අන්න ඒ මුදල අද රුපියල් 5,000ක් දක්වා අඩු කරලා තිබෙනවා. ඒක විශේෂ අවස්ථාවක්. පසුගිය ඉතිහාසය ගත්තොත්, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වෙලා හිටියා. හැබැයි, ඒ කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය මැදිහත්වීම් කළේ නැහැ. ඒ කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය කොන්ත්‍රාත් ලබා දුන්නේ නැහැ. ඇයි කොන්ත්‍රාත් ලබා දුන්නේ නැත්තේ? පසුගිය කාලයේ ප්‍රාදේශීය මාර්ග ඉදිකිරීම්වලදී, ප්‍රාදේශීය ඉදි කිරීම්වලදී ප්‍රජා පාදක සමිතිවලින් තමයි ඒ කොන්ත්‍රාත් කළේ. ප්‍රජා පාදක සමිතිවලට තමයි ඒ කොන්ත්‍රාත් ලබා දුන්නේ. හැබැයි, ප්‍රජා පාදක සමිතිය නමට විතරයි තිබුණේ. ඒවා ගිවිසුම් අත්සන් කළා. ගිවිසුම අත්සන් කළාට කොන්ත්‍රාත් එක මොකක්ද කියලාවත් ප්‍රජා පාදක සමිතිය දන්නේ නැහැ. එහෙම තමයි ගම්වල තිබෙන ප්‍රජා පාදක සමිති වැඩ කළේ. ගොවි සංවිධානය, සමෘද්ධි සමිතිය, වැඩිහිටි සමිතිය, ග්‍රාම සංවර්ධන සමිතිය යන මේ සියලු ප්‍රජා පාදක සමිති කොන්ත්‍රාත්කරුවන්ගේ ග්‍රහණයට අහු වෙලා තිබුණා. මොකද, මේ සමිති කොන්ත්‍රාත් අත්සන් කළාට ඒ සමිති නොවෙයි කොන්ත්‍රාත් කළේ. ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එහෙම නැත්නම් පළාත් සභා මන්ත්‍රී, එහෙමත් නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රී, නැත්නම් ඇමතිවරයාගේ නියෝජිතයා තමයි ඒ කොන්ත්‍රාත් කළේ. මෙන්න මේක දැන් අපි නවත්වලා තිබෙනවා. ඒවා නවත්වන්න නම් වැඩිපුර කොන්ත්‍රාත්කරුවන් රටට අවශ්‍යයි. අලුත් ව්‍යවසායකයන් රටට අවශ්‍යයි. මෙන්න මේ අලුත් ව්‍යවසායකයන් රටට ගෙනෙන්න තමයි ඒ අයගේ ව්‍යාපාරය ලියාපදිංචි කරන ගාස්තු අඩු කරලා ඒ අදාළ මැදිහත්වීම් කරන්න අපි කටයුතු කරලා තිබෙන්නේ. මෙතැන ලොකු වංචාවක් තිබුණා. ඒක නිසා තමයි ප්‍රාදේශීය සභාවට යන්න පොරකන්නේ. ඒ, මොකටද? ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වෙලා ප්‍රාදේශීය සභාවට යන්න පොරකෑවේ මොකටද? ප්‍රාදේශීය සභාවේ ඉන්නකොට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට රුපියල් 15,000ක් වාගේ මුදලක් තමයි දුන්නේ. නමුත් ඒ කාලයේ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ වත්කම් හෙව්වොත් අපට දැන ගන්න පුළුවන් ඔවුන් කොච්චර කොන්ත්‍රාත් කරලා තිබෙනවාද කියලා. එහෙම තමයි මේවා තිබුණේ. ඒවා තමයි අපි මේ නිවැරදි කළේ. ඒ මන්ත්‍රීවරු, සභාපතිවරු ඒ අයට ජීවත් වෙන්න උදව් කරපු නායකයෝ ඒ අයගේ අප්පොච්චි විධියට දැකලා දැන් ආයෙත් කදමලු බැඳ ගෙන එන්න පටන් ගෙන තිබෙනවා. දැන් වැඩේ වැරදිලා තිබෙන්නේ. ආයෙත් අප්පච්චි හොයා ගෙන එන්න පටන් අරගෙන තිබෙනවා. එතැනට තමයි අද රට පත් වෙලා තිබෙන්නේ. ඒ අප්පච්චි හොයා ගෙන එන සමහර අය අතීතයේ හොරකම්, දූෂණ, වංචා එක්ක ගැට ගැහිලා ජීවත් වෙච්ච, මේ ඉදි කිරීම් ක්ෂේත්‍රයේ සේවා සියල්ල අවභාවිත කරපු අය. ඒ අය එහෙම තමයි කටයුතු කළේ. අපි ඒවා නවත්වා තිබෙනවා. ඒක තමයි අද විපක්ෂයේ බොහෝ අයට දරා ගන්න බැරි වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම ඉදි කිරීම් ක්ෂේත්‍රයේ තවත් ගැටලු ගොඩාක් තිබෙනවා. මේ ගැටලු නිරාකරණය කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ගත්තාට පස්සේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කළත්, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අවස්ථා වැඩි කළේ නැත්නම් එතැනත් මාෆියාවක් හැදෙනවා. කොහොමද, ඒ මාෆියා හැදෙන්නේ? අපි හිතනවා ප්‍රදේශයක කොන්ත්‍රාත්කරුවන්, ව්‍යවසායකයන් 10දෙනෙක් ඉන්නවා නම්, කර්මාන්ත 10ක් ඒ ප්‍රදේශයට එනවා නම්, ඒ කර්මාන්ත 10, ඒ 10 දෙනා එක්ක බෙදා ගන්නවා. එහෙම මාෆියාවක් දැන් අපි දකිනවා. ඒවා නිවැරදි කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් කරන්න ඕනෑ. මොකද, ඒ දහදෙනා කොන්ත්‍රාත් 10 බෙදා ගත්තාම එතැන තරගකාරී ලංසු කැඳවීමක් වෙන්නේ නැහැ. ඉතින් ඒක වෙනස් කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය නීති, අණ පනත් තව තවත් ගෙන එන්න ඕනෑ. එහෙම කළොත් තමයි අලුත් ව්‍යවසායකයන් පිරිසකට ඉදිකිරීම් ක්ෂේත්‍රය විවර කරන්න අපට අවස්ථාව උදා වෙන්නේ. ඉතින් ඒ නිසා අපි විවෘතව ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් කරමින් ඉන්නවා.

අපි මේ රට භාර ගත්තේ, හොරකම, දූෂණය, වංචාව නවත්වනවාය කියලා. හොරකම, දූෂණය, වංචාව, නාස්තිය සිද්ධ වුණු ප්‍රධාන ක්ෂේත්‍රයක් තමයි ඉදිකිරීම් ක්ෂේත්‍රය. ගමක ඉන්න ඕනෑම පොඩි දරුවෙක් වුණත් දන්නවා, ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ කොච්චර හොරකම්, දූෂණ, වංචා සිදු වුණාද කියලා. ඒ නිසා ඒවා නවත්වන්න නම් ඒ වෙනුවෙන් වැඩි පිරිසක් ඇතුළු කර ගන්න ඕනෑ; වැඩි ව්‍යවසායකයන් පිරිසක් කැඳවා ගන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි අලුතෙන් කොන්ත්‍රාත් ව්‍යාපාර ලියාපදිංචි කරනකොටත්, ඒ වාගේම කොන්ත්‍රාත්කරුවන්ගේ කලින් තිබිච්ච පරණ ව්‍යාපාර නැවත අලුත් කරනකොටත් ඒ සඳහා වන ගාස්තු අඩු කරන්න අපි තීරණය කළේ. ඉතින් ඒක හොඳ වැඩක්. ඒ නිසා ඒක සුබවාදීව දකින්න ඕනෑ. එහෙම නැතුව අර පරණ විධියට

ගමේ තිබෙන සමිති ටිකට කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන්න දීලා කොන්ත්‍රාත් එක ඇමතිවරයාගේ හරි මන්ත්‍රීවරයාගේ හරි නියෝජිතයා අරගෙන කරපු ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය මැදිහත් වීම අපි මේ තුළින් කරලා තිබෙනවා.

මේ රට අපි නිවැරදි දිශාවට ගෙන යනවා. ඒ නිවැරදි දිශාවට ගෙන යන ගමනේදී අපි මහා භාණ්ඩාගාරය ඉතාම හොඳට කළමනාකරණය කරනවා. පසුගිය කාලයේ මහා භාණ්ඩාගාරය කළමනාකරණය කළා නොවෙයි. මුදල් ඇමතිවරයා, ඒ වාගේම ඒ අදාළ බලධාරීන් සියලුදෙනා කටයුතු කළේ ඉතාම අත්තනෝමතික විධියට. හරියට කිව්වොත් අර වළං කඩේට පැනපු ගොනා වාගේ හැම පැත්තටම බෙද බෙදා ගියා; හැම පැත්තටම ඇන ඇන ගියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
ඒක වෙනස් කරලා අපි රට නිවැරදි දිශාවට ගෙනැල්ලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි මැදිහත් වෙනවා. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.11]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වාහන මත බදු සම්බන්ධයෙන්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයට අදාළ අණ පනත් ගණනාවක් සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ මම විශේෂයෙන්ම මේ කාරණය පිළිබඳවත් කියන්න ඕනෑ. මේ දවස්වල යවන ලොකුම ප්‍රචාරය තමයි -දැන් මේ කලින් කථා කළ මන්ත්‍රීතුමන්ලාත් කිව්වා වාගේ- රේගු බදු මඟින් ඉතිහාසයේ වැඩිම ආදායම ලබා ගත්තාය කියන කාරණය. අපි දන්නවා, පසුගිය කාලය තුළ අපේ රට බංකොලොත්භාවයට පත්වීම තුළ, ඒ වාගේම කොවිඩ් උවදුරත් එක්ක මුහුණ දුන් අවාසනාවන්ත තත්ත්වය තුළ වාහන සහ තවත් භාණ්ඩ ගණනාවක් අපේ රටට ආනයනය කරන එක නවත්වලා තිබුණු බව. ප්‍රධානම දේ තමයි, වාහන ආනයනය අවුරුදු පහක් නතර කරලා තිබුණු එක. අවුරුදු පහකට පස්සේ තමයි වාහන ආනයනය කිරීමට අවසර ලබා දුන්නේ. පසුගිය ජනාධිපතිවරණය වෙලාවේ ජනප්‍රියම කථාව බවට පත් වුණා, "විට්ස්" කාර් එකක් රුපියල් ලක්ෂ 12ට ලබා දෙනවාය කියපු එක. ඒ දවස්වල සමාජ මාධ්‍ය තුළින් අපි දැක්කා, ගොඩක් දෙනෙකුගේ බලාපොරොත්තුවක් තිබුණා, මැතිවරණයෙන් පස්සේ රුපියල් ලක්ෂ 12කට "විට්ස්" කාර් එකක් ගන්න. දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා ඒ සුරංගනා කථා කියලා තමයි ජනතාව රැවැට්ටුවේ. දැන් අද ගණන් අඩුවටම ගන්න තිබෙන කාර් එක බැලුවොත්, රුපියල් ලක්ෂ 25ට විතර ඒ කාලයේ තිබුණු කාර් එකක් දැන් රුපියල් ලක්ෂ 75ක් දක්වා තුන් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම වාහනයක යන්න ආසාවෙන් හිටපු අයට අද වාහනයක යන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. කාර් එකක තියා අඩු ගණනේ මෝටර් සයිකලයකවත් යන්න බැහැ. ජනාධිපතිතුමා මැතිවරණ වේදිකාවේ කිව්වා අපි දැක්කා, අපේ තරුණයන්ට ජපන් බයිසිකලයක යන්න අවස්ථාවක් නැහැ කියලා. දැන් අද ඒ පරණ බයිසිකලයේ ගිය කෙනාට ඒකේවත් යන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ත්‍රීවීල් එකක් පවා අද රුපියල් ලක්ෂ 20කට වඩා වැඩි වෙලා තිබෙනවා. මේ රටට විදේශ විනිමය ලැබෙන්නේ, විශේෂයෙන්ම විදේශගතව වැඩ කරන අපේ ජනතාවගෙන් බව අපි දන්නවා. තරුණ තරුණියන් විතරක් නොවෙයි, වැඩිහිටි සහෝදර සහෝදරියන් පවා විදේශ රටවල වැඩ කරනවා. ඒ අයගෙන් තමයි අපට මේ වසරේදීත් ඇමෙරිකානු ඩොලර් මිලියන 6,000කට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ලැබුණේ. ඊට අමතරව සංචාරක ව්‍යාපාරය තුළින් ලැබෙනවා. ඒ තත්ත්වය තුළ අද අපේ රටේ වාහනයක් මිලදී ගන්න අවස්ථාව උදා කර ගන්න පුළුවන් පිරිස ඉන්නේ කොච්චරද කියලා බලන්න. සාමාන්‍ය ජනතාවට වාහනයක් මිලදී ගන්න පුළුවන්ය කියන හැඟීම ලබා දුන්නාට, අද මේ රටේ ජීවත් වන ජනතාවගෙන් දාහෙන් එක්කෙනෙකුට, දෙන්නෙකුටවත් වාහනයක් මිලදී ගන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. එහෙම කියලා අපි ඒ අයට වාහන ගේන්න එපා කියනවා නොවෙයි. අද වාහන ආනයනය කරනකොට බදු ගණනාවක් අය කරනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ රටවල් කිහිපයක් සම්බන්ධයෙන් ඇඩ්වොකාටා ආයතනය කළ සමීක්ෂණ වාර්තාවක් තිබෙනවා. මම එම වාර්තාව **සභාගත*** කරනවා.

විශේෂයෙන් එම වාර්තාවට අනුව, වාහන ආනයනයේ දී ලෝකයේ අනෙකුත් රටවල් අතරින් අපි තුන්වැනි තැනට බදු අය කරන රට බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා සාමාන්‍ය ජනතාවට, එහෙම නැත්නම් මේ රටේ බහුතරයකට වාහනයක් මිලදී ගැනීම සිහිනයක් බවට පත්වෙලා තිබෙනවා. වාහන ආනයනය සඳහා මිලියන ගණනක් වැය කරලා තිබෙනවා. නමුත්, අද ඒ හැම වාහනයක්ම ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ අපේ රටේ ඉතාම ස්වල්ප පිරිසකට විතරයි කියන එක පැහැදිලිවම කියන්න ඕනෑ. ඔබතුමන්ලා කථා කරපු, ඔබතුමන්ලා නියෝජනය කරපු, ඔබතුමන්ලාට ඡන්දය දුන්, ඔබතුමන්ලා බලාපොරොත්තු දුන් පිරිසගේ වාහන සිහිනය අද බොඳවෙලා, ඒ සිහිනය තිබුණාටත් වඩා ගොඩක් ඈතට ගිහිල්ලා තිබෙනවා.

අපේ රටේ බදු ආදායම දිහා බලනකොට, රේගුව අද වැඩිම ආදායමක් ලබනවා කිව්වත්, වාහන ආනයනයට අදාළව තමයි අද බදු වශයෙන් ලොකු ආදායමක් එන්නේ. ඒ වාගේම අපේ රටේ ජනතාව කන බොන දේවල්වලටත් බදු ගසා තිබෙනවා. පසුගිය දවස්වල තමුන්නාන්සේලා සහල්වලට රුපියල් 65ක බද්දක් ගැහුවා අපි දැක්කා. ඇත්තටම ඒ බද්ද ගැහුවේ කවුරු ආරක්ෂා කරන්නද? ගොවියා ආරක්ෂා කරන්නද? ගොවියා ආරක්ෂා කරන්න නොවෙයි. මොකද, ඒ වෙලාවේ අස්වැන්න නෙළලා ඉවරයි. ඒ බද්ද ගැහුවේ, සහල් මිල අඩු වෙයි කියලා සහල් මාෆියාවට සම්බන්ධ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින් ආරක්ෂා කරන්න.

ඒ වාගේම ලුණු, පොල්, පොල් කිරි ඇතුළු එදිනෙදා පරිභෝජනය කරන භාණ්ඩ ගණනාවකට බදු අය කරනවා. පාරිභෝගික භාණ්ඩවලට අමතරව විදුලි බිල සියයට 15කින් ඉහළ යෑමට එය හේතුවෙලා තිබෙනවා. ඒ වාගේම ඩිජිටල් සේවාවන් සඳහා ඔක්තෝබර් මාසයේ සිට සියයට 18ක බද්දක් අය කරනවා. බදු කුලී ගිවිසුම් මත අය කරන මුද්දර ගාස්තුව සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ රටේ ජනතාව ඉදිරියේදී ඉතාම අමාරු තැනකට, ජීවත් වෙන්න අමාරු තත්ත්වයකට පත් වෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

අපි ගොඩක් දේවල් ගැන කථා කරනවා. අපට ආදායම් අවශ්‍යයි. බදු වැඩි කරනවා කිව්වත්, විශාල වශයෙන් වක්‍ර බදු අය කරන නිසා අද ජනතාව ජීවත් වීමේදී ඉතාම අමාරු තැනකට වැටිලා තිබෙනවා. ඒක මම පැහැදිලිව කියන්න ඕනෑ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා. එහි පැහැදිලිව තිබෙනවා, මේ රටේ තිබෙන දරිද්‍රතාව නිසා ජනතාවගෙන් සියයට 24.5ක් ආහාර සම්බන්ධයෙන් අද අවම මට්ටමේ ජීවන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා කියලා. ඒ නිසා අපි පැහැදිලිව කිව යුතු කාරණයක් තිබෙනවා. එදා මේ රට කඩා වැටිලා තිබුණු වෙලාවේ ප්‍රශ්න ගණනාවක් ආවා, අපි දැක්කා. නමුත් තමුන්නාන්සේලා බලයට පත් වුණාට පස්සේ, තුන්වේල කන්න බැරිව දෙවේලක් කාපු අයට, දෙවේලක් කන්න බැරිව එක වේලක් කාපු අයට තමුන්නාන්සේලා තවදුරටත් බර පටවලා, ඒ කණ්ඩායම මේ වෙනකොට ඉතාම අවාසනාවන්ත තැනකට පත් කරලා තිබෙනවා. ඒ නිසා දුප්පත්කම එන්න එන්නම වැඩිවෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ පවුල්වලින් සියයට 16ක ප්‍රමාණයක් පෝෂ්‍යදායී ආහාර වේලක් නොලබන බව, ඒ වාගේම කතුන් මූලිකත්වය ගත් පවුල්වල ජනතාවට පෝෂ්‍යදායී ආහාර වේලක් නොලැබෙන බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වෙනවා. ඒක අපට පැහැදිලිව පෙනෙනවා. මෙරට ජීවත් වන පවුල්වලින් වැඩි කොටසක් අද බඩගින්නේ සිටින තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒක එන්න එන්නම, දිනෙන් දිනම වැඩි වෙනවා. එම නිසා තමුන්නාන්සේලා මොන දේ කිව්වත්, මේ තත්ත්වය තුළ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය පහළට වැටිලා, ජනතාවට අත්‍යවශ්‍ය දෙයක් වන ආහාර මිලදී ගන්න බැරි කණ්ඩායම දිනෙන් දිනම වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා අද දරුවන්ගේ උපතේ ඉඳලා මවටත්, දරුවාටත් දෙදෙනාටම මන්දපෝෂණ තත්ත්වය ඇති වන එක වැඩිවෙලා තිබෙනවාය කියන කාරණය කනගාටුවෙන් වුණත් සඳහන් කරන්නට ඕනෑ.

මේ තත්ත්වය තුළ කොයිම ආකාරයකටවත් අපට සතුටු වෙන්න බැහැ. ඒකට හේතුව මෙයයි. වක්‍ර බදු හරහා තමන්ගේ ජීවන වියදම ඉහළ ගිහිල්ලා එදිනෙදා ජීවිතයවත් ගත කරන්න බැරි තැනකට ජනතාව අද පත්ව තිබෙනවා. එම නිසා අපට උදන් අනන්න බැහැ, රේගුව මෙච්චර ආදායමක් ලබාගෙන තිබෙනවා කියලා. රජයකට ආදායම් අවශ්‍යයි. නමුත් රජය මේ ආදායම් ලබාගෙන තිබෙන්නේ ජනතාව පිට බර පටවමින් කියන එක අපි පැහැදිලිවම කියන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ රජයකින් රටේ ජනතාව මේ ආකාරයේ දේවල් බලාපොරොත්තු වුණේ නැහැ. ජනතාව ඔබෙන් යම් යම් සහන බලාපොරොත්තු වුණා. නමුත්, මේ වෙනකොට ගොවියාත් ඉතාම අසරණ තැනකට පත්ව තිබෙනවා. තමුන්නාන්සේලා වී ගොවියාට විශේෂයෙන් කිව්වා, වී සඳහා සහතික මිලක් දෙනවා කියලා. නමුත් අද ඉතාම අවාසනාවන්ත තැනකට වී ගොවියා පත්ව තිබෙනවා. ඒ අයගේ නිෂ්පාදනවලට නිසි මිලක් ගන්න බැරි තැනකට පත් වෙලා, ණයකාරයෝ බවට පත් වෙලා, හිටියාටත් වඩා අමාරු තැනකට වැටිලා තිබෙනවා. විශේෂයෙන් මේ කාරණා සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු නොවුණොත්, ඇත්තටම රටේ ආදායම් අඩු කණ්ඩායමක් ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් වන එක වළක්වන්න බැරි වෙනවා.

දැන් පවතින බදු ප්‍රතිපත්තිය තුළ වාහන සම්බන්ධව ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා. අද උදේ අපි දැක්කා නියෝජ්‍ය ඇමතිවරයා ප්‍රකාශයට පත් කරනවා, අපේ රටට ගෙන්වපු සමහර වාහන ප්‍රතිනැව්ගත කරන්න වෙනවා කියලා. ඒවා ඩොලර් වියදම් කරලා ගෙන්වා තිබෙන වාහන. ඒ සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා නම්, ඒවා නිරාකරණය කරගෙන ඒවාට අවශ්‍ය නීති, රෙගුලාසි සකස් කර ගන්නේ නැතුව ප්‍රතිනැව්ගත කරන තැනට ආවොත් අපේ රටේ ඉන්න ව්‍යාපාරිකයන්ට විශාල පාඩුවක් සිදු වෙනවා; රටටත් විශාල පාඩුවක් සිදු වෙනවා. ඒ වාගේම වාහන නිෂ්පාදනය කරන රටවලට විශ්වාසය සම්බන්ධයෙන් ගැටලු ඇති වෙනවා. එම නිසා මේ දේවල් සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාට ලෙහෙසියි, ප්‍රතිනැව්ගත කරනවා කියන්න.

වාහන සම්බන්ධ ව්‍යාපාර කරන අපේ වාහන සේල්වල හිමිකරුවන් අවුරුදු පහක් බලාගෙන ඉඳලා තමයි තමන්ගේ ව්‍යාපාරය දැන් නැවත ගොඩනගාගෙන තිබෙන්නේ. එතකොට ඒ අය බැංකුවලින් ණය පහසුකම් අරගෙන තිබෙනවා. එවැනි ප්‍රශ්න ගණනාවක් ඔවුන්ට තිබෙනවා. වාහන ප්‍රතිනැව්ගත කරනවා කියලා අපේ නියෝජ්‍ය ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වාට, ඒ තුළින් ඒ ව්‍යාපාරිකයන්ට සිදුවන හානිය කොච්චරද? ඩොලර් යොදවා තමයි ඒ වාහන රටට වාහන ගෙන්වා තිබෙන්නේ. ඒ තුළ සිදුවන හානිය සම්බන්ධව ඒ සියලුදෙනා එක්ක සාකච්ඡා කරලා ඒ සඳහා අවශ්‍ය නීති සකස් කරන්න. විදුලියෙන් ක්‍රියාත්මක වන මෝටර් රථ සම්බන්ධයෙන් හරි නීතියක් නැති නිසා තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒවා පැහැදිලි කරගෙන අවශ්‍ය නීති සකස් කරන්න. තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 159දෙනෙක් ඉන්නවා. අපිත් සහයෝගය දෙනවා, රටට අවශ්‍ය මෙවැනි නීති සම්පාදනය කරන්න. එහෙමනම් ඒ ඒ රෙගුලාසි නිසි ආකාරයෙන් සකස් කරලා රටට වාසියක් වන ආකාරයෙන් සහ ව්‍යාපාරිකයා ඇතුළු ඒ හැම කෙනාටමත් පහසුවක් වන ආකාරයෙන් කටයුතු කරන්න කියන එක තමයි අපි මේ වෙලාවේ මතක් කරන්නේ. මෝටර් රථ ආනයනය කරන කොට බදු වර්ග හතරක් පනවා තිබෙනවා. ඒ තමයි, නිෂ්පාදන බද්ද, සුබෝපභෝගී බද්ද, වැට් එක සහ රේගු බද්ද. ඒ ඔක්කෝම අන්තිමට පාරිභෝගිකයාට තමයි ගෙවන්න සිදු වෙලා තිබෙන්නේ. වාහන ගෙන්වීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලා නිසි ආකාරයෙන් කටයුතු කළොත්, පාරිභෝගිකයාට වාගේම ව්‍යාපාරිකයාටත් තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරගන්න අවස්ථාව ලැබෙනවා.

ඒ වාගේම ජනතාවගේ ප්‍රධාන පාරිභෝගික ද්‍රව්‍ය වන අලවලට, හාල්වලට පවා බදු ගහනවා අපි දැක්කා. මෙලෙස වක්‍ර බදු වැඩි කළාට පසුගිය කාලයේ අපි දැක්කා, නිසි පරීක්ෂාවකින් තොරව කන්ටේනර් තුන්සිය ගණනක් නිදහස් කරනවා. ඒ නිදහස් කළ කන්ටේනර් තුළ මොන භාණ්ඩ තිබුණාද කියලා අපි කවුරුවත් තවම දන්නේ නැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම දන්නවා.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
හොඳයි, අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමා කියනවා, එතුමා දන්නවා කියලා. ඒ කන්ටේනර් නිදහස් කිරීම තුළ අහිමි වෙච්ච බද්ද, එහෙම නැත්නම් ඒවායේ තිබුණු භාණ්ඩ මොනවාද කියන එක ගැන කවුද හොයන්නේ කියන එක තමයි ප්‍රශ්නය. ඒ වාගේම නීතිය සම්බන්ධයෙන් කථා කිරීමේදී නීතිය ක්‍රියාත්මක කිරීමට තිබෙන ආයතන ගැනත් පොඩ්ඩක් බලන්න. අපි කැමැතියි, මේ රටේ සම්පත් හොරකම් කරලා, වංචා කරලා තිබෙන අයට දඬුවම් දෙන එකට. අපි කවුරුවත් ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. අද

ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළේ ඉන්න ඇමතිවරුන්ට චෝදනා ගණනාවක් තිබෙනවා. නමුත් ඒවා සම්බන්ධයෙන් අද නීතිය ක්‍රියාත්මක වෙනවාද? මාධ්‍ය තුළින් අපි දැක්කා, අධිකරණයෙන් නොයෙක් නියෝග පනවා තිබෙන බව. නමුත් ඒ නියෝග ක්‍රියාත්මක කරන්න CID එක, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වෙනවාද කියලා අපි බලාගෙන ඉන්නවා.

බොහොම ස්තුතියි.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ අවසරය පරිදි මම එතුමාගෙන් පොඩි ඉල්ලීමක් කරන්නයි අවස්ථාව ඉල්ලුවේ. අද රටේ ණය ප්‍රතිව්‍යුහගත කරලා ණය ගෙවීම් කල් දමා තිබෙනවා. නමුත් අද පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීමත් එක්ක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් විශාල අපහසුතාවලට පත්ව තිබෙනවා, තමන්ගේ ව්‍යාපාර කරගෙන යෑම සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමාගේ අවධානය පිණිසයි මා මේ කාරණය සඳහන් කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ඇමතිතුමාගෙන් මේ වෙනුවෙන් පෙනී සිටින්න කියන ඉල්ලීම කරන්න තමයි මම මේ වෙලාව ඉල්ලා ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන් ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මතු කරපු කාරණය ගත්තොත්, අපි දිගින් දිගටම මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් ආවා. කොරෝනා වසංගතයත්, ඒ කාලයේ තිබ්බ ආර්ථික අර්බුදයත් එක්ක ඇත්තටම ලක්ෂ දෙකකට ආසන්න පිරිසක් මුල් කාලයේදී මේ තත්ත්වයට මුහුණ දුන්නා. නමුත් ක්‍රමානුකූලව ඒ අයට බැංකු ණය පහසුකම් ඇතුළු දෙන්න පුළුවන් ණය පහසුකම් දීලා ඒ පිරිස 20,000කට විතර අඩු වුණා. මූලික වශයෙන් ගත්තාම, පරාටේ තත්ත්වයට පත්වන මට්ටමේ හිටියේ 20,000ක විතර පිරිසක්. ඒ අවස්ථාවේදී අපි මුදල් අමාත්‍යාංශයත් එක්ක මේ සම්බන්ධව දිගින් දිගටම සාකච්ඡා කළා. ඉන් පසු බැංකු එක්කත් අපි සාකච්ඡා කරන්න පටන් ගත්තා. ඒ අනුව අවුරුද්දක සහන කාලයක් ඒ ව්‍යාපාරිකයන්ට ලබා දුන්නා. විශේෂයෙන්ම එකිනෙකා වෙන වෙනම ඇවිල්ලා, බැංකු එක්ක එකඟතාවකට එන්න කියලා කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. අනවශ්‍ය විධියට කටයුතු කරලා තමන් ණය වෙලා ඒ ණය සියල්ල කපා හරින්න කියලා කියන අයත් මෙතැන ඉන්නවා. එහෙම කරන්න බැහැ. මොකද, මේ තැන්පත්කරුවන්ගේ මුදල්. තැන්පත්කරුවන්ගේ මුදල් තමයි ඒගොල්ලන්ට ණය පහසුකම් වශයෙන් දීලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ මේකයි. බැංකුවටත්, ණය ගත් අයටත් එකඟ වෙන්න පුළුවන් මධ්‍යස්ථ තැනක් තිබෙනවා. මම හිතන හැටියට අන්න ඒ තැනට එකඟ වෙනවා නම්, ඒ වෙනුවෙන් යම් පහසුකමක් ඔවුන්ට ලබා දෙන්න පුළුවන්. හැබැයි ඒ පහසුකමට දෙපාර්ශ්වයම සම්බන්ධ වෙන්න ඕනෑ. එහෙම සම්බන්ධ කරන්න පුළුවන් අය පිළිබඳව විවිධ අය ඇවිල්ලා අපිත් එක්ක කථා කළා.

ඒගොල්ලන්ට අපි කිව්වා, ඔබේ නාම ලේඛනය අපට දෙන්න කියලා. දැන් කවුද ඉන්නේ? ඒ එක කණ්ඩායමක් ඇවිල්ලා කථා කරනකොට මම කිව්වා, හොඳයි, පරාටේ තත්ත්වයට පත් වෙයි කියලා බියක් තිබෙන, පරාටේ ක්‍රමය යෝජනා කරලා තිබෙන අයගේ නාම ලේඛනය අපට දෙන්න, අපි බැංකුත් එක්ක සාකච්ඡා කරන්නම් කියලා. නමුත් ඇත්තටම සමහර අය මේ උද්ඝෝෂණය පවත්වාගෙන ගියාට ඒ නාම ලේඛනය දෙන්නේ නැහැ. මම එක කණ්ඩායමකට කිව්වා, දැන් ඒ නාම ලේඛනය හදන්න කියලා. අපේ අමාත්‍යාංශයේ වාඩි කරවාගෙන මම ඒ අයට කිව්වා, ඔයගොල්ලන් ඒ නාම ලේඛනය හදන්න කියලා. නමුත් එහෙම එකක් හැදුවේ නැහැ. සමහර අය සාකච්ඡා කර කර යනවා. ඔබතුමන්ලාත් හම්බ වෙනවා, ඇවිල්ලා අපිවත් හම්බ වෙනවා. එකම කණ්ඩායම් ටිකක් මේ ඉන්නේ. මම දැක්කා, ඊයේත් ඒ අය පාර්ලිමේන්තුවේ ඉන්නවා, කථා කරනවා. නමුත් නිශ්චිත තොරතුරු, දත්ත අරගෙන ඉදිරිපත් වෙන අය අඩුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම දැන් බැංකු ලැහැස්ති වෙලා ඉන්නවා, ඒ පරාටේ තත්ත්වයට පත් වෙච්ච අය සමඟ බැංකු මට්ටමින් සමාලෝචන සාකච්ඡාවලට එන්න. ඇත්තටම ඔබතුමන්ලාටත් අපි යෝජනා කරන්නේ එහෙම අය ඉන්නවා නම් අපටත් කියන්න කියලායි. අපි ඔය හැමෝම එක්ක කථා කරලා තිබෙන්නේ. ඕනෑ නම් මම නම් වශයෙන් ඒ කණ්ඩායම් ගැන කියන්නම්. මම හැමෝම කියලා කියන්නේ නැහැ. ඒ අතර සිටින යම් යම් අයට දේශපාලන අවශ්‍යතාවකුත් තිබෙනවා. සමහර අයට විවිධ වුවමනා තිබෙනවා. නමුත් අපි ලැහැස්තියි, බැංකු පද්ධතියත් ලැහැස්තියි, මේ සම්බන්ධව සමාලෝචනය කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම විපක්ෂයේ අදහස් දැක්වීම් දිහා බලාගෙන ඉන්නකොට මට දැනුණු අවංක අදහස කියන්නම්. ඔවුන්ගේ අදහස වෙලා තිබෙන්නේ, ඔවුන් මේ ආර්ථිකය විනාශ නොකර ඉතුරු කරපු ටිකට ඔවුන්ට thank you කියන්න කියන එකයි. ඔවුන් කියන්නේ, ඔවුන් මේ ඉතුරු ටිකත් පවත්වාගෙන ගිහිල්ලා, ඒ ඉතුරු ටිකත් විනාශ කළා නම්, නුඹලාට මෙහෙමවත් ගොඩදාන්න බැහැ, අපි මේ ආර්ථිකය විනාශ කළා තමයි, හැබැයි අපි විනාශ නොකර ඉතුරු කරපු ටික නිසා තමයි දැන් වාහන ගේන්න පුළුවන් වෙලා තිබෙන්නේ, ඒ නිසා අන්න ඒ ටිකට අපටත් thank you කියන්න කියලා. ඔන්න ඔයගොල්ලන්ටත් thank you කියනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා අලුතෙන් නේ, ආවේ. ඔබතුමා ඉන්න. ඔබතුමාට මේක අදාළ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා කර ගන්න බලන්නේ වෙන දෙයක්. එතුමා අත ඉස්සුවාට පස්සේ මම එතුමාගේ නම කියලා මොනවා හරි කිව්වාම එතුමාට පුළුවන් නේ, YouTube campaign එක කරගෙන යන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා තව අවුරුදු 25කින් විතර ඔය කථාව කියයි. *[බාධා කිරීමක්]* මේ රට පාලනය කරපු, අද විපක්ෂයේ ඉන්න, අවුරුදු 76ක් රට පාලනය කරපු අයට අද මට කියන්න වෙලා තිබෙන්නේ ඔන්න ඕකයි.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

"අද ආර්ථිකය වර්ධනය වෙනවා; ආදායම් වැඩි වෙනවා; සංචාරකයන් එනවා; අපනයනය වැඩි වෙලා තිබෙනවා. හැබැයි, එහෙම වෙලා තිබෙන්නේ අපි විනාශ කරලා ඉතුරු කරපු ටිකෙන් තමයි. ඒක නිසා අපි ඉතුරු ටිකත් විනාශ කළා නම්, තව අවුරුදු 10ක්, 15ක් මේ රට පාලනය කළා නම්, යූඑන්පී එක, සජබ ය, රාජපක්ෂ පවුල, ගෝඨාභය, චන්ද්‍රිකා -මේ ඔක්කොමලා- තව කාලයක් රට පාලනය කළා නම්, ඉතුරු ටිකත් ඔයගොල්ලන්ට ඉතුරු වෙන්නේ නැහැ, ඒ නිසා අපි ඉතුරු කරපු ටිකටවත් අපට ස්තුති කරන්න" කියලා නේ මේ කියන්නේ. ඒක නොවෙයි ද මේකේ හරය? මේ සමස්ත කථාවේ හරය ඕකයි. වෙන මුකුත් නැහැ. ඔබතුමන්ලා දැන් පිළිගන්නවා, මේ ආර්ථිකය හැදෙන්න පටන් අරගෙන තිබෙන්නේ, රට දියුණු වෙන්න පටන් අරගෙන තිබෙන්නේ කියලා. හැබැයි, දැන් මේ කියන්නේ මොකක්ද? අපි තවදුරටත් රට පාලනය කළා නම්, ඒ කියන්නේ, අද විපක්ෂය ආණ්ඩුවේ හිටියා නම් මෙහෙමවත් රට ගොඩ ගන්න බැහැ කියන එකයි. එහෙම මේ රට ගොඩ ගන්න බැරි නිසා ගොඩ ගන්න පුළුවන් තැනින් නවත්වපු එකට විපක්ෂයේ අපිත් දායක වුණාය කියන්න කියලා නේ මේ කියන්නේ. ඒකට ඔයගොල්ලන්ට නොවෙයි, ඔයගොල්ලන්ව ඉක්මනින්ම ගෙදර යවපු, ගෝල්ෆේස් අරගළයේ හිටපු, ගෝඨාගෝගම හදපු, මයිනාගෝගම හදපු ජනතාවටයි ස්තුති කරන්න ඕනෑ. ඒ ජනතාව මහජන බලය පාර්ලිමේන්තුවට ගෙනාපු නිසා තමයි මේ විනාශය නතර වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේක ආර්ථික සාධක නිසාම විතරක් වෙච්ච දෙයක් නොවෙයි. මේ තුළ රටේ නීතිය ස්ථාපිත වීමක් තිබෙනවා; දේශපාලන සංස්කෘතියක් බිහි වීම තිබෙනවා; ආදර්ශ තිබෙනවා. ඒවාට මේගොල්ලන්ට කිට්ටු කරන්නවත් බැහැ. තනි සාධකයක් හැටියට ගත්තොත් ආර්ථිකය ගැන විතරක් කථා කරන්න පුළුවන්. හැබැයි, ආර්ථිකයෙන් විතරක් රටක් ගොඩ යන්නේ නැහැ. අපේ රටේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් කළා. අද නීතියේ සාධාරණත්වයක් ඇති වෙලා තිබෙනවා.

අද මේ නියෝගවලින් කියන්නේ මොකක්ද? ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝගයක්, නිර්දේශයක් ඇමතිවරයා ගත්තොත්, හය මාසයක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒක නීතියක් බවට අද පත් කරනවා. ඒවාට තමයි මිනිසුන්ගේ පිබිදීම ඇති වෙලා තිබෙන්නේ. වෙන මුකුත් නිසා නොවෙයි. ඒ නිසා මම කියන්නේ මේකයි. විනාශ නොකර ඉතුරු කරපු ටිකට විපක්ෂයට ස්තුති කරන්න නොවෙයි, මේ විනාශය නවත්වපු ජනතාවටයි අපි ස්තුති කරන්න ඕනෑ. ජනතාව මහජන බලයෙන් පාරට ඇවිල්ලා, අරගළ කරලා මේ විනාශය නැවැත්වුවා. හැබැයි, ජනතාව ආයෙත් ඒ විනාශකාරී පාලනය නිර්මාණය කරන්න තීරණය කළේ නැහැ. ඒ ජනතාව තමන්ගේ කැමැත්තෙන් ලංකා ඉතිහාසයේ පවත්වපු ඉතා සාමකාමීම ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය පවත්වලා ආණ්ඩුවක් හැදුවා. අද මේගොල්ලන් සතුටු වෙන්නේ නැහැ, මේ ජයග්‍රහණ ගැන. මේගොල්ලන්ට තිබෙන්නේ ඉතාම නරක හැඟීමක්. ඒක නේ, ඇත්ත දැක-දැක බොරු කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තට නිදාගෙන ඉන්න මනුස්සයෙකු නැඟිට්ටවන්න පුළුවන් වුණාට බොරුවට නිදාගෙන ඉන්න කෙනෙකු නැඟිට්ටවන්න බැහැ නේ. බොරුවට නිදාගෙන ඉන්න මිනිස්සු නැඟිට්ටවන්න අපි යන්නේත් නැහැ. ඒක අපේ කාලය නාස්ති කිරීමක්. හැබැයි, ඇත්තට නිදාගෙන ඉන්න කෙනෙකු නැඟිට්ටවන්න ලේසියි.

අද මේ රටේ ජනතාව, විශේෂයෙන්ම ව්‍යාපාරික පන්තිය සහ මධ්‍යම පන්තිය දන්නවා, මේ ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවටයි ලැබෙන්නේ කියලා. අද නාස්තිය, දූෂණය නතර වෙලා තිබෙනවා නම් ඒකේ වාසිය මේ 159දෙනාට ලැබෙන්නේ නැහැ. ඒක මේ රටේ ජනතාවට අයිතියි. නීතියේ ආධිපත්‍යය තහවුරු වෙලා තිබෙනවා නම්, ඒක මේ රටේ ජනතාවට අයිතියි. ඒ ගැන කල්පනා කර බලන්න. මාලිමාව -ජාතික ජන බලවේගය- ආණ්ඩුවක් හැදුවොත් මාස 6කින් මේ රට කඩාගෙන වැටෙනවා කියපු ආණ්ඩුවේ ප්‍රගතිය මොකක්ද? ඒ මාස 6 තුළ ගුවන් තොටුපළේ මෙහෙයුම් ලාභය සියයට 78කින් ඉහළ ගියා. මාස 6ක් තුළ වරායේ ලාභය රුපියල් මිලියන 24,418යි. එය, 2024ට සාපේක්ෂව සියයට 66කින් වැඩි වීමක්.

සෘජු විදේශ ආයෝජන - foreign direct investment - ඇමෙරිකානු ඩොලර් මිලියන 507යි; පසුගිය අවුරුද්දට වඩා මේ කාලය වනකොට එය සියයට 101කින් වැඩි වුණා. සංචාරක කර්මාන්තයෙන් ඉපැයූ ආදායම ඩොලර් බිලියන 1.7යි; පසුගිය අවුරුද්දට වඩා එය සියයට 10කින් වැඩි වුණා. විදේශ ප්‍රේෂණ ඩොලර් බිලියන 3.7යි; එය සියයට 18කින් වැඩි වුණා. රේගුවේ ආදායම රුපියල්වලින් ගත්තොත් ට්‍රිලියනයක් වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 1,000ක් වැඩිවෙලා තිබෙනවා. 2024ට සාපේක්ෂව මේ වෙනකොට අය වැය පරතරයේ හිඟය අඩුවීම සියයට 32.3යි. හොඳ නැද්ද? අපි හිතන්න පුළුවන්, ආර්ථිකයේ එක සාධකයක් වෙනස් වුණා නම් ඒකට විශේෂ හේතුවක් තිබෙන්න පුළුවන් කියලා. වරායේ මෙහෙයුම් ආදායම වැඩි වෙන්නේ වරායේ කාර්යක්ෂමතාව නිසා. අපනයන ආදායම වැඩිවෙලා තිබෙනවා. විදේශ ආයෝජන වැඩිවෙලා තිබෙනවා. ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඩොලරයට සාපේක්ෂව රුපියල උච්චාවචනය වීම ස්ථාවරවෙලා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළ අඛණ්ඩව වර්ධනය වෙමින් තිබෙනවා. පිට රටවලට රැකියා හොයාගෙන ගියපු තරුණයෝ අද ඒක නතර කරලා ලංකාවේ රැඳෙන්න තීරණය කරලා තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, agencies පසුපස ගිය මිනිස්සු ගොඩක් සිටි බව. එහි ප්‍රතිඵලයක් හැටියට අද ඉදිකිරීම් කර්මාන්තය වර්ධනය වෙලා තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්තය විතරක් නොවෙයි, සමස්ත පද්ධතිය, සමස්ත ආර්ථිකය වර්ධනය වෙලා තිබෙනවා. එතකොට දැන් අපි මේ මොකක්ද කරන්නේ? එසේ වර්ධනය වන ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය විධියට ගැළපීම් කිරීමයි අපි මේ කරන්නේ. අපට වාහන අවශ්‍ය වෙන්නේ ඒකට. ඒ සඳහා වාහන අවශ්‍යයි. මොකද, අපේ රටේ ආර්ථිකය දියුණු වෙනකොට වාහන ගෙන්වන්න ඕනෑ. ලෝකයේ තිබෙන නව තාක්ෂණික දේවල් ගෙන්වන්න ඕනෑ. අපි ඒ ගැන බොහොම සතුටුයි. ඔයගොල්ලන් ආණ්ඩුවේ දක්ෂතාව, ආණ්ඩුවේ දියුණුව දකින්න කුහක වුණාට අපි එහෙම නැහැ. අපේ මැද පන්තිය, ව්‍යාපාරික පන්තිය විද්‍යුත් වාහන ගෙනෙනවා අපට පෙනෙනවා. ඒ ගැන අපට සතුටුයි. ඒවා තිබෙන්න ඕනෑ. ඒවාට අවශ්‍ය පහසුකම් අපි හදන්න ඕනෑ. ඒ ප්‍රමිති, ඒ නිර්ණායක තමයි අපි මේ හදන්නේ.

දැන් හුඟක් අය කියනවා, වක්‍ර බදු ආදායම්, වක්‍ර බදු ආදායම් කියලා. වක්‍ර බදු ලැබෙන්නේ කොහොමද? වක්‍ර බදු නිකම් හිටියාට හම්බ වෙන්නේ නැහැ. ආර්ථිකයට අවශ්‍ය ඉඩප්‍රස්ථා හැදුවාට පසුව ආයෝජන එනකොට, ව්‍යාපාර ඇති වෙනකොට, කර්මාන්ත ඇති වෙනකොට, ඉදිකිරීම් ක්ෂේත්‍රය දියුණු වෙනකොට ඒවා මත ආදායම් ලැබෙනවා. ඒ ආදායම් තුළින් ලැබෙන බද්දක් තමයි වක්‍ර බදු කියන්නේ. මට කියන්නකෝ, වක්‍ර බදුවල වැඩි කරපු ගාස්තු මොනවාද කියලා. ගුවන් තොටුපළ මෙහෙයුම්වලින් අපි මේ ආදායම ලබාගෙන තිබෙනවා. ගුවන් තොටුපළ මෙහෙයුම්වලට වැඩි කරපු වක්‍ර බදු මොනවාද? අන්න එහෙම ඉලක්කම් හැටියට කියනවා නම් අපි ඒක පිළිගන්නම්. මේ සභාවේ කථා කරපු 10දෙනෙක් විතර වක්‍ර බදු, වක්‍ර බදු කිව්වා. වරායේ ලාභය - මෙහෙයුම් ආදායම - තුළ වැඩිවෙලා තිබෙන වක්‍ර බදු ප්‍රමාණය කියන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි එහෙම බදු ගහනවා නම් සංචාරකයෝ මේ රටට එන්නේ නැහැ.

අද ගුවන් තොටුපළේ VAT refund කරන එක ආරම්භ කරලා තිබෙනවා. එකතු කළ අගය මත බද්ද - VAT එක - ගහලා තිබෙනවා. හැබැයි, සංචාරකයන් අපේ රටින් යනකොට අපි ඔවුන්ට විදේශ විනිමය දෙනවා. Airport එකේ VAT refund counter එක පටන් අරගෙන තිබෙනවා. ඒ මොකටද? අපි ඒගොල්ලන්ව VAT එකෙන් නිදහස් කරලා ලංකාව තුළ වෙළෙඳාම වර්ධනය කරනවා. සංචාරකයෙක් ඇවිල්ලා අපේ රටේ මැණික් මිලදී ගන්නවා නම්, රත්තරන් බඩු මිලදී ගන්නවා නම් ඔහුට Airport එකේදී අපි VAT එක නැවත ගෙවනවා. ඔවුන්ව බදුවලින් නිදහස් කරලා තිබෙනවා. එතකොට මේ රටට අමතර ආදායමක් ලැබෙනවා. බදුවලින් නිදහස් කිරීම නිසා ඔවුන් යම් දෙයක් ගන්න ප්‍රමාණයට වඩා තව වැඩිපුර මිල දී ගන්නවා. ඒ තුළින් මිලදී ගැනීම දිරිමත් කරලා තිබෙනවා. ඒක හොඳ නැද්ද? එහෙම කියනකොට කියයි, ඒවා අපේ ප්‍රතිපත්ති, ඒවා අපි කරන්න හිටපු ඒවා, අපි හිතාගෙන හිටපු ඒවා, අපේ හිතේ තිබුණු ඒවා කියලා. එහෙම නේ කියන්නේ. 76 අවුරුද්දක් ආණ්ඩුව කළා නම් මේ වර්ධනය ලබා ගන්න තිබුණා නේ. 76 අවුරුද්දක් මොනවාද කළේ? 76 අවුරුද්දක් කරපු නැති දේවල් මේ මාස 8දී කෙරෙනකොට කුහක වෙන්න එපා. රට ගැන හිතලා, රට වෙනුවෙන් සතුටු වෙන්න. අපි ගැන හිතන්න එපා. ඒකට කමක් නැහැ. අපි ගැන හිතන්නේ නැතුව රට ගැන හිතන්න. ඔයගොල්ලන්ගේ දරුවන් ගැන හිතන්න. ඒ දරුවන්ට තමයි මේ ආර්ථිකය හැදෙන්නේ කියලා හිතන්න.

අපි දන්නවා නේ, මේ රටේ පාතාලය කොහොමද තිබුණේ, නීතිය කාගේ අතේද තිබුණේ, සංවිධානාත්මක අපරාධ කොච්චර සිද්ධ වුණාද කියලා. ඒ කාලයේ ආයෝජකයෝ අපේ රටට ආවාද? අනතුරු කොච්චර සිද්ධ වුණාද?

අද ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ සිදු කරන ප්‍රතිසංස්කරණවලින් කරන්නේ මොකක්ද? මේ මාර්ග අනතුරු අවම කරන්න කටයුතු කිරීමයි. අපි දන්නවා, අලුතින් දෙයක් කරන්න පටන් ගන්නකොට අමාරුයි තමයි. වාහනවල ඉස්සරහා සීට් එකේ යන අය seat belt එක දාගෙන යන්න ඕනෑ කියලා නීතිය ගෙනාපු කාලයේ අපට කොච්චර අමාරු වුණාද? හැබැයි, දැන් ඉස්සරහා සීට් එකේ යන අය seat belt එක දාගෙන යනවා නේ. දැන් පිටුපස සීට් එකේ යන අයට seat belt එක දාගෙන යන්න ටිකක් අමාරුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඕනෑම රටක, ඕනෑම තත්ත්වයක් තුළ නීතියක් ක්‍රියාත්මක කරනකොට ඒක ලේසි නැහැ. හැබැයි, ඒක මහ ජනතාවගේ යහපත වෙනුවෙන් නම් කරන්නේ, සුබසාධනය වෙනුවෙන් නම් කරන්නේ, අනාගත පැවැත්ම වෙනුවෙන් නම් කරන්නේ, ඒක මිනිසුන් පිළිගන්නවා.

විපක්ෂය ආණ්ඩු බලයේ ඉන්නකොට අයින් කරලා අපව ගෙනෙන තත්ත්වයට මේ සමාජය පත් වුණාම ව්‍යාපාරිකයෝ මොකද කිව්වේ? කර්මාන්තකරුවෝ මොකද කිව්වේ? "බදු අය කරන්න, කමක් නැහැ. අපි බදු ගෙවන්නම්" කියලා කිව්වා. මේ රටේ බදු ගෙවන ව්‍යාපාරික පන්තිය, බදු ලබාදියාව සහිත අය, ඒ bond එක තිබෙන අය, බදු ගෙවන්න කැමැතියි. ඒගොල්ලන්ට තිබුණු ප්‍රශ්නය තමයි, තමන් ගෙවන බදුවලට සාධාරණත්වයක් ඉෂ්ට වනවාද කියන එක. ඒ බදුවල ප්‍රතිලාභය ජනතාවට යනවාද කියන එක. අන්න අද අපි ඒක සහතික කරලා තිබෙනවා. ඒක තහවුරු කරලා තිබෙනවා. මේ ආණ්ඩුවේ කිසි කෙනෙකුට බදු හොරකම් කිරීම සම්බන්ධව විවේචනයක් නැහැ. හැබැයි, අපි දන්නවා තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ වැට් බදු වංචාවක් සිදු වුණු බව. වැට් බදු වංචාවට ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හිරේ ගියා. ඒ කාලයේ දේශපාලනඥයෝ හිරේ ගියේ නැහැ. මොකද, නීති හදලා තිබුණේ දේශපාලනඥයින්ට එකක්, නිලධාරීන්ට තව එකක් විධියට. අද එහෙම නැහැ. අද දෙගොල්ලන්ටම යන්න වෙනවා. දෙගොල්ලන්ටම එක කාමරයට යන්න වෙනවා. අද ඒවායේ කිසි භේදයක් නැහැ. අද යනවා කට්ටියම. මම අහගෙන සමහරු කියනවා, "අපි යනවා, ඊළඟට ඉන්න කට්ටියටත් එන්න වනවා" කියලා. ඒ කියන්නේ, අපට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණය කියලා මම කථාව අවසන් කරනවා.

අපි වැරදි කරලා තිබෙනවා නම් අපේ ආණ්ඩු කාලයේ වුණත් අපි ඒ වගකීමට බැඳෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒකට අපේ කාලය ඉවර වන කල් අපි ඉන්නේ නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ. මේ රටේ නීතිය කාටත් එකයි. නීතිය කාටත් සමාන වුණාම තමයි නීතිය හරියට ක්‍රියාත්මක වෙන්නේ. ඒකට නිලධාරීන්ට බලපෑම් නැහැ.

ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන ටිකක් වැඩිපුර කථා කරන්න මට ඕනෑකම තිබුණා. මොකද, පසුගිය කාලයේ රාජපක්ෂ පාලම් හදනකොට, රාජපක්ෂ පාරවල් හදනකොට, රාජපක්ෂ සම්මන්ත්‍රණශාලා හදනකොට, රාජපක්ෂ අධිවේගී මාර්ග හදනකොට, ඉදිකිරීම් කොන්ත්‍රාත් දුන්නේ කොහොමද කියලා කියන්න. යහළුවෝ වෙනම තමන්ගේම නමට කොන්ත්‍රාත් ගන්න ඉදිකිරීම් සමාගම් හදා ගත්තා. සමහරුන්ට එක පාරක් හදලා ගෙවීම් කරන්න බැරි වනකොට ඊළඟ කොන්ත්‍රාත්තුවත් දුන්නා. "මග නැඟුම" කියලා වෙනමම ආයතනයක් හදා ගත්තා. මග නැග්ගේ නැහැ, ඒගොල්ලෝ නැග්ගා. මග නැග්ගේ නැහැ, ඒගොල්ලෝ තමයි නැග්ගේ. ඒවා හොරා කාපු ගුහා බවට පත් වුණා. අපි දන්නවා, ඉංජිනේරු ඇස්තමේන්තුවයි, consultancy firmsවල ඇස්තමේන්තුවයි කොහොමද හැදුණේ කියලා. ඒවාට නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේවා පළිගැනීම් නොවෙයි. ඒවා පළිගැනීම් නම් කවදාකවත් මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ ගසා කෑම්, හොරකම් කරපුවා ඇත්තටම මේ රටේ මහ පොළවට වැටුණා නම් ඔබතුමන්ලා අද ආණ්ඩු පක්ෂයේ. එහෙම නම් අපි බලයට එන්නෙත් නැහැ. ආණ්ඩුව හොරකම් කළේ නැත්නම් මිනිස්සු අපට බලය දෙන්න ඕනෑ නැහැ නේ. එහෙම නම් මේ රටේ මීට වඩා සංවර්ධනයක් වෙලා. මීට කලින් මේ ආර්ථික දර්ශක ඉදිරියට ඇවිල්ලා. මීට කලින් එන්න තිබුණු ආයෝජකයෝ තමයි දැන් එන්නේ. මීට කලින් එන්න තිබුණු සංචාරකයෝ දැන් එන්නේ. මීට කලින් හැදෙන්න තිබුණු පාරවල් දැන් හැදෙන්නේ. මීට කලින් දියුණු වෙන්න තිබුණු රට දැන් තමයි දියුණු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි අපේ රටට ආදරෙයි. අපි මේ රට හදනවා. ඒක කොන්දේසි විරහිතයි. ඉදිකිරීම් ක්ෂේත්‍රය, වාහන සම්බන්ධයෙන් අද ගෙනෙන හැම සංශෝධනයක්ම මේ රටේ ආර්ථිකයේ ඉදිරි පුනර්ජීවයට හේතු වනවා මිසක බාධා කරන්නේ නැහැ කියන කාරණය අවධාරණය කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතියි. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ කථාවෙන් පසුව විවාදය ඉදිරියට ගෙන යන්න මමත් සම්බන්ධ වනවා.

අද කාර් සම්බන්ධව තිබෙන ප්‍රශ්නය තුළ කාරණා හතරක් නීතිගත කරනවා. එකක් තමයි, Excise (Special Provisions) Act එක යටතේ නියමය. ඒ වාගේම මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද - Luxury Tax එක - සම්බන්ධ නියෝගය සහ Import Duty එක සම්බන්ධ යෝජනා සම්මතය. මා ඒක ක්‍රියාත්මක කරන ආකාරය ගැන මේ අවස්ථාවේදී කථා කරන්නේ නැහැ. මොකද, ඇමතිවරු ඒ ගැන ඉතාම හොඳට දැනුවත් කළා. දැනට cross-border LCs සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන නිසා කාර් 8,724ක් හම්බන්තොට හිරවෙලා තිබෙනවා. කාර් 8,724ක ප්‍රමාණයක් හිරවෙලා තිබෙනවා කියන එක පොඩි කාරණයක් නොවෙයි. ඒක නිවැරදි කරන්න පුළුවන් ස්ථාවරය අපි ගත යුතුයි. මම හිතන විධියට සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා වැඩ කරන ඇමතිවරයෙක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා වාගේම තීන්දු ගත යුතු ආණ්ඩුවේ කොටස්කරුවෙකුත් විය යුතුයි කියන මට්ටමට තමයි එන්න අවශ්‍ය වන්නේ. මේක රජයේ නිලධාරින්ට ගන්න තිබෙන තීන්දුවක් නොවෙයි. ඇමති මණ්ඩලය ගත යුතු තීන්දු තමයි සමහර වෙලාවට කරන්න අවශ්‍ය වන්නේ. ඒ වාගේම, හැම දේම උසාවියට දීලා උසාවිය තුළින් තීන්දුවක් ගැනීම නොවෙයි අපට අවශ්‍ය වන්නේ. ක්‍රියාත්මක කරන්න තිබෙන දේ කරන එක තමයි අවශ්‍ය වන්නේ. එතුමා ගිහිල්ලා ලුණු සම්බන්ධව කරපු දේවල්, අන්න ඒවා තමයි කරන්න තිබෙන්නේ. තීන්දු ගත යුතුයි. පැල්වත්ත වහනවාද, අරිනවාද කියන තීන්දුව ගත යුතුයි. මේක රජයේ නිලධාරින්ට දෙන්න අවශ්‍යතාව නොවෙයි තිබෙන්නේ. නමුත්, මේ cross-boarder LCs සම්බන්ධයෙන් Import and Export Control Department එකට කියන්න පුළුවන් මෙතැන පරිපාලනයේ වෙනසක් තිබෙනවා, ප්‍රශ්නයක් තිබෙනවා, මෙතැන දූෂණයක් නොවෙයි වෙලා තිබෙන්නේ, පරිපාලනමය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියලා. බැරි වෙලාවත් පුතා වැඩ කරනවා කටාර්වල, තාත්තාට හෝ අම්මාට කාර් එකක් එවන්න ඕනෑ, ඒ නිසා L/C එකක් යවනවා ජපානයට, ජපානයෙන් නොවෙයි එන්නේ. ඒ නිසා 2013දී ගහලා තිබෙන ගැසට් එක අනුව ප්‍රශ්නයක් තිබෙනවා. ඉතින්, ඒ ප්‍රශ්නය තිබෙන නිසා, මේක cross-boarder නිසා ඔන්න ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මේකේ තිබෙන නීතිමය පියවර, නැවත ප්‍රතිඅපනයනය කරනවාද කියන එක නොවෙයි. මේකේ නිවැරදි කිරීමේ ස්වරූපය ඇති කරන එක තමයි අවශ්‍ය වන්නේ. ඉතින්, ඒකට Import and Export Control Department එකට කියන්න පුළුවන් නම් කරුණාකර මේ පරිපාලන ප්‍රශ්නය නිවැරදි කරන්න කියලා, අද බිලියන 90ක් -ඒ කියන්නේ කෝටි 900ක්- සොයාගන්න පුළුවන් මේ clear කිරීම තුළ.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී පෙන්වනවා, මේ කාරණයත්. අද "Daily Mirror" පුවත් පතේ සඳහන්ව තිබෙනවා, "Government considers double cab imports for MPs" කියලා. හැබැයි, ඊට ඉස්සරවෙලා කියනවා කාර් 2,000ක් ගෙනෙනවාය කියලා. මේ මොහොතේ රජයට කාර් 80,724ක් තිබෙනවා. ඒකෙන් වැඩ කරන කාර් 74,000ක් තිබෙනවා. ඒ 74,000 ලංකාවේ තිබෙනකොට ඕස්ට්‍රේලියාව වාගේ රටක 8,200යි තිබෙන්නේ. වියට්නාමය වාගේ රටක 21,000ක් තමයි තිබෙන්නේ. ලංකාව වාගේ රටක කාර් 76,600ක ප්‍රමාණයක් තිබිලා "Daily Mirror" පුවත් පතේ මෙවැනි දෙයක් පළ වුණාම නැවත මන්ත්‍රීවරුන්ට දීමක් තමයි කරන්න හදන්නේ කියලා පෙන්වන්න හදනවා. මේක මන්ත්‍රීවරුන්ට නොවෙයි ගෙන්වන්නේ. කාර් 2,000ක් ගෙනෙනවාලු, රජයේ සේවයට. මේ වැරදි අර්ථකථන දීම දැන්වත් නවත්වමු. ජනාධිපතිවරුන්ගේ දීමනා නවත්වනවා. ඒක ඒගොල්ලන්ගේ තීන්දුවක්. ඉදිරියට එන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෙන්ෂන් නවත්වනවා. මම හිතන විධියට, හිටපු මන්ත්‍රීවරුන්ගේ පෙන්ෂන් නොවෙයි නැති කරන්න අවශ්‍ය වන්නේ, ඉදිරියට එන අයගේ නැති කරන්න අවශ්‍යයි. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ මන්ත්‍රීවරුන්ට cabs දෙනවා කියලා නැවතත් මේ වාගේ වැරදි මතයක් ගියොත් ජනතාව මොනවා හිතයිද? කිච්චේ ජනතාවට ලැබෙන්නේ නැති දෙයක් අපට ලබාගන්න ඕනෑ නැහැයි කියලා නේ, මේ වාගේ වැරදි මතයක් දමාගන්න අවශ්‍ය නැහැ නේද, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි? මේක ඔබතුමාට බලපාන්නේ නැහැ, ඔබතුමා ඇමතිවරයෙක් නිසා. ඉතින්, ඇයි මේ කාර් නැවත මන්ත්‍රීවරුන්ට දෙනවා කියලා ගෙනෙන්නේ? කාර් 2,000ක් ගෙනෙනවා ලු. කාර් 2,000ක් ගෙනෙන්නේ? කාර් 2,000ක් ගෙන්වන්න බිලියන 65කට වඩා යනවා. ඒ කියන්නේ කෝටි 6,500ක්. දැන් රුපියල් 200, 500, 600, 1,000 ඉතුරු කරනවා. Lunch එකේ මිල වැඩි කර තිබෙනවා. බොහොම හොඳයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එතුමා මගේ නම කිව්වා. එතුමාට පැහැදිලි කිරීමක් කරන්න මට පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගෙන්වන වාහන ගෙන්වන්නේ රජයේ මන්ත්‍රීවරුන්ටම නොවෙයි, රජයේ ආයතනවලටයි. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගියොත්, ප්‍රාදේශීය ලේකම්වරයා ගත්තත් අවුරුදු 15ක් විතර පරණ වාහන පාවිච්චි කරන්නේ. ඔබතුමන්ලාටම පෙනෙනවා, ඒ වාහන නඩත්තු කරන එක ඊට වඩා වියදමක් බව. අපේ අමාත්‍යාංශවල තිබෙන ඒ වාගේ පරණ වාහන වෙන්දේසි කර ඉවත් කරලා අලුත් වාහන දෙන්න සැලැස්මක් තිබෙනවා. ඒකට අවශ්‍ය ප්‍රතිපාදන මුදල් අපට ඇති තරම් තිබෙනවා දැන්. මුදල් නැත්නම් අපි මේ දේ කරන්නේ නැහැ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් තිබෙනවාද, නැද්ද කියන එක නොවෙයි නේ, ඇමතිතුමා. මේවා අනවශ්‍ය වියදම් ලෙස නේ පෙන්නුවේ. අර කාර් 2,000ක් විතර auction කළා. ඒ සල්ලි ඇයි පාවිච්චි කරන්නේ

නැත්තේ? මම ඔබතුමාට කැමැති වන්නේ, ඔබතුමා අපි කරන විධියට වැඩේ කරන එක හරි. වමට සිග්නල් දාලා දකුණට හැරෙන්නේ නැහැ, ඔබතුමා. මම ඒකයි ලාල් කාන්ත, සුනිල් හඳුන්නෙත්ති, විජිත හේරත්, බිමල් රත්නායක ගැන කිය කියා ඉන්නේ. මොකද, අපට අවශ්‍ය වන්නේ ඒ ව්‍යාපාර හරි මාර්ගයට ගෙනෙන්නයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා චෝදනා කරමින් පෙළපාළි යන ගමන නවත්වා අද ඔතැන ඉඳිමින් අපට ප්‍රතිඋත්තර දෙන එකට අපි කැමැතියි. මොකද, එදා අපි ඕවා ගැන කිව්වාම, "මේ ඔක්කෝම හොරු" කියලා කිව්වා. හැබැයි, අද ඔබතුමන්ලාත් ඒකම කරනවා; ඒකම අනුමත කරනවා. මොකද, ඒක තමයි කරන්න අවශ්‍ය දේ. අපි කිව්වේ මේකයි. කාර් 84,000ක් රජයේ ආයතනවලට ඕනෑ නැහැ. ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය ආයතන සතුව 8,400ක් වාගේ වාහන ප්‍රමාණයක් තිබෙන විට ලංකාවේ රජයේ ආයතනවල වාහන 76,600 ගණනක් තියාගෙන තව 2,000ක් ගෙනෙන්න අවශ්‍ය නැහැ. එහෙම ගෙනෙන්න හදන ඒකයි තිබෙන ප්‍රශ්නය. මීට පෙර ගාලු මුවදොරට රජයේ වාහන ගෙනිහින්, ඒවා පෙන්නමින් ලොකු සන්දර්ශනයක් පැවැත්වූවා නේ. ඉතින් ඒ තරම් වාහන තිබිලාත් තවත් 2,000ක් ගෙන්වන්න ඕනෑද? ඒ විතරක් නොවෙයි. මේ කියන වාහන 2,000 රජයේ ආයතනවලට ගෙනෙනවා කියලා කියනවා නම් කමක් නැහැ. නමුත්, ඒවා මන්ත්‍රීවරුන් පිට දාලා තිබෙනවා. එහෙම කිව්වාම, මේ පාර්ලිමේන්තුවම නේද හාස්‍යයට ලක් වෙන්නේ? මෙවැනි කටයුතු නවත්වන්න ඕනෑ කියලා යෝජනා ගෙනාපු තැන මෙතැනයි. එහෙම නම් ඒක නිවැරැදි කරන්න. මන්ත්‍රීවරුන්ට වාහන ගෙනෙනවා කියලා කියන්න එපා. මොකද, මෙතැන ඉන්නේ පවතින ක්‍රමය ශුද්ධ කරන්න ඕනෑ කියලා ආපු අය. එහෙම නම් අපි එය ශුද්ධ කරමු. ඩබල් කැබ් එකක් දුන්නා කියලා අපිරිසිදු වීමක් වෙන්නේ නැහැ. නමුත්, ඒක තමයි දැන් ඇති වෙලා තිබෙන මතය. ඉතින් ඒක නිවැරැදි කරන්න කියන එක තමයි මම කියන්නේ. මම කැමැතියි, ඔබතුමන්ලා කාර්වල යන එකට. මම කියනවා, ජනාධිපතිවරයා යන්න ඕනෑ හෙලිකොප්ටර් එකෙන් කියලා. එතකොට යාපනයට එහෙම යනකොට පැය 10ක් පමණ පාරට කාලය නාස්ති කරන්නේ නැතුව පැය ½න් එහේට යන්න පුළුවන්. ගරු කථානායකතුමාගේ නිල නිවස තිබෙන්නේ මගේ නිවස ආසන්නයේ. එය වසා දමා තබන්න එපා; වෙනත් කාර්ය මණ්ඩලවලට දෙන්න එපා. මොකද, එතකොට ඒක අවභාවිත කළා කියලා තව අවුරුදු 5කින් ඒ ගැන ප්‍රශ්න කරාවි. නිල නිවසක් තියාගෙන Davidson Road එකෙන් ගෙයක් ගන්න අවශ්‍ය නැහැ නේද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? කථානායකතුමාට නිල නිවසක් තිබෙන්නේ එතුමාට ඉන්න මිසක් වෙන දේකට නොවෙයි නේ. ඉතින් එතැන වෙනත් සංදර්ශන කරන තැනක් කරන්න එපා කියා මම කියනවා.

ඊළඟට, මම කියන්න කැමැතියි, Sri Lanka Railways එකේ සේවකයන්ට අතිකාල වියදම්වලට - overtimeවලට - මිලියන 5,100ක් පමණ ගෙවා තිබෙන බව. වැඩ කරන්නේ 14,057දෙනායි. ඒ මුදල දවස් 365න් බෙදුවොත් -හැම එක්කෙනාම හැම දවසකම overtime කළා නම්- එක්කෙනෙකුට රුපියල් 1,100ක් ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ පෝය ද, ඉරිදා ද කියා බලන්නේ නැතුව වැඩ කළොත්. මේ විධියට තමයි දුම්රිය දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු වී තිබෙන්නේ. ඊට පසුව ඔබතුමන්ලා කියා තිබෙනවා, අවුරුදු 5ක project එකකට ගෙවීම් කර තිබුණත්, මොකුත් කරලා නැහැ කියලා. මා හිතන විධියට එවැනි දේවලට වෙන් කළ මුදල් තමයි වෙනත් දේවල් සම්බන්ධයෙන් යෙදවිය යුත්තේ. මොකද, ඒවා තමයි අනවශ්‍ය වියදම්. මා කියන්නේ මේකයි. දේශපාලනමය වශයෙන් බණින්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. මේ 225දෙනාත්, ජනාධිපතිවරයාත්, පළාත් සභාවල සිටින 456දෙනාත්, ප්‍රාදේශීය සභාවල සිටින 8,900දෙනාත් මේ ප්‍රශ්නවල කොටස්කරුවන් වෙනවා. ඒ වාගේම සමස්ත රාජ්‍ය සේවය තුළ සිටින මිලියන 1.6ක් වන නිලධාරින් අතර සිටින ඇතැම් අයගේත් ප්‍රශ්න තිබෙනවා. ඒ සමස්ත නිලධාරින්ගෙන් සියයට 90ක් පමණ හොඳයි. ඒ අයගෙන් සියයට 4ක්, 5ක් පමණ වන පිරිස සම්බන්ධයෙන් තමයි බරපතළ ප්‍රශ්න තිබෙන්නේ.

මම මේ අවස්ථාවේ Dr. Rohan Karunaratne සඳහන් කරන කාරණයක් කියන්න ඕනෑ. එතුමා තමයි ලංකා ඉදිකිරීම්කරුවන්ගේ ආයතනයේ සභාපති. එතුමා කියනවා, මේ ආණ්ඩුව දූෂණ කටයුතු නැවැත්වීමට කොතරම් උත්සාහ ගත්තත්, අද වන විට දූෂණය වැඩි වෙලා තිබෙනවා කියලා. එතුමා කියපු දේ මම quote කරන්නම්. එතුමා ආණ්ඩුව ගැන කියන්නේ නැහැ. හැබැයි, තවම අර දේවල් එහෙමම වෙනවා කියලා කියා තිබෙනවා. රොහාන් කරුණාරත්න කියන්නේ ඉතාම දක්ෂ පුද්ගලයෙක්. එතුමා කියා තිබෙනවා, සාමාන්‍යයෙන් දළ දේශීය නිෂ්පාදනයට මෙතෙක් කර්මාන්ත ක්ෂේත්‍රයේ තිබුණු සියයට 9ක දායකත්වය අද වන විට සියයට 2ට අඩු වෙලා තිබෙන බව. "Although the Government has done much to resolve corruption in Sri Lanka, it still exists within institutions. The culture of corruption severely damages Sri Lanka's reputation as a transparent investment destination, deterring investors who prioritize ethical business practices and rule of law" යනුවෙන් එතුමා කියා තිබෙනවා.

ඔබතුමන්ලා දැන් මේ සම්බන්ධයෙන් ඇමතිවරුන්ට බැණලා වැඩක් නැහැ. අපි කුහක විපක්ෂයක් නොවෙයි. ඔබතුමන්ලා ආණ්ඩු බලය අරගෙන දැනට මාස 11ක් පමණ වෙනවා. මේ කාලය තුළ ඔබතුමන්ලාට පෙනී යන්න ඇති, විපක්ෂයේ සිටියදී කෑ ගහමින් සිටියාට වඩා ආණ්ඩු බලය ගත්තාට පසුව මුහුණ දෙන්න සිදු වන ප්‍රශ්න ඊට වඩා ගොඩක් සංකීර්ණ බව. අන්න ඒ නිසා තමයි අපි මෙතැනදී ඔබතුමන්ලා දිරි ගන්වන්නේ. මොකද, දැන් ඔබතුමන්ලා මේ හිසරදය ගැන දන්නවා. මේකත් ඒ අවුරුදු 76ක ශාපයට එකතු වන කොටසක්. ඒ අවුරුදු 76ට තවත් මාස 11ක කොටසක් එකතු වුණා මිස ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. මා මේවා කියන්නේ කුහකකමින් නොවෙයි කියන එක මම හැම අවස්ථාවකම කියනවා. මට අවශ්‍ය වන්නේ මේ ක්ෂේත්‍රය හරි පාරට ගෙනෙන්නයි. පාට, පක්ෂ පැත්තකට දමලා රට හදන ඉදිරි ගමනට අපි ඔක්කෝම අත්වැල් බැඳ ගන්න ඕනෑ කියන මතයේ තමයි මම ඉන්නේ.

ඊළඟට, මම SriLankan Airlines ගැනත් කියන්න ඕනෑ. SriLankan Airlines සම්බන්ධව අහපු ප්‍රශ්නයකට ඔබතුමන්ලාගේ ඇමතිවරයෙක් පාර්ලිමේන්තුවේදී උත්තරයක් දුන්නා. SriLankan Airlines ආයතනය බිලියන 23ක embarkation levies ගෙවන්න තිබෙනවා කිව්වා. හැබැයි, මේ විධියට පෞද්ගලික අංශයේ කොම්පැනියකට රුපියල් 100ක් හෝ ගෙවන්න තිබුණා නම්, මෙලහකට CID එකෙන් ගිහිල්ලා අත්අඩංගුවට අරගෙන රිමාන්ඩ් කරලා bail අරගෙන. මේක රජයේ ආයතනයක්. රුපියල් බිලියන 23ක් -කෝටි 2,300ක්- ගෙවන්න තිබෙනවා. ඒකට මොකක්ද කරලා තිබෙන්නේ? මේ රුපියල් කෝටි 2,300 සමාජයේ තරුණ අය ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන්න පාවිච්චි කළා නම්, ඒ අයට රුපියල් ලක්ෂ දෙකක loan එකක් දුන්නා නම්, අපට ඒ වාගේ ලක්ෂයක පිරිසක් බිහි කරන්න තිබුණා. ඒ වාගේම, Air India and FitsAir ඒ විධියට ගෙවන්න තිබෙනවා. ඇයි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නේ නැත්තේ? දැන් විපක්ෂයට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. මෙහි පරිවර්තනයක් කරලා පරිපාලනය ඉදිරියට ගෙන යන්නයි ඕනෑ. මම ඔබතුමන්ලාට හැම වෙලාවේම කියන්නේ මේ රජයේ නිලධාරින් මේ රටේ 76 වසරක ශාපයේ ප්‍රධාන කොටසක් කියන එකයි. සමහර විට ඒ ගැන කථා කරන කොට, මේ මොකක්ද

[ගරු රවී කරුණානායක මහතා]

කරන්නේ කියලා රජයේ නිලධාරින් හිතාවි. අපිත් ආණ්ඩු කරගෙන ගිහිල්ලා, ඒවා දැකලා තිබෙන නිසා තමයි, මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට ඒ ගැන පෙළිදරව් කරන්නේ.

දැන් බලන්න, ඉදි කිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත්තාම, රනිල් වික්‍රමසිංහ මැතිතුමා තීන්දු කළා, රාජ්‍ය අංශය විසින් ශත පහක්වත් අය කරන්නේ නැතුව ජනතාවට ගෙවල් දෙන්න ඕනෑ කියලා. ඒක පටන් ගත්තේ උතුරු කොළඹ ආසනයෙන්. කොළඹ දිස්ත්‍රික්කයට ගෙවල් 54,300ක් දෙනවා කිව්වා. අපි ගෙවල් 23,000ක් දුන්නා. ඉතිරි ගෙවල් දෙන්න ඉන්න කොට ආණ්ඩුව වෙනස් වුණා. ආණ්ඩුව වෙනස් වුණාට පස්සේ අද වනතුරු එක ගෙයක්වත් දීලා නැහැ. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමා විතරයි ඇමතිවරයෙකු විධියට මේ වෙලාවේ මට මෙහි පෙනෙන්න ඉන්නේ. කරුණාකරලා ඒ කටයුත්ත ඉදිරියට කරගෙන යන්න. ඒක රනිල් වික්‍රමසිංහ මැතිතුමා තීන්දු කළත්, නැතත් කමක් නැහැ. ඒක රජය ජනතාවට සල්ලි දෙන එකක්. ඒක capital formation එකක්; ආයෝජනයක් ඇති කරන එකක්. ඒ ගෙයක් රුපියල් මිලියන 10ක් නම්, ඒ වාගේ ගෙවල් 54,000ක් හදනවා කියන්නේ රුපියල් ට්‍රිලියන 5ක ආයෝජනයක් රටට ඇති වෙනවා කියන එකයි. ඉතින්, ඒක ආයෝජනයක් නොවෙයිද? රනිල් වික්‍රමසිංහ දුන්නාද නැද්ද කියන එක නොවෙයි වැදගත්. අනුර දිසානායක දුන්නත් ඒක ජනතාවට ගෙවල් දෙන සංකල්පයක්. ශත පහක්වත් ගන්නේ නැතුව ගෙවල් දෙන්න එතුමා ඉතා වැදගත් තීන්දුවක් ගත්තේ. මේ තුළින් මම පෙන්වන්න හදන්නේ, එක්සත් ජාතික පක්ෂය මේ රටට ඉමහත් සේවයක් කරපු පක්ෂයක් කියන එකයි. මහවැලි ව්‍යාපාරය, මහපොළ ශිෂ්‍යාධාර ක්‍රමය, වරාය හැදීම, ගෙවල් ලක්ෂ 100ක සංකල්පය කියන ඔක්කොම කරලා තිබෙනවා. ඒවා ඉදිරියට ගෙනියන්න ඕනෑ. මේක සහාය දිවීමේ තරගයක්. ඒ baton එක දැන් දීලා තිබෙනවා, අනුර දිසානායක මැතිතුමා ඇතුළු ඔබතුමන්ලාගේ කණ්ඩායමට. හැබැයි ඔබතුමන්ලා දැන් අර වසර 76ටම බැණ බැණ "මුන් මොකුත් කළේ නැහැ" කියලා කියන එක තමයි තිබෙන ප්‍රශ්නය.

ඔබතුමන්ලා මෙහිදී කිව්වා මුදල් අච්චු ගැසීම කිසිසේත්ම කරන්නේ නැහැ කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා එදා මැතිවරණයක් ගැන හිතන්නේ නැතුව මුදල් අච්චු ගහන **එක** නැවැත්වූවා. එහෙම කරපු එතුමා අද විපක්ෂයට ගිහිල්ලා ඉන්නවා. මුදල් අච්චු ගහන එක මේ ආණ්ඩුවම නැවැත්වූවා කියනවාට වඩා, "රනිල් වික්‍රමසිංහ මහත්මයා ආරම්භ කරපු එක අපිත් ඉදිරියට ගෙනියනවා" කිව්වා නම් වඩා හොඳයි නේද? ආණ්ඩු වෙනස් වෙනකොට රජයේ නිලධාරින් ඇවිල්ලා ලස්සනට කියනවා, "ඔබතුමන්ලා තමයි මේක කළේ" කියලා. අපි ඒක අහලා තිබෙන නිසායි ඔබතුමන්ලාටත් කියන්නේ, කරුණාකරලා ඒ වාගේ දේවලට හසු වෙන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මිනිත්තු 14ක් වාෂ්ප වුණාද, ඔච්චර ඉක්මනට? මම හිතන්නේ නැහැ!

බලන්න, modernization කරන විධිය. මේ කියන මොහොතේදී වියට්නාමය US Dollars 1.7 billion - ඒ කියන්නේ රුපියල් බිලියන 520ක් - පාවිච්චි කරනවා, රජයේ සේවකයන් ලක්ෂ දෙකක් ගෙදර යවන්න. අපි මොනවාද කරන්නේ? අපි තවත් 62,000ක් අපේ දැනට ඉන්න රාජ්‍ය සේවකයන් ලක්ෂ 16ට එකතු කරන්න හදනවා. අපි රුපියල් ට්‍රිලියන 1.4ක් වියදම් කරන ගමන්, තවත් රුපියල් බිලියන 60ක් දැන් එකතු කරන්න හදනවා. අපට අවශ්‍ය වන්නේ, executivesලා, ඒ කියන්නේ, ඉහළ තලයේ ඉන්න අය. මම දැක්කා, දුමින්ද හුලංගමුව මහත්මයා කියපු කථාවක්. එතුමා හය නැතුව කියනවා, මේ රටේ ලක්ෂ 16ක් පමණ වන රාජ්‍ය සේවකයන් ප්‍රමාණය අඩු කරන්න ඕනෑ කියලා. මම එතුමාගේ ඒ ප්‍රකාශය ඉතාම අගය කරනවා. අපි නොවෙයි කියන්නේ. අනුර දිසානායක ජනාධිපතිතුමා පත් කරලා තිබෙන දක්ෂයෙකු වන දුමින්ද හුලංගමුව මහත්මයායි එහෙම කියන්නේ. එතුමා කියනවා, රාජ්‍ය සේවය ලක්ෂ අටහමාරකට අඩු කරන්න ඕනෑ කියලා. අපි ඕක කිව්වා නම්, "අන්න මුන් ටික ඇවිල්ලා තිබෙන්නේ රට කන්න" කියාවි. මේක NPP ආණ්ඩුවේ, ඔබතුමන්ලාගේ දුමින්ද හුලංගමුව මහත්මයායි කියන්නේ. මම අනුමත කරනවා, එතුමා කියන දේ. මොකද, මූල්‍ය විනයක් තබාගන්න අවශ්‍යයි. එතුමා කියනවා, රාජ්‍ය සේවය ලක්ෂ අටහමාරකට අඩු කරන්න ඕනෑ කියලා. හැබැයි, මම කියන්නේ නීති ක්ෂේත්‍රයට මීට වඩා සියයට 200කින්, 300කින් පඩි වැඩි කරන්න කියලායි; පොලීසියට සහ ත්‍රිවිධ හමුදාවට සියයට 200කින්, 300කින් පඩි වැඩි කරන්න කියලායි. ඒ වාගේම, ගණකාධිකාරිවරුන්, දොස්තරවරුන්, ඉංජිනේරුවන්, මුදල් අමාත්‍යාංශයේ සිටින ශ්‍රේණිගත කළ නිලධාරින් ඇතුළු ලක්ෂ තුන හතරකගේ පඩි සියයට 300කින් වැඩි කළාට ප්‍රශ්නයක් නැහැ. අපේ ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා සහ මා ඉන්න Public Finance Committee එකට එනවා, audit team එකේ පඩි වැඩි කරන්න ඕනෑ කියන කාරණය. ඒකේ ඉන්න ඉහළම නිලධාරියාගේ නම කියන්නේ නැතුව මම කියන්නම්. එතුමාට රුපියල් ලක්ෂ දෙහමාරක පඩියක් ලැබෙන්නේ.

නමුත් මහ බැංකුවේ ඉන්න පියන්ට රුපියල් 230,000ක පඩියක් ලැබෙනවා. මොකක්ද මේ? දළ දේශීය නිෂ්පාදිතය ට්‍රිලියන 29ක් තිබෙන රටක,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අද උපන් දිනය සමරන අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමා අනිවාර්යයෙන් තව මිනිත්තු තුන හතරක් මට ලබා දෙයි.

ඔබතුමන්ලාගේ පසු පේළියේ ඉන්න මන්ත්‍රීවරුන්ට සමහර දේවල් කියන්න බැහැ. නමුත් අපි ඒ අයට කියන්නම්, මෙන්න මෙහෙම තමයි කරන්න අවශ්‍ය වන්නේ කියලා. *[බාධා කිරීමක්]*

මට තව මිනිත්තු හතරක් දුන්නා.

සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත් අහගෙන ඉන්න නිසා, මෙතැනට ලාල් කාන්ත ඇමතිතුමාත් ආවා නම් අනුමත කරන නිසා, විජිත හේරත් ඇමතිතුමා සහ බිමල් රත්නායක ඇමතිතුමාත් හිටියා නම් කෙළින්ම කැබිනට් එකෙන් තීන්දු ගන්නවා වාගේ

සලකන නිසා මම මේ කාරණය කියන්නම්. මේ මොහොතේ අපට අවශ්‍ය වන්නේ modernization. දැන් බලන්න, අපි පාර්ලිමේන්තුවෙන් එළියට , -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ ඉල්ලීමට අවසර ලැබුණේ නැහැ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, දීලා තිබෙනවා. එහෙම වෙන්නේ නැහැ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ උපන් දිනය දවසේ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විනාඩි 4ක් දෙනවාද, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා? හරි. විනාඩි හතරක් ලැබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විනාඩි හතරක් දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒ විනාඩි හතර වේලාසන ලබා දීලා තිබෙනවා. විනාඩි හතරක් දීලා තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමිය බලන්න, අපි පාර්ලිමේන්තුවෙන් එළියට යනකොට තිබෙන ground එකේ දස දෙනෙක්, දොළොස් දෙනෙක් පොඩි කැති තියාගෙන හැම දාම තණකොළ කපා කපා ඉන්නවා. මේ වැඩේට මාසයකට රුපියල් මිලියන 10ක්, 15ක්, 20ක් වැය වෙනවා. මේකට electric lawn mower එකක් දුන්නා නම් automation එකක් වෙනවා නේ. මෙන්න මේ වාගේ තමයි රට හදන්න ඕනෑ. අපි expressway එකේ ගියොත්,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்
(The Hon. Deputy Chairperson of Committees)

දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හොඳයි, මම අවසන් කරන්නම්.

Expressway එකට ඇතුළු වෙනකොට පොඩි තුණ්ඩු කෑල්ලක් දෙනවා. ඒ තුණ්ඩු කෑල්ල අරගෙන පිටවෙන තැනදී ඒක නැවත ගන්නවා. රට පුරා මේ කාර්යයට 300ක්, 400ක්, 500ක් සම්බන්ධ වෙනවා. මේ කාර්යයට ETC එකේ වාගේ machine එකක් දැම්මා නම්, expressway එකෙන් පිට වෙනකොට කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ; දූෂණයක් නැහැ, ක්‍රමයට අනුව ඉදිරියට යනවා. එතකොට automation, digitalization කියන දේවල් වෙනවා. එහෙම වෙන්නේ නැති එක තමයි තිබෙන්නේ. අපි සුරංගනා ලෝකයකට ගියාට තවම බූරුවෙකුගේ පිට උඩ යනවා වාගේ තමයි යන්නේ. ඔබතුමිය මූලාසනයේ සිටින මේ අවස්ථාවේ මම තව එක කාරණයක් කියලා මගේ කථාව නවත්වන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. දැන් වැඩිපුරත් විනාඩියක් ගතවෙලා තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ අවස්ථාවේ වැදගත්ම දේ තමයි අපේ අපනයන ක්ෂේත්‍රය. මෙතැන ඉන්න සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා ඒ ගැන හොඳට දන්නවා. එතුමා ගිහින් දිරිගන්වලා තිබුණා, එදා strike කරපු BoI එක. BoI එක නැවත දෙන්න හදනවා, Sri Lanka Customs එකට. ඇයි මේක කරන්න හදන්නේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා? ඔබතුමන්ලා කියනවා, 2030 අපනයන ක්ෂේත්‍රය බිලියන 36ක් කරන්න ඕනෑ කියලා. 2030දී බිලියන 36ක අපනයන කරන්න අවශ්‍ය නම්, BoI එක Sri Lanka Customs එකට දෙනවා කියන්නේ, බිලියන 20කට විතර අඩු කරගන්න එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම දන්නවා ඔබතුමියට කාලයත් එක්ක සටනක් තිබෙනවා කියලා. මම මේ අවස්ථාවේ තව එක කාරණයක් කියනවා. කරුණාකරලා මහ බැංකුව යටතේ තිබෙන EPF එක වහාම ස්වාධීන කරන්න. මහ බැංකුව ස්වාධීන ආයතනයක් නම් දැන් EPF එක ඒගොල්ලන් යටතේ තියන්න ඕනෑ නැහැ. ඒක නැති කරලා ඒ ක්ෂේත්‍රය ගන්න ඉදිකිරීම් - construction - ක්ෂේත්‍රයට. ඒ තුළින් ඉදිරියට ගමන් කරන්න.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.03]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද ඉදිකිරීම්වලට අදාළව සහ රේගුවට අදාළව සාකච්ඡා කරන දවසක්. ඇත්තටම රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා කරනු ලබන අලුත් ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා කරන සෑම විටම ඒ සඳහා අපට ලබා දිය හැකි හැම මතවාදී සහයෝගයක්ම ලබා දිය යුතුයි. නමුත් එකම කණ්ඩායමක් ඉලක්ක කරමින් එක දිගට බදු පනවමින්, එහෙම නැත්නම් රජය විසින් ජනතාවගෙන් බදු ලෙස එකතු කර ගන්නා මුදල්වලින් මහජනතාවට ලැබෙන සේවය, මහජනතාවට පහසුවෙන් ජීවත් වීමට තිබෙන අවස්ථාව මඟහැරී යෑම පිළිබඳව තමයි අපි විපක්ෂයක් ලෙස සාකච්ඡා කරමින් ඉන්නේ. එහෙම නැතිව ඔබතුමන්ලා ඉදිරිපත් කරන මේ ප්‍රතිසංස්කරණවලට අපි කුහක අදහස් ඉදිරිපත් කරනවා නොවෙයි. ඒ වාගේ අදහසක් කිව්වා. නමුත් එහෙම කිසිම දෙයක් නැහැ.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

මට කලින් කථා කරපු ඇමතිතුමා කිව්වා, විදේශ ප්‍රේෂණ වැඩි වෙලා තිබෙනවා කියලා. ඒක අගය කළ යුතු තත්ත්වයක්. හැබැයි ඒ සමඟම කිව්වා, රට යන පිරිස අඩු වෙලා තිබෙනවා කියලා. රට යන පිරිස අඩු වෙලා විදේශ ප්‍රේෂණ -ලංකාවට එන මුදල්- වැඩි වෙන්න නම්, වෙන රටවල ඉන්න මිනිස්සු අපේ රටට සල්ලි එවනවාද කියලා තමයි අහන්න තිබෙන්නේ කථාව පටන් ගන්න තැනදීම.

විදේශ ප්‍රේෂණ ගත්තාම, රුසියාව සහ යුක්රේනය සම්බන්ධ යුද්ධයට ලංකාවේ හමුදාවේ සිටිය සොල්දාදුවන් සහ තරුණයන් සම්බන්ධ වෙලා තිබෙනවා. එහිදී සමහර අය මිය ගිහින් තිබෙනවා, අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ ප්‍රේෂණ එකතු කර ගැනීමට රජයට තිබෙන වගකීම වාගේම, මේ පිළිබඳවත් සොයා බලන්න කියන ඉල්ලීම මම කරනවා. දැන් ඒ රටවලදී ඒ සමහර අය ත්‍රස්තවාදීන් ලෙස හඳුන්වමින් නම් කරලා තිබෙනවා. මුදල්මය පැත්තට අමතරව ඒ පවුල්වල අයට ඒ පිළිබඳ යම් සාධාරණයක් ඉෂ්ට කරගන්නටත්, සමාජයට එතැනින් ඇති වන බලපෑම පිළිබඳවත් සොයා බලමින් ඒ පිළිබඳව කටයුතු

ඒ වාගේම රටට ලැබෙන ඩොලර් ආදායම සඳහා සංචාරකයන්ගේ පැමිණීමත් වැදගත්. අලුතින් ඇති කරලා තිබෙනවා, සංචාරකයන්ට ලංකාවේ ඇතුළේ driving licence එක ගන්න පුළුවන් system එකක්. ඒ පිළිබඳව ඒ ක්ෂේත්‍රයේ රැකියා කරන අයගේ යම් ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව යළි අවධානය යොමු කරන්න කියලාත් මතක් කරනවා. මොකද, ඒ තුළින් ලංකාවේ අයගේ රැකියා විදෙස් අය ගන්නවා කියන අදහස ඒ ක්ෂේත්‍රය තුළ ඉන්න අය තුළ තිබෙනවා. එහෙම දෙනවා නම්, සැලකිය යුතු මුදලක් අය කරලා, අපට අහිමි වෙනවා යැයි හිතෙන මුදල රජයට අය කර ගන්න ක්‍රමයක් හදලා යම් සමාගමක් හරහා හෝ රජය හරහා ඒ ලයිසන් එක ලබා දෙන්න කියලා ඉල්ලනවා. එහෙම නැත්නම් ලංකාවට ලැබෙන්න තිබ්බ මුදලක් විදේශයකින් එන සංචාරකයා අත ඉතිරි වෙනවා. අපි බලන්න ඕනෑ පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය පමණක් නොවෙයි, ඒ අයගෙන් වැඩි මුදල් ප්‍රමාණයක් ලංකාව ඇතුළේ වියදම් කරවන්නේ කොහොමද කියලායි. ඒ වියදම් කරන්න තිබෙන ප්‍රමාණයෙන් එක කොටසක් තමයි ඒ රියදුරන්ට එහෙම නැත්නම් ඒ ආයතනවලට ගෙවන ගාස්තුව. ඒ රැකියා කරන අය අතර ඇති වෙලා තිබෙන ව්‍යාකූලත්වය ඒක තමයි. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න. ඒ මුදල් එකතු කරගන්න අතරතුර, ඒ රැකියා කරන අයගේ අපහසුතා පිළිබඳවත් අවධානය යොමු කරන්න.

දිගින් දිගටම කථා කරනවා, ශ්‍රී ලංකා රේගුවේ ආදායම් වැඩිවීම පිළිබඳව. හැබැයි, ලංකාවට භාණ්ඩ ගෙන්වන අයගෙන් චෝදනාවක් තිබෙනවා. රේගුවේ පවතින අකාර්යක්ෂමතාව නිසා ඒ අයගේ භාණ්ඩ රේගුව රඳවා ගෙන ඉන්න දවස් ගණන වැඩි වෙනවා. එහෙම වැඩි වෙන්න, වැඩිවෙන්න ඒකට මිලක් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ සෑම මිලක්ම රජයට ගෙවන අතරතුර, ඒගොල්ලන් විකුණන භාණ්ඩයට ඒ මිල එකතු කරනවා. එතැනදී එක පැත්තකින් රජයේ ආදායම වැඩි වෙනවා. ඒ ආදායම වැඩි වෙන අතරතුර ඒ භාණ්ඩය ලංකාවට ගේන තැනැත්තා ඒ මුදල භාණ්ඩයට එකතු කරලා පාරිභෝගික ජනතාවට විකුණනවා. එතකොට නැවත වරක් ඒ භාණ්ඩයට වැඩි මිලක් ගෙවන්න පාරිභෝගික ජනතාවට සිද්ධ වෙනවා. එක පැත්තකින් රේගු ආදායම් වැඩි වෙනවා කියලා සතුටින් උදන් අනන ආණ්ඩුව, ඒ භාණ්ඩ රේගුවේ රඳවා ගන්න දවස් ගණන, පැය ගණන අඩු කරන්න ඒ මුදල් යොදා ගන්න බව කොතැනකදීවත් කියන්නේ නැහැ. ඒ එකතු කරගන්න මුදල රේගුවේ කටයුතුවලට දාලා එතැන කාලය අඩු කළොත් ආදායම අඩු වෙයි කියලා බය හිතෙනවාද දන්නේ නැහැ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ, පාරිභෝගික ජනතාවට ඒ සම්පූර්ණ වියදම cover කරගන්න සිද්ධ වීමයි. පාරිභෝගික ජනතාවගෙන් තමයි අන්තිමට ඒ මුදල ඇදිලා යන්නේ. ඒ කියන්නේ, සාමාන්‍ය ජනතාවගෙන්.

ඒ වාගේම රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට දරන උත්සාහය පිළිබඳව දිගින් දිගටම කථා කරනවා. මේ දවස්වල ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව පනතක් පවා සම්මත වෙලා තිබෙන වෙලාවක ඉංජිනේරුවන් අලුතින් බඳවා ගැනීම පිළිබඳ යෝජනාවක් තිබෙනවා. අලුතින් ඉංජිනේරුවන් බඳවා ගැනීමේ යෝජනාව ඇතුළේ විදුලිබල මණ්ඩලයෙන් කියවෙන කාරණාව තමයි, ඒ ඉංජිනේරු රැකියාවට එන්න සුදුසුකම් සම්පූර්ණ කරපු අභ්‍යන්තර සේවකයන් ඉන්නවා කියන එක. ඒ කාල සීමාව සම්පූර්ණ කරපු අය, අභ්‍යන්තර රැකියා ලබා දීමේ පටිපාටිය හරහා බඳවා ගන්න පුළුවන්කම තිබෙද්දී ඇයි බාහිරින් බඳවා ගන්නේ කියන එක පිළිබඳව විදුලිබල මණ්ඩලයේ සේවකයන් අතර ප්‍රශ්නයක් තිබෙනවා. එතැන ප්‍රමාණවත් කණ්ඩායමක් ඉන්නවා නම්, මේ වෙලාවේ ඒ පිරිසෙන් බඳවා ගන්න පුළුවන් නම්, එහෙම නොගන්නේ ඇයි කියන කාරණාව මතු වෙනවා.

ඒ වාගේම තමයි තැපැල් සේවය භාවිත කරමින් පිටරටවල ඉඳලා ලංකාවට භාණ්ඩ එවන අයගේ චෝදනාවක් තිබෙනවා, තැපැල් සේවයේ අකාර්යක්ෂමතාව පිළිබඳව. මේ දවස්වල තිබෙන තැපැල් වර්ජනයේ ප්‍රශ්නය නොවෙයි, ඊට කලින් ඉඳලා තිබෙන ප්‍රශ්නයක් මේක. ඇඟිලි සලකුණ අනිවාර්යය කරනවා කියලා රජය කියනවා. හැබැයි, තැපැල් සේවකයන් කියනවා, එහෙම ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ කියලා. ඒ අයගේ රැකියාවේ වෙනත් ප්‍රශ්න ගණනාවක් එක්ක තමයි මේ වර්ජනය යන්නේ. ඒ අයට සේවක පුරප්පාඩු වාගේ ප්‍රශ්න ගොඩක් කියනවා. ජනාධිපතිතුමා දවසක් කිව්වා, සමහර ආයතන වහන්න සිද්ධ වෙනවා කියලා. හොඳයි. සමහර ආයතන වහන්න ඕනෑ. රාජ්‍ය ව්‍යාපාර කුඩා කරන්න කියන එක තමයි අපේ ප්‍රතිපත්තිය. අන්න ඒ වසා දමන්න බලාපොරොත්තු වන ආයතනවල ඉන්න සේවකයන් කොයි ප්‍රමාණයක් අපට මේ තැන්වලට අනුගත කරන්න පුළුවන්ද කියලා බලන්න පුළුවන්කම තිබෙනවා නේ. ඒ නිසා රාජ්‍ය ආයතනවලින් සමහර ආයතන වහනවා නම්, ඒවායේ ඉන්න සේවක මණ්ඩලයට පුහුණුවක් ලබා දීලා මේ තැන්වලට අනුගත කරන්න, පුළුවන් නම්. රාජ්‍ය සේවය පුළුල් කරගන්නේ නැතුව, රාජ්‍යයේ ප්‍රමාණය වැඩි කරගන්නේ නැතුව සේවකයන් එහා මෙහා කරලාත් මේ කටයුත්ත කරන්න පුළුවන්. මම දැක්කා, ලාල් කාන්ත ඇමතිවරයාත් මේ ගැන කියනවා. සමහර ආයතනවල කාර්ය මණ්ඩලය වැඩි වෙලා ඇති. එහෙම නම්, ඒ වැඩි වෙලා ඉන්න තැන්වලින් සේවකයන් යම් ප්‍රමාණයක් ගත්තා නම් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියන අදහසක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මීට අමතර ප්‍රශ්නයක් මම මතු කරනවා. මේ දවස්වල තිබෙනවා, පාසල් ගුරුවරුන්ගේ ප්‍රශ්නයක්. ඔවුන් දිගින් දිගටම මගෙන් ඉල්ලීමක් කළා, ඒ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරවන්න කියලා. පාසල් ගුරුවරුන්ගේ ප්‍රශ්න කිහිපයක් ගැන කථා කරනවා. එකක් තමයි, වසර පහකට වරක් රජයේ පාසල් ගුරුවරුන්ගේ ගුරු මාරු ප්‍රතිපත්තිය සිද්ධ වෙනවා. හැබැයි, පාසල් ගුරුවරුන්ගේ යෝජනාවක් තිබෙනවා, මේ ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී වසර අවසානයේ ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, වසර මැද ක්‍රියාත්මක කරද්දී ඉගෙන ගන්න ළමයින්ට ඒ ගලා ගෙන ගිය ක්‍රමය වෙනස් වෙලා අලුත් ගුරුවරු එනවා. විශේෂයෙන්ම කුඩා පන්තිවලට. ඒ නිසා ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී වසර අවසානයේ ඒක කරන්න පුළුවන් නම් හොඳයි කියන අදහස තිබෙනවා.

ඒ වාගේම, පාසල් ගුරුවරු කියලා කියන්නේ රාජ්‍ය සේවයේ වරප්‍රසාද අඩුවෙන් භුක්ති විඳින පිරිසක්. ඒ අය භුක්ති විඳිමින් සිටින එක වරප්‍රසාදයක් තමයි, තමන් සේවය කරන පාසලේ අවුරුදු 3කට වඩා වැඩි කාලයක් ඉගැන්නුවාම තමන්ගේ දරුවාව එම පාසලට ඇතුළත් කර ගැනීමට හැකියාව තිබුණු එක. එම වරප්‍රසාදය නැති වෙනවා කියන කථාව මත පදනම්ව තමයි මේ දවස්වල පාසල් ගුරුවරු විරෝධතාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා ආණ්ඩුව පොඩ්ඩක් සානුකම්පිතව කල්පනා කරලා මේ ගුරුවරුන්ගේ මානසික නිදහස පිළිබඳවත්, මේ ගුරුවරු කරමින් සිටින රාජකාරිය පිළිබඳවත්, අනෙක් රාජ්‍ය සේවකයන්ට සාපේක්ෂව ගුරුවරුන්ට ලැබෙන වරප්‍රසාද අඩුවීම කියන පදනම පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි, ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ පසුගිය දවස්වල ඇති වෙච්ච ප්‍රශ්නය. ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකුත් මේ සභාවේ සද්ද නැතිව ඉන්නවා. නමුත් මේ පාසලේ ප්‍රශ්න ගැන මටයි කථා කරන්න වෙලා තිබෙන්නේ. ඒ වෙලාවේ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ මේ විදුහල්පතිවරයා පත් කර ගැනීමේදී නිසි ලෙස පත් කිරීම සිදු කරපු බව ආණ්ඩුවෙන් කිව්වා. අන්න එතැන හොඳ උදාහරණයක්. සමහර දේවල් සම්බන්ධයෙන් විභාග පාස් කරලා නියමිත සුදුසුකම් සම්පූර්ණ කළත්, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරගෙන යෑමේදී අසාර්ථකත්වයක් නිර්මාණය වෙනවා. විශේෂයෙන්ම ළමයි ප්‍රමාණය වැඩි පාසල්වලට විදුහල්පතිවරු පත් කරන විට සුදුසුකම් සම්පූර්ණ කිරීමට අමතරව ඒ අයගේ පුද්ගල හැකියාව, පිරිස පාලනය කරගෙන ඒ කණ්ඩායම් පවත්වාගෙන යෑමට ඇති හැකියාව පිළිබඳවත් අවධානය යොමු කරමින්, ඊළඟ පත් කිරීම් කරන්නය කියන ඉල්ලීමත් අපි කරනවා. මොකද, ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය කියලා කියන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන පාසලක්. එම පාසලේ මේ ප්‍රශ්නය දිගින් දිගටම ඇතිවීම සම්බන්ධයෙන් එක පැත්තකින් අපටත් ඒ අයගෙන් පණිවුඩ ලැබෙනවා. ඒ වාගේම පාසලේ දරුවන්ටත් අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යෑමේ ගැටලු ඇති වෙනවා. අධ්‍යාපනික සුදුසුකම්වලට අමතරව, විභාග qualificationsවලට අමතරව, කාර්යභාරය ප්‍රායෝගිකව කරන්න පුළුවන් මිනිස්සු මේ තැන්වලට පත් කරන්න කියන ඉල්ලීමත් කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

ගරු ආර්.ජී. විජේරත්න මහතා
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේ රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය, මුදල් පනත යටතේ නියෝගය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී ඊට අදාළව ගරු ඇමතිතුමන්ලාත්, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන සහෝදර මන්ත්‍රීතුමන්ලාත් ඇති තරම් කරුණු ඉදිරිපත් කළා. එහෙත් මේ රට ආර්ථික අගාධයට ඇදවට්ටපු, රට විනාශ කරපු, ඒකට හවුල් වෙච්ච උදවිය තවමත් පවසන්නේ කුමක්ද? ආර්ථිකය ප්‍රසාරණය වෙලා නැහැ, ආර්ථිකයේ ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන්නේ නැහැ කියන මෙන්න මේ වාගේ කතන්දර කියමින්, ගෝරනාඩු කරන තත්ත්වයක් තමයි උදාවෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම ආර්ථිකය ප්‍රසාරණය වුණාද, ඒකේ ප්‍රතිලාභ අපේ ජනතාවට ලැබෙනවාද, නැද්ද කියන එක ප්‍රාදේශීය මට්ටමේ උදාහරණ කිහිපයක් ඇසුරින් පැහැදිලි කරන්න මම කල්පනා කළා. ඇත්තටම බදු ආදායම අහිමි වුණේ ඇයි? එක පැත්තකින්, බදු ආදායම් ලබන්න ඕනෑ වත්කම් නිසි ලෙස නියාමනය වෙලා තිබුණේ නැහැ. ඒ වාගේම, ඊට අදාළව නිසි තක්සේරුවක් කරලා තිබුණේ නැහැ. බදු ගෙවීම පිළිබඳව ඔවුන්ට යම් උත්ප්‍රේරණයක්, යම් විශ්වාසයක් ඇති වෙලා තිබුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඊට අදාළව නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ මෙන්න මේ කාරණා සියල්ල පිළිබඳව අවධානය යොමු කළා.

ප්‍රාදේශීය මට්ටමේ උදාහරණ කිහිපයක් අරගෙන මම පෙන්වන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ආසනයට ප්‍රධාන වශයෙන් කළුගල් සපයන ගල්කොරියක් තිබුණා. මේක අත්පත් කරගෙන තිබුණේ එම ආසනයේ සමගි ජන බලවේගයේ ප්‍රධාන සංවිධායකවරයා. පුළුවන් නම් ඒක නැහැයි කියලා කියන්න. ඔහු මේ ගල්කොරිය නිසි ලෙස, විනිවිදභාවයකින් අත්පත් කරගෙන තිබුණේ නැහැ; නිසි තක්සේරුවක් කරලා තිබුණේ නැහැ. ඒ නිසාම රජයට නිසි බදු ආදායම හිමි වුණේ නැහැ. වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විධියට මේකට අදාළ නිසි නියාමනයක් කරලා, නිසි තක්සේරුවක් කරලා ඒ ආදායම ලබා ගන්න කටයුතු කළා. පසුගිය වර්ෂයේ මේ මුළු ගල්කොරියෙන්ම ලැබුණු ආදායම රුපියල් 80,000යි. ඒත් මේ වර්ෂයේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වෙලා තක්සේරු කරලා මේ ගල්වල ප්‍රසිද්ධ වෙන්දේසියේ අවුරුද්දක කාලයකට බදු දුන්නා. ආදායම කීයද? ආදායම රුපියල් 4,025,000යි. ගිය අවුරුද්දේ ලැබුණු ආදායම රුපියල් රුපියල් 80,000යි. මේ අවුරුද්දේ ආදායම රුපියල් 4,000,000යි. ආදායම 50 ගුණයකින් ඉහළ ගියා. මෙහෙමයි ආදායම වැඩි කර ගත්තේ.

ඒ විතරක් නොවෙයි. රිකිල්ලගස්කඩ නගරයේ ප්‍රධාන වෙළෙඳ සැල් 21ක් තිබුණා. මේවා රජයට අයිති භූමියක තමයි ඉදිකර තිබුණේ. තිස් අවුරුදු දීර්ඝ කාලීන බද්දක් තිබුණේ. බොහෝ වෙළෙඳ සැල්වලින් මේ බදු ආදායම හිමි වෙලා තිබුණේ නැහැ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විධියට ඒ වෙළෙඳ සැල් හිමියන්ට මේ කරුණු පැහැදිලි කරලා -රජයට ඔබ ලබා දෙන බදු මුදලින් ඇත්ත සේවාව සිද්ධ වෙනවා කියන කාරණය පැහැදිලි කරලා- ඔවුන්ගෙන් බදු ආදායම ලබා ගන්න අපි කටයුතු කළා. හිඟ බදු මුදල සහ හිඟ දඩ මුදල් සියල්ල එකතු කළාම එක්කෝටි හැටලක්ෂයක පමණ හිඟ මුදලක් තිබුණා. අපි ඔවුන්ට සහන කාලයක් ලබා දීපු නිසා, දැන් ඔවුන්ට විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ වර්ෂය තුළ ඔවුන් ඒ බදු ගෙවීම පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා බදු ආදායම ඉහළ ගිහිල්ලා තිබෙනවා.

ඊයේ දවසෙත් කථා කළා, සමෘද්ධිය පිළිබඳව. සමෘද්ධිය කිව්වාම හඟුරන්කෙත ආසනයට ලොකු සම්බන්ධයක් තිබෙනවා. ඒත් පසුගිය කාලයේ මොකද කළේ? ආසනය පුරා තිබෙන සමෘද්ධි බැංකු දහයක වත්කම්, ලක්ෂ 28 ගණනේ ලක්ෂ 280ක් වියදම් කරලා පෞද්ගලික ඇඟලුම් කර්මාන්තශාලාවක් ආරම්භ කළා. ඒත් ඒ දේශපාලනඥයෝ කළේ මොකක්ද? ටික කාලයක් යද්දී රජයේ ආයතනයක් විධියට තිබ්ච්ච ඒ ඇඟලුම් කර්මාන්තශාලාව පෞද්ගලික සමාගමකට වික්කා. මම ඊට වඩා යමක් කියන්නේ නැහැ. මොකද, ඒ මහා මුදල් වංචාව පිළිබඳව මේ වන විට අධිකරණ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙන නිසා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ ඇඟලුම් කර්මාන්තශාලාව අයිති භූමිය රාජ්‍ය දේපළක්. ඒකට

[ගරු ආර්.ජී. විජේරත්න මහතා]

කිසිදු බදු මුදලක් ගෙව්වේ නැහැ. ඒ පෞද්ගලික ව්‍යාපාරිකයා අවුරුදු 8ක් තිස්සේ බදු ගෙවලා නැහැ. අන්න දැන් රජය මැදිහත් වෙලා, තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නිසි තක්සේරුවක් කරලා ඒ අහිමි වෙච්ච බදු ආදායම ලබා ගන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. රිකිල්ලගස්කඩ නගරයේම තව වෙළෙඳ සැල් 16ක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු බෙදාගෙන බදු නොගෙවමින් හිටියා. දැන්, ඊට අදාළ නීතිමය ක්‍රියාමර්ග ගන්න පටන්ගෙන තිබෙනවා. මෙන්න මේ විධියට රජයට අහිමි වෙලා තිබුණු බදු ආදායම ලබා ගැනීම සඳහා ක්‍රියාමර්ග ගනිමින් ඉන්නවා. ඒ ආදායම ඉහළ දමනවා වාගේම, අනෙක් පැත්තෙන් ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ලැබෙන්න අපි කරපු දේවල් මොනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ දිස්ත්‍රික්කයේ ආසනවල අයට කෘෂි කර්මාන්තය සඳහා මහා යන්ත්‍රෝපකරණ නැහැ. ඒ සඳහා විසඳුමක් දෙන්න ඕනෑ කියලා අපි කල්පනා කළා.

පසුගිය කාලයේ ආණ්ඩුවලින් කළේ, එක් එක් පුද්ගලයා ඉලක්ක කර ගනිමින් යම් යම් යන්ත්‍රෝපකරණ ලබා දෙන එකයි. ඒ නිසා අපි ඊට වඩා වෙනස් ක්‍රියාමාර්ගයක් ගත්තා. අපි සාධාරණව හිතුවා. ඒ නිසා ලක්ෂ 30ක මුදලක් වෙන් කරලා, උපකරණ මිලදී ගෙන ඒවා ගොවිජන සේවා මධ්‍යස්ථානයට භාර දුන්නා. ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඊට අදාළ නිලධාරියෙක් පත් කළා. දැන් ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට තමන්ට අවශ්‍ය වෙලාවට ඒ යන්ත්‍රෝපකරණ අරගෙන තමන්ගේ කාර්යයන් පහසු කර ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මෙන්න ආර්ථිකයේ ප්‍රතිලාභ මහ ජනතාව අතර සාධාරණව බෙදී යන ආකාරය.

ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රදේශවල විශාල වශයෙන් කිරි නිෂ්පාදනය කරනවා. ඒත් ඔවුනට අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය වෙලා තිබුණේ නැහැ. ඒ නිසා අපට පුළුවන්කම ලැබුණා, මේ සැරේ මුදලක් වෙන් කරලා ඒ සත්ත්ව නිෂ්පාදනයට අවශ්‍ය උසස් වර්ගයේ තණකොළ නිෂ්පාදනය කරන භූමි නිර්මාණය කරන්න. මේ වෙනකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත්, පශු වෛද්‍ය කාර්යාලයත් එකට එකතු වෙලා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අදාළ ඉඩම්වල, වතු සමාගම්වලට අයිති ඉඩම්වල වගා නොකරපු භූමි උසස් වර්ගයේ තණකොළ නිෂ්පාදනය කිරීම සඳහා යෙදවීමට කටයුතු සූදානම් කරමින් ඉන්නවා. මෙන්න ආර්ථිකයේ ප්‍රතිලාභ මහ ජනතාව අතර බෙදිලා යන ආකාරය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එක පැත්තකින් ආදායම ඉහළ නංවාගෙන, අනෙක් පැත්තෙන් ඒ ලැබෙන ආර්ථිකයේ ප්‍රතිලාභ මහ ජනතාව අතර සාධාරණව බෙදී යන ආකාරයට අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා මේ සිදුවෙන මහා පුනරුදය, එහෙම නැත්නම් මහා ප්‍රබෝධය විඳ දරා ගන්න බැරි විපක්ෂයේ උදවිය දිගටම අසත්‍ය කියමින්, අවලාද නඟමින්, ජනතාව නොමඟ යවමින් කටයුතු කරන බව තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා අප ඔබට කියන්නේ මෙයයි. ඔබ වෙනස් වන්න, ඔබ යථාර්ථය තේරුම් ගන්න. එහෙම නැත්නම් ඔබ දේශපාලනික වශයෙන් මිය යනවා, සත්තයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට වේලාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.20]

ගරු රියාස් ෆාරුක් මහතා
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம், உற்பத்தித் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளை மற்றும் இன்னும் சில ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

கடந்த ஆட்சிக் காலத்தில் நாடு கடும் பொருளாதார நெருக்கடிக்கு உள்ளாகியது. அவ்வேளையில், வாகன இறக்குமதி தடைசெய்யப்பட்டு இருந்தது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததைத் தொடர்ந்து, நாட்டின் பொருளாதாரம் முன்னோக்கிச் செல்வதாலும் நாட்டு மக்களின் தேவைகளைக் கருத்திற்கொண்டும் நாட்டின் வருமானத்தை அதிகரித்துக் கொள்வதற்காகவும் கட்டங்கட்டமாக வாகன இறக்குமதிக்கான தடையை அரசாங்கம் நீக்கியது. முதலாவதாக, 2024.10.01ஆம் திகதி பொதுப் போக்குவரத்துக்கும், விசேட போக்குவரத்துக்குமான வாகன இறக்குமதிக்கான தடையை நீக்கியது. இரண்டாவதாக, 2024.12.01ஆம் திகதி வியாபாரம் அல்லது பொருட்கள் போக்குவரத்துக்கான வாகன இறக்குமதிக்கான தடையை நீக்கியது. மூன்றாவதாக, 2025.02.01ஆம் திகதி தனிப்பட்ட தேவைக்கான அதாவது, cars, vans, pickup vehicles போன்ற வாகனங்களின் இறக்குமதிக்கான தடையை நீக்கியது. இதன்போது பல வகையான வாகனங்கள் இறக்குமதி செய்யப்பட்டன.

குறிப்பாக, petrol, diesel, hybrid, electric போன்ற வாகனங்களின் இறக்குமதியின்போது HS codeமூலம்தான் duty வரி தீர்மானிக்கப்பட்டது. அதில் சில சிக்கல்கள் வந்தாலும், அவை அவ்வப்போது தீர்த்து வைக்கப்பட்டன. கடந்த கால அரசாங்கம் வாகன இறக்குமதியின்போது சரியான விதிமுறைகளைக் கடைப்பிடிக்காததனால் யப்பானிலுள்ள கூடுதலான கம்பனிகள் bank LCஐ அனுமதிக்கவில்லை; அதனை ஏற்றுக்கொள்ளவில்லை. அத்தோடு, இன்னும் சில கம்பனிகள் undervalue செய்து ஐக்கிய அரபு இராச்சியம், சிங்கப்பூர் போன்ற நாடுகளிலிருந்து cross-border LC மூலம் வாகனங்களை இறக்குமதி செய்தது. அந்த வாகனங்கள் இங்கு வந்தடைந்ததும் சில சட்டப் பிரச்சினைகள் ஏற்பட்டன. Reconditioned வாகன இறக்குமதியின்போது, வாகனத்தை ஏற்றுமதி செய்யும் நாட்டிலுள்ள bank ஒன்றின் முத்திரை - seal - குத்தப்பட்ட documents இருக்க வேண்டுமெனச் சொல்லப்பட்டது. அதில் சில சிக்கல்கள் ஏற்பட்டதால், தொடர்ந்தும் பேச்சுவார்த்தை நடாத்தப்பட்டது. எனினும், பிரச்சினைகளை முடிவுக்குக் கொண்டுவர முடியாதுபோன காரணத்தால் அவற்றை மீள் ஏற்றுமதி - re-export - செய்யவேண்டிய நிலைக்கு அரசாங்கம் தள்ளப்பட்டது. அதனால், வாகன இறக்குமதியாளர்கள் நீதிமன்றத்தை நாடினர்.

இதனைத் தொடர்ந்து, BYD என்ற electric வாகனம் கொண்டுவரப்பட்டது. அதிலும் ஒரு சில பிரச்சினைகள் ஏற்பட்டன. அதாவது, 100 கிலோ வாட் வாகனமா அல்லது 150 கிலோ வாட் வாகனமா என்ற பிரச்சினை ஏற்பட்டது. அந்தப் பிரச்சினை மொரட்டுவ பல்கலைக்கழகத்தின் உதவியுடன் தீர்த்து வைக்கப்பட்டது. அதைத் தொடர்ந்து, HS Codesஐ எப்படித் தீர்மானிப்பதென்ற பிரச்சினை ஏற்பட்டது. அதில் electric உடன் சேர்த்து புதிய தொழில்நுட்பங்களும்

பாவிக்கப்பட்டிருப்பதால் , hybrid மற்றும் electric ஆகிய இரண்டுக்கும் நடுவில் ஓர் HS codesஐ உருவாக்கி, அந்தப் பிரச்சினையை ஓரளவுக்கு முடிவுக்குக் கொண்டு வரும்வேளையில், அந்த விடயம் தொடர்பாகவும் நீதிமன்றத்தை நாடியிருக்கின்றனர்.

இன்று எதிர்க்கட்சி உறுப்பினர் முஜிபுர் ரஹுமான் அவர்கள், அம்பாந்தோட்டை துறைமுகத்தில் நெருக்கடி காரணமாக வாகனங்களை நிறுத்த முடியாதுள்ளதாகவும், அவசரமாக இதுதொடர்பாக நடவடிக்கை எடுக்கும்படியும், அத்துடன் dutyஉம் அதிகளவு கூட்டப்பட்டுள்ளதாகவும் கூறினார். அவை 2015 - 2019 காலப்பகுதியில் இறக்குமதி செய்யப்பட்ட வாகனங்களாகும். அவை shipஇல் வந்துகொண்டிருக்கின்றவேளை - இலங்கையை வந்தடைவதற்கு ஓரிரு தினங்களுக்கு முதல் - கடந்த அரசாங்கம் dutyஐ இரண்டு மடங்காகக் கூட்டியதால் வாகன இறக்குமதியாளர்கள் அவற்றை clear பண்ணவில்லை. அதனால் நிறைய வாகனங்கள் இன்னும் அங்கே தரித்து நிற்கின்றன. அது அவருக்குத் தெரியாதுபோலும்! அவருக்கு அது மறந்துவிட்டது என்றுதான் நான் நினைக்கின்றேன். அந்த வாகனங்களைக்கூட குறித்த இறக்குமதியாளர்களுக்குக் கொடுப்பதற்கு சட்டப் பிரச்சினைகள் இருப்பதால் இன்னும் அந்த விடயத்தை முடிவுக்குக் கொண்டுவர முடியாதுள்ளது.

நான் இந்தச் சபையில் குறிப்பாக ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். கடந்த பாராளுமன்ற அமர்வுகளின்போது எதிர்க்கட்சி முஸ்லிம் உறுப்பினர்கள், ஆளும்கட்சி முஸ்லிம் உறுப்பினர்களைப் பார்த்து, "நீங்கள் பேசுவதில்லையா? 8 முஸ்லிம் உறுப்பினர்களும் இங்கேதான் இருக்கிறார்களா?" என்று கேட்டார்கள். உண்மையிலே நாங்கள் தேவையானவற்றை அவ்வப்போது பேசுகின்றோம். நாங்கள் பாராளுமன்ற அமர்வுகளின்போது சபையில் எப்போதுமே அமர்ந்திருக்கின்றோம். அவர்களைப் போன்று பேசிவிட்டு, நாங்கள் ஓடுவதில்லை. ஆனால், நாங்கள் பேசும்போது இனவாதக் கருத்துகளைப் பேச மாட்டோம். முஸ்லிம், சிங்களம், தமிழ் என இனங்களைக் குறிப்பிட்டோ, முஸ்லிம் ஊர்களின் பெயர்களைக் குறிப்பிட்டோ எங்களுடைய உரைகளை நாங்கள் ஒருபோதும் நிகழ்த்த மாட்டோம். ஒட்டுமொத்த நாட்டு மக்களுடைய தேவைகளை அறிந்துதான், அவர்கள் சார்பாகத்தான் நாங்கள் பேசுவோமே தவிர, இனவாதக் கருத்துகளை நாங்கள் பேசுவதில்லை என்ற messageஐ நான் எதிர்க்கட்சி முஸ்லிம் உறுப்பினர்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எங்களுடைய அரசாங்கம் இனவாதத்தை ஒழிப்பதற்காக உருவாக்கப்பட்ட அரசாங்கமாகும். உதாரணமாக, என்னுடைய கண்டி மாவட்டத்திலுள்ள அக்குறணை, திகன ஆகிய இடங்களில் இனவாதப் பிரச்சினை ஏற்பட்டு முழு மாவட்டமும் எரிந்தது. அப்போது இந்த முஸ்லிம் MPs எங்கேயிருந்தார்கள்? என்று நாங்கள் கேட்கிறோம். அவர்கள் அப்போது Governmentஇல்தான் இருந்தார்கள். அவர்களால் அப்பிரச்சினையைத் திரும்பிக்கூட பார்க்க முடியவில்லை. அந்தக் கலவரத்தின்போது கண்டி மாவட்டம் பற்றி எரிந்தது. மறுநாள் காலை 8.00 மணியளவில் தற்போதைய சனாதிபதி அவர்களும், கௌரவ அமைச்சர்களான பிமல் ரத்நாயக்க, நளிந்த ஜயதிஸ்ஸ, சுனில் ஹந்துன்னெத்தி ஆகியோர் அக்குறணைக்கு வந்தார்கள். அக்குறணையிலிருந்து திகன வரையுமாக முழு ஊரையும் பார்வையிட்டு, அங்குள்ள மக்களுடன் கலந்துரையாடி அவர்களுக்கு ஆறுதல் சொன்னார்கள். 'நாம் மனிதர்கள்' என்ற conceptஇல் நாடுமுழுவதும் பிரசாரத்தைச் செய்து இந்த நாட்டின் அமைதியைப் பேணுவதற்குப் பாடுபட்டார்கள். அந்த நேரம் இந்த முஸ்லிம் MPs எங்கே இருந்தார்கள்? என்பதைக் கேட்பதற்கு நாங்களும் ஆவலாக இருக்கின்றோம். இதுபோன்ற இனவாதத்துக்கு நாங்கள் ஒருபோதும் துணைபோக மாட்டோம் என்று கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். வாய்ப்பளித்தமைக்கு நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.29]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා

රජය මුදල් අච්චු ගැසීම කියන කාරණය සම්බන්ධයෙන් විපක්ෂයෙන් චෝදනාවක් එල්ල කරලා තිබෙනවා. ඒ නිසා අපි දවස් කිහිපයක ඉඳන් ඒ ගැන කථා කරනවා. මේ සම්බන්ධයෙන් අද වෙනකොට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මතයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම අද උදේ දැක්කා, ඒ ගැන "Daily Mirror" පුවත් පත වාර්තා කරලා තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුව තමයි මුදල් අච්චු ගහනවා නම් අච්චු ගසන්නේ, ඒක රජය විසින් කරන්නේ නැහැ, ඒක භාණ්ඩාගාරයේ කාර්යයක් නොවන බව අපි දිගින් දිගටම ප්‍රකාශ කරද්දීත් ඒ සම්බන්ධයෙන් යම්කිසි අවිනිශ්චිතභාවයක් ඇති කරන ආකාරයේ කථා විපක්ෂයේ මන්ත්‍රීවරු විසින් සිද්ධ කරනවා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම 2023දී ගෙනෙන ලද ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් නිශ්චිතවම monetary financing කියන එක, ඒ කියන්නේ මහ බැංකුව විසින් මුදල් අච්චු ගහලා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මිලදී ගැනීම හරහා රාජ්‍යයේ අය වැය කටයුතු මූල්‍යයනය කිරීම කියන මේ ක්‍රියාවලිය නීත්‍යනුකූල ලෙස තහනම් කරලායි තිබෙන්නේ. ස්වාධීන මහ බැංකුවක් ඇති කරනවා කියලා මොකක්ද කළේ? ඒක අපි කළ වැඩක් නොවෙයි. ඒක එවකට සිටි රජය කළ වැඩක්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් අනුව. ස්වාධීන මහ බැංකුවක් ඇති කරනවා කියලා මහ බැංකුවත්, භාණ්ඩාගාරයත් වෙන් කරන එක සම්බන්ධයෙන් අත ඔසවලා ඡන්දය දීපු මන්ත්‍රීවරුත් අද වෙනකොට පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොනවාද අහන්නේ?

භාණ්ඩාගාරය කරන දේවල් භාණ්ඩාගාරය කරනවා. මහ බැංකුව කරන දේවල්වලට භාණ්ඩාගාරයට වගකීම භාර ගන්නට බැහැ. එතකොට නිශ්චිත වශයෙන්ම මුදල් අච්චු ගැසීම කියන කාරණය පළමුකොටම මහ බැංකුව විසින් සිදු කළ යුතු කාර්යයක්. ඒ කාර්යය භාණ්ඩාගාරයේ කාර්යයක් නොවන බව බොහොම පැහැදිලිව අමාත්‍යාංශය විසින් දැනුම් දීලා තිබියදීත් මම හිතන විධියට විපක්ෂයට තවම පැහැදිලි නැහැ, ස්වාධීන මහ බැංකුවක් කියන්නේ මොකක්ද, monetary financing කියන්නේ මොකක්ද, ඒක ආර්ථිකයට අයහපත් වෙනවාද, අයහපත් වෙන්නේ මොන කොන්දේසි යටතේද කියන කාරණා. මේවා ගැන අදහසක් නැතුව තමයි එතුමන්ලා සභාවට ඇවිල්ලා දවස් කිහිපයක් තිස්සේ ඒ ගැන කථා කරන්නේ. එතුමන්ලා, රජය විසින් රුපියල් ට්‍රිලියන 1.2ක මුදල් අච්චු ගහලා තිබෙනවා කියන කාරණය පතුරුවමින් යනවා. අද වෙනකොට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ කාරණය නිශ්චිත

[ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

වශයෙන් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ ප්‍රතික්ෂේප කිරීමත් එක්කම යම් පැහැදිලි කිරීමකුත් මහ බැංකුව විසින් සිද්ධ කරලා තිබෙනවා. ඒ කියන්නේ මහ බැංකුවත් අපි මේ කියන කාරණයම, ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මේ කියන ආකාරයෙන් මුදල් අච්චු ගැසීමක් - monetary financing කියන එක - මහ බැංකුවට සිද්ධ කරන්න බැහැ කියන කාරණය බොහොම පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ වාගේම කියලා තිබෙනවා, ආර්ථිකයේ සංසරණය වෙන මුදල් ප්‍රමාණය වැඩි වෙලා තිබෙන්නේ මහ බැංකුව මුදල් අච්චු ගැසීම හරහා නොවෙයි, ඇත්තවශයෙන්ම පෞද්ගලික අංශයට විශාල වශයෙන් දායක වෙලා තිබෙන නිසායි, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ණය ලබා දීමේ ක්‍රියාවලිය පුළුල් කරලා තිබෙන හින්දා කියලා. ඒ කියන්නේ වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට වැඩිපුර ණය ලබා දීලා තිබෙනවා. ඒ අනුව ආර්ථිකයේ ප්‍රසාරණයක් ඇති වෙලා තිබෙනවා. ඒ ප්‍රසාරණ කටයුතු එක්ක තමයි ආර්ථිකය තුළ සංසරණය වෙන මුදල් ප්‍රමාණය වැඩි වෙලා තිබෙන්නේ කියලා කියනවා. මේ කාරණයෙන් ඇත්තටම පැහැදිලි වෙන්නේ මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි?

මේ අනුව අපිට පැහැදිලි වෙනවා, ආර්ථිකය ප්‍රසාරණය වෙලා තිබෙනවා කියන එක. ඇයි, පෞද්ගලික අංශය මේ වාණිජ බැංකුවලින් ණය ගැනීම වැඩි කරලා තිබෙන්නේ? ඒ, පොලී අනුපාතය දීර්ඝව පහළ මට්ටමක පවත්වාගෙන එන්නට අපි සමත් වෙලා තිබෙන හින්දා. අපි එක අතකට විපක්ෂයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ වාගේ අභූත චෝදනා ආණ්ඩුවට ඉදිරිපත් කිරීම ගැන. මොකද, ඒ තුළින් අපිට අවස්ථාවක් ලැබෙනවා, පාර්ලිමේන්තුවටත්, සමාජයටත් මේ වාගේ සාකච්ඡා ගෙන එන්නට. මේ සභාවේදී දැන් ගරු මන්ත්‍රීවරු කථා කරන විධියට බොහොම පැහැදිලිව හිතෙනවා, පෞද්ගලික අංශයේ ආර්ථිකය restrict කරලා තිබෙනවා, එහෙම නැත්නම් සීමාසහිත වෙලා තිබෙනවා, බාධා පැමිණිලා තිබෙනවා කියලා. ඒ වාගේ අදහසක් තමයි අද ඉදිරිපත් වෙන යෝජනා සම්බන්ධයෙන් වුණත් ඇති වෙලා තිබෙන විවාදයේදී එළියට එන්නේ. නමුත් බොහොම පැහැදිලිව මේ කරුණුවලින් ඔප්පු වෙන කාරණය මොකක්ද? පෞද්ගලික අංශය ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය වැඩි කරලා තිබෙනවා. ඒ හරහා ආර්ථික ප්‍රසාරණය, ආර්ථිකයේ මුදල් සංසරණය වාගේම ආර්ථිකයේ තිබෙන මුදල් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේක ආර්ථික වර්ධනය සහ ආර්ථික ප්‍රසාරණය හරහා සිදු වෙන මුදල් වැඩිවීමක් මිස විපක්ෂය කියන ආකාරයට මහ බැංකුව විසින් monetary financing එහෙම නැත්නම් Treasury Bills මිලදී ගැනීම හරහා රජය මූල්‍යයනය කිරීමේ කටයුත්තක් මඟින් සිදු වෙන මුදල් වැඩිවීමක් නොවෙයි.

ඇත්තටම අපි මේ කාරණය මතක තියා ගන්න ඕනෑ. මේ මුදල් අච්චු ගැසීම ගත්තාම, අපි නිකම් වැරදි වැඩක් කරනවා, මේක ආර්ථිකය කඩා වට්ටන දිශාවට යන වැඩක් හැටියට නේ, මේ signal එක දෙන්නේ. නමුත්, අපි මේ කාරණය තේරුම් ගන්නට ඕනෑ. මොකද, 2022දී අපේ රටේ ආර්ථිකය කඩා වැටීම, උද්ධමනය ඉහළ යෑම, පොලී අනුපාතය ඉහළ යෑම සම්බන්ධයෙන් ගත්තාම, රජය විසින් මුදල් අච්චු ගැසීම නිසා මේවා ඇති වුණා කියන අදහසක් ඒ වෙලාවේදී මතු වුණා. එතකොට ඒ අදහසට සමපාතව තමයි දැනුත් විපක්ෂයෙන් මේ මුදල් අච්චු ගැසීම සිද්ධ වෙනවා කියන අදහස මතු කරන්න හදන්නේ. මුදල් අච්චු ගැසීමක් සිද්ධ වෙනවා කියන එකෙන් ආර්ථිකය කඩා වැටෙන්න ඔන්න මෙන්න තිබෙනවා කියන එක තමයි මේ නැවතත් මතු කරන්න හදන අදහස. ඒක තමයි මේ ගෙනෙන්න හදන අදහස. හැබැයි, අපි තේරුම් ගන්නට අවශ්‍යයි, 2022ට පෙර, -2020 - 2022 කාලය තුළ- මේ මුදල් අච්චු ගැසීම කරන්නේ එවකට පැවති වසංගත තත්ත්වය තුළ කියන එක. ඇත්තටම භාණ්ඩාගාර බිල්පත් - Treasury Bills - මිලදී ගැනීම හරහා මහ බැංකුව විසින් මුදල් අච්චු ගැසීම සිදු කරන්නේ ඇත්තටම ඒ වෙලාවේදී ආර්ථිකය ප්‍රසාරණය නොවෙච්ච නිසායි. ඒ වෙලාවේදී ආර්ථිකය ප්‍රසාරණය වීමේ තත්ත්වයක් තිබුණේ නැහැ. ලංකාව වසංගත තත්ත්වයක් යටතේ තිබුණේ. ඒ නිසා ආර්ථිකය ප්‍රසාරණය වුණේ නැහැ. ඒ නිසා ආර්ථිකයට යන මුදල් ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. ආර්ථිකය ප්‍රසාරණය නොවෙන අවස්ථාවක් තුළ රජයේ අය වැය කටයුතු මූල්‍යයනය කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් අච්චු ගැසීම හරහා තමයි ඒ මුදල් සංසරණය - circulation - ඇති කළේ. එතකොට ඒ තත්ත්වයයි, මේ තත්ත්වයයි ගුණාත්මක වශයෙන් වෙනස්. දැන් ආර්ථිකය ප්‍රසාරණය වෙනවා. මුදල් සංසරණය වැඩි වෙනවා; ඒ අනුව ආර්ථිකය ප්‍රසාරණය වෙනවා. පෞද්ගලික අංශයට ණය ලබා ගැනීමේ හැකියාව වැඩි වෙලා තිබෙනවා. Interest rate එක අඩු වෙලා තිබෙනවා. එතකොට ආර්ථිකයේ හොඳ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම, නීතිමය ලෙස මේ කියන ආකාරයෙන් මුදල් අච්චු ගැසීමක් සිදු කිරීමට බලයක් මහ බැංකුවට ඇත්තේත් නැහැ. මහ බැංකුව ඒක සිද්ධ කරලාත් නැහැ. මහ බැංකුව බොහොම නිශ්චිත වශයෙන් කියලා තිබෙනවා, 2024 ඔක්තෝබර් මාසයේ සිට 2025 ජූනි මාසය දක්වා මේ කියන ආකාරයේ මුදල් අච්චු ගැසීමක් මහ බැංකුව විසින් සිද්ධ කරලා නැහැ කියන එක. ඇත්තටම මේ කාරණය ගැන මේ පාර්ලිමේන්තුවේ කියවන සමහර අය ආර්ථික විද්‍යාව සම්බන්ධව දැනුමක් නැතිකමටවත්, මේ ස්වාධීන ශ්‍රී ලංකා මහ බැංකු පනත පිළිබඳව දැනුමක් නැතිකමටවත්, මුදල් අච්චු ගැසීම කියන්නේ මොකක්ද, ඒක ආර්ථිකයට අහිතකර වන්නේ මොන කොන්දේසි යටතේද කියන එක සම්බන්ධව දැනුමක් නැතිකමටවත් නොවෙයි මේ වැඩේ කරන්නේ. දැන් සමහර අය අහනවා, විපක්ෂයට විවේචන කරන්න බැරිද කියලා. හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් එහෙම අහනවා මම දැක්කා. ඇත්තටම මම ඒ වෙලාවේදී මේ සභාවේ හිටියේ නැහැ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සහභාගි වෙන්න තමයි මම මේ පාර්ලිමේන්තු සභා ගැබෙන් නැඟිටලා ගියේ. එහෙම නැතුව හෙක්ටර් අප්පුහාමි මහත්මයාගේ කථාව අහගෙන ඉන්න බැරිව නොවෙයි. හෙක්ටර් අප්පුහාමි මහත්මයාත් කියනවා, විවේචනය කරන එක විපක්ෂයේ කාර්යයක් කියලා. ඔව්, විවේචනය කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් පදනම්සහගතව ඒ විවේචන කරන්න. මේ වාගේ මේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා මිථ්‍යාවක් ජනතාව තුළ ඇති වෙන ආකාරයට විවේචන සිද්ධ කරන්නට එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණයත් මම අවසාන වශයෙන් කියනවා. මහ බැංකුව විසින් හඳුනාගෙන තිබෙනවා, මේ තොරතුරු සමාජගත කරන ලද ආයතනය. The Center for Human Rights and Research කියලා ආයතනයක් තමයි මේ තොරතුරු සමාජගත කරන්නේ. ඒ කියන්නේ, ආණ්ඩුව රුපියල් ට්‍රිලියන 1.2ක මුදල් අච්චු ගැහුවා කියන මතය සමාජගත කරන ආයතනය වන the Center for Human Rights and Research, broad money supply එහෙම නැත්නම් මේ මුදල් සැපයුම ප්‍රසාරණය වීම - for the nine-month period from October, 2024 to June, 2025 - මුදල් අච්චු ගැසීමක් ලෙස හඳුනා ගන්නවා. මේ ආයතනය සම්බන්ධව නිශ්චිතවම මහ බැංකුව assessment එකක් කරලා කියනවා, මේ ආයතනයට මුදල් අච්චු ගැසීම කියන්නේ මොකක්ද, ඒ කාරණය මොකක්ද කියන එක ගැන දැනුමක් නැතිව තමයි මේ ප්‍රකාශය සිදු කරලා තිබෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එවැනි අවස්ථාවක, Centre for Human Rights වාගේ නමක් තිබෙන, ආර්ථිකය සම්බන්ධව මීට පෙර කිසිම ක්‍රියාකාරිත්වයක් දක්වා

නැති ආයතනයක් විසින් කියපු දෙයක් කිසිම සොයා බැලීමක් කරන්නේ නැතිව, අඩුම ගණනේ Central Bank එකත් එක්ක check කරන්නේවත් නැතිව විපක්ෂය විසින් දැන දැන මෙවැනි තොරතුරු සමාජගත කිරීම වැරදි කාරණයක්. ඉතින් ඒ වාගේ විවේචන කරන්නේ නැතිව රටට යහපත්, රජය නිවැරදි දිශාවට යොමු කරවන විවේචන කරනවා නම් අපේ කිසිම විරෝධතාවක් නැහැ කියලා මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.39]

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාත්, ජේ.සී.අලවතුවල මන්ත්‍රීතුමාත් කථා කරද්දී කිව්වා වාහනයක් ගන්න විධියක් නැහැ දැන් ඒක සිහිනයක් විතරයි කියලා. අපි ඒ මන්ත්‍රීවරුන්ට සහ විපක්ෂයේ අයට මතක් කර දෙන්න ඕනෑකම තිබෙනවා අපේ රටට වාහන ආනයනය කරන්න පටන් ගත්තේ 2019න් පස්සේ 2024 අවුරුද්දේ - අවුරුදු 5කින් - බව. වසර 5ක් මේ රටට වාහන ආනයනය කළේ නැත්තේ ඒ ආණ්ඩු. ඒ තරම් මේ රට බංකොලොත් කළා ඔවුන් එකතු වෙලා. අඩුම තරමේ ඒ අවුරුදු 5ක කාලය ඇතුළත ළමයින්ට සෙල්ලම් කරන්න සෙල්ලම් කාර් එකක්වත් ගෙනෙන්න බැරි වුණු ආණ්ඩුවක් දැන් කියනවා, Vitz කාර් එකක් ගන්න විධියක් නැහැ, අරක ගන්න විධියක් නැහැ, මේක ගන්න විධියක් නැහැ කියලා. වසර 5කට පස්සේ හෝ මේ රටේ ජනතාවට, මේ රටේ මිනිස්සුන්ට වාහනයක් ගන්න පුළුවන් විධියට කටයුතු කර තිබෙන්නේ මේ නව රජය විසින්ය කියන එක අපි මේ රටේ ජනතාවටත් මේ රටේ කුහක විපක්ෂයටත් මතක් කර දෙන්න ඕනෑකම තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි දැන් වාහන ගෙනෙන්න පටන් අරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මීට දවස් දෙකකට කලින් අගෝස්තු මාසයේ 19වෙනි දා වෙනකොට අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා ඩොලර් මිලියන 1,378ක LC open කරන්න. අවුරුදු 5ක් කිසිම දෙයක් නොකරපු, සෙල්ලම් කාර් එකක්වත් ගෙනෙන්න මුදල් වෙන් කර ගන්න බැරිව තිබුණු මේ රට බංකොලොත් කරපු කුහක විපක්ෂය අද අපෙන් ප්‍රශ්න කරනවා කෝ අරක ගන්න පුළුවන් ද, මේක ගන්න පුළුවන්ද කියලා. අගෝස්තු මාසයේ 19වෙනි දා වෙනකොට අපි LC open කරලා තිබෙනවා ඩොලර් මිලියන 1,378ක. ඔන්න වෙනස. ඒ නිසා මේ රටේ කවුරුන් හෝ කෙනෙක් වාහනයක් ගන්න බලාපොරොත්තුවෙන් හිටියා නම්, ඔවුන්ට සිහිනයක් තිබුණා නම්, අන්න මාලිමාවේ ආණ්ඩුවකින් ඒකට අවස්ථාව හදලා තිබෙනවා. කුහක විපක්ෂයට දැන ගන්නයි අපි මේක කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අගෝස්තු මාසයේ 21වෙනිදා. ජනාධිපතිතුමා බලයට පත් වෙලා අදට හරියටම මාස 11යි. අපි කවුරුත් දන්නවා අපි මේ රට භාර ගන්නකොට මොන මට්ටමකද මේ රට තිබුණේ කියලා. ඒ බිඳ වට්ටපු, විනාශ කරපු, නැති කරපු රට, ආර්ථිකය භාර අරගෙන ගෙවුණු මාස 11 ඇතුළත - ඉතාම කෙටි කාලයක් තුළ - අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා ශක්තිමත් අඩිතාලමක් මත එය යළි ස්ථාවර මට්ටමකට ගෙන එන්න. ඒ ශක්තිමත් අත්තිවාරම මත අද දවසින් දවස මේ රටේ මිනිසුන්ට අලුත් බලාපොරොත්තු ඇති කරමින්, මේ රට ගොඩනැඟෙමින් තිබෙනවා. ඒක අද මේ රටේ ඉන්න අය විතරක් නොවෙයි, විදෙස් රටවල ඉන්න අය පවා දකිනවා. අද දෙස් විදෙස් ගොඩක් පුද්ගලයන්, ගොඩක් ආයතන වර්තමාන රජයේ මූල්‍ය කළමනාකාරිත්වය පිළිබඳව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව ඔවුන්ගේ පැසසුම් ඉදිරිපත් කරලා තිබෙනවා. මම දැක්කා, මීට දවස් ගණනාවකට කලින් IMF එක ඔවුන්ගේ ප්‍රසාදය පළ කරලා තිබුණා. ලෝක බැංකුව ඔවුන්ගේ ප්‍රසාදය පළ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ජාත්‍යන්තර බ්ලූම්බර්ග් සඟරාව ඉදිරිපත් කරලා තිබෙනවා, ලබන අවුරුද්ද වෙනකොට මේ රට 2018දී තිබුණු තත්ත්වයට පත් වෙනවාය කියලා. මේ රටේ ආර්ථික කටයුතු පිළිබඳව ඔවුන් ඉතාම සුබවාදීව ඔවුන්ගේ දැක්ම ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින් ඒ විධියට දෙස් විදෙස් හැමෝම අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මම දැක්කා අපේ රටේ විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරු ගණනාවක් මේ රටේ ආර්ථිකය ගමන් කරමින් තිබෙන විධිය පිළිබඳව, ඒ සාධනීය තත්ත්වය පිළිබඳව ඉතාම ඉහළින් වර්ණනා කරලා තිබුණා; අගය කරලා තිබුණා. එහෙම දෙස් විදෙස් පිරිස් ඉතාම ප්‍රශංසනීය ලෙස මේ උත්සාහය අගය කරනකොට අපේ විපක්ෂය කටයුතු කරන විධිය බැලුවාම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කුහක විපක්ෂයක් කියලා කියන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අද අපේ රජයට, වර්තමාන ආණ්ඩුවට මේ විධියට පැසසුම් ලැබිලා තිබෙන්නේ ඇයි? ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි. අපි මේ ආර්ථිකය ඉතාම හොඳින්, ශක්තිමත්ව ගොඩනඟමින් යන නිසායි. අද මේ මොහොත වෙනකොට අපි ඉතාම වේගයෙන් මේ රටේ ආර්ථිකය ගොඩනඟමින් ඉන්නවා. ඔබ අප කවුරුත් දන්නවා, රටක අය වැයක් හදනකොට ඒ අය වැයෙන් ඉදිරි වර්ෂය තුළ කොපමණ ආදායමක් උපයා ගන්න ඇස්තමේන්තු කරනවාද කියන එක අය වැය ලේඛනයේ සටහන් කරන බව. ඒ විතරක් නොවෙයි. ඒ අවුරුද්ද තුළ කොපමණ මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න ඇස්තමේන්තු කරනවාද කියන එක ඒ ලේඛනයේ සටහන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 මුල් මාස හය ගෙවෙද්දී අපි අපේ ආදායම් ඉලක්ක පසුකරමින් තිබෙනවා. අපි මීට කලින් කිසිම ආණ්ඩුවක් යටතේ දැකලා නැහැ, අය වැයකින් අපේක්ෂා කළ ආදායම සම්පූර්ණ කර ගන්න ලැබී තිබෙනවා. හැබැයි, එහෙම දැකලා නැති වුණාට අපි දැකලා තිබෙනවා, හැමදාමත් හැම ආණ්ඩුවක්ම වියදම් ඇස්තමේන්තුවට වඩා වැඩිපුර මුදල් ප්‍රමාණයක් වියදම් කරලා වර්ෂය අවසන් කළ ආකාරය. අන්න ඒ ඉතිහාසය වෙනස් කරලා, ඉතිහාසයේ පළමුවැනි වතාවට අපි වසරේ මාස හයක් ගෙවෙනකොට, පළමු කාර්තු දෙක අවසන් වෙනකොට රජයේ සමස්ත ආදායම හැටියට රුපියල් බිලියන 2,325ක ආදායමක් උපයාගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වුණේ මේ අවුරුද්දටම රුපියල් බිලියන 4,990ක සමස්ත ආදායමක්. නමුත් පළමුවැනි කාර්තු දෙක අවසන් වෙනකොට අපට පුළුවන්කම ලැබී තිබෙනවා, රුපියල් බිලියන 2,325ක ආදායමක් උපයා ගන්න. ආදායම වැඩි වීම සියයට 25ක් වෙලා තිබෙනවා. වියදම්වල වැඩි වීම සියයට 11යි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ නිසා අපේ රට පිළිබඳව, අපේ රටේ ආර්ථිකය පිළිබඳව හැම පැත්තකින්ම බලාපොරොත්තු දල්වා ගන්න පුළුවන් මොහොතකයි අපි මේ ඉන්නේ. ඒ විතරක් නොවෙයි. ඒ ආදායම් වැඩි වීම තුළ, වියදම් අඩු වීම, වියදම් කපා හැරීම තුළ අපට පුළුවන්කම ලැබී තිබෙනවා, මේ ගෙවුණු මාසය 6 තුළ අය වැය හිඟය සියයට 32.3කින් අඩු කර ගන්න. එවැනි සමත්කම් ප්‍රමාණයක් මේ මොහොත වන විට මේ ආණ්ඩුව පෙන්වා තිබෙනවා.

ඒ විතරක් ද නොවෙයි, 2025 අවුරුද්දේ පළමු මාස 5 තුළ අපි වරායේ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 24,418 දක්වා වැඩි කරගෙන තිබෙනවා. එය ගිය වසරට සාපේක්ෂව සියයට 66ක

[ගරු ගයාන් ජනක මහතා]

වර්ධනයක්. සෘජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 507 දක්වා වැඩි කරගෙන තිබෙනවා. එය ගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 101ක වර්ධනයක්. සංචාරක ආදායම ඩොලර් බිලියන 1.7 දක්වා වැඩි කරගෙන තිබෙනවා. එය සියයට 10ක වර්ධනයක්. විදෙස් ප්‍රේෂණ ඩොලර් බිලියන 3.7 දක්වා වැඩි කරගෙන තිබෙනවා. එය සියයට 18ක වර්ධනයක්. අය වැය හිඟය ගැන මම කලින් කිව්වා. කාලය මදි නිසා මම ඒක නැවත කියන්නේ නැහැ. අපනයන ආදායම ඩොලර් බිලියන 8.3 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා. එය සියයට 6.7ක වර්ධනයක්. විදෙස් වත්කම් ඇමෙරිකානු ඩොලර් බිලියන 6.1 දක්වා වැඩි කරගෙන තිබෙනවා. අපි හිතනවා, එය සියයට 7 දක්වා වැඩි කරගන්න අපට පුළුවන්කම තිබෙයි කියලා. ඒ විතරක් නොවෙයි, ඉතාම කෙටි කාලයක් ඇතුළත අපි දේශීය ආයෝජන අතින් ද සියයට 18ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා.

අපි මේ රටේ ජනතාවට ආරාධනා කරනවා, ඔබ මේ ආණ්ඩුව දිහා බලන්න, මේ ආර්ථික දත්ත, තොරතුරු හා කරුණු මත ඔබ මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය හදාගන්න කියලා. ඒ විතරක් නොවෙයි, මේ මොහොතේ මේ රටට නායකත්වය දෙන දේශපාලන ව්‍යාපාරය කෙරෙහි විශ්වාසය තබා ගන්න. ආර්ථික දත්ත මත පදනම්ව විතරක් නොවෙයි, අවුරුදු 76කට පස්සේ ජනතාවගේ වුවමනා අනුව වෙනස් කරගත් මේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ අලුතින් මේ රටට නායකත්වය දෙන දේශපාලන නායකත්වය කෙරෙහි ඔබේ විශ්වාසය ඇති කර ගන්න, බලාපොරොත්තු තබා ගන්න. ඒ අදහස ඉදිරිපත් කරමින් මම මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[අ.භා. 3.50]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය පිළිබඳව. මීට කලින් කථා කරපු ආණ්ඩුවේ මන්ත්‍රීතුමාත් කියනවා මම දැක්කා, මීට පෙර වාහන ගන්න හැකියාවක් තිබුණේ නැහැ, ඒ හැකියාව දැන් ඇති කර තිබෙනවා කියලා. අපි කියන්නේ ඒක නොවෙයි. වාහනවලට ගහන අධික බද්ද - tax එක - නිසාම ලංකාව දැන් වාහන මිල අතින් ලෝකයේ තුන්වැනි ස්ථානයේ ඉන්නේ. මේ මිලට වාහනයක් ගන්න බැහැ. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා කිව්වා, තරුණයන්ට පදින්න ජපානයෙන් බයිසිකල් අරන් දෙනවා කියලා. මේක තරුණයන්ගේ හීන මරපු ආණ්ඩුවක්. ඒකයි අපි කිව්වේ. වාහන ගෙන්වන්න බැරි නැහැ, ගෙන්වන්න පුළුවන්. නමුත්, කාටද මේ මිලට ඒ වාහන ගන්න පුළුවන්? ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා ආණ්ඩුව එම කාරණයත් හොඳින් අවබෝධ කරගන්න ඕනෑ.

විශේෂයෙන්ම, ගල් අඟුරු ටෙන්ඩරයක් ගැන දිගින් දිගටම ප්‍රශ්න ගණනාවක් මතු කළා. මම ඊයේත් ඒ කාරණය මතු කළා. මේ කියන ජාත්‍යන්තර ටෙන්ඩර් එකට ඉල්ලුම් කිරීම සඳහා සාමාන්‍යයෙන් දින 42ක් දෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් මාර්තු, අප්‍රේල් මාසවල තමයි ගල් අඟුරු සඳහා ටෙන්ඩර් එක කැඳවන්නේ. හැබැයි, මේ කියන ටෙන්ඩර් එක අගෝස්තු වෙනකල් අල්ලාගෙන හිටියා. දැන් මේ ටෙන්ඩර් එකට දින 21යි දීලා තිබෙන්නේ. ජාත්‍යන්තර තත්ත්වයේ ටෙන්ඩර් ගැන නේ තමුන්නාන්සේලා කථා කළේ. දැන් ඒ කථා ඉවරයි. මෙහිදී ජාතික ප්‍රසම්පාදන කොමිසමේ මාර්ගෝපදේශ පැහැදිලිවම කඩලායි තිබෙන්නේ. හැබැයි, කවුරුවත් මේ ගැන කථා කරන්නේ නැහැ. මේ ටෙන්ඩරයට ඉල්ලුම් කරන්න Potencia නම් කොම්පැනියක් අවශ්‍ය කරන සුදුසුකම් ටික හදාගත්තා. පසුගිය කාල වකවානුව තුළ ඒ අයට ඉඩ දුන්නා තම අඩුපාඩුව මඟ හරවාගන්න; නැව් 6ක ගල් අඟුරු ගෙන්නලා පෙන්වන්න. මොකද, ගල් අඟුරු මෙට්‍රික්ටොන් ලක්ෂ 5ක් විතර ගෙන්වා තිබීම කියන සුදුසුකම මේ සඳහා තිබෙන්න ඕනෑ. ඒක කරන්න ඉඩ දීලා, ඊට පස්සේ මේ කොම්පැනියට අවසර ගන්න අවශ්‍ය කරන කටයුතු ටික කරන කල් මේ ටෙන්ඩරය කල් ඇද්දා. කල් ඇදලා දැන් මොකක්ද කරලා තිබෙන්නේ? අගෝස්තු මාසයේ 18වන දා වනකොට මේ කොම්පැනිය අනුමත කරනවා; අනුමත කරපු දවසේම ටෙන්ඩර් එක දානවා. ඒ නිසා ගල් අඟුරු සමාගමේ සභාපතිතුමා ඉල්ලා අස් වුණා. මෙයට අත්සන් කරන්න බැරි නිසා - අගෝස්තු 17 දිනය දාලා - ශ්‍රීමත් ඩයස් පෙරේරා මැතිතුමා ඉල්ලා අස් වුණා. මේ වාගේ වැරැදි, වංචාසහගත ටෙන්ඩරයකට අත්සන් කරන්න බැරි නිසා එතුමා ඉල්ලා අස් වුණා.

මීට කලින් SUEK කියන company එක තමයි මේ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙලා සිටියේ. Black Sand Commodities කියන රුසියානු කොම්පැනිවලින් බඩු ටික අරන් ඇවිල්ලා ඒගොල්ලෝ තමයි ඒ සම්බන්ධයෙන් පෙනී හිටපු කොම්පැනිය බවට පත් වෙලා සිටියේ. SUEK කියන කොම්පැනියට ප්‍රශ්නය ආවාම තමයි දැන් Potencia Company එක හදාගත්තේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව Potencia Company එකට ඒ වැඩේ කරන්න හොඳට ඉඩ දීලා බලාගෙන ඉන්නවා. ඒක සම්පූර්ණ වැරැදියි. මොකක්ද හේතුව? ඒ තුළ පැහැදිලිව තිබෙන්නේ අතිදැවැන්ත දූෂණයක්. ඒ විතරක් නොවෙයි. මම බොහොම පැහැදිලිව කියනවා, මෙහිදී රුපියල් මිලියන 120ක් හුවමාරු වුණු බව. කවුද ඒ මුදල් ගත්තේ? මොන පෞද්ගලික ලේකම් ද එය ගෙනැල්ලා දුන්නේ? ඕනෑ නම් අපට නම් ගම් සහිතව කියන්න පුළුවන්. මේ ගැන මෙතැනදී කථා කරන එක මම

දැන් නතර කරනවා. එම ගල් අඟුරු ටෙන්ඩරයට අදාළව අතිදැවැන්ත දූෂණයක් සිදු වෙනවා. තමුන්නාන්සේලා මහා ලොකුවට කයිය ගැහුවේ මෙය දූෂණය, වංචාව නැති ආණ්ඩුවක් කියලා. එකක් නොවෙයි, ලිට්‍රෝ ගෑස් සම්බන්ධවත් මේ ප්‍රශ්නය තිබෙනවා.

ඒ විතරක් ද නොවෙයි. Immunoglobulin සම්බන්ධවත් මෙවැනි ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණා. එදා ඒ ප්‍රශ්නය ආවාම කෙහෙළිය රඹුක්වැල්ල හිරේ දැම්මා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? Immunoglobulin ගෙනාපු කොම්පැනි එකේ ඒ සාම්පල් ටික ලංකාවේ ෆේල් වුණා. ෆේල් වුණාම මොකක්ද කළේ? ෆේල් වුණාට පස්සේ ඒක withhold කළා; ඒක බෙදන්න එපා කියලා නැවැත්තුවා. නවත්වලා NMRA එක ඒ ගැන පරීක්ෂණයක් කළා. පරීක්ෂණයක් කළාට පස්සේ මොකක්ද වුණේ? ඒක ෆේල් කියලා හඳුනා ගත්තා. එහෙම හඳුනා ගත්තාට පස්සේ මොකක්ද වුණේ? ඒ බඩු ටික withdraw කරන්න කිව්වා. Withdraw කරන එක පැත්තකින් තියලා ඉන්දියානු කොම්පැනිය ගිහිල්ලා අරගෙන ආවා, ඉන්දියාවෙන් certificate එකක්. ඒ certificate එක අරගෙන ඇවිල්ලා ඒක පෙන්නුවා. ඉස්සර නම් ඉන්දියාවේ product එකක් ඉන්දියාවේ laboratoriesවලින් check කරන්න දෙන්නේ නැහැ. එක්කෝ ජර්මනියෙන් හරි, වෙනත් රටකින් තමයි check කරන්න දෙන්නේ. නමුත් අවසාන වශයෙන් මොකක්ද වුණේ? මේ වනකොට තුන් දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. අවසානයේදී වෙලා තිබෙන්නේ ඒකයි. Colombo North Teaching Hospital එකේදී කේ.ඩී. සුජීව කියලා පුද්ගලයෙක් මිය ගියා. නුවර hospital එකේදී ඩබ්ලිව්.ජී. නන්දසිංහ කියන කෙනෙක් මිය ගියා. ඒ දෙන්නාම ළඟදී මිය ගිය අය. ඊට කලින් ත්‍රිකුණාමලයේ කෙනෙක් මිය ගියා. මේ විධියට මේ ආණ්ඩුව යටතේ ගෙනාපු Immunoglobulin එන්නත ලබා දීලා දැනට මිනිස්සු තුන්දෙනෙක් මිය ගිහින් තිබෙනවා. එහෙම නම්, කවුද ඒකට වග කියන්න ඕනෑ, කවුද හිරේ යන්න ඕනෑ? NMRA එක මේ විධියට පරීක්ෂණ කරලා නවත්වපු ඖෂධයක් ආපහු රෝගීන්ට ලබා දෙන්න වෙනදා කවදාවත් ඉඩ දුන්නේ නැහැ. Withdraw කරන්න කියපු එකක් test කරලා නැවත අරගෙන එන්න කිව්වේ නැහැ. එහෙම නැවත අරගෙන එන්න කියපු එන්නතක් ගෙනැල්ලා තමයි මේ රටේ මිනිසුන්ට දැන් ලබා දීලා තිබෙන්නේ. මේක කෙහෙළිය රඹුක්වැල්ල කළ දේට වඩා භයානක කාරණයක්. මොකද, මේ හේතුවෙන් තුන්දෙනෙක් මැරිලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ආණ්ඩුව මොකක්ද කියන්නේ කියලා දැනගන්න අපි කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

හෙට රනිල් වික්‍රමසිංහ මහත්මයාට CID එකට එන්න කියලා තිබෙනවා. සුදත්ත මහත්මයා - "සුදා" මහත්තයා - යූටියුබ් එකේ කියා තිබෙනවා මම දැක්කා, "අනිවාර්යයෙන් රනිල් වික්‍රමසිංහව අත් අඩංගුවට ගන්නවා. නැත්නම් මම මේ චැනල් එක කරන එක නවත්වනවා" කියලා. මාර කථාවක් ඒක. මේ රටේ මහෙස්ත්‍රාත්වරුන්ට කරන බලපෑමක් මේ කර තිබෙන්නේ. මෙය ඇත්තටම නීතියට කරන බලපෑමක්. අනුර දිසානායක ජනාධිපතිතුමා කිව්වේ නීතියේ විධානයේ ආධිපත්‍යය රකිනවා කියලා. එය රැකපු හැටි තමයි මේ පෙනෙන්නේ. මේ රටේ හිටපු ජනාධිපති හරි, කවුරු හරි කෙනෙක්ව CID එකට ගෙනෙනවා කියලා කිව්වාම, "එයාව හෙට අත්අඩංගුවට ගත්තේ නැත්නම් මම YouTube Channel එක නවත්වනවා" කියන්න YouTubeකාරයෙකුට පුළුවන් වෙලා තිබෙනවා. එහෙම කියන්න කොයි තරම් බලයක් තිබෙන්න ඕනෑද?

මීට පෙර දවසකත් කථා කළා, මහෙස්ත්‍රාත්වරුන් මාරු කිරීම ගැන. එය විශාල අර්බුදයක්. රවි සෙනෙවිරත්න මහත්මයාගේ චෝදනා පත්‍රයේ තිබුණු ඒවා සංශෝධනය කරන්න කැමැති නැති වුණාම, ඇමති කෙනෙක් අත්අඩංගුවට ගන්න, නැත්නම් ඔහුගෙන් ප්‍රශ්න කරන්න කිව්වාම ඒ මහෙස්ත්‍රාත්වරුන් මාරු කරනවා. මේ කරන්නේ මොකක්ද? මේ රටේ නීතියේ ආධිපත්‍යය හදන වැඩ පිළිවෙළක් ගැන කථා කළාට ඒ වැඩේ කෙරෙන්නේ නැත්නම් ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා ඒ ගැන පැයක් කථා කළත් වැඩක් නැහැ කියලායි මා හිතන්නේ. ඒ කාරණයත් මතු කරමින්, මට කාලය ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
උගන්ඩාවේ සල්ලි ගෙනෙන්න ඕනෑ නැද්ද?

[අ.භා. 3.58]

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ගෙනෙමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ විවිධ මන්ත්‍රීවරුන්ගෙන් විවිධ අදහස් අද විවාදයට අදාළව උද්ගත වෙලා තිබෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ. කොහොම වුණත්, අද අපට ව කථා කරන්න තිබෙනවා 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ සාදනු ලැබූ නියෝග පිළිබඳවත්. ඊට අදාළ යම් සංඛ්‍යා දත්ත කිහිපයකට අවධානය යොමු කරන්න මම කැමැතියි. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවෙන් සෑම මාසයකම මේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉදිරිපත් කරනවා, මාධ්‍ය නිවේදනයක් මඟින්. මේ දර්ශකයට අනුව 2025 අප්‍රේල් මාසයේ ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ, සමස්ත ක්‍රියාකාරකම් දර්ශකයේ අගය සියයට 41.4යි. අප්‍රේල් මාසයේ සියයට 41.4ක් වෙච්ච මේ දර්ශකයේ අගය මැයි මාසය වෙනකොට සියයට 59.7ක් දක්වා ඉහළ යනවා. අප්‍රේල් මාසය උත්සව සමය. හැබැයි, ඒ තත්ත්වයෙන් පසුවත් මැයි මාසය වෙනකොට මෙය සියයට 59.7 දක්වා ඉහළ යනවා. සියයට 50 ඉක්ම වූ ප්‍රශස්ත අගයක ඉදිකිරීම් කර්මාන්තයට අදාළ මේ දර්ශකයේ අගය පවතිනවා. ජූනි මාසය වෙනකොට මේ දර්ශකයේ අගය සියයට 58.6ක්. ඒකෙන් ඇත්තටම පෙන්නුම් කරන්නේ මේ ව්‍යාපෘතිවල සිද්ධ වෙච්ච ධනාත්මක වර්ධනයයි; ස්ථාවර මිල මට්ටම නිසා අපේ ඉදිකිරීම් කර්මාන්තයේ තිබෙන ස්ථාවර බව හා ප්‍රගතිශීලී ගමනයි. 2025 ජූලි මාසය වෙනකොට -ඒ අවසන් මාසයේ- ඒ දර්ශකයේ අගය සියයට 62.2ක්. එතකොට මොකක්ද

[ගරු නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

මේ දර්ශකය හරහා කියාපාන කරුණ? ඒ තමයි ඉදිකිරීම් කටයුතු සඳහා තවදුරටත් ලංකාවේ හිතකර පරිසරයක් පවතිනවාය කියන එක. මේ දර්ශකාංකය ඉහළ යනවාත් එක්කම අපට අමතක කරන්න බැහැ සේවා නියුක්ති දර්ශකයත් ඉහළ යනවා, ඒ වාගේම තොග මිලදී ගැනුම් දර්ශකයත් කැපී පෙනෙන ලෙස ඉහළ යමින් තිබෙනවාය කියන එක. ඒ එක්කම ඇණවුම් දර්ශකයත් තවදුරටත් ඉහළ යමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අද තත්ත්වයත් එක්ක පසුගිය කාල පරිච්ඡේදය සංසන්දනය කරලා බැලුවොත් අපට අමතක කරන්න පුළුවන්ද, පසුගිය කාලපරිච්ඡේදය තුළ මේ රටේ ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටුණු ආකාරය? මේ රටේ මූල්‍ය අර්බුදයට මුල වුණේ මේ රටේ පැවති අසාර්ථක දේශපාලන නායකත්වයයි. ඉතාම අදූරදර්ශී විධියට දේශපාලනඥයන්, ඒ වාගේම ප්‍රතිපත්ති සම්පාදකයන් කටයුතු කරපු නිසා තමයි ඒ දේශපාලන අස්ථාවරත්වයත් එක්ක මේ රට මූල්‍ය අර්බුදයක් කරා ගියේ. එතකොට අපේ රටේ රැකියා ලක්ෂ ගණනින් අහිමි වුණා. පෙදරේරුවෝ, JCB යන්ත්‍ර ක්‍රියාකරුවෝ, අත් උදවුකරුවෝ, ගබඩා භාරකරුවෝ, ගිණුම් ලිපිකරුවෝ, කොන්ත්‍රාත්කරුවෝ යන මේ හැමෝටම -ලක්ෂ ගණනකට- රැකියා අහිමි වෙලා තිබුණා. ඒ වාගේම මහා පරිමාණ මාර්ග සංවර්ධන ව්‍යාපෘති අතරමඟ නතර කරන්න සිද්ධ වුණා. අහස උසට ගොඩනැගුණු ගොඩනැගිලිවල වැඩ අතරමඟ නතර කරන්න සිද්ධ වුණා. එතකොට කවුද ඒකට වග කිව්වේ? විපක්ෂය ඔය කියන විධියට හරියට මේ රට කළා නම්, මේ රටේ මූල්‍ය ස්ථාවරත්වය ඇති කළා නම්, විපක්ෂය කියන විධියට අපටත් වාහන ගන්න තිබුණා. එහෙම නම් හැමෝටම වාහන ගන්න පුළුවන්. එහෙම ගන්න බැරි වුණේ ම එදා ඒ අය මේ රටේ හරියට ආණ්ඩු කළේ නැති නිසායි කියන එක තේරුම් ගන්න ඒ අය ඇයි පසු බසින්නේ කියන එක තමයි අපි කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා නව වටයකින් මේ රටේ මහජනතාව ජන වරමක් දීලා තිබෙනවා, රටම එකම වැඩ බිමක් බවට පත් කරන්න. දැන් ඉදිකිරීම් කර්මාන්තය නැවත වතාවක් පණ ගසමින් නැගිටලා තිබෙනවා, හිස ඔසවලා තිබෙනවා. ඒ හරහා රැකියා නිර්මාණය වෙලා තිබෙනවා, වෙළඳපොළ ශක්තිමත් වෙලා තිබෙනවා, ආයෝජකයන් ලංකාවට එනවා. ඒ වාගේම විශ්වාසයක් ගොඩනැගිලා තිබෙනවා, වංචාවකින් තොරව, දූෂණයකින්, අක්‍රමිකතාවකින් තොරව මේ රටේ නැවත වතාවක් ඉදිකිරීම් කර්මාන්තය ගොඩ නංවන්න පුළුවන් කියලා. මොකද, දැන් හැම ව්‍යාපෘතියකින්ම සියයට 10ක් ගහන දේශපාලනඥයෝ නැහැ; "Mr. Ten Percent"ලා නැහැ.

ඒ වාගේම කියන්න ඕනෑ, අධිකරණ කටයුතු මඟ හරින අය අපේ ආණ්ඩුවේ නැහැ කියන එකත්. නයා ගැහුවා කියලා අධිකරණය මඟ හැරපු, පුටුවෙන් වැටුණා කියලා අධිකරණය මඟ හැරපු අය එදා හිටියා. දැන් එහෙම අය නැහැ. ඒ නිසා අධිකරණය ගැන විශ්වාසයක් තිබෙනවා. අධිකරණයේ කටයුතු ගැන අපට ඒ තිබෙන විශ්වාසය නිසාම ආණ්ඩුවේ වෙන්න පුළුවන්, විපක්ෂයේ වෙන්න පුළුවන්, ඕනෑම මහජන නියෝජිතයෙකුට එරෙහිව අධිකරණ කටයුත්තක් සිද්ධ වෙන්න පුළුවන්.

ඒ ගැන විශ්වාසය තියලා අධිකරණයට ඒ වගකීම ඉෂ්ට කරන්න අවශ්‍ය නිදහස, අවස්ථාව, ස්වාධීනත්වය, ස්ථාවරත්වය පවරා තිබෙනවා. අධිකරණයේ කටයුතුවලට ව්‍යවස්ථාදායකය අත පොවපු ඒ තත්ත්වය නව රජය බලයට ඒමත් එක්ක අපි අවසන් කර තිබෙනවා. ඒ නිසා අධිකරණයේ කටයුතු ස්වාධීනව කෙරිගෙන යනවා.

ඒ වාගේම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ රටේ බොහොම හොඳ, අවංකව, කැපවීමෙන් වැඩ කරන දක්ෂ ව්‍යවසායකයන් සහ ව්‍යාපාරික ප්‍රජාවක් ඉන්නවා. ඒ වාගේම බොහොම නිර්මාණශීලී නවෝත්පාදක රක්ෂණ සපයන්නන් ඉන්නවා. විශ්වාසයෙන් වැඩ කරන්න පුළුවන් මූල්‍ය සමාගම්, හොඳ බැංකු පද්ධතියක් තිබෙනවා. බලගතු වෙළෙඳ මණ්ඩල, සංගම් තිබෙනවා. කාර්යක්ෂම රාජ්‍ය නිලධාරිනුත් ඉන්නවා. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් තිබෙනවා. හැබැයි, ඒ සියල්ල තිබුණත් හොඳ දේශපාලන නායකත්වයක් නැත්නම්, ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩලයක් නැත්නම්, මේ රට මේ දක්වා අරගෙන එන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඉතාම පැහැදිලියි අපි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත ප්‍රකාරව අද අපි ඇති කරන්න යන නීතිමය ප්‍රතිපාදනවල විශේෂත්වයක් තිබෙනවා. එකක් තමයි, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත ප්‍රකාරව අපි බිහි කරගත්ත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය. ඒ අධිකාරියේ මූලික අරමුණු අතරේ එන එකක් තමයි, මේ තීරකවරුන්ට අවස්ථාවක් ලබා දීම සහ මේ තීරකවරුන් ලියාපදිංචිය නියාමනය කිරීම ඉතාම හොඳින් සක්‍රියව සිද්ධ කිරීම. ඒ වාගේම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය ශ්‍රේණිගත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමත්, ඒ කොන්ත්‍රාත්කරුවන්ගේ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමත් ඒ අරමුණු අතර තිබෙනවා. මේ අධිකාරියේ අරමුණු පසුගිය කාල පරිච්ඡේදය තුළ නිසි පරිදි සිද්ධ කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඇයි? ඒ, දේශපාලනඥයන්ගේ ඇඟිලි ගැසීම් නිසා. හැබැයි, ඒ ඇඟිලි ගැසීම්වලින් තොරව, විනිර්මුක්තව, ඉතා පැහැදිලිව, ස්වාධීනව දැන් මේ අධිකාරියට තීන්දු තීරණ ගන්න පුළුවන්, ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය ප්‍රතිපාදන අපි සම්පාදනය කර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ පනත ප්‍රකාරව අපි ඇති කරන නීතිමය ප්‍රතිපාදනය අනුව තීරකවරුන් කියන්නේ, ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ගිවිසුම්වලදී ආරාවුලක් ඇති වුණොත් ඒ ආරාවුල නිරවුල් කිරීම සඳහා මැදිහත් වන පාර්ශ්වය. මේ පාර්ශ්ව ලියාපදිංචිය සඳහා පැවති ගාස්තුව, ලියාපදිංචිය අලුත් කිරීම සඳහා පැවති ගාස්තුව රුපියල් 20,000ක්. අපි ඒ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රුපියල් 5,000 දක්වා අඩු කර තිබෙනවා. ඒ නිසා අපි දකිනවා, මේ වාගේ සුමට නීති පැනවීම තුළින්, නීතිය නම්‍යශීලී කිරීම තුළින් අපට ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගතිශීලී වර්ධනයක් බලාපොරොත්තු වෙන්න පුළුවන් කියලා. අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රට ස්ථාවර ගමනක් කරා අරගෙන යන්න වාගේම, මේ රටේ ජීවත් වන හැම ජන කොට්ඨාසයකගේම ජීවිතයේ බලාපොරොත්තු වෙච්ච පරමාර්ථ කරා අරගෙන යන්න අවශ්‍ය කරන ප්‍රතිපත්ති සම්පාදනය කරන්නයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසානයි.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ ගමනට සහාය වීම විනා මේ ගමන බංකොලොත් කරන්න බංකොලොත් විපක්ෂයක් විධියට උඩ ගෙඩි දෙන්න එපා කියමින්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත්, පාර්ලිමේන්තුව ඇතුළෙත් ඒ කාර්යය කරන්න එපා කියන එක විතරක් මේ වෙලාවේ සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිශාන්ත ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

ගරු නිශාන්ත ජයවීර මහතා
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් අලුතින් හඳුන්වා දෙන රේගු සංකේතවලට අදාළව රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මතය, ඒත් එක්කම ඊට ආනුෂංගික වූ මුදල් පනත යටතේ නිකුත් කළ ගැසට් පත්‍රයේ සඳහන් නියෝගය, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කළ ගැසට් පත්‍රයේ සඳහන් නියමය සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග අනුමත කර ගැනීම සඳහා අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

ඇයි අපි මෙහෙම දෙයක් ඉදිරිපත් කරන්නේ කියලා බලමු. නව රජය බලයට පත් වීමත් එක්ක, එතෙක් කාලයක් නවතා තිබුණු වාහන ආනයනය 2025 පෙබරවාරි 01වැනි දා ඉඳලා නැවත විවෘත කළා. වාහන ආනයනය කිරීමේදී වාහනයක් රේගුවට එනකොට රේගුව බදු අය කරන්නේ රේගු සංකේත, නැත්නම් HS - Harmonized System - codes යටතේ. එතකොට මෙතෙක් තිබුණු HS codes ගත්තොත්, වාහන වර්ග ප්‍රධාන වශයෙන් 4කට වෙන් කර තිබුණා. පළමුවෙනි වර්ගය තමයි, ඉන්ධන මඟින් ධාවනය වන වාහන. ඊට පස්සේ, විද්‍යුත් වාහන - electric vehicles - තිබුණා. ඒත් එක්කම hybrid vehicles කියලා තිබුණා. ඊට අමතරව "Other" කාණ්ඩය තිබුණා. තාක්ෂණය දියුණු වීමත් සමඟම අලුතින් එන වාහන අතරට නව වාහන ප්‍රභේදයක් ආවා. ඒ වාහන ප්‍රභේදය මෙතෙක් තිබුණු HS කාණ්ඩය යටතට ගත්තොත්, අර කාණ්ඩ තුනට අමතර "Other" කාණ්ඩය යටතේ තිබුණේ. "Other" කියන කාණ්ඩයට දැම්මොත් මේවාට අතිවිශාල බදු මුදලක් අය වෙනවා. නමුත්, මේ වාහනයක් භාවිත කිරීමේදී ඉන්ධන පරිභෝජනය ගොඩක් ඉහළ මට්ටමක තිබෙනවා. ඒ කියන්නේ, ඉන්ධන ලීටරයකින් කිලෝමීටර විශාල ගණනක් ධාවනය වෙනවා. අන්න ඒ කරුණුත් සලකා බලා, ජනතාවගේ පැත්තට, වාහන ආනයනය කරන්නන්ගේ පැත්තට සහනයක් දීම පිළිබඳවත් සලකා බලා මේකට නව HS code එකක් හඳුන්වා දෙන්න වුණා.

අලුත් වාහන කාණ්ඩය, ඒ කියන්නේ හයිබ්‍රිඩ් කියන දෙමුහුන් වාහනයක් ගත්තොත්, ඒවායේ තාක්ෂණය වෙන්නේ වාහනය ධාවනය කරන අවස්ථාවේදී ක්‍රම දෙකක් පාවිච්චි වීමයි. ඒ කියන්නේ පෙට්‍රල් හෝ ඩීසල් සහ බැටරිය කියන දෙකම පාවිච්චි වෙනවා, වාහනයේ රෝදය ධාවනය වෙන්න. එතකොට අලුතින් ආපු ශ්‍රේණිගත දෙමුහුන් - series hybrid - කියන වාහන වර්ගයේදී වෙන්නේ ඉන්ධන වර්ගයක් මඟින් එන්ජිම ක්‍රියාත්මක වෙනවා, ඒ එන්ජිම ක්‍රියාත්මක වීම ඇතුළේ බැටරියක් ආරෝපණය වෙනවා, ඒ ආරෝපණය වන බැටරියෙන් විදුලි මෝටරය ක්‍රියාත්මක වීම මඟින් වාහන ධාවනය වෙනවා. එතකොට මෙන්න මේ ආකාරයෙන් ධාවනය වන වාහන වර්ගයකට මෙතෙක් කාලයක් HS codes හඳුන්වා දීලා තිබුණේ නැහැ. තිබුණු එක "Other" කියන category එකට දැම්මොත් අතිවිශාල බදු මුදලකට යටත් වෙනවා. අන්න ඒක නිවැරදි කරන්න තමයි මේ සංශෝධන ටික ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මෙතැනදී මේ වාහනවල මිල ගණන් කථාබහට ලක් වුණා. වාහනවල මිල ගැන කථා කළොත්, විපක්ෂය පැත්තෙන් වාහනවල මිල ඉදිරිපත් කළේ ඩොලර් එකක් රුපියල් 187ට තිබුණු කාලය අනුවයි. නමුත්, අද ඩොලර් එකක් කීයද? අද ඩොලර් එකක් රුපියල් 300ක මට්ටමට තිබෙනවා. අපි විදේශයක ඉඳලා වාහනයක් ගෙනෙනකොට ඩොලර් ප්‍රමාණයට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය විශාල වශයෙන් වැඩිවෙලා තිබෙනවා. ඉතින්, ඒ තුළින් අනිවාර්යයෙන්ම වාහනයේ මිල වැඩි වෙනවා. අපි second-hand vehicle market එක ගත්තොත්, ඒකත් ස්වභාවිකවම මීට ආසන්න ප්‍රමාණයකට වැඩිවෙලා තිබුණා. අපි අලුතින් වාහන ගෙනෙනකොට ද්විතියික වෙළෙඳ පොළත්, use කරපු වාහන විකුණන වෙළෙඳ පොළත්, වට්ටන්නේ නැතිව අපට කටයුතු කරන්න සිදු වෙනවා. මොකද, ඒ වාහනවලට ලීසිං සමාගම්වලින් කල්බදු පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ වාහනයක මිල එකපාරට පහළට වැටුණොත් කල් බදු සමාගම් කඩාගෙන වැටෙනවා. අපි ඒ සියලුම කාරණා පිළිබඳව සලකා බලා තමයි මේ බදු ක්‍රමය ඇති කරලා තිබෙන්නේ.

මේ වෙනතුරු අය කරපු බදු ගැන කථා කළොත්, සියයට 300, සියයට 400, සියයට 500, සියයට 600 දක්වා බදු ගහලා තිබෙනවා කියලා විපක්ෂය පැත්තෙන් කරුණු මතු කළා. මම මේ වෙලාවේදී මේ කරුණුත් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ වෙනකොට - 2025.07.27 දින වනකොට - ශ්‍රී ලංකා රේගුවෙන් ආපු වාහන ටික ගත්තොත්, ඒ වාහන වෙනුවෙන් ගෙවලා තිබෙන මිල, පොලී සහ රක්ෂණ වටිනාකම - CIF value එක - රුපියල් බිලියන 185ක් වෙනවා. අපි ඒ වෙනුවෙන් හම්බ වෙච්ච බදු ප්‍රමාණය සලකා බැලුවොත්, එය රුපියල් බිලියන 282යි. එතකොට CIF එකට අදාළව හම්බ වෙච්ච බදු ප්‍රමාණය ගත්තොත්, සියයට 1.5යි. ඒක සියයට 600ක් වැඩිවෙලා නැහැ. හැබැයි, මෙහෙම දෙයක් තිබෙනවා. අති සුඛෝපභෝගී වාහනයක් එනවා නම් ඒකට විශාල බදු ප්‍රමාණයක් අය කරනවා. ඉතින්, ඒක සාධාරණයි. මොකද, ඒ වාහනයක් ඉන්ධන ලීටරයකින් කිලෝමීටර තුනක්, හතරක් තමයි ධාවනය කරන්න පුළුවන් වෙන්නේ. ඒ වාහනයක් මෙහෙට ගෙන්වා ගන්න විශාල මුදලක්; විදේශ විනිමයක් වැය වෙනවා. අන්න, ඒ නිසා අති සුඛෝපභෝගී වාහනවලට විශාල බදු මුදලක් අය කරලා තිබෙනවා. හැබැයි, අපේ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බස් රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහන රථ සඳහා අය කරන බදු ප්‍රමාණ ඉතාම පහළ මට්ටමක තමයි තියලා තිබෙන්නේ. එහෙම තබලා අය වෙච්ච සමස්ත බදු ප්‍රතිශතය ගත්තොත්, මේ වෙනකොට සියයට 1.5ක් තමයි අය කරලා තිබෙන්නේ. ආපු CIF value එක 100 නම් ඒකට 150ක් තමයි බදු විධියට අය කරලා තිබෙන්නේ. ඒ වාගේ බදු අය කිරීමක් තමයි මේ වනකොට කරලා තිබෙන්නේ.

ඊට අමතරව, රේගුවේ ආදායම ගැන මෙතැනදී මතු වුණා. විශේෂයෙන් විපක්ෂයෙන් මතු කළා, අපි වාහන මත අය කරන බද්ද නිසා තමයි රේගුවේ ආදායම වැඩිවෙලා තිබෙන්නේ කියලා. අපි සංඛ්‍යාලේඛන අරගෙන බැලුවොත්, 2024 වසරේ රේගුවේ ආදායම - වාහනවලට අමතරව අනෙක් ඒවායින් රැස් කරපු ආදායම - ගත්තොත්, රුපියල් බිලියන 872යි හම්බවෙලා තිබෙන්නේ. 2025 අවුරුද්දේ ශ්‍රී ලංකා රේගුව විසින් වාහන ආනයනයට අමතරව රැස් කරපු ආදායම බැලුවොත්, බිලියන 978ක් ඇවිල්ලා තිබෙනවා. එතකොට, රේගුව විසින් වාහන නැතිව වෙනත් භාණ්ඩ ආනයනය කිරීමෙන් බිලියන 106ක් ලබාගෙන තිබෙනවා. එතකොට වාහන ආනයනයෙන් ලැබෙන ආදායම නැතිව ගත්තත්, 2024 අවුරුද්දට සාපේක්ෂව 2025

[ගරු නිශාන්ත ජයවීර මහතා]

අවුරුද්දේ ශ්‍රී ලංකා රේගුව සියයට 112කට වැඩි ආදායමක් ලබාගෙන තිබෙනවා. ඒ අනුව ඉතා පැහැදිලිව පෙනෙනවා, රජයේ නිවැරදි මෙහෙයවීම සහ මඟ පෙන්වීම ඇතුළේ ක්‍රියාත්මක වීම තුළ ශ්‍රී ලංකා රේගුවේ ආදායම වැඩි වෙලා තිබෙනවා කියලා. අපි රේගු ආදායම සලකා බැලුවොත්, ජනවාරි මාසයේ ඉඳලා මේ දක්වාම වැඩි වෙලා තිබෙනවා. මාසික ආදායම ගත්තාමත් මුදල් අමාත්‍යාංශය විසින් ලබා දීලා තිබෙන ආදායම් ඉලක්කය හැම මාසයේම අභිභවා ගිහින් තිබෙනවා. ශ්‍රී ලංකා රේගුවට මුදල් අමාත්‍යාංශය විසින් 2025.08.12 දිනට ලබා දීලා තිබෙන ආදායම් ඉලක්කය ට්‍රිලියන 1.18යි. නමුත්, රේගුව විසින් ට්‍රිලියන 1.31ක් උපයා තිබෙනවා. ඒ කියන්නේ, ශ්‍රී ලංකා රේගුවට ලබා දීලා තිබෙන ආදායම් ඉලක්කය අභිභවා ගිහින් තිබෙනවා. මේ වනකොට සියයට 111ක ආදායමක් ලබා ගනිමින්, ලබා දීලා තිබෙන ඉලක්කයට එහාට යන්න සමත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වාහන ආනයනය පිළිබඳවත් ප්‍රශ්නයක් මතු වුණා. අපේ රටට වාහනයක් ආනයනය කරනවා නම් JAAI සහ JEVIC කියන ඇගයීම් ආයතන දෙකෙන් සුදුසුකම් පරීක්ෂා කර අනුකූලතා සහතික ලබාගෙන ගෙන්වීමට ජනාධිපතිතුමා විසින් කලින් අවස්ථාව ලබා දීලා තිබුණා. ඊට අමතරව Bureau Veritas කියන අනුමත පරීක්ෂණ ආයතනයක පරීක්ෂණ සහතිකය යටතේ වාහන විශාල ප්‍රමාණයක් අපේ රටට ආනයනය කර තිබුණා. අන්න ඒ සහතිකය යටතේ ගෙන්වීම නිවේදනයේ ඇතුළත් වෙලා තිබුණේ නැහැ. මෙතැනදී චෝදනාවක් එල්ල වුණා, ජනාධිපතිතුමා විසින් සංශෝධනයක් ගෙනැල්ලා නීතිය වෙනස් කරලා එය ඇතුළත් කරලා වැරදි විධියට එය ක්‍රියාත්මක කළාය කියලා. නමුත්, එතැනදි සිදු වුණේ මෙයයි. පනතේ පැහැදිලිව දක්වා තිබෙනවා, මුදල් අමාත්‍යවරයාට පුළුවන් කියලා අදාළ වෙනත් පිළිගත් සහතිකයක් ඇතුළත් කරන්න. Bureau Veritas කියන්නේ ලෝකයම පිළිගත් ආයතනයක්. අන්න ඒ වාගේ ආයතනයකින් ලබා දෙන අනුකූලතා සහතිකයක් මේකට ඇතුළත් කරන්න පුළුවන්. අන්න ඒ වාගේ ඇතුළත් කිරීමක් කරන්න තමයි ඒ වෙලාවේ එම සංශෝධනය කළේ. ඊළඟට චෝදනාව වුණේ, cross-border issue එක යටතේ ගෙන්වපු වාහනවලට ඒ විධියට අවස්ථාවක් ලබා දුන්නේ නැහැ කියලා. නමුත්, cross-border issue එක යටතේ වාහන ගෙන්වීමේදී පැහැදිලිවම නිකුත් කරලා තිබෙන ගැසට් නිවේදනය උල්ලංඝනය වෙලා තිබෙනවා. එය නිවැරදි කිරීමේ හැකියාවක් නැති නිසා තමයි එහෙම නොකළේ. මේ වනකොට එය අධිකරණය වෙත යොමු වෙලා තිබෙනවා. අධිකරණයෙන් ලැබෙන නියෝගය අනුව ඉදිරි කටයුතු ඉතා කඩිනමින් සිදු වෙයි.

ඊළඟට, ශ්‍රී ලංකා රේගුවේ අකාර්යක්ෂමතාව ගැන කථා කළා. හැබැයි, තිබුණු තත්ත්වයට වැඩිය නව රජයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා රේගුව ඉතාම කාර්යක්ෂම මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. හැබැයි යම් යම් තැන් තව සංශෝධනය වෙන්න ඕනෑ කියලා අපි හඳුනාගෙන තිබෙනවා. ඉදිරියේදී ඒවාත් නිවැරදි කරමින්, වාහනයක් හෝ ඕනෑම භාණ්ඩයක් ලංකාවට ආනයනය කළොත් ඉතා කෙටි කාලයකින් එම වාහනය හෝ භාණ්ඩය නිදහස් කර ගන්න අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා රේගුවේ සම්පාදනය වෙමින් පවතිනවා. මේ වනකොටත් ඒ වෙනුවෙන් මෘදුකාංග හදලා තිබෙනවා. මොකද, කෙනෙකුට ශ්‍රී ලංකා රේගුව හරහා වාහනයක් හෝ ඕනෑම භාණ්ඩයක් ආනයනය කිරීමේ අවස්ථාව තිබෙනවා. දැනටත් වාහනය හෝ භාණ්ඩ මෙහෙට එන්න කලින් online මඟින් ඒ තොරතුරු ටික ඉදිරිපත් කරන්නත්, ඉදිරිපත් කරලා ඒ process එක ඉතා ඉක්මනින් සිදු වෙලා වාහනය හෝ භාණ්ඩය ලංකාවට ළඟා වීමෙන් පසුව ඉතා ඉක්මනින් clear කර ගන්න අවස්ථාව ඉදිරියේදී සැකසෙනවා. මීටත් අමතරව තව කියන්න තිබෙන්නේ, නව රජය බලයට පැමිණීමත් එක්ක touristsලා ගෙවපු VAT එකටත් නිදහසක් දීලා තිබෙනවා. ඒ නිදහස දීම ඇතුළේ එන සංචාරකයෝ භාණ්ඩ මිලදී ගැනීම තුළ ආර්ථිකයට හොඳ තල්ලුවක්, දිරියක් ලැබෙනවා. ඒ කරුණුත් සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.18]

ගරු මනෝජ් රාජපක්ෂ මහතා
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදෑසන සිට මේ රටේ ජනතාවට ඉතාම වැදගත් වන කාරණා කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරනවා. පසුගිය වසර 5ක කාලය තුළ අපේ රටේ වාහනයක් අවශ්‍ය ජනතාවට වාහනයක් ගෙන්වා ගැනීමේ ඉඩකඩ, වටපිටාව නිර්මාණය වෙලා තිබුණේ නැහැ. එවැනි තත්ත්වයක් තුළ විශේෂයෙන්ම ඊට අදාළ වන රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මතයක්, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය, මුදල් පනත යටතේ නියෝගය සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග සම්බන්ධව තමයි අද මේ විවාදය පෙළගැසී තිබෙන්නේ. මට පෙර කථා කරපු නිශාන්ත ජයවීර මන්ත්‍රීවරයාත් ඉතා හොඳින් මෙම රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මතය සම්බන්ධව තිබෙන තාක්ෂණික කාරණා ඉදිරිපත් කළා. ඒ වාගේම උදෑසන සිට කථා කරපු අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් මේ පිළිබඳව ඉතා හොඳ පැහැදිලි කිරීමක් කළා. අප දැන් මේ විවාදයේ අග භාගයට පැමිණ සිටිනවා.

පසුගිය අවුරුදු 5ක විතර කාලය තුළ ලංකාවට වාහන ගෙන්වන එක නතර කර තිබුණා. අපේ ආණ්ඩුව පත් වුණාට පසු 2025 පෙබරවාරි මාසයේ 01වැනි දා සිට තමයි නැවත වාහන ගෙන්වා ගැනීම සඳහා අවස්ථාව ලැබුණේ. වසර 5ක පමණ කාලයක් ලංකාවට වාහන ගෙන්වූයේ නැති වුණාට, වාහන තාක්ෂණයේ සිදු වූ දැවැන්ත ඉදිරි පිම්මත් එක්ක අලුත් වාහනවල වෙනස්කම් සිදුව තිබුණා. මෙලෙස තාක්ෂණික වශයෙන් වෙනස්කමකට ලක් වෙච්ච වාහන මොන category එකටද අයිති වෙන්නේ කියන කාරණය සම්බන්ධව තමයි මේ විවාදය මතුවෙලා තිබෙන්නේ.

අලුතින් ගෙන්වන electric වාහන "වෙනත්" කියන category එක ඇතුළේ බදුවලට ලක් කරන්න පටන් ගත්තාට පසු විශාල බද්දකට යටත් වන නිසාම තමයි අපේ ආණ්ඩුව ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් මේ සංශෝධන සිදු කර තිබෙන්නේ, අලුත් HS codes හඳුන්වා දී තිබෙන්නේ. තමන්ටම කියා වාහනයක් ගන්න සිහින දකින අපේ රටේ ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහනය ලබා දීමේ අරමුණින් තමයි අපි ආණ්ඩුවක් විධියට මේ විශේෂ යෝජනා සම්මතය ඉදිරිපත් කරමින් මේ නව HS code ක්‍රමයක් හඳුන්වා දෙන්නේ.

අපි කවුරුත් දන්නවා, අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මතයක් හදලා තිබුණු බව, මේ ආණ්ඩුවට මොකුත් කරගන්න බැරි වෙනවා, වාහන ගෙන්වන්න කොහොමත් බැරි වෙනවා, ඒ නිසා මේ ආර්ථිකය කඩාගෙන වැටෙනවා, රට නැවතත් පෙර තිබුණු තැනින් පහළට වැටෙනවා කියා. පසුගිය කාලයේ එවැනි මුසාවාද සමාජගත කරන්න සමහරු උත්සාහ කර තිබෙනවා. අද ඒ

සියල්ලම බොරුවක් -මිථ්‍යාවක්- බවට පත් වෙලා වාහන ගෙන්වා ගන්න ජනතාව විශාල වශයෙන් පෙලඹෙමින් සිටිනවා. එහිදී මතු වන තාක්ෂණික ගැටලුවලට, විවිධ අර්බුදකාරී තැන්වලට අදාළ පහසුකම් ටික දෙන්න තමයි මේ සාකච්ඡාව, මේ සංවාදය, මේ විවාදය මතුවෙලා තිබෙන්නේ.

අපේ ආර්ථිකය කොතරම්දුරට ශක්තිමත් වුණාද කියන එකට නිර්ණායකයක් තමයි මිනිසුන් වාහන ගෙන්වා ගන්න පෙලඹෙන එක. පසුගිය කාලයේ වාහනයක් ගෙන්වා ගන්න තියා තමන් පවත්වාගෙන ගිය පෙට්ටි කඩයවත් කරගෙන යන්න බැරි තත්ත්වයක් තමයි ජනතාවට තිබුණේ. තිබුණු කුඩා ව්‍යාපාර සියල්ල අකර්මණ්‍ය වෙලා, කෘෂි කර්මාන්තය පැත්තෙනුත්, අනික් සෑම සියලු ක්ෂේත්‍රයකමත් බිඳවැටීමක් පසුගිය කාලයේ සිදුව තිබුණා. මේ සභාව තුළම අවස්ථා කිහිපයකදීම මතු වුණා, කොවිඩ් වසංගතයත් මෙයට හේතු වුණා කියන එක. විශේෂයෙන්ම විපක්ෂය පැත්තෙන් එසේ ප්‍රකාශ වුණා. කොවිඩ් වසංගතය ලෝකයටම බලපෑවා. එහෙත් ලෝකයේ අනෙක් රටවල ආර්ථිකය මේ තරම් කඩාගෙන වැටුණේ නැහැ. ලංකාවේ ආර්ථිකය මේ තරම් පහළට කඩාගෙන වැටෙන්න, රට බංකොලොත් වෙන්න බලපෑවේ කොවිඩ් වසංගතයම විතරක් නොවෙයි. එයින් යම් ආංශික බලපෑමක් සිදු වෙන්න ඇති. එහෙත් පසුගිය පාලකයින් දශක 7කට වැඩි කාලයක් ඉතාම අදූරදර්ශී ලෙස අපේ රට ක්‍රමානුකූලව ටිකෙන් ටික, ටිකෙන් ටික ආර්ථික වශයෙන් දුර්වලතාවට පත් කරපු එකේ ප්‍රතිඵලයක් විධියට තමයි පසුගිය කාල පරිච්ඡේදය තුළ සෑම ක්ෂේත්‍රයකින්ම අපේ රට කඩාගෙන වැටුණේ. ආර්ථික පැත්තෙනුත් අපේ රට ඉතාම පහළ තැනකට ඇද වැටීමේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ සමස්තය සිද්ධ වුණේ.

අපි කවුරුත් දන්නවා, පසුගිය කාලයේ ව්‍යාපාර ක්ෂේත්‍රය කඩාගෙන වැටිලා තිබුණා, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය කුඩුපට්ටම් කරලා තිබුණා, ඒ නිසා නව ආණ්ඩුව විධියට මේ සියල්ලම නැවත ගොඩනඟන්න දැන් අපට සිද්ධ වෙලා තිබෙන බව. ඒ වාගේම ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතරට යන ක්‍රම සහ විධි හදන්න අවශ්‍යයි, ඒවා ජනතාවට ලබා දෙන්න අවශ්‍යයි. ඒ විතරක් නොවෙයි. නීතියේ ආධිපත්‍යයේ හිමිකම අද ජනතාවට ලැබෙමින් තිබෙනවා. ඒ කටයුතු තව වැඩිදියුණු කිරීමේ ඕනෑකම තිබෙනවා. ඒ විතරක් නොවෙයි. නාස්තිය අවම කරන්න ඕනෑ, හොරකම සහමුලින්ම නැති කරන තැනට අපි වැඩ කරන්න ඕනෑ. ඒ අනුව හොරකම නැති කරන තැනට අද අපේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා, වංචාව නැති කරන තැනට අපේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. එහි ප්‍රතිඵල තමයි අද මේ ආර්ථිකයට එකතු වෙමින් තිබෙන්නේ. හොරකම, වංචාව, නාස්තිය අවම කරලා, ඒ මුදල් ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන් භාවිත කිරීම, උපයෝගී කර ගැනීම තමයි අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය බවට පත් වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අද වන විට සමාජය තුළ ව්‍යාපාර ගැන කථා කරනවා. අපි කවුරුත් දන්නවා, ව්‍යාපාර කරන අයට ඉදිරි වර්ෂය සඳහා forecast එකක් හදාගන්න එකම මීට පෙර ගැටලුවක් වෙලා තිබුණු බව. ඉදිරි වර්ෂය සඳහා තමන්ගේ ව්‍යාපාරය සැලසුම් කරන්නේ කොහොමද කියන එක ඒ කාලයේ ව්‍යාපාරිකයන්ට තිබුණු ලොකුම ගැටලුවක් වුණා. අද ඒ ප්‍රශ්නය විසඳී තිබෙනවා. ඒ නිසා තමන් කරන ව්‍යාපාරය ඉදිරි වර්ෂය තුළදී මොන තැනකට ගෙනියනවාද, ඒ සඳහා කොපමණ මුදලක් ආයෝජනය කරනවාද කියන කාරණා සැලසුම් කිරීමේ ආර්ථික හැකියාව, විශ්වාසය, ඒ ආර්ථික ස්ථාවරත්වය අද ව්‍යාපාරිකයන් තුළ ගොඩනැඟී තිබෙනවා.

අද මොකක්ද වෙලා තිබෙන්නේ? අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවා. රුපියල ස්ථාවර වෙලා තිබෙනවා. ඩොලරයේ වටිනාකම අද වන විට රුපියල් 300ට අඩුවෙන් තිබෙන්නේ. ඒ වාගේම විදේශ ආයෝජන වැඩි වෙලා තිබෙනවා. අපේ රටට ඩොලර් ගලා ඒම වැඩිවෙලා තිබෙනවා, අපට ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඊට සාපේක්ෂව රැකියා අවස්ථාත් පුළුල් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි ජනතාව අද බදු ගෙවන්න පැකිළෙන්නේ නැහැ, මැළි වෙන්නේ නැහැ. ජනතාව දැන් බදු ගෙවනවා. ඒ වෙන මොකක් නිසාවත් නොවෙයි. ඒ ගෙවන බදු ක්‍රමානුකූලව, නිසියාකාරව ජනතාවගේ සුබසාධනය, යහපත වෙනුවෙන් යෙදවෙනවා කියන එක අද රටේ ජනතාව දන්නා නිසායි. ඒ නිසා තමයි ජනතාව බදු ගෙවන්න පෙලඹිලා තිබෙන්නේ. මීට පෙර මේ රට පාලනය කළ අය ජනතාව ගෙවන බදු මුදල් වංචා කළා කියන එක දන්නා නිසා තමයි එවකට පැවති පාලන සමයේ ජනතාව බදු ගෙවීම පැහැර හැර තිබෙන්නේ; මඟ හැර තිබෙන්නේ. ජනතාවට ඒකට කම්මැළි වුණා. නමුත් අද ජනතාව බදු ගෙවන්න පෙලඹී තිබෙනවා.

ඊළඟට ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්තාම, පසුගිය කාලයේ එම කටයුතු කඩා වැටී තිබුණා, විශාල ව්‍යාපෘති නැවතිලා තිබුණා. නමුත් අද ඒවා නැවත ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. විශේෂයෙන්ම මා ජීවත් වන කෑගල්ල දිස්ත්‍රික්කයේ තමයි වරකාපොල නගරය තිබෙන්නේ. කවුරුත් දන්නවා, කොළඹ-නුවර පාර කියන්නේ A1 මාර්ගය බව. වරකාපොල නගරය පසුකර ලෙහෙසියෙන් යන්න බැහැ. මොකද, වරකාපොල නගරයේදී විශාල වාහන තදබදයකට හසු වෙනවා. එය අවම කිරීම සඳහා වරකාපොල නගරය මඟහැර යෑමට bypass එකක් පටන් ගත්තා. එහි ඉදිකිරීම් අතරමඟ නැවතුණා. හැබැයි අපේ ආණ්ඩුවට පුළුවන්කම ලැබී තිබෙනවා, 2026 වර්ෂය තුළ එම bypass එක සෑදීමේ කටයුතු අවසන් කර, එම මාර්ගයේ පවතින තදබදයට විසඳුම් ලබා දෙන්න. අද උදේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් ඒ ගැන ප්‍රකාශ කළා. ඒ ආකාරයට අපේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය දැවැන්ත පිම්මකින් ඉදිරියට අරගෙන යන්න අපේ ආණ්ඩුවට හැකියාව තිබෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, තුල්හිරිය කියන්නේ කර්මාන්ත විශාල ප්‍රමාණයක් තිබෙන ප්‍රදේශයක් බව. ඒ වාගේම එම ප්‍රදේශයේ ජන ඝනත්වයත් ඉහළ මට්ටමක තිබෙනවා. එම ප්‍රදේශයේ ජීවත් වන පවුල් 25,000ක් විතර පසුගිය කාලයේ පානීය ජල පහසුකම සහ තවත් අවශ්‍යතා නැතුවයි සිටියේ. මොකද, යෝජිතව තිබුණු විසල් ජල යෝජනා ක්‍රමයත් අතරමඟ නැවතිලා තිබුණේ. එවැනි ව්‍යාපෘති නවතින්න ඒ කාලයේ අපේ රටේ ආර්ථිකය තුළ පැවැති දුබලතා මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබුණු විවිධ ගැටලු යනාදියත් බලපෑවා. හැබැයි, අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙන්නේ. ඒ අනුව ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතාව සපුරාලීමටත්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු ඉදිරියට කරගෙන යෑමටත් අපේ ආණ්ඩුවට හැකියාව ලැබී තිබෙනවා. ඒ නිසා මේ වන විට ආර්ථික වශයෙන් අපි ශක්තිමත් වෙලා තිබෙන බව කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි රටක් විධියට ආර්ථික වශයෙන් ශක්තිමත් වෙමින්, ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් අපේ සංවර්ධන ඉලක්ක හඹා යනකොට, විපක්ෂය ඊට එරෙහිව මොනවා හෝ කියන්න පුරුදු වෙලා තිබෙනවා. අපි ඒවා ගණන් නොගෙන, අපේ සැලසුම් වෙත, ඉලක්ක වෙත ගමන් කිරීමයි වැදගත් වෙන්නේ. මේ රටේ ජනතාවට මම කියන්න කැමැතියි, ආණ්ඩුවක් විධියට අපට සැලැස්මක්, ඉලක්කයක් තිබෙන බව. අන්න ඒ ඉලක්ක හඹා යමින් ඒවා සම්පූර්ණ කිරීම වෙනුවෙන් අපි ඉදිරි කාලය තුළ මේ රට මෙහෙයවනවා, ඒ වෙනුවෙන් වැඩ කරනවා කියන පොරොන්දුව දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. M. Nizam Kariapper. You have nine minutes.

[අ.භා. 4.28]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මතයකුත්, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියමයකුත්, මුදල් පනත යටතේ වන නියෝගයකුත්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ වන නියෝගයකුත් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මේ අතරින් රේගු ආඥාපනත යටතේ ඉදිරිපත් කර තිබෙන යෝජනා සම්මතය සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියමය පැහැදිලිවම HS කේතය පිළිබඳව වූ යෝජනා වෙනවා.

ඒ කියන්නේ මෙහෙමයි. අනාගතයේදී අපේ ප්‍රවාහනය අනිවාර්යයෙන්ම සිදු විය යුතුව තිබෙන්නේ මේ විධියටයි. පාරම්පරිකව පසුගිය කාලයේ තිබුණු combustion engine එක වෙනුවට පළමුවන අවස්ථාවේදී විදුලි එන්ජිමත්, combustion engine එකත් හයිබ්‍රිඩ් කරලා අවස්ථාවක් ලබා දීලා, ඊට පස්සේ plug-in hybrid එකට ගිහිල්ලා අවසානයේදී 100 per cent electric vehiclesවලට යෑමේ evolution එකක් තමයි අපි ළඟ තිබෙන්නේ. ඒක තමයි මෙතැනදී ජාත්‍යන්තර වශයෙනුත් - internationally - පිළිගත් ක්‍රියා මාර්ගය. පාර්ලිමේන්තුව ඇතුළත නොවෙයි, පිටතදී ගොඩක් අය මූල්‍යමය වශයෙන් මෙහි තිබෙන ලාභ - අලාභ ගැන විතරයි දකින්නේ. ප්‍රධාන වශයෙන්ම ඒකට තමයි ඒගොල්ලන්ගේ හිත යොමු වෙලා තිබෙන්නේ.

ඉන් ඔබ්බට ගිහිල්ලා සාමාන්‍යයෙන් භාවිත වන භූගත තෙල් - fossil oil - පාවිච්චි කරලා එන්ජිම ක්‍රියාත්මක කිරීමේදී සිදු වන පාරිසරික දූෂණය වළක්වා carbon footprint එක අඩු කිරීමේ මහඟු සේවයක් මෙතැනදී ලැබෙනවා. ඒ පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධයෙන් ලොකු අඩුපාඩුවක් තිබෙනවා. සමහර විට මම කල්පනා කරනවා, මේ HS කේතය හඳුන්වා දීමේදීත්, HS කේතය මත ඒ ලබා දෙන බදු හඳුන්වා දීමේදීත් පුළුවන් තරම් carbon footprint එක පදනම් කරගෙන ඒ බදු, වරප්‍රසාද ලබා දීම බොහොම වැදගත් කියා. සමහර විට ඒක කෙරෙනවා ඇති. නමුත්, කොතරම් දුරට එය කෙරෙනවාද කියන එක පිළිබඳව සැකයක් තිබෙනවා. එහෙම නැත්නම් අපිට අර ඉලක්කය කරා යන්න අමාරු වෙයි. මොකද, හුදෙක් ඒ වාහනයේ මිල, වාහනය ධාවනය කිරීම සඳහා විදුලිය හෝ තෙල් භාවිත කිරීමේදී, ඒ ශක්තිය - energy එක- පාවිච්චි කිරීමේදී සිදු වන වියදම් සියල්ල පදනම් කරගෙන තමයි මේ දිහා බොහෝ ජනතාව බලන්නේ. නමුත්, අපි ඉන් ඔබ්බට යන්න වෙනවා.

මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, අධිවේගී මාර්ග - expressways - භාවිත කිරීම පිළිබඳව මේ ආණ්ඩුව අනාගතයේදී වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා, මධ්‍යම අධිවේගී මාර්ගය පිළිබඳව දැන් උනන්දුවක් ඇති වෙලා තිබෙනවාය කියා. නැඟෙනහිර පළාතේ කල්මුණේ ඉඳලා එන පුද්ගලයෙක් හැටියට මම හැම දාම පාවිච්චි කරන්නේ දක්ෂිණ අධිවේගී මාර්ගය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක් වරක් charge කරගෙන, දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිත කිරීමේදී කිලෝමීටර් 450ක්, 500ක් යන්න පුළුවන් ඉලෙක්ට්‍රික් වාහනයක් ගැන තමයි දැන් කථා කරන්නේ. නමුත්, ඒවායේ මිල ඉතා අධිකයි. නමුත්, කිලෝමීටර් 250-300 ඇතුළත යන්න තිබෙන වාහන ටිකක් ලාභයි. එවැනි වාහන අපිට ගන්න පුළුවන් තත්ත්වයේ තිබෙනවා. නමුත්, ඇයි අපි එවැනි වාහන මිලදී ගන්නේ නැත්තේ? අපි වාහනය එක් වරක් charge කරගෙන, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 40ක්, 45ක් නැත්නම් 50ක් යනකොට අපිට පළමුවන සේවා ප්‍රදේශය - service area එක - හමු වෙනවා. අපිට ඒ සේවා ප්‍රදේශයෙන් වාහනය charge කර ගන්න අවස්ථාව ලැබෙනවා. ඉන් ඔබ්බට මත්තල exit එක දක්වා කිලෝමීටර් 150ක් යන්න තිබෙනවා. ඉන් ඔබ්බට කල්මුණේ වාගේ ප්‍රදේශයකට යන්න එතැන ඉඳලා තව කිලෝමීටර් 200 ගණනක් තිබෙනවා. ඒ අනුව ඔක්කොම කිලෝමීටර් 425ක් පමණ තිබෙනවා. කිලෝමීටර් 300 ගණනක් අපිට යන්න තිබෙනවා. නමුත්, අපි එකවර කිලෝමීටර් 300ක්, 350ක් යන්න charge කළත්, charge එක නැති වෙයි කියලා හයයි. ඒක නිසා අපිට සමාන්තරව charging stations නොමැති වීම සම්බන්ධව විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අඩුම ගණනේ ඔය අධිවේගී මාර්ගවල අවසාන ස්ථානයකවත් අපිට කරදරයක්, බියක් සැකක් නැතුව මිනිත්තු දහයකින්, පහළොවකින් fast charging තිබෙන හොඳ standard charging points ස්ථාපිත කරන්නේ නැතුව, මේ electric වාහන ගෙන ඒම පිළිබඳව යම් ප්‍රශ්නයක් මතු වෙනවා.

ඊළඟට, සාමාන්‍ය ජනතාව භාවිත කරන "ටුක් ටුක්" එහෙම නැත්නම් ත්‍රී වීලර් - රෝද තුනේ වාහන - සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා.

දැන් සාමාන්‍ය "ටුක් ටුක්" එකක් ගන්න රුපියල් ලක්ෂ 20කට වැඩි මුදලක් වැය වෙනවා. ඉලෙක්ට්‍රික් වාහනවල මිල ඊට වඩා වැඩියි. මෙවැනි ලොකු ආයෝජනයක් මත ලබා ගන්නා වාහනයේ energy එක සඳහා මාසිකව යන වියදම කොච්චර අඩු වුණත්, අර මනුස්සයාගේ මුල් ආයෝජනය සඳහා වැය කළ මුදල නැවත ලබා ගන්න අවශ්‍ය නිසා අඩු වියදමකින් ධාවනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභය ඒ වාහනය පාවිච්චි කරන customersලාට ලබා දෙන්න බැරි වෙනවා. ඒ නිසා අපට මේ පිළිබඳව විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න වෙනවා. අනෙක් කාරණය මේකයි. ඔය ත්‍රීවිලර් charge කිරීම ගෙවල්වල කරන්න පටන් ගත්තාම මතු වෙන තාක්ෂණික ප්‍රශ්න තිබෙනවා. ත්‍රීවීලර් ගෙදර ගෙනිහින් එක දිගට normal chargersවල දමන්න පටන් ගත්තාම ඒ ampsවල තිබෙන ප්‍රශ්න මත තවත් ප්‍රශ්න ගොඩක් මතු වෙනවා. ඒක නිසා අපි මේ කරුණු ගැනත් අනිවාර්යයෙන්ම සලකා බලන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ඒක එතැනින් ඉවර වෙන්නේත් නැහැ. ඔය HS code එකේ තව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මොකද, අපි එදිනෙදා - ඒ, ඒ දවසට - එන වාහන ගැන බලලා තමයි HS code එක categorize කරන්නේ. දැන් categories ගොඩක් තිබෙනවා. Hybrid කියලා එකක් තිබෙනවා. Hybridවලත් electric කියලා එකක් තිබෙනවා. ඊට අමතරව තව කාණ්ඩ ගොඩක් තිබෙනවා. ශ්‍රේණිගත විදුලි පරිපථය මත සිදු වන ධාවනය - ඒ කියන්නේ, එකිනෙකට සමාන්තර - parallel - විදුලි පරිපථය මත සිදු වන ධාවනය. මේ දෙක එකතු කිරීම, මේ දෙක සමාන්තර කිරීම කියලා අලුත් තාක්ෂණය දවසින් දවස එළියට එනවා. එහෙම අලුත් තාක්ෂණය එන හැම අවස්ථාවකදීම අපට එක, එක HS codes දමමින් ඉන්න බැහැ. ඒක බොහොම වැදගත්.

අනෙක් කාරණය මේකයි. HS code එක භාවිත කරලා වංචා සිදු වන අවස්ථා තිබෙනවා. ළඟදී ඔය ප්‍රශ්නය මතු වුණා, BYD එක සම්බන්ධයෙන්. ඒවායේ standards පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා අපි ඒවා ගැනත් පොඩ්ඩක් සංවේදී වෙන්න ඕනෑ.

අන්තිම මිනිත්තුවේ මට තවත් වැදගත් කාරණයක් සඳහන් කරන්න අවස්ථාව ලබා දෙන්න. ඉදිකිරීම් කර්මාන්තයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මට කලින් කථා කළ මන්ත්‍රීතුමියකුත් මේ ගැන කිව්වා. ඉදිකිරීම් කර්මාන්තයේ යෙදෙන කොන්ත්‍රාත්කරුවන් රජය සමඟ ඉදිකිරීමක් සඳහා කොන්ත්‍රාත්තුවක් ලබා ගත්තාට පස්සේ ඔහුට ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් අධිකරණ ගානේ රස්තියාදු නොවී එහෙම නැත්නම් තීරකයන් හරහා ඒ සම්බන්ධ ප්‍රශ්නය විසඳා ගන්න ක්‍රමවේදයක් අවශ්‍යයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ තීරක තීන්දු ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් නැහැ. If it is an arbitration, you can get it implemented in the Commercial High Court, but if it is an adjudication, then there is no provision. Then, again, we have to go on the normal course of the judicial system. එතැනත් පොඩි අඩුපාඩුවක් තිබෙනවා. අධිකරණ ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ හිටියා නම් ඒ කාරණය පිළිබඳවත් එතුමාගේ අවධානය යොමු කරන්න තිබුණා. ඒ නිසා අපි මේවා ගැන බලන අවස්ථාවේදී අපට අනිවාර්යයෙන් සිද්ධ වෙනවා, එතැනින් පොඩ්ඩක් එහාට ගිහිල්ලා මේ කාරණා පිළිබඳව සැලකිලිමත් වෙලා වැඩ කරන්න.

අවසාන කාරණය හැටියට මම මේ කාරණයත් සඳහන් කරනවා. HS Code එක සහ විදුලි වාහන ගැන කියනකොට මට කියන්න බැරි වුණු කථාවක් තිබෙනවා. මම කලින් සඳහන් කළා, charging points සම්බන්ධයෙන්. බස්නාහිර පළාතෙන් පිට වාහන තියාගෙන ඉන්න කට්ටියට, දීර්ඝ ගමනක් යන කට්ටියට රට පුරා විහිදිලා යන පරිදි සාමාන්‍ය electric charging points හදා ගන්න අවශ්‍යයි. නමුත් ඒ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම අනාගතයේදී ලංකාවට විදුලි - electric - ත්‍රිරෝද රථ ලබා ගන්න අවස්ථාවක අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් තවමත් ප්‍රතිපත්තියක් වශයෙන් සකස් කරලා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Madam Presiding Member, please give me half a minute.

ඒක නිසා sustainable energy - wind power, solar power - හරහා ඒ ස්ථානවල ඇති කරන පද්ධති මඟින් දවල් කාලයේ ලැබෙන සූර්ය ශක්තිය උපයෝගී කරගෙන ඒ ස්ථානයේදීම වාහන charge කිරීමේ වැඩ පිළිවෙළක් අපි හදා ගන්න ඕනෑ කියන යෝජනාව ඉදිරිපත් කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුති කරමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.38]

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ගෙන තිබෙනවා වැදගත් පනත් දෙකකට ගෙනෙන ලද සංශෝධන. විශේෂයෙන්ම වාහන ගෙන්වීමේදී සහ ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් ඒ වැදගත් තීන්දු ගනිමින් තිබෙනවා. ඒ අනුව, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 58 වගන්තිය යටතේ සාදනු ලබන නියෝග. ඒකට අනුව ඉතාම පැහැදිලිව, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 20,000යි. ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව මීට පෙර තිබුණේ රුපියල් 20,000යි. එය රුපියල් 5,000 දක්වා අඩු කරනවා. මේ පිළිබඳව පසුගිය කාලයේ කොන්ත්‍රාත්කරුවන්ගේ විශේෂ ඉල්ලීමක් තිබුණා.

ඒ වාගේම කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණිගත කිරීමේදී ඒ ඒ ශ්‍රේණි සඳහා වෙන් කරන ලද මූල්‍ය සීමාව බැලුවොත්, CS2 ශ්‍රේණියේ මිලියන 3,000 වශයෙන් වූ සීමාව මිලියන 6,000න් ඉහළට වැඩි කර තිබෙනවා. මේක කරන්න සිදු වුණේ ඇයි කියා මා කියන්නම්. විශේෂයෙන් පසුගිය වසරකට ආසන්න කාලය තුළ කර්මාන්ත ක්ෂේත්‍රයත්, ඉදිකිරීම් ක්ෂේත්‍රයත් විශාල වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. අපි බලයට එන විට තිබුණු තත්ත්වය ගත්තොත්, මේ රට කඩා වැටීම, රට බංකොලොත්වීම හේතුවෙන්, මේ රටේ ආර්ථිකය කඩා වැටීම හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයද විශාල කඩා වැටීමකට ලක් වෙලායි තිබුණේ. ඉදිකිරීම් නවත්වලා තිබුණේ. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලක්ෂ ගණනකගේ රැකියා අහිමි වෙලායි තිබුණේ.

අද විපක්ෂය නින්දෙන් නැඟිට්ටා වාගේ, බය වෙලා වාගේ ප්‍රකාශ නිකුත් කරන්න පටන් ගෙන තිබෙනවා. විශේෂයෙන් අද උදේ ඉඳලාම ඒ අය කථා කළේ පසුගිය අවුරුදු දෙක තුනකට එහා කාලයේ ඒ අය ජීවත් වුණේ නැහැ වාගේයි. මේ රට මහා සෞභාග්‍යවත් රාජ්‍යයක් විධියට අපට භාර දුන්නා වාගෙයි කථා කළේ. බංකොලොත් වෙලා නැවත නැඟිටිමින් තිබුණු රාජ්‍යයක් භාර දුන්නා කියලායි කිව්වේ. හැබැයි, අපි රට භාර ගන්න අවස්ථාව වෙනකොට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටි ලක්ෂ ගණනක් සේවකයන්ට තමන්ගේ රැකියා අහිමි වෙලා තිබුණා. ඉදිකිරීම් කඩා වැටිලායි තිබුණේ; ඉදිකිරීම් ආයතන කඩා වැටිලායි තිබුණේ. නමුත් වර්තමාන ආණ්ඩුවේ ක්‍රියාමාර්ග තුළ මේ මොහොත

[ගරු ටී.බී. සරත් මහතා]

වෙනකොට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියයට 13කට ආසන්න වර්ධන වේගයක් අත්පත් කරගනිමින් තිබෙනවා. අන්න ඒ මහා වර්ධන වේගය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධනය තවදුරටත් අත්පත් කර ගැනීමට තමයි මේ සංශෝධන ගෙන එන්නේ.

විශේෂයෙන් C8, C9 වාගේ ශ්‍රේණිවල මූල්‍ය සීමාව මිලියන දෙක සහ මිලියන හතර දක්වා තමයි තිබුණේ. ඒක මිලියන හතරෙන් එහාට මිලියන හය දක්වා වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. මම පසුගිය දවස්වල මේ ගැන සොයා බැලුවා. මේ ශ්‍රේණිවල වැඩියෙන්ම ලියාපදිංචි වෙලා තිබෙන්නේ, පසුගිය ආණ්ඩුවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, සභාපතිවරු. අදටත් -මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා තිබියදීත්- වැඩියෙන්ම කොන්ත්‍රාත් කරන්නේ, මේ ශ්‍රේණි අතර ඉන්නේ, ඒ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, සභාපතිවරු සහ පොදුජන එක්සත් පෙරමුණේ ක්‍රියාකාරින්. ඒගොල්ලන්, ඒගොල්ලන්ගේ පාක්ෂිකයන් තමයි මේවායේ ලියාපදිංචි වෙලා පසුගිය කාලය පුරාවට කොන්ත්‍රාත් කරමින් සිටියේ. තවදුරටත් කොන්ත්‍රාත් කරන්නේ ඒගොල්ලන් තමයි. අද මහා ලොකුවට කයිවාරු ගැහුවට, "මේවා අසාධාරණයි" කියලා කථා කළාට ඒගොල්ලන් තමයි මේ ක්ෂේත්‍රය තුළ ඉන්නේ. ඒ ක්ෂේත්‍රවලට තමයි අපි මේ සාධාරණය ඉටු කරමින් සිටින්නේ. මේ පනතේ සංශෝධන පිළිබඳව විශාල ලෙස කථා කරන්න මම සූදානම් නැහැ. ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

විශේෂයෙන් මතු වෙච්ච තවත් කරුණු කාරණා ගණනාවක් පිළිබඳව කියන්න තිබෙනවා. විපක්ෂය, මේ පනත ගැන, මේ පනතේ සංශෝධන ගැන නොවෙයි කථා කළේ. එහි තිබෙන හොඳ ගැන නොවෙයි කථා කළේ. පනතට මුවා වෙලා වෙන වෙන දේවල් තමයි ඔවුන් කිව්වේ.

දැන් බොහෝ අය කිව්වා, මේ කන්නයේ වී මිලදී ගැනීමේදී අසාර්ථකභාවයක් තිබෙනවාය කියලා. නමුත් මේ ගෞරවනීය සභාවේදී මම කියන්න සතුටුයි, යල කන්නයකදී ගත්තු වැඩිම වී අස්වැන්න අපි මෙවර ගන්න බව. මෙට්‍රික්ටොන් 22.5 ඉක්ම වූ වී අස්වැන්නක් ගන්න පුළුවන් කියලා ප්‍රබල විශ්වාසයක් අපට තිබෙනවා. පසුගිය කාලයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කරන ලද විශාල සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස එවැනි විශාල අස්වැන්නක් ලබා ගන්න හැකියාව ලැබී තිබෙනවා. හැබැයි පසුගිය කාලයේ මෙවැනි අස්වැන්නක් එනකොට එවකට පැවැති ආණ්ඩුවලට වී මිලදී ගැනීමේ ක්‍රමවේදයක් තිබුණේ නැහැ. වී අලෙවි මණ්ඩලය වහලා තිබුණේ, සමුපකාර වහලා තිබුණේ. රජය සතුව වී ගබඩා තිබුණේ නැහැ. ඒවා පෞද්ගලික සමාගම්වලට විකුණලා තිබුණේ. පොළොන්නරුවේ තිබුණු විශාලතම වී ගබඩා පෞද්ගලික සමාගම්වලට විකුණලා තිබුණේ. එහෙම කරලා තිබුණු තත්ත්වයක් තුළත් අද වී අලෙවි මණ්ඩලය පමණක් ස්ථාන 142කදී වී කිලෝ එකක් රුපියල් 120 ගණනේ මිලදී ගන්න කටයුතු කරලා තිබෙනවා. අද වෙනකොට වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 90කට වඩා අඩු කරන්න අපි සමත් වෙලා තිබෙනවා.

අපි බලයට එනකොට පොහොර සහනාධාරය හෙක්ටෙයාරයකට රුපියල් 10,000යි දුන්නේ. අද වෙනකොට පොහොර සහනාධාරය හෙක්ටෙයාරයකට රුපියල් 25,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, තෙල් මිල අඩුවෙලා තිබෙනවා. අපි බලයට එනකොට තිබුණු ඩීසල් මිල නොවෙයි දැන් තිබෙන්නේ. ඒ නිසා සී සෑම සඳහා වැය වන මුදල අඩු වෙලා තිබෙනවා. සෑම ක්ෂේත්‍රයකම මිල අඩුවෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තයට අදාළ බොහෝ දේවල්වල මිල අඩු කරන්න අපි කටයුතු කර තිබෙනවා.

යන්ත්‍රෝපකරණවල මිල අඩු කරන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ මත නිෂ්පාදන වියදම අඩු කරලා තිබෙනවා. විශේෂයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, "සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපතිතුමාත් ඉන්නවා, ලේකම්තුමාත් ඉන්නවා දැන් පාර්ලිමේන්තුවේ; හැබැයි දැන් ගොවියා ගැන හොයලා බලන්නේ නැහැ" කියලා. අපි බලයට එනකොට සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විධියට අපි කිව්වා, නිෂ්පාදන වියදම තුනෙන් බෙදලා ඒකේ එක ගුණයක් එකතු කරලා ගොවියාගේ වී මිල තීන්දු කරනවා කියලා. එහෙම නම් වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 90යි නම්, ඒක තුනෙන් බෙදුවාම රුපියල් 30යි. රුපියල් 90යි, රුපියල් 30යි එකතු කරලා තමයි, වී කිලෝ එකකට රුපියල් 120ක මිල දීලා තිබෙන්නේ. ගොවි ජනතාවගේ සමාජ ජීවිතය අනුව ගත්තාම ඒ මිල අතිශය සාධාරණ මිලක් කියලා අපි කියන්නේ නැහැ. හැබැයි, ගොවි ජනතාවගේ නිෂ්පාදන වියදමට සාධාරණ මිලක් දෙන්න අපි කටයුතු කර තිබෙනවා.

ගොවියෙක් වුණාම නිෂ්පාදන වියදම විතරක් නොවෙයි ඔහුට තිබෙන්නේ. ඒ ගොවි පවුලට සමාජ ජීවිතයක් තිබෙනවා. ඒ ගොවි පවුලේ දරුවන් පාසල් යවන්න ඕනෑ. රෝගී වුණාම බෙහෙත් හේත් ටික ගන්න ඕනෑ, ගමනක් බිමනක් යන්න ඕනෑ, ඇඳුම් පැළඳුම් ගන්න ඕනෑ. ඔවුන්ටත් සමාජ ජීවිතයක් තිබෙනවා. ඒ සමාජ ජීවිතයට උපරිම සාධාරණය කරන්න තවම අපට හැකියාවක් ලැබිලා නැහැ. නමුත්, නිෂ්පාදන වියදමට සාධාරණයක් අපි ඉෂ්ට කරලා තිබෙන්නේ. විපක්ෂය ඒ කාලයේ නිෂ්පාදන වියදමට සාධාරණයක් ඉෂ්ට කළේ නැහැ. අවුරුදු 76ක් මේ රට පාලනය කරපු පාලකයන්ට අපි කියනවා, නිෂ්පාදන වියදම තුනෙන් බෙදලා, ඒකේ එක ගුණයක් නිෂ්පාදන වියදමට එකතු කරලා ගොවි ජනතාවට දීපු එක කන්නයක් කියන්න කියලා. මම අභියෝග කරනවා, පුළුවන් නම් කියන්න. ගොවි ජනතාවට එවැනි සාධාරණයක් කළා ද කියලා පුළුවන් නම් කියන්න. පසුගිය දශක දෙකක කාලය තුළ වී අලෙවි මණ්ඩලය වී කිරපු ගාණ කොච්චර ද කියලා කියන්න. අද වෙනකොට කන්නයේ අස්වැන්නෙන් සියයට 45ක් නෙළනකොට මෙට්‍රික්ටොන් 25,327කට ආසන්න වී ප්‍රමාණයක් අපි අරන් තිබෙනවා. අස්වැන්නට සාපේක්ෂව ගත්තොත් ඒක විශාල වී ප්‍රමාණයක් නොවෙයි. හැබැයි, එය වෙළෙඳ පොළට බලපෑම් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. අද විවෘත වෙළඳ පොළේ වියළි වී කිලෝ එකකට රුපියල් 120ක මිලක් රඳා පවත්වා ගන්න අපි සමත් වෙලා තිබෙනවා.

දැන් විපක්ෂයේ බොහෝ කථාවලදී කියැවුණා, බදු ගහලා, බදු ගහලා, වක්‍ර බදු ගහලා රටේ පුරවැසියන් ලොකු පීඩනයකට ලක් කරලා තිබෙන්නේ කියලා. අපි අලුතින් ගහපු වක්‍ර බද්දක් කියන්න බලන්න. අපි අලුතින් ගහලා තිබෙන්නේ මොන බදු ද කියලා කියන්න. හැබැයි, වක්‍ර බදු ගහලා මේ රටේ දෙකෝටි විසිලක්ෂයක් ජනතාව වක්‍ර බදු ගෙවනකොට, ඒ බදු ගෙව්වේ කාට ද? මහා පරිමාණ සමාගම්වලට, මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට. ඒගොල්ලන්ට තමයි වක්‍ර බදු ටික එකතු වෙන්නේ. ගමේ මනුස්සයා සීනි කිලෝ එකක් ගන්නකොට, තේ කොළ කිලෝ

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එකක් ගන්නකොට, පරිප්පු කිලෝ එකක් ගන්නකොට, වක්‍ර බදු ගෙව්වේ මහා පරිමාණ ව්‍යාපාරිකයින්ට. ඒගොල්ලන් කොහොමද කෝටි ගණන් බදු වංචා කළේ? අපේ ආණ්ඩුව බලයට එනකොට අපේ රටේ ප්‍රධාන ව්‍යාපාරිකයෝ 10දෙනෙක් රුපියල් කෝටි 25,000කට වඩා බදු වංචා කරලා තිබුණා. අද මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට, සමාගම්වලට බදු වංචා කරන්න බැහැ. අද ඔවුන්ගෙන් බදු අය කරන්න පටන් අරන් තිබෙනවා. හැබැයි, සියයට සියයක් සාධාරණව කියලා මම කියන්නේ නැහැ. නමුත් වෙනදාට වඩා බදු අය කරන්න පටන් අරගෙනයි තිබෙන්නේ. වක්‍ර බදු අය කරපු මහා පරිමාණයේ ව්‍යාපාරිකයන්ගෙන් තමයි මේ බදු අය කරලා තිබෙන්නේ. එහෙම තමයි ආණ්ඩුව බදු වැඩි කරලා තිබෙන්නේ. ගයාන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, දැන් කාර්තුවෙන් කාර්තුවට බදු වැඩි කරගෙන තිබෙන්නේ, වක්‍ර බදු අය කරගෙන තිබෙන්නේ මහා පරිමාණ ව්‍යාපාරිකයා හොරකම් කරපු බදුවලින්. ඒකට තමයි විපක්ෂයට උණ ගැනිලා තිබෙන්නේ. විපක්ෂයට මේ තරම් අමාරුව හැදිලා තිබෙන්නේ ඒ ගොල්ලන්ගේ මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් බදු අය කරපු නිසා. දයා ගමගේ, දයා ඇපරල් සමාගමේ අයිතිකරු; එක්සත් ජාතික පක්ෂයේ භාණ්ඩාගාරික. කොහොමද, ඔහු බදු වංචා කරලා තිබුණේ! කෝටි දෙදහස් ගණනක බදු වංචා කරලා තිබුණා. දැන් ඒවා අය කරලා තිබෙනවා. දැන් ඒවා අය කරන කොට සමහරුන්ට උණ ගැනෙනවා; පස්ස රත් වෙනවා; විපක්ෂයේ පඩුපුල් ආසනය උණු වෙනවා. ඒකයි මේ වෙලා තිබෙන්නේ. අපි ඒ මුදල් කාටද වෙන් කරලා තිබෙන්නේ? වක්‍ර බදුවලින් එකතු කරපු සෑම රුපියලක්ම දීලා තිබෙන්නේ කාටද? ගොවි ජනතාවට. ගොවි ජනතාවට ඇළවල්, දොළවල්, වැව් හදන්න රුපියල් මිලියන 78,000ක් වෙන් කරලා තිබෙනවා. අපි වක්‍ර බදු එකතු කරලා, වෙනත් බදු එකතු කරලා තිබෙනවා. වර්තමාන ආණ්ඩුව ඒ බදු හොරකම් කරලා නැහැ, දූෂණය කරලා නැහැ, වංචා කරලා නැහැ. ඒවා ආපහු වෙන් කරලා තිබෙන්නේ එක්කෝ මහාමාර්ග හදන්න; එක්කෝ රෝහල් හදන්න, එහෙම නැත්නම් වැව් හදන්න, එහෙමත් නැත්නම් ගෙවල් හදන්න. මහා පරිමාණයේ ව්‍යාපෘතිවලට තමයි සල්ලි වෙන් කරලා තිබෙන්නේ. හැබැයි, 2015-2020 කාලයේ, එනම් ඒ අවුරුදු 5ම ඒ හදලා සම්පූර්ණ කරපු ගෙවල්වල සංඛ්‍යාලේඛනය ගත්තොත්, ගෙවල් 4,000 ගණනක් තිබෙන්නේ. අපි මේ අවුරුද්ද අවසන් වනකොට ගෙවල් 10,000කට වඩා සම්පූර්ණයෙන් හදලා අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය පැත්තෙන් ලොකුවට මතු කරපු තවත් කාරණයක් තමයි, 'වාහන ගෙන්වපු එක හොඳයි. හැබැයි, වාහන මිලදී ගන්න බැහැ. මොකද, මිල වැඩි වෙලා' කියන එක. 2019දී වාහන ගෙන්වීම නතර කරන කොට ඇමෙරිකානු ඩොලරයක අගය පැවතුණේ රුපියල් 120ට, 130ට. අපි ආණ්ඩුව භාර ගන්න කොට ඇමෙරිකානු ඩොලරයක අගය කීයද? අපි ආණ්ඩුව භාර ගන්න කොට ඇමෙරිකානු ඩොලරයක අගය රුපියල් 330කට ආසන්නයි. ඇමෙරිකානු ඩොලරයක අගය රුපියල් 300ක පවත්වාගෙන යන්න අපි සමත් වෙලා තිබෙනවා. රුපියල් 120ට ඇමෙරිකානු ඩොලරයක අගය තිබියදී වාහන ගෙන්වන කොට පැවැති වාහනයක මිල වාගේ තුන් ගුණයකින් ඇමෙරිකානු ඩොලරයක අගය රුපියල් 300ට තිබියදී සහ ආර්ථිකය කඩා වැටුණාට පසුව වාහන ගෙන්වන කොට වාහනයක මිල වැඩි වෙලා තිබෙනවා. විපක්ෂය ඒක කියන්නේ නැහැ. මොකද, ඒක තමන්ගේ කෙරුවාවේ ප්‍රතිඵලය නේ. ඒ නිසා ඒක කියන්නේ නැතිව, වාහන ගණන් ගිහිල්ලා කියනවා. වාහන ඉබේම ගණන් ගියාද? වාහන ගණන් ගියේ අපි බදු ගහලාද?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
වාහන මිල තුන්ගුණයකින් වැඩි වෙලා- *[බාධා කිරීමක්]*

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු අර්චුනා මන්ත්‍රීතුමා, කෑ ගහන්නේ නැතිව ඉන්න. ඔබතුමා ඒ ආණ්ඩුවේ පව් ගෙවන්නේ නැතිව ඉන්න. ඔබතුමා අපිත් එක්ක ආපු කෙනෙක් නේ. ඔබතුමා ඒ ආණ්ඩුවේ පව් ගෙවන්න යන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය මේ නගන තර්ක පට්ටපල් බොරු. දයාසිරි ජයසේකර මහත්මයා, ඩී.වී. චානක මහත්මයා කයිවාරු ගහනවා. හැබැයි, කයිවාරුවෙන් පස්සේ එතුමන්ලා මේ ගරු සභාව ඇතුළේ නැහැ. සභාවෙන් පිටතට යනවා. උත්තර දෙනකොට එතුමන්ලා ඉන්නේ මේ සභාවෙන් පිට. මෙතැනට ඇවිල්ලා කයිවාරු ගහලා, බොරු කියලා මෙතැනින් යනවා. වාහන ගණන් ගිහිල්ලා කියනවා. වාහන ගණන් ගිහිල්ලා තිබෙනවා තමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
2019ට සාපේක්ෂව දැන් වාහනවල මිල බලන්න. එහෙම නැතිව, අපි ගණන් යවලා නොවෙයි මේ තිබෙන්නේ. Luxury වාහන ගණන් යවලා තිබෙන්නේ, ඩී.වී. චානකලාට. සාමාන්‍ය ජනතාවට දෙන්න පුළුවන් උපරිම ගණනටත් වඩා අඩුවට වාහන දෙන්න තමයි අපි කටයුතු කරන්නේ. තව අවුරුදු එකක් දෙකක් තුනක් යනකොට රටට මොකක්ද වෙන්නේ කියලා බලමු. රටේ ආර්ථිකය සංවර්ධනය වෙන්න වෙන්න, එහි ප්‍රතිඵලය ලබා දෙන්නේ යාපනයේ දුප්පත් මිනිසුන්ට බව මතක තබා ගන්න, ගරු අර්චුනා මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් තත්පර 30කින් පමණ කථාව අවසන් කරනවා.

විපක්ෂය නගන බොහෝ තර්කවලට තොරතුරු, දත්ත නැහැ. ඒ අය බොරු කියන්නේ. නමුත් අපි තොරතුරු, දත්ත එක්ක තමයි කරුණු පැහැදිලි කරන්නේ. මේ රටේ පොදු ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහනය දෙන්නත්, ජනතාවගේ අවශ්‍යතාව ඉටු කිරීම වෙනුවෙනුත් තමයි මේ සංශෝධන සිදු කරන්නේ. ඒ කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.53]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවාදය අවසන් කරන්නත් එක්කම මම යම් කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න කැමැතියි, විශේෂයෙන් මෙම විවාදය අතරතුරදී සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මහතා සෞඛ්‍ය සම්බන්ධයෙන් කියපු කරුණකට පිළිතුරු ලබා දෙමින්. එතුමා ඉතාම සාහසික ප්‍රකාශයක් කරලා තිබුණා නිවැරදි නොවන දත්ත සහ තොරතුරු මත පදනම් වෙලා. ඒකෙන් මේ රටේ සෞඛ්‍ය පද්ධතිය සහ ඖෂධ පිළිබඳව ජනතාව තුළ අනියත බියක් ඇති කිරීමේ පරමාර්ථයක් තිබෙන බව පෙනෙනවා. කෙහෙළිය රඹුක්වැල්ල, හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයාට හිරේ යන්න සිදු වුණු immunoglobulin ඖෂධය යළිත් වතාවක් භාවිත කරලා මේ වන විට රෝගීන් තුන්දෙනෙකු මිය ගිහින් තිබෙනවා කියලා එතුමා කිව්වා. ඒ රෝගීන් හිටපු රෝහල්වල නම් සහ මිය ගිය බව කියන රෝගීන් දෙදෙනෙකුගේ නම් ද එතුමා මේ ගරු සභාවට වාර්තා කළා. දැන් ඒවා හැන්සාඩගත වෙලා තිබෙනවා. ඒ නිසා මම කල්පනා කළා මේ අවසන් විනාඩි කිහිපයේදී හෝ මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ කියලා.

කෙහෙළිය රඹුක්වැල්ල හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයාගේ කාලයේ ඔහු immunoglobulin කියන ඖෂධය ගෙනාවා. ඒ සම්බන්ධයෙන් බරපතළ වංචාවක් සිදු වෙලා තිබෙනවා. ඒ ගැන පරීක්ෂණ පවත්වා තිබෙනවා, නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතිනවා. ඒක වෙනම කථාවක්. හැබැයි immunoglobulin කියන්නේ අපේ රටේ රෝගීන්ට ලබා දිය යුතු අත්‍යවශ්‍ය ඖෂධයක්. ඒක ඊට පස්සේත් ගෙනැල්ලා තිබෙනවා. අපි දැනුත් ඒක භාවිත කරනවා. Immunoglobulin ගෙනාපු පමණින්ම ඒක කෙහෙළිය රඹුක්වැල්ල ගෙනාපු immunoglobulin වර්ගයම වෙන්නේ නැහැ. එහෙම වුණොත් අපට මොන ඖෂධයක්වත් ගේන්න වෙන්නේ නැහැ නේ. ඒක immunoglobulin නම තිබෙන, වැරදි විධියට ගෙනාපු වැරදි ඖෂධයක්. නමුත් එතැනින් පස්සේ වෙනත් සමාගම්වලින්, වෙනත් නිෂ්පාදකයන්ගෙන් immunoglobulin කියන ඖෂධ ගෙනැල්ලා අපි භාවිත කරමින් සිටිනවා. දැන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මොකක්ද කරන්න හදන්නේ? දැනුවත්ව, සාහසිකව මේ දෙක පටලවන්න උත්සාහ කරනවා. 2024 අගෝස්තු මාසයේ 17වන දා immunoglobulin ඖෂධ තොගය - ඒ කියන්නේ, කෙහෙළිය රඹුක්වැල්ල ගෙනාපු එක නොවෙයි. ඊට පසුව ගෙනාපු immunoglobulin ඖෂධ තොගය - භාවිත කරමින් තිබියදී යම් තැනක reactions වාර්තා වෙලා තිබුණා. මේ කියන්නේ, 2024 අගෝස්තු 17වන දා. ඒ reactions වාර්තා වුණාට පස්සේ අගෝස්තු 28වන දා ජාතික ඖෂධ නියාමන අධිකාරිය sample එකක් ගෙනැල්ලා පරීක්ෂා කරන්න තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒ අතරේ මේ කියන immunoglobulin විතරක් නොව, තවත් ඖෂධ භාවිත කරමින් සිටි රෝගියෙක් ත්‍රිකුණාමල රෝහලේදී මිය ගිහින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මරණයටත් මේක හේතු වෙන්න ඇතැයි යන සැකය පවතින නිසාත්, ඒ වාගේම අගෝස්තු මාසයේ 17වන දා රෝගීන් යම් පිරිසකගෙන් reactions යම් ප්‍රමාණයක් වාර්තා වුණු නිසාත් සැප්තැම්බර් 07වෙනි දා NMRA එක තීන්දුවක් අරගෙන තිබෙනවා ඒ සම්පූර්ණ නිෂ්පාදනයම withhold කරන්න. සාමාන්‍යයෙන් මේ තීන්දුව හැම ඖෂධයක් සම්බන්ධයෙන්ම මේ විධියටම ගන්නේ නැහැ. යම් ඖෂධයක sample එකක එහෙම reactions වාර්තා වුණොත් ඒ sample එක තමයි නතර කරන්නේ. සම්පූර්ණ නිෂ්පාදනයම, ඖෂධ තොගයම නතර කරන්නේ නැහැ. ඒ වෙලාවේදී මැතිවරණයක් අභිමුව සිටි නිසා යම් යම් කණ්ඩායම් සමාජ මාධ්‍යවල ඒ පිළිබඳව කරුණු වාර්තා කරමින් සිටියා. සමහර විට ඒකත් බලපාන්න ඇති, batch withdrawal එකකට යන්නේ නැතිව සම්පූර්ණ product withdrawal එකකට යන්න. කොහොම නමුත්, ඔක්තෝබර් 18වන දා සම්පූර්ණ product withdrawal එකක් කරන්න කියලා NMRA එක තීන්දුවක් ගෙන තිබෙනවා. ඒකට පදනම් වෙන්නේ, අපේ NMRA එකේ lab එකෙන් ගත්තු report එකේ මේ ඖෂධයේ endotoxin එකක් තිබුණා කියලා වාර්තා වීම. ඒක හරි. හැබැයි, ඒ අතරේ NMRA එකේ සාමාන්‍ය ක්‍රමවේදය තමයි ඖෂධයක එවැනි අසාත්මිකතාවක් පිළිබඳව, නැත්නම් ඒකට හේතුව වාර්තා වුණාට පස්සේ නිෂ්පාදකයාට අයිතියක් ලබා දෙනවා lab reports පදනම් කරගෙන ඔහුගේ පැත්තෙන් ඒ ගැන කරුණු වාර්තා කරන්නට. ඒ අනුව ඒ ඖෂධය නිෂ්පාදනය කළ ඉන්දියාවේ Ichor Biologics Private limited කියන සමාගම ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගන්නා, එහෙම නැත්නම් WHO pre-qualified lab එකකින් පරීක්ෂණ වාර්තාවක් ගෙනැත් දීලා තිබුණා NMRA එකට, ලංකාවේ NMRA එකේ lab එක ඇතුළේ මේ පරීක්ෂණ ක්‍රියාවලිය සිදු කළ ආකාරය සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපි තව විනාඩි කිහිපයක කාලයක් ලබා ගනිමු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයේ කටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ ලංකාවේ NMRA එකේ lab එක ඇතුළේ immunoglobulin සම්බන්ධයෙන් සිදු වන පරීක්ෂණ ක්‍රියාවලිය ගැන. ඒක සාමාන්‍යයෙන් අමුතු ක්‍රියාවලියක් නොවෙයි. අපේ lab එකක් ඇතුළේ sample එකක් fail වුණොත් නිෂ්පාදකයාට පුළුවනි, ඔහුගේ පැත්තෙන් ඒකට කරුණු වාර්තා කරන්න. ඒ අනුව ලෝක

සෞඛ්‍ය සංවිධානය විසින් පිළිගත් පරීක්ෂණාගාරයක වාර්තාවක් නිෂ්පාදකයා ඉදිරිපත් කරලා තිබුණා, පෙබරවාරි මාසයේදී පමණ. ඒක භාර දුන්නාටම NMRA එක පිළිගන්නේ නැහැ. NMRA එක යළිත් ඒ lab එකත් එක්ක අදහස් හුවමාරු කරගෙන, පරීක්ෂණ වාර්තා විශ්ලේෂණය කරලා අප්‍රේල් 07වැනි දා තීන්දුවක් ගන්නවා, මේ ඖෂධයේ එහෙම ප්‍රශ්නයක් නැහැ කියලා. ඒ අනුව අප්‍රේල් 11වැනි දා ජාතික ඖෂධ නියාමන අධිකාරිය නිවේදනයක් නිකුත් කරනවා, මේ ඖෂධයේ ඉතුරු තොගය නියමිත තත්ත්ව යටතේ තිබුණා නම් පාවිච්චි කරන්න පුළුවන් කියලා. එතකොට ඔය කියන immunoglobulin ඖෂධයෙන් vials 7,500ක් ලංකාවට ගෙනත් තිබුණා. ඒ වෙනකොට අපේ රෝහල් පද්ධතියේ තව vials 1,500ක් පමණ තමයි ඉතුරු වෙලා තිබුණේ. ඒ vials 1,500නුත් අර පාලිත උෂ්ණත්ව තත්ත්ව යටතේ තිබුණු ඖෂධ භාවිත කරන්නට කියලා සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා නිවේදනයක් ගියා. ඒක තමයි වෙච්ච ක්‍රියාවලිය. මේක සාමාන්‍යයෙන් විය හැකි දෙයක්. විද්‍යාත්මකව පිළිගත්ත ක්‍රියාවලියක්.

මේ තිබෙන සමහර කරුණු පදනම් කරගෙන දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියන්න හදනවා, මේ ඉන්දියාවේ නිෂ්පාදකයෙක් ඉන්දියාවේ lab එකකින් ගෙනාපු එකක් පිළිගැනීම කරන්න බැහැ කියලා. එහෙම එකක් නැහැ. කොයි රටේ නිෂ්පාදනය කළත්, ලෝක සෞඛ්‍ය සංවිධානය - WHO එක - පිළිගත් පරීක්ෂණාගාරයක වාර්තාවත් අපි පිළිගන්නවා. අපි ඒ ගැන නැවත විශ්ලේෂණය කරලා තමයි ඒ product එක භාවිත කරන්න පුළුවන් කියලා කිව්වේ.

ඒ වාගේම, එතුමා මේ සභාවේදී නම් තුනකුත් කියමින් කියලා තිබෙනවා, "මේ වෙනකොට උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ කේ.ඩී. සුජීව, නුවර ඩබ්ලිව්.**ජේ. නන්දසිංහ** කියලා දෙදෙනෙකුත් මේකෙන් මිය ගියා, තව ත්‍රිකුණාමලයේ කෙනෙකුත් මිය ගියා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 සැප්තැම්බර් මාසයේ ත්‍රිකුණාමලයේ රෝගියා මිය ගියේ මේ immunoglobulin ඖෂධයේ ප්‍රශ්නයක් නිසා නොවෙයි කියලා වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ කියන රෝගීන් දෙදෙනාත් immunoglobulin ඖෂධයේ ප්‍රශ්නයක් නිසා නොවෙයි මිය ගියේ කියන එකත් වාර්තා වෙලා තිබෙනවා. මේ අය මිය ගිහිල්ලා තිබෙනවා. හැබැයි මේ immunoglobulin ඖෂධයේ නිසා නොවෙයි. නමුත් දැන් මේ මොකක්ද කරන්න හදන්නේ? එක්කෝ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඕනෑ වෙලා තිබෙන්නේ මේ කරුණු විකෘති කරලා, පාර්ලිමේන්තුවේදී කථා කරලා, ඒවා සමාජයට යවලා ආණ්ඩුවට මඩ ගහන්න. එක අරමුණක් ඒක වෙන්නට පුළුවන්. එහෙම නැත්නම්, මේ ඖෂධය ගෙනාපු සමාගමත් එක්ක තරග කරන තව සමාගම් තිබෙනවා නේ. එතකොට ඔවුන්ගේ අභිලාෂ ඉටු කරන්නට දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා මේ සභාවේ කථා කළා වෙන්නත් පුළුවන්. මම දන්නේ නැහැ ඒ මොකක්ද කියලා. නමුත් ඒ කොයි එකත් වෙන්න පුළුවන්. මොකද, අප්‍රේල් මාසයේදී NMRA එක මේ ඖෂධයේ ඉතිරි කොටස් යළි භාවිත කරන්නට අනුමැතිය ලබා දුන්නාට පස්සේ සමහර කණ්ඩායම් එකක්, දෙකක් විතර සමාජ මාධ්‍ය භාවිත කරලාත් එවැනි සෝෂාවක් හදන්න උත්සාහ කරනවා මම දැක්කා. ඒ අය පිටිපස්සේ හිටපු ඖෂධ සමාගම් කවුද කියන එකත් අපි හොඳටම දන්නවා. ඒක නිසා මේක ඇත්තටම මම හිතන හැටියට, මේක එතුමා කරුණු නොදැනම කිව්වා නොවෙයි, ඒ වෙලාවේදී ආණ්ඩුවට මඩ ගහන්න ඒකත් පාවිච්චි කරන්න පුළුවන්ද කියලා තමයි මේක කළේ කියලා. මොකද, ඔය news එක දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා අද පාර්ලිමේන්තුවේ කියනවා හා සමානව මේ රටේ එක්තරා නාළිකාවකුත් ඔය විදියට වාර්තා කළා. ඒ, "කෙහෙළිය රඹුක්වැල්ලට හිරේ යන්නට සිදු වෙච්ච ඖෂධ තොගය මේ ආණ්ඩුවෙන් මෙන්න මෙහෙම ගෙනැල්ලා භාවිත කරලා තිබුණාය" කියලායි. ඒක ඉතාම වැරදි ප්‍රකාශයක් නිසා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ රූපවාහිනී මාධ්‍ය ආයතනය ගෙනැල්ලා කරුණු පැහැදිලි කළා. මොකද, ඒගොල්ලන්ට TV licence එක ලබා දෙනකොට තිබෙනවා, සෞඛ්‍යට සම්බන්ධ කරුණු විකෘති කරලා සමාජයේ කැළඹීමක් ඇති කිරීම TV licence එක cancel වෙන්න වුණත් හේතු වෙනවාය කියලා. ඒ අරමුණෙන් දෝ නොවෙයි දෝ කියන එක කෙසේ වෙතත්, කෙහෙළිය රඹුක්වැල්ලගේ immunoglobulin ඖෂධයේ ප්‍රශ්නය එක්ක පටලවලා ඔවුන් එසේ වාර්තා කළේ, දැනුවත්ව. ඒ අනුව පස්සේ වෙලාවක ඒ මාධ්‍ය ආයතනය ඒ ප්‍රවෘත්තිය යම් ප්‍රමාණයකින් නිවැරදි කළා. එසේ නිවැරදි කරලා තිබියදීත් සමගි ජන බලවේගයේ දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කරලා ජනතාවට පණිවුඩයක් දෙන්න හැදුවා මේ immunoglobulin ගැන. මේ immunoglobulin vials 7,500ට පසුව, පසුගිය මාස 8 තුළදී අපි immunoglobulin vials ලක්ෂ 2ක් ලංකාවට ගෙනැල්ලාත් තිබෙනවා.

එක සැරයක් immunoglobulin vials 120,000ක්, ඊට පස්සේ vials 70,000ක් ගෙනැල්ලා තිබෙනවා. තවත් ප්‍රමාණයක් ගෙනැල්ලා තිබෙනවා. ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක් immunoglobulin vials ගෙනැල්ලා රෝහල් පද්ධතිය තුළ භාවිත කරනවා. අපි අනාගතයේදීත් මේවා ගෙනෙනවා. ඒවා ගෙනැල්ලා නියමිත තත්ත්ව යටතේ ඒ samples පරීක්ෂා කරලා පරීක්ෂණාගාර වාර්තා අරගෙන තමයි අපි කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාව ගත්තේ වෙන මොනවාවත් නිසා නොවෙයි, මේ කාරණය අවධාරණය කරන්නයි. විශේෂයෙන් ම immunoglobulin කියන්නේ මරණාසන්න පුද්ගලයෙකුට, ඒ කියන්නේ ජීවිතයත්, මරණයත් අතර සටන් කරන රෝගියෙකුට ලබා දෙන ඖෂධයක් කියන එක. එවැනි ඖෂධයක් පිළිබඳව පාර්ලිමේන්තු වරප්‍රසාද භාවිත කරලා මේ වාගේ සාහසික බොරු ප්‍රචාරය කරන එක, පතුරුවන එක මේ රටේ ජනතාවට කරන බලවත් අසාධාරණයක්. කෙහෙළිය රඹුක්වැල්ල මහතා හිටියා; ඒගොල්ලන් ඖෂධ මගඩි සිදු කළා. හැබැයි, අද වෙනකොට immunoglobulin කියන ඖෂධය හා වෙනත් ඖෂධ අපි නියමිත ක්‍රම යටතේ ගෙනැල්ලා මේ රටේ ජනතාවට ලබා දීමේදී, ඒ ජනතාව බිය කරන්න කියලා හිතාගෙන මේවා කරනවා නම් ඒක වැරදියි. මේ කරුණු විකෘති කිරීම සම්බන්ධයෙන් ඒ මන්ත්‍රීවරයා අඩුම ගණනේ හෙට උදේවත් හැන්සාඩ් වාර්තාවෙන් එම ප්‍රකාශය ඉවත් කර ගන්න කටයුතු කරාවි කියලා මම බලාපොරොත්තු වෙනවා. මොකද, මට මතකයි මීට කලිනුත් අනුරාධපුරයේ වාහන වෙන්දේසියක් ගැන මාධ්‍ය සාකච්ඡා පවත්වලා කරුණු කියලා තිබුණා. පාර්ලිමේන්තුවේත් ලොකු සද්දයක් දාලා ඊට පස්සේ එතුමාටම කියන්න සිද්ධ වුණා, වැරදි තොරතුරු මත පදනම් වෙලා තමයි ඒ දේවල් කිව්වේ කියලා. මේකත් එහෙම දෙයක්. මේ වාගේ අය තමයි අද විපක්ෂයේ ඉඳගෙන එකතු වෙලා ආණ්ඩු පෙරළන්න එක එක ගෙවල්වල රෑට රෑට සාකච්ඡා කරන්නේ. ඉතින් මෙහෙම කටයුතු කරන කට්ටියක් කවද්ද ආණ්ඩු පෙරළන්නේ කියලා රටේ ජනතාව කල්පනා කරන්න ඕනෑ. අඩුම ගණනේ ආණ්ඩුවට විවේචනයක් ඉදිරිපත් කරනවා නම් සත්‍ය තොරතුරු මත පදනම් වෙලා කරුණු ඉදිරිපත් කරන්න හැකියාවක් නැති මන්ත්‍රීවරු තමයි මේ. ඒ ගැන මම කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි මට මේ වෙලාව ලබා දීම ගැන.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත: නියමය
உற்பத்தித் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.08.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මුදල් පනත: නියෝගය
நிதிச் சட்டம்: ஒழுங்குவிதி
FINANCE ACT: REGULATION

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත: නියෝග
நிர்மாணத்தொழில் அபிவிருத்திச் சட்டம்: ஒழுங்குவிதிகள்
CONSTRUCTION INDUSTRY DEVELOPMENT ACT: REGULATIONS

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ සහ 35(1), (2) සහ (4) වගන්ති සමඟ කියවිය යුතු 58 වගන්තිය යටතේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ඔෂානි උමංගා මහත්මිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

සැමොම අන්තර්ගත ඩිජිටල් ආර්ථිකයක් සඳහා වූ රජයේ වැඩ පිළිවෙළ
அனைவரையும் உள்வாங்கிய டிஜிட்டல் பொருளாதாரம் தொடர்பான அரசாங்கத்தின் வேலைத்திட்டம்
GOVERNMENT'S INITIATIVE TOWARDS AN INCLUSIVE DIGITAL ECONOMY

[අ.භා. 5.06]

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරවනවා:

"නව රජයේ ප්‍රධාන සංවර්ධන උපාය මාර්ග ක්ෂේත්‍ර තුනෙන් එකක් වන ඩිජිටල් ආර්ථික සංවර්ධනය සඳහා ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරමින් ඩිජිටල් ආර්ථික මාර්ග සිතියම හඳුන්වා දී ඇත. එවැනි පසුබිමක සැමොම අන්තර්ගත ඩිජිටල් ආර්ථිකයක් වෙනුවෙන් වූ බහුවිධ සංවර්ධන, ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික වැඩසටහන් හා සෙසු ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබීම සම්බන්ධයෙන් මෙම ගරු සභාවේ අවධානයට යොමු කරවමි.

ඩිජිටල්කරණයේ, විශේෂයෙන්ම පොදු ඩිජිටල් යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ හා නැඟී එන කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත තාක්ෂණයන්හි, ප්‍රතිඵල වඩාත් සඵලදායී ලෙස ජාතික ආර්ථිකය සමඟ ඒකාග්‍ර කිරීමත්, තරුණ හා කාන්තා ප්‍රජාවන්ට ප්‍රමුඛත්වය දෙමින් ඩිජිටල් ආර්ථිකයේ නවෝත්පාදන හා තාක්ෂණය ආශ්‍රිත ව්‍යාපාර ප්‍රාරම්භන (Tech Startups) ප්‍රවර්ධනයට අදාළව ශ්‍රී ලංකාවේ තරගකාරී විභවය ගෝලීය ප්‍රජාවට විදහා දක්වමින් ඒ සඳහා වූ විදේශ ප්‍රාග්ධනය මෙරටට ආකර්ෂණය කර ගැනීමත් මෙහි ලා ඉතා වැදගත් වේ.

මෙම සංදර්භය පිළිබඳ පුළුල් ජනතා අවධානයක් මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම අධ්‍යාපන ආයතන, අන්තර්ජාතික විශේෂඥයන්, ආයතන හා විදෙස්ගත ශ්‍රී ලංකික ප්‍රජාවත් සම්බන්ධකර ගන්නා පුළුල් වැඩසටහනක් ඇති කළ යුතු බව නිරීක්ෂණය කරන අතර, ඉහත ක්ෂේත්‍රයන්හි ජයග්‍රහණ හා අනාගත පැතිකඩ නිරූපණය කෙරෙන ක්‍රියාකාරකම් මාලාවක් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය මඟින් දියත් කිරීම සුදුසු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ඩිජිටල්කරණය ගතික සහ අඛණ්ඩ ක්‍රියාවලියක්. ඕනෑම රටක් රජයක් හෝ පෞද්ගලික ආයතන ඩිජිටල්කරණය ඵලදායී ලෙස වැලඳ ගන්නේ නම් එය පුරවැසියන්ගේ වාගේම පාරිභෝගිකයන්ගේ හෝ පාර්ශ්වකරුවන්ගේ වෙනස් වෙන අවශ්‍යතා සහ අපේක්ෂා සපුරාදීම සඳහා තරගකාරී කාර්යක්ෂම සහ සඵලත්වය ඉහළ නංවමින් නිෂ්පාදන හා සේවා සැපයුම පහසු කළ හැකි ක්‍රමයක්.

ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගොඩනැඟීම වෙනුවෙන් මේ රටේ පුරවැසියන් අපට බලය ලබා දුන්නා. රට ඩිජිටල්කරණය කරා ගෙන යාමේ ප්‍රයත්නය අපේ ඒ ජාතික දැක්ම සාක්ෂාත් කර ගැනීමේ එක් මෙහෙයුමක්. පසුගිය කාලය තුළ නිවැරදි දත්ත නොමැති වීම, දත්ත විකෘති කිරීම, දත්ත අස්ථානගත වීම වැනි කාරණා නිසා තීරණ ගැනීමට තිබුණු ඉඩකඩ අහිමි වුණු රටක්, අපේ රට. අධිකරණ ගිනි ගත්තා. රටේ තාක්ෂණය යාවත්කාලීන කිරීම වෙනුවට, වංචාව, දූෂණය, නාස්තිය රස්සාවක් කර ගත්ත පිරිසක් විසින් එය නොකර සිටි ආකාරය තමයි පසුගිය කාලයේ අපි දැක්කේ. අපි මේ වෙනකොට ආණ්ඩුවක් විධියට වංචාව, දූෂණය, නාස්තිය zero කරන්න සමත් වෙලා තිබෙනවා. ඩිජිටල්කරණය තුළින් නව තාක්ෂණය භාවිත කර, යල් පැන ගිය ක්‍රමවේද වෙනුවට ගෝලීයකරණයට සමගාමීව පොහොසත් රටක් ගොඩනැඟීමට අවශ්‍ය කරන ජාතික ඩිජිටල් ප්‍රතිපත්ති හා උපාය මාර්ග අපි මේ වෙනකොට හඳුනාගෙන තිබෙනවා. රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීම, National ID card එක, රියදුරු බලපත්‍රය, පාස්පෝට් එක, land registration ආදිය ඩිජිටල්කරණය කිරීම සඳහා platform එකක් මේ වෙනකොට නිර්මාණය කරමින් පවතිනවා. ඒ වාගේම Lanka Government Network එක පුළුල් කිරීම, Lanka Government Cloud එක පුළුල් කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය හා ඒ තුළින් වරප්‍රසාද නොලබන කොටස්වලට ඩිජිටල්කරණ උපාංග ලබා ගැනීමට පහසුකම් සලසා දීම, දත්ත මධ්‍යස්ථාන, සයිබර් ආරක්ෂණ රාමු පවත්වාගෙන යාම, smart city හා සමගාමීව ඩිජිටල් යටිතල පහසුකම් ව්‍යාපෘති ගොඩනැඟීම ඒ අතර වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි, රට ඩිජිටල්කරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද, ප්‍රතිපත්ති සකසා අවසන්. මේ පිළිබඳව දැනුවත් වෙන්න කියලා තරුණයන්, ව්‍යාපාරිකයන් ඇතුළු මේ රටේ පුරවැසියන් සියලුදෙනාට අපි ආරාධනා කරනවා. මේ platform එක මත වැඩ කරන්න ඔබ සියලුදෙනාගේම දායකත්වය ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.11]

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද අතිශය ප්‍රායෝගික, කාලෝචිත යෝජනාව ස්ථිර කරමින් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, ලෝකයේ බොහෝ රටවල් නව තාක්ෂණය තුළින්, ඩිජිටල්කරණය තුළින් වේගයෙන් ඉස්සරහට යද්දී අවුරුදු 76ක් තිස්සේ අපේ රට පාලනය කළ පාලකයන් විසින් ඒ පිටුපසින් ඉබි ගමනින් යන රටක් බවට අපේ රට පත් කළ බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද දවසේ පළ වෙලා තිබෙන ප්‍රවෘත්තියක් උපුටා දක්වන්න කැමැතියි. එහි තිබෙනවා, "ඇපල් සමාගම විසින් iPhone 17 Pro Max ජංගම දුරකථනය සැප්තැම්බර් මාසය තුළදී වෙළෙඳ පොළට නිකුත් කිරීමට නියමිත බව විදෙස් වාර්තා සඳහන් කරයි" කියලා. ඒ වාගේම එහි තවදුරටත් සඳහන් වෙනවා, "ඇපල් සමාගමේ iPhone 17 මාදිලිය ඉන්දියාව තුළ එකලස් කිරීමට නියමිත බවද විදෙස් මාධ්‍ය වාර්තා කරයි. ඒ වෙනුවෙන් ඉන්දියානු කර්මාන්තශාලා පහක් සූදානම්ව ඇති බවත්, මෙය ඉන්දියාව තුළ iPhone නිෂ්පාදනයක් ලෙස එකලස් කිරීමේ කටයුතු සිදු කරන පළමු අවස්ථාව ලෙසත් විදෙස් මාධ්‍ය වාර්තා කරයි" යනුවෙන්. ඒ, අපේ අසල්වැසි රට. හැබැයි, අපේ රටේ තත්ත්වය මොකක්ද? ලෝකයේ රටවල පාලකයෝ තමන්ගේ රටවල්, රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කරනකොට අපි පසුගිය දශක දෙක තුන තුළදී තට්ටු ගණන් උස බිල්ඩින් හැදුවා; ඒ බිල්ඩින්වලින් හොරා කෑවා. ඒ වාගේම ඒ රටවල් කෘත්‍රිම බුද්ධිය - AI තාක්ෂණය - නවෝත්පාදනයට හඳුන්වා දෙනකොට අපේ රටේ සමහර විද්‍යාඥයෝ පේටන්ට් බලපත්‍රය විකුණුවා. එහෙමයි අපේ රටේ සිද්ධ වුණේ. ඒ වාගේම ලෝකයේ රටවල පාසල්වල, විශ්වවිද්‍යාලවල දරුවන් පරිගණක තාක්ෂණයෙන් සන්නද්ධ වෙද්දී අපේ රටේ පරිගණක විද්‍යාගාරයක් නැති පාසල් කොච්චර තිබෙනවාද? පරිගණකයක් හැසිරවීමටවත් නොදන්නා ග්‍රාමීය දරුවන් කී දාහක් නම් ඇද්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ වාගේ වටපිටාවක් ඇතුළේ රට ඩිජිටල්කරණයට ලක් කිරීම පහසු වෙන්නේ නැහැ. ඒක අභියෝගාත්මකයි. විශේෂයෙන්ම මේ සඳහා රාජ්‍ය යන්ත්‍රණය, පෞද්ගලික යන්ත්‍රණය, ඒ වාගේම අධ්‍යාපන ආයතන, විදේශීය විශේෂඥයන්, විදේශීය ආයතන, විදෙස් ප්‍රජාව සම්බන්ධ කරගත යුතුයි. ඒ වාගේම ආරම්භක පියවරේදීම පාසල් සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළින්, ඒ කියන්නේ අධ්‍යාපන ආයතන මට්ටමින් විශේෂ වූ ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍යයි. අපේ රජය මේ වෙනකොටත් digital ID එක සහ e-passport එක හඳුන්වා දීමේ ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙනවා. මේ මඟින් සිදු වෙන්නේ පුද්ගලයින් හඳුනා ගැනීම පමණක්ම නොවෙයි. මෙහිදී, ආයතන සමඟ ගනුදෙනු කිරීමේ පහසුව ඇති වෙනවා. අනෙක් පැත්තෙන් අපරාධ මර්දනයටත් මේක උපකාරී වෙනවා. ඒ වාගේම රාජ්‍ය ආයතන ඩිජිටල්කරණයට ලක් කිරීම හමුවේ ඒවායේ කාර්යක්ෂමතාව වැඩි වීම පමණක්ම නොවෙයි, සේවකයින්ට පහසුව සැලසීම, ඒ වාගේම දූෂණය, නාස්තිය අවම කර ගැනීමත් අපට කර ගන්න පුළුවන් වෙනවා. එම නිසා අපි හිතනවා, මේ රජය ඩිජිටල්කරණය සඳහා, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා ඩිජිටල්කරණය සඳහා මේ රජය ගෙන යන ක්‍රියාමාර්ගය ඉතාම ප්‍රායෝගිකයි, කාලෝචිතයි කියලා අපි හිතනවා. හැබැයි, අපට මේ කාර්යය පහසු වෙන්නේ නැහැ, අභියෝගාත්මකයි. හැබැයි අපි හිතනවා, මේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය දැනුම, හැකියාව, වුවමනාව තිබෙන පිරිසක් අප සතුයි කියලා. එම නිසා ලෝකය පිටුපසින්, ඉබි ගමනින් යන රටක් වෙනුවට, ලෝකයත් එක්ක එකට ඉස්සරහට යන රටක් බිහි කරන්න අපට පුළුවන්.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[5.15 p.m.]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Presiding Member, I am much thankful to the Hon. (Mrs.) Oshani Umanga for bringing in this Adjournment Motion at this very appropriate time.

Sir, I would like to ask her a question. ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය මේ වෙලාවේ සභාවේ ඉන්නවාද කියලා මම දන්නේ නැහැ. Digital economy එක ගැන ඔබතුමිය මෙතැනදී කියලා තිබෙනවා. කරුණාකරලා මට කියන්න පුළුවන්ද, PayPal account එකක් අපේ රටේ හදන්න පුළුවන්ද කියලා? කමක් නැහැ, උත්තරයක් එන්නේ නැහැ. අපේ රටේ Payoneer account එකක් හදන්න පුළුවන්ද? සාමාන්‍යයෙන් අපේ රටේ ඉඳලා එක භාණ්ඩයක්, සාමාන්‍යයෙන් පොල් කටුවෙන් හදන හැන්දක් USAවලට, UKවලට යවන්න පුළුවන්. මම යවලාත් තිබෙනවා. ඔප්පු කරන්නත් පුළුවන්. සාමාන්‍යයෙන් ඒ එක හැන්දක් ඩොලර් 30යි, 40යි. ඒ කියන්නේ රුපියල් 12,000යි. හැබැයි, අපට මෙහේ ඉඳලා Etsy හරහා හෝ, නැත්නම් eBay හරහා හෝ විකුණන්න පුළුවන්. අපි Etsy හරහා විකුණනවා නම් GPay account එකක් ඕනෑ. GPay කියන්නේ මොකක්ද කියලා ඔබතුමියට කියන්න පුළුවන්ද? මම හිතන විධියට ලෝක වෙළෙඳ පොළේ handmade items වැඩිපුරම විකුණන්නේ Etsy accounts හරහා. අපේ රටේ එක්කෙනෙකුටවත් ඒ account එකක් හදන්න බැහැ. ඒවා දන්නේ නැතුව මේ වාගේ යෝජනා ගෙනැල්ලා වැඩක් නැහැ. එම නිසා මේ මාතෘකාව ගැන වැඩිපුර කථා කරලා වැඩක් නැහැ කියලා මම විශ්වාස කරනවා.

ඔබතුමිය "ඩිජිටල්" කියන මාතෘකාව ගැන කියන නිසා මම ආපසු fingerprint කථාවට එන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, fingerprint කථාව ගැන ඊයේ ඔබතුමාත් දකින්න ඇති. අද මම newsවල දැක්කා, ඒ වර්ජනයේ අද 4වැනි දවස කියලා කියනවා. Sri Lanka Post එකේ Postmaster General කියලා තිබෙනවා ලු, හෙට ඉඳලා VOP ගහනවා කියලා. ඒක හොඳයි. අනිවාර්යයෙන්ම VOP ගහන්න ඕනෑ. ඒ විධියටම ගිහිල්ලා hospitalsවල සිටින doctorsලාටත් VOP ගහන්න ඕනෑ; hospital එකේ සිටින nursesලාටත් VOP ගහන්න ඕනෑ. නලින්ද ජයතිස්ස ඇමතිතුමා මගේ හොඳ යාළුවා. ඇත්තටම මගේ හිතවතා. හැබැයි, මම එතුමාට පොඩි අභියෝගයක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම hospital එකේ හිටපු කාලයේ පැය 4යි OT ලියන්න පුළුවන්. නමුත් සමහරු බොරුවට OT ලියනවා. උදේ 8.00 ඉඳලා දවල් 12.00 වෙනකල් අපි duty ඉන්නවා; සවස 2.00 ඉඳලා 4.00 වෙනකල් duty ඉන්නවා. නමුත්, උදේ 6.00 ඉඳලා OT ලියලා තිබෙනවා. උදේ 6.00 වෙනකොට මොන hospital එකටද "ඩොකාලා" එන්නේ? එහෙම නම් ආණ්ඩු පක්ෂයේ ඉන්න ඔබතුමන්ලා කවුරු හරි ඔප්පු කරලා පෙන්වන්න, "ඩොකාලා" උදේ 6.00ට එනවා කියලා. සම්පූර්ණ බොරුවක් ලියන්නේ. හවස 4.00 ඉඳලා 6.00 වෙනකල් OT ලියනවා. "ඩොකාලා" යන්නේ තුනහමාරට. එතකොට, CCTV එක check කරලා අපේ doctorsලාටත් දැනට තිබෙන තත්ත්වය වෙනස් කරලා දමමු. මමත් ලියලා ඇති, නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අපි වචන භාවිතයේ දී පරිස්සම් වෙලා කථා කරමු.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sure, Sir. Accept my sincere apologies, if I said anything wrong in Sinhala. Sometimes, English words would come out of my mouth. I am so sorry for that.

ගරු ඇමතිතුමාට මම අභියෝගයක් කරනවා, එතුමා overtime ලියපු පොත අරගෙන බලමු. 2005, 2010, 2015, 2020, 2025 කියන හැම අවුරුද්දේම බොරු ලියලා ඇති. මම අභියෝග - challenge - කරනවා. මම එළියටත් ගිහිල්ලා කියනවා, දැන් සිටින "ඩොකාලා", සමහර postgraduate ඩොකාලා පැය 24ම වැඩ කරනවා. "ඩොකාලා" කියන්නේ doctorsලාට. මම දන්නේ නැහැ, ඒකට වෙන meaning එකක් තිබෙනවාද කියලා. සමාවෙන්න. දැන් ඉන්න nursesලාට 200 hours OT ලියන්න පුළුවන්. හිතලා බලන්නකෝ, සතියකට 200 hours OT කරන්න පුළුවන්ද කියලා. මෙට්‍රන්ලා OT ලියනවා, 240 hours. ඒ කියන්නේ කන්නේ නැහැ, බොන්නේ නැහැ, වැසිකිළියට යන්නේ නැහැ. ඒ කිසි දෙයක් කරන්නේ නැහැ, overtime විතරයි. එහෙම කරන්න පුළුවන්ද, මේ රටේ? අහිංසක postal staff එකේ අයට fingerprint තියන්න කියනවා. ඒගොල්ලන් අද මට කථා කළා. ඒ අය මට කිව්වා, fingerprint තියන්න ඔවුන් කැමැතියි කියලා. හැබැයි, දැන් ප්‍රශ්නය තිබෙන්නේ, fingerprint එක තියන එක නොවෙයි. ඒගොල්ලන් කියන්නේ, "අද මම duty එකට එන්නේ නැත්නම් මගේ duty එක cover කරන්නේ යාළුවා නම්, ඒ යාළුවා මම වෙනුවෙන් overtime කරනවා නම්, fingerprint තිබ්බොත් duty hoursවලට ඒගොල්ලන් කොහොමද මගේ overtime claim කරන්නේ" කියන එකයි. ඒගොල්ලන් පැයකට ගන්නේ රුපියල් 120යි, 110යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක් කාරණයක් කියන්නම්. මගේ පඩිය ගිය මාසයේ රුපියල් ලක්ෂ හතරයි. ඔබතුමන්ලා ඔක්කෝටම වඩා මගේ පඩිය වැඩියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

ඇයි දන්නවාද? අනික් ඔක්කෝටම වඩා මගේ පඩිය වැඩි වෙන්න හේතුව, මම Jaffna ඉඳලා එන එකයි. මට transport වියදම් වියියට රුපියල් 189,000ක් දෙනවා. එතකොට මට ලැබෙනවා, රුපියල් ලක්ෂ හතරක්. මම ඒක දවස් 30ට බෙදනවා. මම දවසකට පැය අටහමාරක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා. ඒ එන මුදල පැය අටහමාරෙන් බෙදනවා. ඊට පස්සේ විනාඩි 60න් -මිනිත්තු 60න්- බෙදනවා. එතකොට one minuteවලට එන්නේ රුපියල් 26යි. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නේ සතියකට විනාඩි 16යි. උපරිම ගන්න පුළුවන් විනාඩි 8යි. එතකොට ඒ විනාඩි 16ට ගෙවනවා නම්, MP කෙනෙකුට ගෙවන්න පුළුවන් උපරිම මුදල රුපියල් 416යි. රුපියල් 416ක් අරගෙන අපට ජීවත් වෙන්න පුළුවන්ද? පොඩ්ඩක් හිතලා බලන්න, අපේ basic පඩිය ගැන. මම ඩොක්ටර් වෙලා ඉන්නකොට, මගේ basic පඩිය කීයද? රුපියල් 51,000යි. ජීවත් වෙන්න පුළුවන්ද? ඒක නිසා බොරුවට OT ලියනවා. නැත්නම් මොකුත් කරන්න බැහැ. OT ක්‍රමයකට අපේ ඩොක්ටර්ස්ලාව ගෙනැල්ලා තිබෙන්නේ මේ ආණ්ඩුව. පුළුවන් නම් basic එක වැඩි කරන්න කියනවා, රුපියල් ලක්ෂ තුනට. එතකොට එක්කෙනෙක්වත් OT ලියන්නේ නැහැ.

තව එක කාරණයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. මම දැක්කා, අපේ Chief Government Whip කියලා තිබුණා, ප්‍රභාකරන් හිටපු නිසා Jaffnaවල මාෆියා තිබුණේ නැහැ කියලා. හැබැයි, මම නම් කියන්නේ මේකයි. ප්‍රභාකරන් ගැන අපි කථා කරන්නම්. ඒ, අපේ දෙයියෝ. ඔබතුමන්ලා කථා කරන්න, ඔබතුමන්ලාගේ පැත්තේ මැරුණු -සෙබළියෝ නොවෙයි- රණවිරුවෝ ගැන. පළාත් සභා මැතිවරණය තිබෙනවා කියලා, ප්‍රභාකරන් දෙයියෝ කියලා කථාව පටන් ගත්තා. කවුද? බිමල් රත්නායක. ඒක මාධ්‍යවල තිබුණා. මම දන්නේ නැහැ, මේක කොතැනද කථා කරලා තිබුණේ කියලා. හැබැයි, අපි කියන්නේ මෙයයි. ප්‍රභාකරන් ගැන කියන්නේ ත්‍රස්තවාදීන්ගේ කථාව මෙතැන නැවත අවුස්සන්න නොවෙයි. අපි කියන්නේ අපි වෙනුවෙන් මැරුණු මිනිසුන්ට අපි ගරු කරනවා කියන එකයි. ඒ විධියට ඔයගොල්ලන් වෙනුවෙන් මැරුණු මිනිස්සුන්ට ඔයගොල්ලන් ගරු කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි. මට තත්පර 20ක් දෙන්න.

Jaffnaවලට ගිහිල්ලා ප්‍රභාකරන් දෙයියෝ කියලා මාධ්‍යවලට බොරු කියන්න එපා කියන්න, බිමල් රත්නායකට. ඒ, අපේ දෙයියෝ. ඕනෑ නම් වඳින්න කියන්න, ඒක කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තමන්ගේ රට වෙනුවෙන් මැරුණු ලක්ෂ ගාණක් සිංහල රණවිරුවෝ ඉන්නවා. පුළුවන් නම්, ඒගොල්ලන්ට ගරු කරන්න කියන්න, බිමල් රත්නායකට. Jaffnaවලට ගිහිල්ලා ඡන්දය ගන්න ඕනෑ කියලා බොරු කිව්වාට අපි කවදාවත් ඡන්දය දෙන්නේ නැහැ. මමත් රැවටුණා. එක දවසක් කථා කළා. උගන්ඩාවලින් සල්ලි ගේන්න ඕනෑ නැද්ද කියලා ඇහුවා. ඒ කාලයේ මම නිකම් ඩොක්ටර් කෙනෙක්. මම කිව්වා, අන්න, අප්පට සිරි මේ අය උගන්ඩාවෙන් සල්ලි ගේනවා කියලා. අද අපි ඇහුවා ගේන්න ඕනෑ නේද කියලා. අද කියනවා, ඔව්, ගේන්න ඕනෑ කියලා. අනේ, බොරුවක් කරන්නේ නැතුව පුළුවන් නම් ඔයගොල්ලන් කියපු ටික ඉවර කරන්න බලන්න.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.22]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඔෂානි උමංගා මහත්මියට මගේ ස්තුතිය පුද කරනවා. ඇත්තටම ඩිජිටල්කරණය සහ ඩිජිටල්කරණය හරහා ආර්ථිකය දියුණු කිරීම කියන්නේ එක විෂයයක්. අද ඒකට අදාළ Sectoral Oversight Committee එකට යන්න මට අවස්ථාව ලැබුණා. ආණ්ඩුවටයි, විපක්ෂයටයි කිසිම භේදයකින් තොරව එකතු වෙලා වැඩ කර ගන්න පුළුවන් ස්ථානයක් හැටියට මා එය දකිනවා. ඩිජිටල්කරණය සහ ඩිජිටල්කරණ ආර්ථිකය කියන එක අපගේ අනාගත පරපුරේ ප්‍රධානම අරමුණක්. ඒකට විරුද්ධව කාටවත් යන්න බැහැ. මම එක උදාහරණයක් කිව්වා. ඒක මම Sectoral Oversight Committee එකේදීත් කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය දවසක විදේශගත වූ අවස්ථාවේ Bangkok Airport එකෙන් බැස්සාම landing card එක පුරවන්න තිබුණේ ඩිජිටල් තාක්ෂණය හරහා. මට සැහෙන වෙලාවක් ගියා, ඒ කටයුත්ත කර ගන්න. මොකද, QR code එක scan කර ගැනීමේදී මට ප්‍රශ්නයක් මතු වුණා. නමුත්, මම කියන්නේ ඒකයි. මම නිකම් බැලුවා, එතැනට සාමාන්‍යයෙන් එන ව්‍යාපාරිකයන් වාගේම අපේ රටේ ඉඳලා ගිය අය කිසි කරදරයක් නැතුව ඒ කටයුත්ත කරලා තිබුණා. ස්වාමීන් වහන්සේලාත් පැමිණ තිබුණා, කිසි කරදරයක් නැතුව ඒ කටයුත්ත කරලා තිබුණා. ඒකෙන් මට එකක් තේරුණා, that when there is a necessity, we would do it; ඒ අවශ්‍යතාව මත අපට ඒක කර ගන්න පුළුවන්. ඕක වුණා, කොවිඩ් කාලයේදීත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ ටික දෙමළ භාෂාවෙනුත් කියන්න ඕනෑ.
'கொவிட்' தொற்றுக் காலத்தில் நாங்கள் டிஜிற்றல் முறைமை ஊடாக பொருளாதாரம் சம்பந்தப்பட்ட எல்லா வேலைகளையும் செய்தோம்; நீதிமன்ற வேலைகளையும் செய்தோம். குறிப்பாக, நான் கொழும்பில் இருந்துகொண்டு மட்டக்களப்பு குடியியல் மேன்முறையீட்டு மேல் நீதிமன்ற நடவடிக்கைகளில் டிஜிற்றல் முறைமை ஊடாகக் கலந்து கொண்டேன்.

මඩකලපුව සිවිල් අභියාචනා අධිකරණයට අපට සම්බන්ධ වෙන්න පුළුවන් වුණා, ඩිජිටල් තාක්ෂණය හරහා. ඒ වාගේම තමයි ඩිජිටල් තාක්ෂණය හරහා අපට ශ්‍රේෂ්ඨාධිකරණයට නඩු ඉදිරිපත් කරන්නත් පුළුවන් වුණා. දැනුත් මම හිතන්නේ calling of cases, ඩිජිටල් තාක්ෂණය හරහා කරනවා. මම හිතන විධියට,

[ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා]

දැන් සිටින අග්‍ර විනිශ්වයකාරතුමා පැහැදිලිව කියලා තිබුණා, ඩිජිටල්කරණය හරහා අධිකරණ කටයුතු කරනවා කියලා. ඒක හරි වැදගත්. මොකද, පොඩි වෙලාවකට අපි කොච්චර වියදම් කරනවාද? ඒ සඳහා අපේ ඉන්ධන, කාලය ඔක්කෝම නාස්ති කරනවා. සමහර විට යාපනය, මඩකලපුව, ගාල්ල, මාතර, නුවරඑළිය වාගේ දිස්ත්‍රික්කවල අධිකරණවල පවරන හැම නඩුවකටම අපට කොළඹ ඉඳලා හොඳ ජ්‍යෙෂ්ඨ නීතිඥයන්ගේ සේවය අඩු මුදලකට ලබා ගන්න පුළුවන් වන කාලයක් ඉදිරියේදී එයි. මොකද, senior lawyer කෙනෙක් එතැනට flight එකක යනවා නම් අද රුපියල් 40,000ක් යනවා. ඉදිරියේදී අපට ඒ මුදල අඩු කර ගන්න පුළුවන්.

எனவே, டிஜிற்றல் பொருளாதாரம் ஊடாக இந்த நாட்டை ஒன்றுபடுத்துவதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் முன்னெடுக்கின்ற நடவடிக்கையை நாங்கள் ஆதரிக்கின்றோம். இது ஏற்கனவே ஆரம்பிக்கப்பட்டுள்ள ஒரு விடயம்தான். எனினும், இதனூடாகப் பாரியதொரு மாற்றத்தை நாங்கள் எதிர்காலத்தில் இந்த நாட்டில் எதிர்பார்க்கலாம். எனவே, இந்த விடயத்தைப் பாராளுமன்றத்துக்குக் கொண்டுவந்தமைக்காக நாங்கள் உங்களுக்கு நன்றி சொல்ல வேண்டும். இந்தச் செயன்முறையில் சில குறைபாடுகள் இருக்கத்தான் செய்கின்றது. பொருளாதாரத்தை டிஜிற்றல் மயப்படுத்தும் போது, நாங்கள் சில திணைக்களங்களை முக்கியமாகப் பார்க்க வேண்டும்.

දැන් බලන්නකෝ, පළාත් පාලන ආයතන ගැන. පළාත් පාලන ආයතනවල ගෙවීම් දැන් GovPay හරහා වෙනවා. ගොඩක් මන්ත්‍රීවරු Sectoral Oversight Committee එකේදීත් මට ඒ ගැන කිව්වා. එතුමන්ලා හරි කැමැතියි, ඒ අයගේ taxes ටික GovPay හරහා pay කර ගන්න. අධිකරණ fines ටික කෙළින්ම ගිහිල්ලා GovPay හරහා ගෙවා ගත්තා නම්, ආපසු ඕවාට කොළ පුරවා, එතැනින් පළාත් පාලන ආයතනවලට යවා ගැනීමේ කරදරයක් ඇති වෙන්නේ නැහැ. එතැනින් ගියාම Land Registriesවල stamp duty ටික GovPay හරහා අපට ගෙවන්න පුළුවන් නම් අදාළ පළාත් පාලන ආයතනයට ඒ මුදල් දවසකින් ලැබෙනවා. මම නගරාධිපති හැටියට කටයුතු කරපු කාලයේ කල්මුනේ මහනගර සභාවට අය විය යුතු මුදල් ටික අය කර ගන්න මට Trincomalee ගිහිල්ලා දවස් දෙකක් ඉන්න වුණා. ඒ කියන්නේ අවුරුදු තුනක හිඟ මුදල් තිබුණා ලබාගන්න. ඒගොල්ලන්ට ඒක GovPay හරහා කර ගන්න පුළුවන්. ඒ නිසා මේ කටයුත්ත අපට එකතු වෙලා කරන්න පුළුවන්. කිසිම කොන්දේසියක් රහිතව - without any condition - ඒ සඳහා අපට සම්පූර්ණ සහාය දැක්විය හැකි අවස්ථාවක් තමයි මේක. ඒක මම ජනතාවටත් කියන්න ඕනෑ.

GovPay என்பது, உள்ளூராட்சி மன்றங்கள் வரிப் பணத்தைப் பெற்றுக்கொள்வதற்கு குறிப்பாக, நீதிமன்றத் திலிருந்து கிடைக்கவேண்டிய பணத்தைப் பெற்றுக் கொள்வதற்கும், அந்தந்தப் பிரதேசங்களில் நடைபெறுகின்ற காணி கொடுக்கல்வாங்களின்போது செலுத்தப்படுகின்ற முத்திரைக் கட்டணம் ஊடான வரிப் பணத்தைப் பெற்றுக் கொள்வதற்கும் நல்லதொரு திட்டம்! நாங்கள் இது சம்பந்தமான விடயங்களை இன்னும் ஐந்து வருடங்களுக்கு அல்லது ஒரு வருடத்துக்குப் பிறகு செய்வதற்குக் காத்திருக்கத் தேவையில்லை; உடனடியாகச் செய்யலாம். இன்றைய தினம் நடைபெற்ற டிஜிற்றல் தொடர்பான Sectoral Oversight Committeeக்குக்கூட முக்கியமான நபர்கள் வந்திருந்தார்கள். அவர்கள் இவ்விடயத்துக்குத் தங்களுடைய ஒத்துழைப்பைத் தருவதாகச் சொல்லியிருந்தார்கள். டிஜிற்றல் பொருளாதார மானது பார்க்கும் பார்வையில் சாதாரண ஒரு விடயமாக இருந்தாலும், அதன்மூலம் எங்களுக்குக் கிடைக்கும் பலாபலன்கள் மிக அதிகம். எனவே, நாங்கள் இதனைச் செய்ய வேண்டும்.

දැන් අපි බලමු, ශක්තිය - energy - ගැන. අපි වාහනයක නැගලා වේගයෙන් යනවා. මම පාර්ලිමේන්තුවට ආපු පළමු දවසේම කිව්වා, ඩිජිටල් තාක්ෂණය අපට මෙතැනට ලබා දෙන්න කියලා. මම මේ laptop එක දෙන්න එපා කියලා කොච්චර අඬලා ඇද්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කවදාවත් කවුරු හරි මේ laptop එක ඇරලා වැඩක් කරලා තිබෙනවාද? නැහැ නේ. අපට මෙතැනට දෙන්න පුළුවන්, මීට වැඩිය හොඳ digital screen එකක්. අපට simultaneously, එහෙම නැත්නම් සමාන්තරව අපට Sectoral Oversight Committeesවලට සහ අනෙකුත් Committeesවලටත් සහභාගි වෙන ගමන් මේ සභාවේත් ඉන්න පුළුවන්. දැන් බලන්න, "Daily Mirror" පුවත් පතේ තිබෙනවා, "What has happened to the MPs in the area?" කියලා. මෙතැන empty seats සහිත photos ටිකක් අරගෙන දානවා. ඒකට හේතුව, බොහෝ විට අපට ඒ කමිටුවලට යන්න සිදුවීමයි. අපට මෙතැන ඉඳගෙනම ඩිජිටල් තාක්ෂණය හරහා අපේ වැඩකටයුතු ටික කර ගන්න ක්‍රමවේදයක් හදාගන්න එක මහ ලොකු දෙයක් නොවෙයි. Parliamentary Affairs Division එක හරහා අලුත් digital popup screen එකක් දාලා ඒ හරහා අපට මේ වැඩ ටික කර ගන්න එක මහා ලොකු දෙයක් නොවෙයි. අපට තිබෙනවා, මේ laptop එක. මේ හරහා අපට ඒවාට සහභාගි වෙන්න connect කර ගන්න පුළුවන්. ඊට සමාන්තරව මෙතැනත් අපට ඉන්න පුළුවන්. මහා ලොකු දේවල් එකපාරටම කල්පනා නොකර පොඩි පොඩි දේවල් කරමු. පළාත් පාලන ආයතන, පාර්ලිමේන්තුව ඩිජිටල්කරණය කරමු. දැනටමත් අධිකරණ පද්ධතියේ තිබෙන ඒ ඩිජිටල්කරණය නැවත පණ ගැන්වීම වැදගත්. ඒ වාගේ සරල දේවල් කරමු. දැනටත් ticketing systems තිබෙනවා. ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය එය හඳුන්වා දී තිබෙනවා, සම්පූර්ණ ඩිජිටල්කරණයක් කරන්න කවුරු හරි පිට රටින් සල්ලි දෙනතුරු ඉන්නේ නැතුව තිබෙන උපකරණ - equipment - භාවිත කරලා ඩිජිටල්කරණයට අපි යමු. ඒ සඳහා අපි දායක වෙන්න ලැහැස්තියි. අපි මේක විවේචනාත්මකව කියනවා නොවෙයි. මම හිතන විධියට, හැම මන්ත්‍රීවරයෙකුම මේ සම්බන්ධයෙන් දායක වෙන්නත්, සහයෝගය ලබා දෙන්නත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ඔෂානි උමංගා මන්ත්‍රීතුමියට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.29]

ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය කාලෝචිත සහ වැදගත් මාතෘකාවක් වන ඩිජිටල්කරණය මේ රජය නිවැරදිව කරන්නේ කොහොමද, ඒ සඳහා අපි රටේ සියලු ජනතාව සහභාගි කර ගන්නේ කොහොමද කියන එක යෝජනාවක් විධියට මේ සභාවට ගෙනාවා. මට පෙර

කථා කළ විපක්ෂයේ මන්ත්‍රීතුමා මේ සම්බන්ධව නිවැරදිව කථා කළත්, ඊට ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමා නම් කථා කළේ ඇත්තටම ඩිජිටල්කරණය කියන මාතෘකාවට අදාළව නොවෙයි. එතුමා ඩිජිටල්කරණය ගැන දන්නා වචන කිහිපයක් පාවිච්චි කළාට තනිකරම මාතෘකාවෙන් පිට තමයි කථා කළේ. එතුමා වෙනදා වාගේම පල් හැලි වගයක් තමයි කිව්වේ. අවාසනාවකට, ඒ කථාව තුළ මේ සභාවට හෝ රටේ ජනතාවට වැදගත් වන කිසිම කරුණක් අන්තර්ගත වෙලා තිබුණේ නැහැ.

අපේ රජය මේ වනකොට සෑහෙන ව්‍යාපෘති ගණනාවක් ඩිජිටල්කරණය කිරීමට පටන් අරගෙන තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, 2012 අවුරුද්දේ ඉඳන් තමයි මේ රටට digital ID පද්ධතියක් ගෙනෙන්න උත්සාහ ගන්නේ. හැබැයි, අපි බලයට එනකල්ම එය ඉටු කිරීමට එතුමන්ලා අපොහොසත් වෙලා තිබෙනවා. නමුත්, අපි බලයට ඇවිල්ලා, දැන් මේ පිළිබඳ ඉතා කඩිනම් සහ ස්ථිරසාර වැඩ පිළිවෙළක ඉන්නවා. අපි බලාපොරොත්තු වනවා, ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය වාගේ වනකොට digital ID පද්ධතිය ලංකාවට ගෙනැල්ලා පළමුවෙනි ID එක issue කරන්න.

ඒ වාගේම GovPay වාගේ පද්ධති හරහා digital payments පැත්තට යන්න අපි කටයුතු සකස් කර තිබෙනවා. මම අද උදේ බලනකොට ඒ පද්ධතිය හරහා ආයතන 97ක් connect කරලා තිබුණා. මේ වනකොට අපේ ජනතාව ඩිජිටල් මාධ්‍ය හරහා - GovPay හරහා - කරන paymentsවලට ආයතන 100ක් සම්බන්ධ කර තිබෙනවා. GovPay හරහා සේවාවන් 1,232කට ඩිජිටල් මාධ්‍යයෙන් ගෙවීම් කිරීමේ හැකියාව ඇති අතර, මේ දක්වා මිලියන 95ක ගෙවීම් සිදු කර තිබෙනවා. ඒ වාගේම digital TV පද්ධතිය, ඩිජිටල් රියදුරු බලපත්‍ර, ඩිජිටල් විදේශ ගමන් බලපත්‍ර සහ ඩිජිටල් මාධ්‍යයෙන් අස්වැසුම ලබා දීම, පොහොර සහනාධාරය බෙදීමේ යන්ත්‍රණය පවා ඇති කරන්න අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම ඩිජිටල්කරණය හරහා අධිකරණ පද්ධතියත් කාර්යක්ෂම කරන වැඩ පිළිවෙළ අපි ගෙන එමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් රජය විතරක් කටයුතු කරලා මදි. මේ ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ හරියට කරන්න නම් මේ සඳහා රටේ සියලු ජනතාව සහභාගි වෙන්න ඕනෑ. දේශපාලන යන්ත්‍රණය, ප්‍රතිපත්ති සම්පාදකයන්, රාජ්‍ය සේවාව, පෞද්ගලික අංශය, අධ්‍යාපනඥයින්, විශ්වවිද්‍යාල හා පාසල් ළමුන් ඇතුළු පොදු ජනතාවම මේ ඩිජිටල්කරණයට සහභාගි විය යුතුයි. එහෙම වුණොත් තමයි රජය මුදල් යොදවලා කරන ඩිජිටල්කරණ වැඩ පිළිවෙළෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්න අපට පුළුවන් වෙන්නේ. මොකද, ඩිජිටල් පද්ධති සකස් කළාට වැඩක් නැහැ, ඒවා නිවැරදි ආකාරයට පරිහරණය වෙන්නේ නැත්නම්. ඒ පරිහරණය ඇති කිරීමට රජය මැදිහත් වෙලා ජනතාව දැනුවත් කරන, ජනතාවගේ උනන්දුව ඇති කරන වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම අපි ක්‍රියාත්මක කරනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා ලෙස ගෙනා සංකල්පයක් විධියට සැප්තැම්බර් මාසය "ඩිජිටල් මාසය" ලෙස නම් කරලා, දින 100ක දැවැන්ත ඩිජිටල්කරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අප රජය කටයුතු සූදානම් කරමින් ඉන්නේ. ඒ කටයුත්තේදී ඩිජිටල් වැඩමුළු කරන්න, අලුත් ඩිජිටල් පද්ධති එළිදක්වන්න සහ මේ ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ කොළඹට පමණක් සීමා නොකර පිට පළාත්වලට, දිස්ත්‍රික්කවලට, නගරවලට සහ ගමට ගෙනයන දැවැන්ත වැඩ පිළිවෙළකට අපි ප්‍රවිෂ්ට වෙනවා. ඒ හරහා අපට පුළුවන් වෙයි, මේ රට සංවර්ධනය කරා යන ගමනේදී ඩිජිටල් පුනරුදයක් ඇති කරන්න. ඒ හරහා ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ පිළිබඳව ජනතාවට දැනුම ලබා දෙන්නත්, මේ සම්බන්ධයෙන් එක එක පාර්ශ්ව තුළ තිබෙන දුර්මත නැති කරන්නත් අපට පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සමහරු උත්සාහ කරනවා ඔවුන්ව බිය වද්දන්න. සමහරු මේ ඩිජිටල්කරණයට විරුද්ධව කථා කරනවා. ඒ වාගේම වැරැදි මත ප්‍රචාරය කරනවා. අපේ ජනතාව හරි විධියට දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළවල් හරහා ඒවාත් නැති කරන්න අපට පුළුවන්කම ලැබෙයි. මේ ඩිජිටල්කරණ මාසයේදී අපි බලාපොරොත්තු වෙනවා, ප්‍රධාන වැඩසටහන් 5ක් කරන්න. මට ලැබී ඇති කාලය සීමිත නිසා මම ඉතාම කෙටියෙන් ඒ ගැන කියන්නම්.

පළමුවැනි වැඩසටහන විධියට ඩිජිටල්කරණ නවෝත්පාදනයට සහ ව්‍යවසායට උර දීම වශයෙන් අපි "Disrupt Asia" කියලා ප්‍රදර්ශනයක් සහ සම්මන්ත්‍රණයක් පවත්වනවා. ඒ හරහා ලෝකයේ ඉන්න ප්‍රධාන පෙළේ ආයෝජකයන් ලංකාවට ගෙන්වලා අපේ තිබෙන ආයෝජන අවස්ථා පෙන්වන්නත්, අපේ startupsවලට ලංකාවෙන් පිටත යන්නේ නැතුව ලංකාව තුළදීම ආයෝජන ලබා ගන්නත් අවශ්‍ය පරිසරය ඇති කරන්න රජය මැදිහත්වෙලා කටයුතු කරනවා.

දෙවැනි වැඩසටහන විධියට අපි Sri Lanka Fintech Summit එකක් සංවිධානය කරලා තිබෙනවා. ඒ කියන්නේ, තාක්ෂණය පාවිච්චි කරලා ආර්ථික කටයුතු ඉතාම කඩිනම්ව කරන්නේ කොහොමද කියන එක සම්බන්ධව. ඩිජිටල් ගෙවීම් - Fintech - පමණක් නොවෙයි, ශුද්ධ ණය ගෙවන පද්ධති - microlending, රක්ෂණාවරණ දෙන පද්ධති සහ eKYC වාගේ දෙන පද්ධති ඩිජිටල්කරණය හරහා ගෙනෙන්න අපි ලංකාවේ summit එකක් කරනවා. ඒ හරහා අපට පුළුවන් වෙයි, අන්තර්ජාතික වශයෙන් තිබෙන දැනුම ලංකාවට ගෙනැල්ලා, ලංකාවේ Fintech community එකට ඒ දැනුවත්වීම ලබා දෙන්න.

තුන්වැනි වැඩසටහන ඉතා වැදගත්. ඒ අනුව අපි "National AI Expo" එකක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ හරහා ලංකාවටත් පුළුවන් වෙයි, කෘත්‍රිම බුද්ධිය - AI, artificial intelligence - හරහා ලෝකයේ රටවල් යන දැවැන්ත ගමනට පාර්ශ්වකරුවෙක් වෙන්න. මොකද අපි දන්නවා, AI තාක්ෂණය පැත්තෙන් ලංකාව ඉතාම පසුගාමී මට්ටමක සිටින බව. අපේ රටට AI තාක්ෂණය ගෙනැල්ලා, ඒ තාක්ෂණය පාවිච්චි කරලා කරන නවෝත්පාදන සහ ඒවා පාවිච්චි කරලා කාර්යක්ෂමතාව වැඩි කරන්න හදන සැලැස්ම අපි මේ වාගේ summit එකකින් කොහොමද දායක කර ගන්නේ කියන එක. AI Fund එකක්, an AI Centre of Excellence වාගේම AI යටිතල පහසුකම් හදන්න අපි ඒ හරහා බලාපොරොත්තු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර මට තව විනාඩියක් ලබා දෙන්න.

ඒ වාගේම හතරවැනි වැඩසටහන විධියට අපි සයිබර් නිරීක්ෂණ ආයතනයක් ස්ථාපිත කරන්න දැන් කටයුතු කරගෙන යනවා. අපි ඒක ලබන සැප්තැම්බර් මාසයේදී එළිදක්වනවා. ඒ

[ගරු එරංග වීරරත්න මහතා]

හරහා අපට පුළුවන් වෙයි, අපේ තිබෙන රාජ්‍ය ආයතනවලටත්, පෞද්ගලික ආයතනවලටත් මේ සයිබර් අවකාශයේ සිදුවෙන සයිබර් ප්‍රහාර මැඬලන්න real-time threat hunting වාගේ software ගෙනැල්ලා, එවැනි ප්‍රහාර නැති කරන්නේ කොහොමද කියන එක වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදන්න.

පස්වැනි වැඩසටහන තමයි, අපි මේ කරන ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ. Digital ID වේවා, එහෙම නැත්නම් විදේශ ගමන් බලපත්‍ර, රියදුරු බලපත්‍ර, GovPay, QR Payments, AI තාක්ෂණය පාවිච්චි කරන හැටි සහ ඩිජිටල් සහනාධාර ගෙවීම් ක්‍රමවේදයන් කියන මේවා කොහොමද වැඩ කරන්නේ කියලා ජනතාවට බලා ගන්න අපි digital experience centres හදනවා. එක digital experience centre එකක් අපි කොළඹ හදනවා. අනෙක් එක මම ඉස්සෙල්ලා සඳහන් කළ විධියට කොළඹට පමණක් සීමා නොවී අපේ ගම්බද පළාත්වල පවා ඉන්න පුරවැසියන්ට ඒ ඒ පද්ධති වැඩ කරන ආකාරය දැක බලා ගන්න පුළුවන් ආකාරයෙන් - ඔවුන්ටම ඇවිත් ඒවා කරන ආකාරය බලා ගන්න - experience centers විධියට mobile experience centres හදලා මේ වැඩසටහන අපි කොළඹින් ගමට ගෙන යන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අපි මේ වාගේ විශාල වැඩසටහන් කරගෙන යන ගමන් ඉන්නේ.

ඊළඟට අපි 5G ගෙනෙන්න වැඩ කටයුතු කරනවා. ඩිජිටල්කරණය තුළින් ඉස්කෝල නවීකරණය කරන්න අපි වැඩසටහන් ගෙනෙනවා. ගමනාගමනය, සෞඛ්‍ය, අධ්‍යාපනය වාගේ ක්ෂේත්‍රවල පවා ඩිජිටල්කරණය හරහා කඩිනම්, කාර්යක්ෂම සේවාවක් ජනතාවට ලබා දීමට අපේ රජයෙන් වැඩ පිළිවෙළක් ගෙනෙනවා. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරන සැප්තැම්බර් මාසය තමයි ඉස්සරහට එන්නේ. සැප්තැම්බර් මාසයෙන් පටන්ගෙන දින 100ක් මේ කටයුත්ත සිදු වනවා. ඒ සඳහා රජයට හොඳ වැඩ පිළිවෙළක් තිබෙනවා. මට සෑහෙන විශ්වාසයක් තිබෙනවා, මේ වැඩ පිළිවෙළ හරහා අපේ ජනතාව දැනුවත් කරන්න සහ ඔවුන්ගේ සහයෝගයත් ලබාගෙන 2030 වනකොට අපි බලාපොරොත්තු වන මට්ටමට ඩිජිටල්කරණය තුළින් රට සංවර්ධනය කරන්න අපට පුළුවන් වෙයි කියලා.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.38ට, 2025 අගෝස්තු 22වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.38க்கு, பாராளுமன்றம் 2025 ஓகஸ்ட் 22, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.38 p.m. until 9.30 a.m. on Friday, 22nd August, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.